වාර්ෂික වාර්තාව
2014

ජාතික විද්‍යා පදනම
47/5, මේට්ලන්ඩ් පෙදෙස,
කොළඹ - 07.
ශ්‍රී ලංකා.
www.nsf.ac.lk

NATIONAL SCIENCE FOUNDATION

සභාපතිතුමාගේ පණිවුඩය

ජාතික විද්‍යා පදනමේ 2014 වර්ෂය උදෙසා වන වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරන්නට ලැබීම මට දනවනුයේ මහත් සතුටකි. රටෙහි ප්‍රමුඛ විද්‍යා සහ තාක්ෂණ සංවිධානය වශයෙන් ජාතික විද්‍යා පදනම හට රටෙහි සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා විද්‍යාව තාක්ෂණය සහ නව්‍යකරණය මෙහෙයවීමේලා ඉටුකිරීමට ඇත්තේ තීරණාත්මක කාර්යභාරයකි. ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ 1994 අංක 11 දරන විද්‍යා තාක්ෂණ සංවර්ධන පනතින් බලය පවරන ලද්දා වූ ජාතික විද්‍යා පදනම දැනුම මත පදනම් වූ ආර්ථිකයක් නිර්මාණය කිරීම උදෙසා පර්යේෂණ සංවර්ධන සහ නව්‍යකරණයන්ට පහසුකම් සපයයි. ලැබී ඇති බලය ප්‍රකාර අපි ජනතාවගේ ජීවිතයෙහි ගුණාත්මකභාවය වර්ධනය කරනු වස් සියලු විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයන්හි දැනුම් නිර්මාණය, ධාරිතා වර්ධනය සඳහා පහසුකම් සැපයීම, තාක්ෂණ මාරුව, ව්‍යාප්තිය සහ දැනුම නිෂ්පාදනය කිරීම කෙරේ අවධානය යොමු කරන්නෙමු. මෙකී ඉලක්ක සපුරාගනු පිණිස ජාතික විද්‍යා පදනම විශේෂඥයන් සහ කීර්තිමත් විද්‍යාඥයන් සමඟ කටයුතු කරයි. එහෙයින් 2004 වර්ෂය තුළ සිය සේවය සැපයූ පිරිසට කෘතවේදීත්වය පළකිරීමට මහත් සතුටින් ඉදිරිපත් වන මම අනාගතයේ දී ද ඵලදායී මෙහෙවරක් අපේක්ෂා කරමි.

මේ රටෙහි විද්‍යා හා තාක්ෂණ අංශයෙහි විද්‍යා පදනමෙහි සුවිශිෂ්ට දායකත්වය විද්‍යා සහ තාක්ෂණ කළමනාකරණ තොරතුරු දත්ත පදනමෙහි ලියාපදිංචි වී සිටිනා බොහෝ විද්‍යාඥයන් සහ තාක්ෂණඥයන් විසින් මතුකර දක්වනු ලබයි. විද්‍යා හා තාක්ෂණ කළමනාකරණ තොරතුරු දත්ත පද්ධතිය නිතිපතා යාවත්කාලීන කෙරෙන අතර 2014 වසර අවසන් වන විට ඒ යටතේ ලියාපදිංචි වී ඇති විද්‍යාඥයින්ගේ මුළු සංඛ්‍යාව 5324 ක් විය.

ඉහත සඳහන් බලය සහ ලියාපදිංචි වී සිටිනා සහභාගි වන්නන්ගේ සංඛ්‍යාව අනුව ශ්‍රී ලංකා විද්‍යා පදනම විද්‍යාත්මක දත්ත රැස්කිරීම විශ්ලේෂණය සහ නිර්වචනය කිරීම සම්බන්ධයෙන් කේන්ද්‍රීය ආයතනය ලෙස කටයුතු කරනා බව සුපැහැදිලි ය. රටෙහි විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ සහ කර්මාන්ත ප්‍රවර්ධනය උදෙසා උපායමාර්ගයන් සහ ප්‍රතිපත්ති සංවර්ධනය කෙරෙනු පිණිස වන තීරණාත්මක තීරණයන් ගැනීම උදෙසා මෙකී තොරතුරු භාවිත කරනු ලැබිණ.

සෛද්ධාන්තික පර්ශේෂණයන්ට වඩා විද්‍යා පදනම තුළ විසල් උපායක්‍රමික වැදගත්කමක් ප්‍රායෝගික පර්යේෂණ ව්‍යාපෘතීන්ට ලැබෙන බවට සහතික කරනු වස් ජාතික විද්‍යා පදනම විසින් පියවර ගනු ලැබූ බව සඳහන් කිරීම ද සතුටකි. මීට පදනම් වූයේ රටෙහි මේ මොහොතෙහි පවත්නා අවශ්‍යතාවයි. එහිදී කාර්මික සහ ආර්ථික සංවර්ධනය උදෙසා වන පර්යේෂණයන් සහ නව්‍යකරණයන් හට හිමිකර දෙනු ලැබ ඇත්තේ ඉහළ වැදගත්කමකි. මීට සමපාතව පදනමෙන් කුඩා සහ මධ්‍ය පරිමාන කර්මාන්තයන්ට විශාල යෙදවුම් සහිතව එම කර්මාන්ත කෙරේ අවධානය ද යොමුකරන ලදි. තාක්ෂණ සංවර්ධනය, තාක්ෂණ මාරුව සහ වාණිජකරණය යන්න 2014 වසරේ දී පර්යේෂණ සහායයන් ලබාදිය යුතු වැදගත් කලාපයන් සේ සටහන් කෙරිණි. මෙකී අරමුණ යටතේ තේමාවන් දෙකක් මත එනම් "තාක්ෂණ සංවර්ධනය සඳහා සහාය වීම" සහ "ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා සහායවීම" යන්න යටතේ පදනම විසින් අරමුදල් සපයන ලදි. මෙකී පියවරින් අපේක්ෂිත ප්‍රධාන ප්‍රතිඵලය වනුයේ කර්මාන්ත සංවර්ධනය, ව්‍යවසායකත්වය සංවර්ධනය සහ ජාතික ආර්ථිකය වෙත පූර්ණ දායකත්වය සැපයීම දිරිගැන්වීමයි.

ජාතික තේමා මූලික ජාතික වැඩසටහන මගින් අඛණ්ඩව ජාතික පර්යේෂණ ප්‍රමුඛතාවන් එනම් ආහාර සුරක්ෂිතතාව ජල සුරක්ෂිතතාව දේශගුණ විපර්යාස සහ ස්වභාවික ව්‍යසන මෙන්ම බලශක්ති ආරක්ෂාව යන්නට ආමන්ත්‍රණය කෙරිණි. මෙකී ප්‍රයත්නයෙහි මූලික අරමුණ වනුයේ විධිමත් විද්‍යාත්මක පදනමක් සහ තොරතුරු දැනුවත් ආකාරයක් සහිතව තීරණ ගැනීම සඳහා පහසුකම් සපයනු පිණිස බහුවිද ශික්ෂණයෙන් යුත් සහයෝගී පර්යේෂණයන් ප්‍රවර්ධනය කිරීමයි.

සංවර්ධනය අනිවාර්යයෙන්ම ආර්ථික පරිසර සහ සමාජ යන ත්‍රිත්ව මානයන්හි සමානව ක්‍රියාත්මක විය යුතු හෙයින් ශුද්ධ විද්‍යා සහ තාක්ෂණ සංවර්ධන ක්ෂේත්‍රයන් තුළ කරනු ලබනා පර්යේෂණයන් හා සමගාමීව සමාජ අංශය තුළ පර්යේෂණයන් වර්ධනය කිරීමට පදනම විසින් පියවර ගනු ලැබිණි. ශ්‍රී ලංකාව ගත්කල ඒ සතුව සැඟවුණු සහ අභාවිත දැනුම් සම්භාරයක් ඇති බවත් කාලයත් සමඟ ඒ ක්ෂය වෙමින් හෝ වැනසී යමින් පවතින බවත් ජාතික විද්‍යා පදනමේ ප්‍රබල විශ්වාසයයි. මෙය මගහරවා ගැනීමට සහ මෙකී දැනුම වැඩිදියුණු කිරීමට විද්‍යා පදනම 2013 වසරේ දී මූලික පියවර ගත් අතර අංශ කීපයක් තුළ පවත්නා දේශීය සහ සම්ප්‍රදායික දැනුම සහ පරිචයන් ගවේෂණයට අඛණ්ඩව කටයුතු කරන ලදි. මෙහි අරමුණ වූයේ මෙකී දැනුම රැස්කර සංරක්ෂණය කර සුදුසු ආකාරයෙන් රටේ යහපත තකා භාවිත කිරීමයි. මෙකී ප්‍රයත්නය මගින් වටිනා දැනුමක් සම්පාදනය කරනු ඇති බවත් ප්‍රයෝජනවත් ප්‍රතිඵල උපදවාලනු ඇති බවටත් මම අපේක්ෂා කරමි.

සාමාන්‍ය ජනතාව හා පාසල් දරුවන් අතර විද්‍යාව ප්‍රචලිත කිරීමේ සහ වර්ධනය කිරීමේ වගකීම දරනා ප්‍රධාන

ආයතනය ලෙස ජාතික විද්‍යා පදනම අඛණ්ඩව සිය කාර්යභාරය ඉටු කළේ ය. පාසල් දරුවන් අතර විද්‍යාව සම්බන්ධයෙන් සවිමත් පදනමක් ස්ථාපිත කරනු පිණිස විද්‍යා පදනම අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් කටයුතු කරයි. 2014 වසරේ ලෝක විද්‍යා දිනයේ පාසල් වැඩසටහන් නොවැම්බර් මස දී පවත්වන ලද්දේ මානව වර්ගයාගේ ප්‍රයෝජනය උදෙසා අභ්‍යාවකාශ තාක්ෂණය යන වැදගත් තේමාව යටතේ ය. එහි දී පාසල් ළමුන් සහ ගුරුවරුන් 1500ට වැඩි පිරිසක් ඊට ආකර්ශණය කර ගන්නා ලදී. සරසවි විද්‍යා සමාජ වැඩසටහන යනු විද්‍යා විෂය ධාරාව හදාරන උපාධි අපේක්ෂකයන් තුළ උද්යෝගය ඇති කිරීම, එක්ව කටයුතු කිරීම සහ රටේ සංවර්ධනය උදෙසා ධාරිතා සංවර්ධනය උදෙසා වන වේදිකාවක් නිර්මාණය කිරීමේ අරමුණින් ස්ථාපිත කරන ලද තවත් වැදගත් ක්‍රියාකාරකමක් වන අතරම 2014 වසරේ අවසානය වන විට 29 දෙනෙක් ජාතික විද්‍යා පදනමෙහි ලියාපදිංචිව සිටියෝ ය.

ජාතික විද්‍යා පදනම මගින් සංවිධානය කරනු ලැබූ සම්මන්ත්‍රණ, සම්මේලන සහ වැඩමුළුවලට කලාපීය මෙන්ම ජාත්‍යන්තර වශයෙන් ද විශාල පුද්ගල සංඛ්‍යාවක් සම්බන්ධ වූවෝ ය. දේශීය වශයෙන් පවත්වනු ලැබූ වැඩමුළු ජනතාව තුළ විවිධ අංශයන්හි මතුව ඇති තත්කාලීන අභියෝගයන් පිළිබඳ දැනුවත් කිරීමට මහෝපකාරී විය. විවිධ මාතෘකා - ඉන් සමහරක් එතරම් ප්‍රකට නොවන මාතෘකා ය - සම්බන්ධයෙන් පවත්වන ලද සම්මේලන සම්මන්ත්‍රණ දේශන වැඩමුළු සහ මාධ්‍ය සාකච්ඡා විශාල පිරිසකගේ ආකර්ශණයට හේතු වූ අතර එමගින් විද්‍යා පදනමට අනාගතය උදෙසා නව ඇසකින් බැලීමට අවස්ථාවක් ලැබිණි. මේ පියවර ජාතික විද්‍යා පදනමේ කාර්යයන් සමඟ පොදු ජනයාගේ පුළුල් සහභාගිත්වයක් සඳහා මුල පුරන ලද්දේ යැයි අපි විශ්වාස කරමු. එසේම, අපි මෙකී ක්‍රියාකාරකම් අඛණ්ඩව වැඩිදියුණු කරමින් පවත්වාගෙන යෑමට අපේක්ෂා කරමු.

විවිධ යෝජනා ක්‍රමයන් යටතේ පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා අරමුදල් සම්පාදනය හැරුණු විට සිය පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන් ඉදිරිපත් කිරීමට සහ එවන් කාර්යයන්ට සහභාගි වීමට විද්‍යා කටයුතුවල නිරත ප්‍රජාවන්ට අනුග්‍රාහකත්වය සැපයීමට විද්‍යා පදනමට හැකියාව ලැබීම පිළිබඳව අපට ඇත්තේ සතුටකි. විද්‍යාත්මක දැනුම සහ පර්යේෂණ සහ සංවර්ධන සොයාගැනීම් පිළිබඳ තොරතුරු ව්‍යාප්ත කිරීමට අදාළව විද්‍යා පදනම වාර සඟරා දෙකක් ප්‍රකාශයට පත් කරයි. - එනම් ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනම් වාර සඟරාව (විද්‍යාව පිළිබඳ සවිස්තරාත්මකව උපුටනු ලබනා දර්ශකයෙහි ප්‍රශංසාවට ලක් වූ එකම සඟරාව) සහ ශ්‍රී ලංකා සමාජ විද්‍යා වාර සඟරාව. තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශය පකිස්ථානයෙහි විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරනු ඇත. ලෝක විද්‍යා ඇකඩමිය සමඟ සම්බන්ධ වෙමින් ජාතික විද්‍යා පදනම ජීව විද්‍යාව, රසායන විද්‍යාව, ගණිතය සහ භෞතික විද්‍යා යන ක්ෂේත්‍රයන්හි පර්යේෂණ කාර්යයන්හි යෙදෙමින් සුවිශිෂ්ටතා අත්කරගත් කුසලතා පූර්ණ තරුණ විද්‍යාඥයින්ට වාර්ෂික ත්‍යාග පිරිනැමීම සඳහා යෝජනා ක්‍රමයක් ස්ථාපිතකර තිබේ.

අප වෙත පවරන ලද වගකීම් භාරයන් ඉටුකරලමින් ජාතිය උදෙසා වන අපගේ බැඳීම සපුරාලනු වස් වර්ෂය පුරා වෙහෙස මහන්සි වී කටයුතු කළ ජාතික විද්‍යා පදනමේ කාර්ය මණ්ඩලයට මම මෙහිදී කෘතවේදිත්වය පළකර සිටිමි. අනාගත වසරවල දී වඩාත් දියුණු ශක්‍යතාවන්ගෙන් යුක්තව අපගේ පාර්ශ්වකරුවන්ට සේවය කරනු පිණිස විද්‍යා පදනම ඉදිරියට ද කටයුතු කරනු ඇත. ස්වකීය සහාය පිළිබඳව කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන්ට ද වසර පුරා ඉටුකරන ලද කැපවීමෙන් යුත් සේවාව පිළිබඳව සියලු කමිටු සාමාජිකයන්ට ද කෘතවේදිත්වය පළ කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි.

මහාචාර්ය
ඩබ්ලිව්. එල්. සුමතිපාල
B.Sc (Phy) (Cey), M.S., Ph.D (Meteorology) (Hawaii), FIP, CPhys

අධ්‍යක්ෂ ජනරාල්ගේ වාර්තාව

මේ වාර්තාව මගින් 2014.12.31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ ජාතික විද්‍යා පදනමෙහි කාර්ය සාධනය පිළිබඳව අවධානය යොමු කෙරේ.

මූල්‍ය සමාලෝචනය

කාලීන වශයෙන් රජයෙන් අරමුදල් ලැබීම අවිනිශ්චිත තත්ත්වයට පත්වීම හේතුවෙන් කළමනාකාරීත්වයට සිය වගකීම් ඉටුකිරීමේලා ප්‍රවේසමකාරී ප්‍රතිපත්තියක් භාවිත කිරීමට සහ අරපිරිමැසුම්දායී පියවරයන් අනුගමනය කිරීමට සිදු විය. ඒ අනුව පර්යේෂණයන් සහ ප්‍රධාන විද්‍යාත්මක ක්‍රියාකාරිත්වයන් උදෙසා දරන ලද ප්‍රදානයන්හි වටිනාකම වර්ෂය තුළ දළ වශයෙන් රු. මිලියන 200 ක් විය. මේ වනාහි තථ්‍ය අවශ්‍යතාවෙන් 84%ක් පමණි. එසේම එය වර්ෂයේ ප්‍රතිපාදනයන්ගෙන් 16%කි. අරමුදල්වලින් 11%ක් භාණ්ඩාගාරය විසින් මුදා නොහැර පැවති අතර එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රදානය සඳහා අනුමැතිය ලද තාක්ෂණ සහ පර්යේෂණ ප්‍රදානයන් කිහිපයක්ම නතර කිරීමට සිදුවිණි.

අරමුණු සාධනය

අත්විඳින ලද බොහෝ සීමාකාරී සාධකයන් හා අභියෝගයන් පැවතියේ වුව ජාතික විද්‍යා පදනම සුදුසු උපාය ක්‍රමයන් භාවිත කිරීම තුළින් ස්වකීය අරමුණු ළඟා කරගැනීම උදෙසා සමබර ආකාරයට කටයුතු කළේ ය. පර්යේෂණ සහ සංවර්ධන කටයුතු ප්‍රවර්ධනයට මෙන්ම රටෙහි පර්යේෂකයන් සහ පර්යේෂණ ආයතනයන්හි ධාරිතාව වර්ධනයට කැපීපෙනෙනා දායකත්වයක් ද සපයන ලදි. කාර්මික සංවර්ධනය උදෙසා තාක්ෂණ සංවර්ධනය සහ පර්යේෂණයන්හි ප්‍රතිඵල වාණිජ නිෂ්පාදනයන් සඳහා ව්‍යාප්ත කිරීම සඳහා ද යම්තාක් දුරකට පහසුකම් සපයන ලදි. විද්‍යාත්මක දැනුමෙහි සාක්ෂරතාවෙන් යුත් සමාජයක් ගොඩනැගීම උදෙසා දරන ලද දායකත්වය ද ඉතා වැදගත් ය. විද්වතුන් සහ පර්යේෂණ ප්‍රජාවන්, ප්‍රතිපත්ති සම්පාදකයන් සහ පරිපාලකයන්ට අවශ්‍ය වන්නා වූ විද්‍යා හා තාක්ෂණ තොරතුරු සම්පාදනයේලා විද්‍යා පදනම ප්‍රශංසාත්මක කාර්යයක් ඉටුකළේ ය.

පර්යේෂණ සඳහා පහසුකම් සැපයීම

පර්යේෂණයන් සඳහා පහසුකම් සැපයීමේ අරමුණ වන්නේ ජාතික සංවර්ධන අවශ්‍යතාවන්ට ආමන්ත්‍රණය කරනා පර්යේෂණ සහ සංවර්ධන සහ නවෝත්පාදන කාර්යයන් සඳහා අවශ්‍ය සහාය සැපයීම, ජාතික පර්යේෂණ නවෝත්පාදන පද්ධතිය මගින් සිදුකරනු ලබනා පර්යේෂණ සංවර්ධන සහ නවෝත්පාදනයන්හි ගුණත්වය ඉහළ නැංවීමයි. මේ අරමුණ සපුරාගනු පිණිස 2014 වර්ෂය තුළ කැපීපෙනෙනා ජයග්‍රහණයන් අත්කර ගන්නා ලදී.

- ***තරඟකාරී පර්යේෂණ ප්‍රදාන යෝජනා ක්‍රමය*** : මෙම යෝජනා ක්‍රමයේ අපේක්ෂාව වනුයේ රටෙහි විද්‍යාත්මක පර්යේෂණයන් උදෙසා අවශ්‍ය මූල්‍ය භෞතික සහ ශ්‍රම සම්පත්හි සුලබතාව සහතික කිරීමයි. මෙකී යෝජනා ක්‍රමය යටතේ රු. මිලියන 76.1 වටිනා ප්‍රදානයන් නව පර්යේෂණයන් 29ක් උදෙසා පිරිනැමිණි. 2014 වසර තුළ අරමුදල් සම්පාදනය කරන ලදුව තවමත් කෙරීගෙන යන පර්යේෂණ සංඛ්‍යාව 119 වන අතර පූර්ව වර්ෂයේ දී අරමුදල් පිරිනමන ලද ව්‍යාපෘති 11ක කටයුතු සම්පූර්ණ කර තිබේ. තරඟකාරී පර්යේෂණ ප්‍රදානයන් වෙනුවෙන් වසර තුළ දරන ලද මුළු මූල්‍ය ප්‍රදානයන්ගේ වටිනාකම රු. මිලියන 84.85කි. වර්ෂය තුළ ජාතික විද්‍යා පදනම විසින් අරමුදල් සම්පාදනය කරන ලද ව්‍යාපෘතීන්හි ශ්‍රම අවශ්‍යතා සම්පූර්ණ කිරීමට පහසුකම් සලසනු පිණිස නව පර්යේෂක සිසුන් 20 දෙනකු පත්කරන ලදි. ජාතික විද්‍යා පදනමෙහි අරමුදල් මගින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන් වෙතින් ඉදිරිපත් කෙරුණු පර්යේෂණ පත්‍රිකා 8ක් සහ 3ක් පිළිවෙළින් විදේශීය සහ දේශීය වාර සඟරාවන්හි පළවී තිබේ. මේ අතර සිදුකරන ලද වෙනත් පර්යේෂණ සන්නිවේදනයන්හි සංඛ්‍යාව 87කි.

- ***ජාතික තේමා මූලික පර්යේෂණ වැඩසටහන*** : ජාතික තේමා මූලික පර්යේෂණ වැඩසටහන යනු ජාතික ප්‍රමුඛතාවන්ට ආමන්ත්‍රණය කරන්නා වූ මෙහෙවරාභිමුඛ බහුවිධ ශික්ෂණ, සහයෝගී පර්යේෂණ වැඩසටහනකි. තේමා මූලික පර්යේෂණ වැඩසටහන යටතේ මෙතෙක් හඳුනාගනු ලැබූ වැඩසටහන් ත්‍රිත්වය එනම් ආහාර සුරක්ෂිතතාව, දේශගුණික වෙනස්කම් හා ස්වභාවික ව්‍යසන සහ ජල සුරක්ෂිතතාව වසර තුළ අත්විඳින ලද මූල්‍ය සහ කාර්ය මණ්ඩල සීමාවන් මධ්‍යයේ වුව සෑහීමකට පත්විය හැකි ප්‍රගතියක් පෙන්වා තිබේ. දේශගුණ වෙනස්කම් සහ ස්වාභාවික ව්‍යසනයන් පිළිබඳ තේමා පත්‍රිකාව පිළියෙල කිරීමේ කටයුතු සම්පූර්ණ කර ඇති අතර රජයේ සහ පුද්ගලික අංශයේ ආයතනයන්හි හවුල්කාරිත්වය තුළින් උපායක්‍රමික වශයෙන් වැදගත්

වන්නා වූ කලාපයන් 6ක ක්‍රියාත්මක කළ යුතු ව්‍යාපෘති 12ක් හඳුනාගෙන ඇත. ඒ අතරම ආහාර සුරක්ෂණය යන තේමාව යටතේ 2012 හා 2013 වසර තුළ පිරිනමන ලද ව්‍යාපෘති 9ක් අඛණ්ඩව සතුටුදායක ප්‍රගතියක් පෙන්වා තිබේ. ජල සුරක්ෂිතතා තේමාව යටතේ අත්කරගන්නා ලද කැපීපෙනෙනා ජයග්‍රහණයක් වනුයේ ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණය පිළිබඳ යුනෙස්කෝ වැඩසටහන සාර්ථකව සපුරාලීමට හැකිවීමයි. එමගින් දිස්ත්‍රික්ක 6ක් තුළ වැඩමුළු 10ක් ආවරණය කරන ලදි. මෙකී වැඩසටහනෙහි අරමුණ වූයේ ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණ සහ ජල සංරක්ෂණය පිළිබඳව ගොවි ප්‍රජාවන් අතරෙහි දැනුවත්භාවය ඇතිකිරීමයි.

පර්යේෂණ ප්‍රජාවන්හි ධාරිතා වර්ධනය සහ ජාත්‍යන්තර සහයෝගිතාව

ඉහළ දක්ෂතාවකින් යුත් නිපුණ පර්යේෂකයන්ගෙන් යුත් තීරක පිරිසක් යනු රටක සංවර්ධනය උදෙසා වන අත්‍යවශ්‍ය සාධකයකි. මෙකී ජාතික අවශ්‍යතාවට ආමන්ත්‍රණය කරනු පිණිස ජාතික විද්‍යා පදනම පර්යේෂණ ප්‍රජාවෙහි ධාරිතා වර්ධනය උදෙසා යෝජනා ක්‍රම ගණනාවක් පිරිනමයි. මේ සම්බන්ධයෙන් වසර තුළ සිදුකරන ලද දායකත්වය කැපීපෙනේ.

- ***සංචාර සඳහා ප්‍රදාන*** : වර්ෂය තුළ දී ශ්‍රී ලාංකික විද්‍යාඥයන් හට සංචාරක ප්‍රදානයන් 51ක් පිරිනමන ලදි. මෙහි අරමුණ වනුයේ පර්යේෂකයන්ට තම පර්යේෂණයන්හි සොයාගැනීම් පිළිබඳව ජාත්‍යන්තර තලයේ ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසීම මෙන්ම නව සොයාගැනීම් ජයග්‍රහණයන් සහ සංවර්ධනයන් වැනි දෑ සම්බන්ධයෙන් විද්‍යාත්මක දැනුම ලබාගැනීමට ඉඩ සැලසීමයි.

- ***විශේෂ විදෙස් පුහුණු වැඩසටහන්*** : මෙකී යෝජනා ක්‍රමය යටතේ විදේශයන්හි විශිෂ්ට පර්යේෂණ මධ්‍යස්ථාන සහ විද්‍යාගාරයන්හි තම දැනුම සහ පර්යේෂණ ශක්‍යතාවන් වර්ධනය කරගැනීම සඳහා පර්යේෂකයන් 16 දෙනකුට මූල්‍ය සහායන් සපයන ලද අතර මේ සඳහා ජාතික විද්‍යා පදනමේ දායකත්වය රු. මිලියන 3.78කි.

- ***පර්යේෂණ ශිෂ්‍යත්වයන්*** : වර්ෂය තුළ දී ජාතික විද්‍යා පදනමේ අරමුදල් මත ක්‍රියාත්මක ව්‍යාපෘතින්හි වැඩකළ පර්යේෂක සිසුන් 24 දෙනකුට පශ්චාත් උපාධි සඳහා ලියාපදිංචි වීමට උපකාර සැලසූ අතර සිසුහු 15 දෙනකු සිය පශ්චාත් උපාධි සම්පූර්ණ කළ අතර 5 දෙනෙක් ආචාර්ය උපාධිය සම්පූර්ණ කළෝ ය.

- ***විද්‍යාව හා තාක්ෂණය උදෙසා වන ජාත්‍යන්තර හවුල්කාරිත්වය*** : විදේශයන්හි සේවය කරනා ඉහළ මට්ටමේ විද්‍යාඥයන් සහ තාක්ෂඥයන්ගේ සේවය ලබාගනු පිණිස විද්‍යා හා තාක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර හවුල්කාරිත්වය යටතේ ප්‍රදානයන් 3ක් සිදුකරන ලදි.

- ***දේශීය සහ ජාත්‍යන්තර සම්මේලන සඳහා අනුග්‍රාහකත්වය සැපයීම*** : ජාතික සහ ජාත්‍යන්තර සම්මේලනයන් 24ක් සංවිධානය කරනු පිණිස වර්ෂය තුළ ජාතික විද්‍යා පදනම පර්යේෂණ සංගමමයන් සහ ආයතනයන්ට අනුග්‍රාහකත්වය සැපයී ය. මෙහි අරමුණ වූයේ පර්යේෂණයන්හි ප්‍රතිඵල සහ අත්දැකීම් බෙදාගැනීම ප්‍රවර්ධනයයි. මෙහිදී ප්‍රදානය කරන ලද අරමුදල් ප්‍රමාණය රු. මිලියන 4.94කි.

අධ්‍යයන සහ පර්යේෂණ ආයතනයන්හි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා පහසුකම් සැපයීම.

ගෝලීය විද්‍යා හා තාක්ෂණ පර්යේෂණයන් සමඟ ගමන් කරනු පිණිස පර්යේෂණාන් සඳහා නවීන යටිතල පහසුකම්වලින් සමන්විත විද්‍යාගාර අවශ්‍ය වේ. ඒ අනුව රටෙහි පර්යේෂණ යටිතල පහසුකම් වර්ධනය කරනුවස් විශ්ව විද්‍යාල සහ පර්යේෂණ ආයතනයන් හට රු. මිලියන 7.29 වටිනා උපකරණ පිරිනමන ලදි.

තාක්ෂණ සහ ව්‍යවසායකත්ව සංවර්ධනය

මෙකී වැඩසටහනෙන් අපේක්ෂිත ප්‍රධාන ප්‍රතිඵලය වනුයේ කාර්මික සංවර්ධනය කරා මං සලසන නව තාක්ෂණය සහ නවෝත්පාදනයන් ප්‍රවර්ධනය කිරීමත් එමගින් ජාතික ආර්ථිකයේ වර්ධනය සඳහා දායකත්වය සැපයීමත් ය. තාක්ෂණ සංවර්ධනයට සහ අලුතින් ස්ථාපිත කරන ලද ව්‍යාපාරයන්ට උපකාර කරනු පිණිස වසර තුළ දී මුළු ගණනින් ප්‍රදානයන් හයක් පිරිනමන ලදි. වසර තුළ මෙසේ දරන ලද සමස්ත මූල්‍ය ප්‍රතිපාදනය රු. මිලියන 23.55කි. වර්ෂය තුළ ස්ඵෘෂ්‍ය නිමැවුම් සහිතව තාක්ෂණ ව්‍යාපෘති හයක් සාර්ථකව සම්පූර්ණ කරන ලද අතර එහි නිපැයුම් වාණිජ ක්‍රියාවලිය සඳහා සූදානම්ව පවතී. සාර්ථක ව්‍යවසායකයකු සඳහා වන ප්‍රධාන අවශ්‍යතාවක් වනුයේ බුද්ධිමය දේපළ සහ ඊට අදාළ ගැටලු පිළිබඳ ඉහළ දැනුමකින් යුක්ත වීමයි. තාක්ෂණ ව්‍යාප්ති පහසුකම් මධ්‍යස්ථානය එනම් "වන්-ස්ටොප් ටෙක් ස්පොට්" 2014 නොවැම්බර් 04 දින දියත් කරන ලද්දේ ප්‍රදානයන්හි නිමැවුම් වාණිජකරණය සඳහා ආයෝජකයන්ට මෙන්ම නව නිපැයුම්කරුවන්ට සප්‍රයෝජනවත් වේදිකාවක් නිර්මාණය කරමිනි. වර්ෂය තුළ පේටන්ට් පත්‍රිකා පිරවීම සඳහා නව නිපැයුම්කරුවන් 9 දෙනකුට සහ විද්‍යා හා තාක්ෂණ නිලධාරීන් තිදෙනකුට

උපදේශනයන් සපයන ලදි. මෙවන් දේශීය නිෂ්පාදනයන් සඳහා යහපත් එමෙන්ම තිරසර වෙළෙඳපොළක් සහතික කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති නොමැතිකම මේ කාර්යයේ දී හඳුනාගන්නා ලද ප්‍රධාන බාධකයක් වේ.

කැපීපෙනෙනා පර්යේෂණයන් වෙනුවෙන් සම්මාන පිරිනැමීම : පර්යේෂණ හා තාක්ෂණයෙහි ප්‍රවර්ධනය උදෙසා කැපීපෙනෙනා දායකත්වයක් පළකළ පර්යේෂකයන් හට ත්‍යාග පිරිනැමීමට අභිප්‍රේරණයට සහ දිරිමත් කිරීමට ජාතික විද්‍යා පදනම ත්‍යාග ප්‍රදාන යෝජනාක්‍රම කිහිපයක් ඉදිරිපත් කරයි. ඒ අනුව වර්ෂය තුළ දී යෝජනා ක්‍රම ගණනාවක් යටතේ සැලකිය යුතු පර්යේෂකයන් පිරිසකට පහසුකම් සපයන ලදි.

- ***ජාතික විද්‍යා පදනමෙහි පර්යේෂණ සම්මාන සහ ජාතික විද්‍යා පදනමෙහි තාක්ෂණ සම්මාන*** : ජාතික විද්‍යා පදනමෙහි අරමුදල් මත ක්‍රියාත්මක වූ ව්‍යාපෘතීන් හරහා කැපීපෙනෙනා දායකත්වය සැපයූ පර්යේෂකයන් සහ තාක්ෂණඥයන් හට සම්මාන 4ක් සහ ප්‍රශංසාත්මක සහතික තුනක් පිරිනමන ලදි. සම්මාන ප්‍රදානෝත්සවය දෙසැම්බර් 23 පැවැත්විණි.

- ***ලෝක විද්‍යා අධ්‍යයන සම්මාන*** : මෙම යෝජනා ක්‍රමය මගින් සිය පර්යේෂණ කාර්යයන්හි සුවිශිෂ්ට දක්ෂතා දැක්වූ තුරුණු විද්‍යාඥයින්ට ප්‍රදානයන්ට ලබාදෙන අතර මෙකී යෝජනා ක්‍රමය යටතේ ජීව විද්‍යා ක්ෂේත්‍රය තුළින් එක් නාම යෝජනාවක් ලෝක විද්‍යා අධ්‍යයන සම්මාන ලේකම් කාර්යාලයට 2014 වසරේ එහි සම්මාන උළෙලේ දී සලකා බැලීම පිණිස ඉදිරිපත් කරන ලදි.

- ජාතික විද්‍යා හා තාක්ෂණ යනු: ජාතික මට්ටමේ කැපීපෙනෙනා දායකත්වයන් හඳුනාගනු පිණිස ජාතික විද්‍යා පදනම මගින් ක්‍රියාත්මක කරනු ලබනා තවත් යෝජනා ක්‍රමයකි. ජාතික සම්මාන 5ක් සහ කුසලතා සහතික 5ක් පිරිනමනු පිණිස ප්‍රවර්ගයන් 9ක් යටතේ ව්‍යාපෘති 10ක් තෝරාගන්නා ලදි. අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට නියමිත සම්මාන ප්‍රදානෝත්සවය සඳහා කටයුතු පිළියෙල වෙමින් පවතී.

- පර්යේෂණ උපාධි අධීක්ෂණය සඳහා වන උපකාරක යෝජනා ක්‍රමය මගින් අපේක්ෂා කෙරෙනුයේ පශ්චාත් උපාධි පර්යේෂණ කරා යොමුවුණ විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයන්හි පර්යේෂයන්හි නිරත සිසුන් අධීක්ෂණය කිරීමෙහි යෙදී සිටිනා විද්‍යාඥයින්/ඉංජිනේරුවන් හඳුනාගැනීමට සහ ඔවුන් අභිප්‍රේරණය කිරීමට මෙන්ම ඔවුන්ට උපකාර කිරීමට ය. මේ අනුව පර්යේෂණ උපාධි අධීක්ෂණය සඳහා වන උපකාරක යෝජනා ක්‍රමය මගින් වසර තුළ සම්මාන 6ක් පිරිනමන ලදි.

ජාත්‍යන්තර හවුල්කාරිත්වයන්:

ලෝක විද්‍යා ඇකඩමිය, අයිසීඑස්යූ, අයිසීජීඊබී, එස්අයිඩීඒ, අයිඑෆ්එස් වැනි ජාත්‍යන්තර විද්‍යා සංවිධානයන් කිහිපයක ජාතික මට්ටමේ කේන්ද්‍රීය ලක්ෂ්‍ය ලෙස කටයුතු කරමින් ජාතික විද්‍යා පදනම අඛණ්ඩවව සපලදායී හවුල්කාරිත්වයන් පවත්වාගැනීමට සමත් විය. එසේම ජාතික විද්‍යා පදනම සහ පකිස්ථාන විද්‍යා පදනම අතර නව හවුල්කාරිත්වයක් ගොඩනැගීමට මූලාරම්භයන් සකසන ලදි. මෙමගින් දේශීය විද්‍යාඥයන්ට/තාක්ෂණඥයන්ට විශේෂඥ උපකාර ලබාගැනීමට සහ පකිස්ථානයේ පර්යේෂණ ආයතනයන් සමඟ එක්ව විද්‍යා හා තාක්ෂණ විවිධ ක්ෂේත්‍රයන් තුළ සහයෝගී ක්‍රියාකාරකම් ස්ථාපිත කිරීමට අවස්ථාවක් සැලසෙනු ඇත.

සන්නිවේදන විද්‍යාව

මෙම වැඩසටහනෙහි මූලික අරමුණ වනුයේ විද්‍යාත්මක සාක්ෂරතාවෙන් යුත් සමාජයක් ගොඩනැගීම උදෙසා විද්‍යාව තාක්ෂණය සහ නවෝත්පාදනයන් ජනප්‍රිය කිරීමයි. ලෝක විද්‍යා දින පාසල් වැඩසටහන යනු පාසල් ප්‍රජාව තුළ විද්‍යා සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම පිණිස සංවිධානය කරනු ලබනා වාර්ෂික අවස්ථාවකි. ඒ අනුව 2014 වැඩසටහන මානවයාගේ යහපත උදෙසා අභ්‍යාවකාශ තාක්ෂණය යන තේමාව යටතේ සංවිධානය කරනු ලැබූ අතර ජාතික විද්‍යා පදනමෙහි ලියාපදිංචි වී ඇති පාසල් විද්‍යා සමාජයන් අතරේ තරගාවලියක් පවත්වන ලදි. විශිෂ්ට ශ්‍රී ලාංකික විද්‍යාඥයකු වන ඇමරිකා එක්සත් ජනපදයෙහි නාසා ආයතනයේ ආචාර්ය සරත් ගුණපාල ප්‍රධාන අමුත්තා ලෙස වැඩසටහනට සහභාගි විය.

තුරුණු විද්‍යා නායකයෝ මැයෙන් නව වැඩසටහනක් හඳුන්වා දෙන ලද අතර එහිදී විද්‍යා ක්ෂේත්‍රයේ නායකයන් ලෙස අ.පොස.ස උ.පෙළ සිසුන් 25 දෙනකු පුහුණු කරන ලදි. සමාජයේ විවිධ අංශයන්හි විද්‍යාත්මක දැනුම ප්‍රවර්ධනය කරනු පිණිස ව්‍යාප්තිය පිණිස ජාතික වැදගත්කමකින් යුත් මාතෘකාවලියක් මත පොත්, සඟරා සහ වීඩියෝ වැඩසටහන් ගණනාවක් ප්‍රකාශයට පත් කෙරිණි. තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශය මගින් සංවිධානය කරනු ලැබූ විද්‍යා සතියට (නොවැම්බර් 04-10) ජාතික විද්‍යා පදනම සක්‍රීයව සහභාගි විය. විදු කවය දේශන මාලාව යටතේ ජාතික වැදගත්කමකින් යුත් ගැටලු පිළිබඳ සාකච්ඡාවක් ඇතිකරනු පිණිස විද්වතුන්ට සහ පොදුජනයාට වේදිකාවක් නිර්මාණය කිරීමේ අරමුණින් මූලික විද්‍යා ආයතනය සමඟ සහයෝගයෙන් ප්‍රසිද්ධ දේශන මාලාවක් සංවිධානය කෙරිණි.

විද්‍යාත්මක සාක්ෂරතාවෙන් හෙබි සමාජයක් ස්ථාපිත කිරීමේ මාර්ග සිතියමෙහි පවත්නා හිඳුස් පුරවාලනු පිණිස විද්‍යා මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට මූලික පියවර ගනු ලැබිණි.

ස්වභාවික සම්පත් තිරසර භාවිතය

භූ උද්‍යානයක් ලෙස නම් කරනු පිණිස සලකා බලනු වස් යුනෙස්කෝව වෙත උස්සන්ගොඩ පිළිබඳ නාමයෝජනා ලේඛන කට්ටලයක් ඉදිරිපත් කරනු ලැබිණි. සිංහරාජ බුන්දල හුරුලු සහ නාකියාදෙණිය සංකීර්ණය යනාදී ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ජෛවගෝලීය සංචිතයන් හතරක් පිළිබඳ වාර සමාලෝචනයන් සම්පූර්ණ කරන ලද අතර අදාළ වාර්තා යුනෙස්කෝවට ඉදිරිපත් කෙරිණි.

විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති පර්යේෂණ

රටක සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා ජාතික ප්‍රතිපත්තීන් සහ විද්‍යාත්මක දර්ශනයන් සැකසීම පිළිබඳ වන තොරතුරු අතිශය තීරණාත්මක වේ. ලැබී ඇති බලය පරිදි විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති පර්යේෂණ අංශය පාර්ශ්වකරුවන් පර්යේෂකයන් පරිපාලකයන් සහ ප්‍රතිපත්ති සම්පාදකයන් හට සපයනු පිණිස දත්ත එක්රැස් කිරීම නිර්වචනය සහ විග්‍රහය උදෙසා වන ජාතික වැදගත්කමකින් යුත් විශේෂ කලාපයන් පිළිබඳ ප්‍රතිපත්ති පර්යේෂණයන් අඛණ්ඩව සිදු කළේ ය. වර්ෂය තුළ දී ජාතික පර්යේෂණ සහ සංවර්ධන මිනුම් සහ විද්‍යා තාක්ෂණ හා තොරතුරු පශ්චාත් උපාධි පිළිබඳ සෙවුම් අධ්‍යයනයක් පවත්වන ලද අතර මේ අධ්‍යයනයන් දෙක තුළින් ම කැපීපෙනෙනා ප්‍රගතියක් දක්නට ලැබුණි.

තොරතුරු අවශ්‍යතා සම්පූර්ණ කිරීම.

විද්‍යා හා තාක්ෂණ කළමනාකරණ තොරතුරු පද්ධතියේ දත්ත පදනම පාර්ශ්වකරුවන් පරිපාලකයන් සහ ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ තොරතුරු අවශ්‍යතා සපුරාලීම පිණිස යහපත් තොරතුරු මූලාශ්‍රයක් සපයයි. විද්‍යාත්මක හා තාක්ෂණ කළමනාකරණ තොරතුරු පද්ධතියෙහි ලියාපදිංචි වී ඇති මුළු විද්‍යාඥයන්ගේ සංඛ්‍යාව 2014 වසරේ අවසානය වන විට 5,320 ක් ලෙස වාර්තාවිණි. ජාතික විද්‍යා පුස්තකාල සහ සම්පත් මධ්‍යස්ථානය යනු විද්‍යාත්මක ප්‍රතිරූපයන් උදෙසා විද්‍යා හා තාක්ෂණ සාහිත්‍ය ව්‍යාප්ත කිරීමේ ජාතික කේන්ද්‍රය වේ. එය ශ්‍රී ලංකාකික ප්‍රභවයක් සහිත විද්වත් සාහිත්‍යයක පූර්ණ ලේඛනවලින් සමන්විත ඩිජිටල් පුස්තකාලයක් පර්යේෂණ සහ අධ්‍යයනය ආයතන හරහා පැතිරුණු ඩිජිටල් පුස්තකාල ජාතික ජාලයක් දක්වා ව්‍යාප්ත කරමින් පවත්වාගෙන යයි (ආයතනික ගබඩා). ජාලයට නව ගබඩා 7ක් සම්බන්ධ කිරීමත් සමඟ මේ ජාලය වසර තුළ ඉහළ ප්‍රගතියක් පෙන්නුම් කර තිබේ. ජාතික විද්‍යා පදනමේ අරමුදල් මත කරන ලද පර්යේෂණ නිමැවුම් පිළිබඳ සම්පූර්ණ පඨිතයන්ට ප්‍රවේශයන්ට සපයනු පිණිස නව ඉලෙක්ට්‍රොනික ගබඩාවක් ස්ථාපිත කෙරිණි. මාර්ගගතව පළකරන ලද ශ්‍රී ලංකා වාර සඟරාවන්හි නාම සංඛ්‍යාව, ශ්‍රී ලංකාවෙහි සමාන විද්වතුන් විසින් සමාලෝචනයට ලක්කරන ලද වාර සඟරා මාර්ගගත ප්‍රකාශයට පත්කිරීම සඳහා වන වේදිකාවන් 59ක් වාර්තා වී තිබේ. 2014 වසර තුළ දී නව නාමයන් 6ක් ශ්‍රී ලංකා මාර්ගගත වාර සඟරාවන්ට එක් වී තිබේ.

අරමුදල් සපයන සංවිධාන හා පර්යේෂණ ආයතන - විශ්වවිද්‍යාල හරහා භාවිත කිරීම පිණිස ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසම සමඟ සහයෝගයෙන් පර්යේෂණ ප්‍රතිඵල කරා විවෘතව එළඹිය හැකි විවෘත ප්‍රකාශනයක් ප්‍රවර්ධනය කරනු පිණිස විවෘත ප්‍රවේශ ප්‍රතිපත්ති ආකෘතීන් පිළියෙල කෙරිණි. මෙම උපායමාර්ගය මගින මහජන අරමුදල් යොදවා පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලාංකික පර්යේෂණයන්ගේ සොයාගැනීම් කරා වඩා ඉහළ බලපෑමක් ඉහළ පිළිගැනීමක් මෙන්ම ඉහළ ව්‍යාප්තියක් ප්‍රවර්ධනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ජාතික විද්‍යා පදනමේ වාර සඟරාව

ජාතික විද්‍යා පදනමේ වාර සඟරාව යනු වර්තමානයේ තොම්සන් රොයිටර්ස් දත්ත පදනමෙහි සුවිගත කරනු ලබන එකම වාර සඟරාවයි. වාර සඟරාවේ කලාප 4 ම නියමිත වෙලාවට පළකරනු ලැබිණි.

දියුණු කරන ලද පාලනය, කළමනාකරණය හා පරිපාටි - තොරතුරු තාක්ෂණ භාවිතය

කාර්යසාධන කාර්යක්ෂමතාව වර්ධනය කිරීම උදෙසා ජාතික විද්‍යා පදනමෙහි සියලු ප්‍රධාන ක්‍රියාකාරකම් ඒකාබද්ධ කිරීම පිණිස පණගන්වන ලද මාර්ගගත පද්ධතිය මගින් දක්වන ලද්දේ ඉතා මඳ ප්‍රගතියකි. වසර උදෙසා තීරණය කරන ලද ඉලක්කයන් ජාතික විද්‍යා පදනමෙන් බැහැර හේතු නිසා ළඟාකරගත නොහැකි විය. අන්තර්ජාල සංඛ්‍යාත අන්තරය සහ දේශීය ජාල උත්ශ්‍රේණි ගතකිරීමේ උපකරණයන් යනු තොරතුරු තාක්ෂණ ඒකකය මගින් ඉටුකරන ලද ප්‍රධාන කාර්යයන් වේ. කෙසේ වුව ද වසර පුරාම ජාලයෙහි කාර්ය සාධනය පැවතියේ පහත් මට්ටමක ය. ජාතික විද්‍යා පුස්තකාල හා සම්පත් මධ්‍යස්ථානයෙහි දත්ත පදනම් දෙකම වසර තුළ බිඳවැටුණු අතර තොරතුරු තාක්ෂණ ඒකකය මගින් ඒවා යළි ප්‍රතිශ්ඨාපනය කිරීමට සපයන ලද උපකාරයන් ප්‍රමාණවත් නොවී ය. නවීන පද්ධතීන් හා සමගාමීව තොරතුරු තාක්ෂණ පහසුකම් උත්ශ්‍රේණි ගතකිරීම සහ නිපුණ කාර්ය මණ්ඩලයක් යොදා එය සවිමත් කිරීම වැදගත් වේ.

නිපුණ විද්‍යාත්මක පරිපාලන තාක්ෂණික හා උපකාරක කාර්ය මණ්ඩලය

සංවිධානයක සාර්ථකත්වය පිණිස මානව සම්පත තීරණාත්මක කාර්යභාරයක් ඉටුකරයි. පෙර වසර හා සසඳන කල්හි කාර්යමණ්ඩල පුහුණු තුළ කැපීපෙනෙන ප්‍රගතියක් දක්නට ලැබුණි. පවරන ලද විශේෂිත කාර්යයන් තුළින් යහපත් කාර්යසාධනයක් ලබාගැනීමට හැකිවන සේ දේශීය සහ විදේශීය රැස්වීම්/වැඩමුළු/සම්මන්ත්‍රණයන්ට සහභාගිත්වය හරහා ඉහළ මට්ටමේ ව්‍යාත්තීයභාවයක් ලබාගනු පිණිස තාක්ෂණ කළමනාකාරීත්ව නිපුණතා වැඩිදියුණු කිරීම පිණිස කාර්ය මණ්ඩලයට අවස්ථාවක් සපයන ලදි. ඒ අනුව දේශීය සම්මන්ත්‍රණ 38ක් විදේශීය රැස්වීම්/වැඩමුළු/සම්මන්ත්‍රණ 11ක් වෙනුවෙන් කාර්ය මණ්ඩලය ජාතික විද්‍යා පදනම නියෝජනය කළේ ය. ප්‍රධාන වශයෙන්ම නායකත්වය සහ කණ්ඩායම් හැඟීම ගොඩනගනු පිණිස මාදුරුඔය ශ්‍රී ලංකා හමුදාවේ විශේෂ බලකා පුහුණු පාසලෙහි කාර්ය මණ්ඩලයේ සියලුදෙනා උදෙසා බාහිර වැඩසටහනකට සහභාගි වීමට අවස්ථාව සලසන ලදී.

තත්ත්ව කළමනාකරණ පද්ධතිය

ජාතික විද්‍යා පදනම ආයතනයේ සියලු කාර්යය ප්‍රදේශයන් හරහා එහි පාර්ශ්වකරුවන්ට ස්ථිර ගුණාත්මක සේවාවක් සැපයීම කෙරේ බොහෝ සේ අවධානය යොමු කරන හෙයින් ISO 9002:2008 ගුණත්ව කළමනාකරණ පද්ධති සහතිකය ලබාගැනීමේ අරමුණින් කාර්යයන් දියත් කරන ලදි. මෙහිදී සම්මත මෙහෙයුම් පරිපාටි සංශෝධනය ඇතුළුව ලේඛනගත කාර්යයන් සම්පූර්ණ කරන ලද අතර ලේඛනයන්හි ප්‍රධාන ලයිස්තුවට ප්‍රවේශවීම සඳහා විද්‍යුත් මාර්ගයක් ස්ථාපිත කරන ලදි. කෙසේවෙතත් වසර තුළ පෙන්නුම් කරන ලද්දේ ඉතා අඩු ප්‍රගතියකි. මීට හේතුව ගුණත්ව කළමනාකරණ පද්ධතියෙහි වගකීම දරනා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැතිවීම සහ අනෙකුත් වැදගත් කාර්යයන්ට ප්‍රමුඛතාව දීමයි.

තුලිත ලකුණු කාඩ්පත

සමස්තයක් වශයෙන් අරමුණු සාධනය කිරීමත් එමගින් සිය අපේක්ෂා ඉටුවන සේ ජාතික විද්‍යා පදනමේ පාර්ශ්වකරුවන් උදෙසා ගුණාත්මක සේවාවක් සපයමින් සෑම අංශයක් සඳහාම ප්‍රමිතීන් සහ වාර්ෂික ඉලක්ක හඳුනාගැනීම සංවර්ධනය සහ ස්ථාපිත කිරීම මෙමගින් සිදු කෙරේ. එසේම ඒ වනාහි පුද්ගල සහ සංවිධානමය කාර්ය සාධනය මැන බැලිය හැකි උපකරණයකි. ප්‍රධාන කාර්ය සාධන දර්ශකයන් නිර්වචනය කරන ලද අතර පාර්භෝගිකයා අභ්‍යන්තර ක්‍රියාවලීන්, සේවකයන් සහ මූල්‍ය පාර්ශ්වයන් කෙරේ කේන්ද්‍රීය අවධානය යොමු කරමින් පුද්ගල සහ සංවිධාන මට්ටමින් ප්‍රගතියට මනින ලදි.

සීමා සහ අභියෝග

සංවිධානයක සේවාවන්හි කාර්ය සාධනය බොහේ දුරට තීරණය වන්නේ කාර්ය මණ්ඩලයෙහි ශක්තිය සහ ප්‍රමාණවත් අරමුදල් තිබීම යන සාධක මත ය. වසර තුළ අත්දකින ලද ඉහළ කාර්ය මණ්ඩල පිරිවැටුම යනු ජාතික විද්‍යා පදනම විසින් මුහුණදෙන ලද ප්‍රධාන අභියෝගයකි. වසර උදෙසා වෙන්කරන ලද සම්පූර්ණ අරමුදල් ප්‍රමාණය නොලැබීමත් භාණ්ඩාගාරය විසින් අරමුදල් මුදාහැරීමේ දී අත්විඳින ලද අඛණ්ඩ ප්‍රමාදයන් වසරේ ඉලක්ක සපුරා ගැනීම උදෙසා වන ප්‍රයත්නයට අයහපත් ලෙස බලපෑ අනෙකුත් ප්‍රධාන සීමාකාරී සාධකයන් වේ. ව්‍යාපෘතීන් සඳහා නියම වේලාවට අරමුදල් බෙදාහැරීමේ නොහැකියාව සැලසුම්ගත ඉලක්කයන් කරා ළඟාවීම කෙරෙහි අයහපත් ලෙස බලපෑ අතර ඒ තත්ත්වය පර්යේෂණ ප්‍රජාවන් අතරෙහි ජාතික විද්‍යා පදනමේ ප්‍රතිරූපයට බරපතළ ලෙස බලපෑවේ ය. ප්‍රමාණවත් නොවන තොරතුරු තාක්ෂණ පහසුකම් සහ ප්‍රමාණවත් තොරතුරු තාක්ෂණ උපකාරයන් සඳහා වන පරිගණක සර්වරයන්ට අවශ්‍ය වන්නා වූ බැක්-අප් පද්ධතියක් නොමැතිවීම සැලසුම් කළ අයුරින් අරමුණු කරා ළඟාවීමට බාධා පැමිණවී ය.

සුනේත්‍රා පෙරේරා
වැඩබලන අධ්‍යක්ෂ ජනරාල්
විද්‍යාවේදී (ජීව විද්‍යා) කොළඹ සරසවිය, විද්‍යාපති (ඇබර්ඩීන්)

පටුන

සමස්ත විග්‍රහය, සුරකිනු ලබන සාරධර්ම, දැක්ම හා මෙහෙවර, පවරන ලද කාර්ය 1
මුඛ්‍ය දර්ශණය, ක්‍රමෝපායික අභිමතාර්ථ 2
ජාතික විද්‍යා පදනම් කළමනාකරණ මණ්ඩලය 3
සංවිධාන ව්‍යුහය 4
ජාතික විද්‍යා පදනම් කමිටු 5

****

2014 විශේෂ අවස්ථා 7
පර්යේෂණ, සංවර්ධන සහ නවෝත්පාදනය (RD&I) 11
තාක්ෂණ පැවරීම 20
විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති පර්යේෂණ සහ ක්‍රමෝපාය සකස් කිරීම 25
විද්‍යා අධ්‍යාපනය සහ ප්‍රචලිත කිරීම 33
විද්‍යා සහ තාක්ෂණ යටිතල ව්‍යුහය, හැකියවන් සහ හවුල් සබඳතා ගොඩනැගීම 43
දැනුම නිර්මාණය කිරීම, රැස්කිරීම, සකස්කිරීම සහ බෙදාගැනීම 49
ස්වභාවික සම්පත් තිරසර පරිභෝජනය 59
ජාතික විද්‍යා පදනමෙහි භෞතික සහ මානව සම්පත් හා ක්‍රියාවලි ප්‍රශස්තකරණය කිරීම 61

****

මූල්‍ය ප්‍රකාශන

2014 කාර්ය සාධනය පිළිබඳ ගිණුම් නිලධාරියාගේ නිරීක්ෂණ 68
2014 දෙසැම්බර් 31 වන විට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 70
මුදල් සංචරණ ප්‍රකාශය 72
ගිණුම් පිළිබඳ සටහන් 73

2014 විගණන වාර්තාව

විගණකාධිපතිවරයාගේ වාර්තාව 81
විගණකාධිපතිවරයාගේ වාර්තාව පිළිබඳ ජාතික විද්‍යා පදනමේ අදහස් 91

****

ඇමුණුම්

ඇමුණුම 1 - 2014 වසරේ සම්පූර්ණ කරන ලද පර්යේෂණ ප්‍රදානයන් 98
ඇමුණුම 2 - විද්‍යාත්මක ජයග්‍රහණයන් සඳහා සම්මාන භඔඍඡ - ආහාර ආරක්ෂාව 100
31-12-2014 දිනට ක්‍රියාත්මක ප්‍රදාන
ඇමුණුම 3 - පර්යේෂණ උපකරණ ප්‍රදාන - 2014 101
ඇමුණුම 4 - පර්යේෂණ ප්‍රදාන ක්‍රමයේ සාරාංශය - 2014 102
ඇමුණුම 5 - ජාතික විද්‍යා පදනමේ පර්යේෂණ සම්මාන 103
ඇමුණුම 6 - SUSRED සම්මාන 2014 105
ඇමුණුම 7 - ප්‍රදානය කළ සංචාර ප්‍රදාන 106
ඇමුණුම 8 - පිරිනැමූ OSTP ප්‍රධාන 112
ඇමුණුම 9 - අනුග්‍රාහකත්ව, විද්‍යාත්මක රැස්වීම් හා පුහුණු වැඩසටහන් 2014 114
ඇමුණුම 10 - වසර 2013 තුළ ජාතික විද්‍යා පදනම් කාර්යමණ්ඩලයට සපයන ලද 117
දේශීය පුහුණුවීම්
ඇමුණුම 11 - විදේශ පුහුණු වැඩසටහන් 120
ඇමුණුම 12 - ජාතික විද්‍යා පදනම කාර්ය මණ්ඩලය සහභාගිත්වය 121
සම්මන්ත්‍රණ/රැස්වීම්/දේශන (දේශීය සහ විදේශීය) -2014
ඇමුණුම 13 - ප්‍රධාන කාර්ය මණ්ඩලය - 2014 122

****

සමස්ත විග්‍රහය

ශ්‍රී ලංකා ස්වාභාවික සම්පත්, බලශක්ති, සහ විද්‍යා අධිකාරියෙහි (NARESA) අනුප්‍රාප්තිකයා ලෙස 1994 අංක 11 දරණ විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පණත මගින් 1998 වර්ෂයේදී ජාතික විද්‍යා පදනම (NSF) ස්ථාපිත කරන ලදී. 1968 දී ස්ථාපිත කරන ලද ජාතික විද්‍යා සභාවෙහි (NSC) අනුප්‍රාප්තිකයා ලෙස 1981 වසරේ දී ශ්‍රී ලංකා ස්වාභාවික සම්පත්, බලශක්ති සහ විද්‍යා අධිකාරිය ස්ථාපිත කරන ලදී. 2008 වසරේදී ජාතික විද්‍යා පදනම ශ්‍රී ලංකාවේ විද්‍යා සහ තාක්ෂණ ක්ෂේත්‍රයට ඉටු කරන ලද 40 වසරක අමිල මෙහෙවර සැමරීය.

සුරකිනු ලබන සාරධර්ම

විද්‍යාවේ සාර්විකතාවය සහ දැනුම පරිශීලනයේ නිදහස යන මූලධර්ම ද්විත්වය අනුමත කරනා අතරම තනි පුද්ගලයන් ලෙස අනෙක් විද්‍යාඥයන් සමග සන්නිවේදනය පවත්වා ගැනීමට, විද්‍යාත්මක කුසලතාව හැරුණ කොට භෞමිකව කෙරෙනා වෙනස් සැලකීම් නොසලකා ගෝලීයව තම විද්‍යාත්මක කටයුතු වැඩිදියුණු කිරීම පිණිස විද්‍යාඥයන් සතු ස්වාධීනත්වය සුරැකීමට සහ පවත්වා ගැනීමට ජාතික විද්‍යා පදනම කැපවී සිටින අතරම තවදුරටත් විද්‍යාඥයන්ගේ හිමිකම් සහ වගකීම් සම්බන්ධයෙන් තම අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී ජාතික විද්‍යා පදනම වයස, ජනවාර්ගික සම්භවය, ස්ත්‍රී පුරුෂභාවය, භාෂාව, ශාරීරික දුබලතා, දේශපාලන ආස්ථානයන් සහ ආගම මත පදනම් වන කවරාකාරයේ වෙනස් කොට සැලකීමකට වුව එරෙහි වෙයි.

දැක්ම

ශ්‍රී ලංකාවේ ආර්ථික සහ සමාජ සෞභාග්‍යය උදෙසා විද්‍යාව තාක්ෂණය සහ නවෝත්පාදනයන් ප්‍රවර්ධනය කිරීමෙහිලා ජාතියේ ප්‍රමුඛතම ගාමක බලවේගය බවට පත්වීම.

මෙහෙවර

පාරදෘෂ්‍යභාවය, වගකිව යුතු බව, සාධාරණත්වය, සමානාත්මතාවය සහ තිරසරබවෙහි මූලධර්මයන් සහතික කරමින් සහ ආයතනයෙහි කාරය මණ්ඩලය සුරක්ෂිත කරමින්,

- ඵලදායක සහ කාර්යක්ෂම ලෙස දැනුම්වත් සමාජයක් සහ ආර්ථිකයක් ගොඩනැගීමට සහ
- අප රටෙහි ජනතාවගේ දිවි මගෙහි ගුණාත්මකභාවය සහ ජීවන මට්ටම ඉහල නැංවීම පිණිස දායක වීමට

මූල්‍යාධාර සැපයීම, දැනුම් උත්පාදනය, ශක්‍යතා වර්ධනය, හවුල් සබඳතා ගොඩ නැංවීම, තොරතුරු ව්‍යාප්ත කිරීම, සහ විද්‍යාව ප්‍රචලිත කිරීම, ඔස්සේ පර්යේෂණ සංවර්ධන සහ නවෝත්පාදනයන් මෙන්ම තාක්ෂණය ව්‍යාප්ත කිරීම සඳහා මූලාරම්භය සැපයීම සහ සහය වීම

පවරන ලද කාර්යභාරය

1994 අංක 11 දරණ විද්‍යා සහ තාක්ෂණ සංවර්ධන පණත මගින් විශේෂිත කොට දක්වා ඇති පහත සඳහන් කාර්යයන් සඳහා ජාතික විද්‍යා පදනමට බලය පැවරී තිබේ.

අ)
- සමාජ විද්‍යා පර්යේෂණයන් සහ විද්‍යා අධ්‍යාපන වැඩ සටහන් ඇතුළුව විද්‍යාත්මක පර්යේෂණ විභව්‍යතාවන් ශක්තිමත් කිරීම
- ශ්‍රී ලංකාවෙහි ස්වාභාවික සම්පත් සංවර්ධනය කිරීම
- ශ්‍රී ලංකාවේ ජනතාවගේ සුභසාධනය ප්‍රවර්ධනය
- විද්‍යා සහ තාක්ෂණ ක්ෂේත්‍රයේ පර්යේෂකයන් පුහුණු කිරීම

පිලිබඳ අදහස පෙරදැරිව විශ්ව විද්‍යාල, විද්‍යා සහ තාක්ෂණ ආයතන, සහ විද්‍යාඥයන් විසින් සිදු කරනු ලබන මූලික සහ ව්‍යවහාරික විද්‍යාත්මක පර්යේෂණ සඳහා මූලාරම්භය සැපයීම, පහසුකම් සැපයීම සහ උපකාරී වීම.

ආ) ශ්‍රී ලංකාවේ සිටින සහ විදෙස්ගත විද්‍යාඥයන් අතර විද්‍යාත්මක තොරතුරු හුවමරුව සඳහා උපකාරී වීම.

ඇ) පිළිගත් විද්‍යා සහ තාක්ෂණ ආයතනයන්හී සිදු කරනු ලබන විද්‍යාත්මක අධ්‍යයන සහ විද්‍යාත්මක කටයුතු සඳහා ශිෂ්‍යත්ව සහ අධි ශිෂ්‍යත්ව පිරිනැමීම.

ඈ) විද්‍යාත්මක සහ තාක්ෂණික පුද්ගලයන් පිළිබඳව තත්කාලීන නාම ලේඛණයක් පවත්වා ගැනීම, සහ වර්තමානයේ තිබෙන ප්‍රමාණය සහ පක්ෂේපිත අවශ්‍යතා සඳහා වන ශ්‍රී ලංකාවේ විද්‍යාත්මක සහ තාක්ෂණික සම්පත් පිළිබඳව දත්ත රැස් කිරීම, විද්‍යා, තාක්ෂණ මෙන්ම අනෙකුත් ක්ෂේත්‍රවල ප්‍රතිපත්ති සම්පාදනයේ ලා අවශ්‍ය කෙරෙන තොරතුරු සම්පාදනය කරන්නා වූ මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කිරීම.

ඉ) මූල්‍යාධාර සැපයීම සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් මහජනයා අතර විද්‍යාව ප්‍රචලිත කිරීම.

මුඛ්‍ය දර්ශණය

ජාතික විද්‍යා පදනම මූලධර්මයන් දෙකකින් බැඳේ.

විද්‍යා සරසවිය

තනි පුද්ගලයන් ලෙස අනෙක් විද්‍යාඥයන් සමග සන්නිවේදනය පවත්වා ගැනීමට, විද්‍යාත්මක කුසලතාව හැරුණ කොට භෞමිකව කෙරෙනා වෙනස් සැලකීම් නොසලකා ගෝලීයව තම විද්‍යාත්මක කටයුතු වැඩිදියුණු කිරීම පිණිස විද්‍යාඥයන් සතු ස්වාධීනත්වය සුරැකීමට සහ පවත්වා ගැනීමට ජාතික විද්‍යා පදනම කැපවී සිටින අතරම තවදුරටත් විද්‍යාඥයන්ගේ හිමිකම් සහ වගකීම් සම්බන්ධයෙන් තම අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී ජාතික විද්‍යා පදනම වයස, ජනවාර්ගික සම්භවය, ස්ත්‍රී පුරුෂභාවය, භාෂාව, ශාරීරික දුබලතා, දේශපාලන ආස්ථානයන් සහ ආගම මත පදනම් වන කවරාකාරයේ වෙනස් කොට සැලකීමකට වුව එරෙහි වෙයි. ජාතික විද්‍යා පදනම මෙකී මූලධර්මය භාවිතාවේ යෙදවීම චේතනාන්විතව හෝ අන්‍යාකාරයකින් වලක්වන ප්‍රකාශ හෝ ක්‍රියාවන් මගින් ස්වකීය ක්‍රියාකාරකම් අවුල් කිරීම නොඉවසයි.

විද්‍යා අන්වේෂණය සඳහා නිදහස

පිළිගත් විද්‍යාත්මක ක්‍රියාවලීන්ට අනුව සිදු කෙරෙන්නේ නම් සහ වගකීම උසුලනු ලබන්නේ නම් ජාතික විද්‍යා පදනම නිදහසේ විද්‍යාව අන්වේෂනය කිරීම සඳහා විද්‍යාඥයන්ට ඇති අයිතිය පිළිගෙන සුරකියි. සමස්තයක් ලෙස සමාජය උදෙසා විද්‍යාව අවභාවිතාවේ යෙදවීම අහෝසි කිරීමට සහ විද්‍යාවේ වාසි උපරිම කිරීමට සාමූහික වගකීමක් සහිත වීමට සහ සිය කර්තව්‍යයන් අවංකව, ඒකාග්‍රතාවයෙන් යුක්තව, විවෘත බවකින් සහ ගෞරවණීය ලෙස සිදු කිරීමට වෙන් වෙන්ව විද්‍යාඥයන් හට වගකීමක් ඇතැයි ජාතික විද්‍යා පදනම පිළිගනියි.

ක්‍රමෝපායික අභිමතාර්ථ

මේ අනුව ජාතික විද්‍යා පදනමට පැවරුණ බලය මත පදනමේ බලය පැවරුමෙහි සඳහන් ප්‍රධාන අංශ පහක් ආවරනය කරනුවස් ඉලක්ක පහක් නිර්මානය කර ඇති අතර අප රටේ ප්‍රමුඛතම විද්‍යා සහ තාක්ෂණ ආයතනය ලෙස ක්‍රියාත්මක වීමට සහ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ 1994 අංක 11 දරණ පණත මගින් පවරනු ලැබ ඇති ආකාරයට ආයතනයෙහි රාජකාරි කටයුතු සහ කාර්යයන්හී නියැලීමට හැකිවන අයුරින් සය වැනි ඉලක්කයක්ද පිහිටුවා ඇත.

අභිමතාර්ථය 1 : පර්යේෂණ සංවර්ධන සහ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම මෙන්ම විද්‍යා සහ තාක්ෂණ හැකියාවන් ගොඩනැගීමේ ප්‍රමුඛතම ආයතනය බවට පත් කිරීම සහ අප රටේ තිරසර සංවර්ධනය සඳහා ස්වාභාවික සම්පත් සංරක්ෂණය සහ පරිභෝජනය ප්‍රවර්ධනය සඳහා හවුල්කරුවකු වීම.

අභිමතාර්ථය 2 : තාක්ෂණ සංවර්ධනය සහ ව්‍යාප්තියේ නියමුවා බවට පත්වීම සහ පර්යේෂණ සංවර්ධන සහ නවෝත්පාදන වාණිජකරනය කිරීමේ ප්‍රවීණ උත්ප්‍රේරකයකු ලෙස ක්‍රියා කිරීම.

අභිමතාර්ථය 3 : දත්ත එක්රැස් කිරීම, විශ්ලේශනය කිරීම, විග්‍රහ කිරීම, විවරණය කිරීම, ගබඩා කිරීම, ව්‍යාප්ත කිරීම, සහ විද්‍යා තාක්ෂණ සහ නවෝත්පාදන තොරතුරු සඳහා ප්‍රවේශයක් සැකසීම.

අභිමතාර්ථය 4 : මහජනතාව අතර විද්‍යාව, තාක්ෂණ සහ නවෝත්පාදන ප්‍රචලිත කිරීමේ සහ විද්‍යා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමේ නියමුවා බවට පත් වීම.

අභිමතාර්ථය 5 : විද්‍යාව, තාක්ෂණ සහ නවෝත්පාදන ක්ෂේත්‍රයේ නියැලෙන්නන්ට ජාත්‍යන්තර සබඳතා ගොඩනගා ගැනීමට ප්‍රධාන ප්‍රවේශය බවට පත් වීම.

අභිමතාර්ථය 6 : අභිවර්ධනය කරන ලද යහ පාලනය, කළමණාකරනය, සහ අධිෂ්ඨාන ප්‍රතිබද්ධ විද්‍යාත්මක, පරිපාලනමය, සහ තාක්ෂණික මෙන්ම උපකාරක කාර්ය මණ්ඩලයක් සහිත පර්යේෂණ, සංවර්ධන සහ නවෝත්පාදන සඳහා මූල්‍යාධාර සපයන නියමු සංවිධානය බවට පත්වීම.

ජාතික විද්‍යා පදනම කළමණාකරන මණ්ඩලයක් විසින් පාලනය කරනු ලබන අතර එය සභාපති, අධ්‍යක්ෂ ජනරාල් සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය, ජාතික අධ්‍යාපන ආයතනය, සහ මුදල් අමාත්‍යාංශය නියෝජනය කරමින් එක් එක් ආයතනය වෙනුවෙන් පත් කරන ලද එක් සාමාජිකයකු සහ ගරු තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තවත් සාමාජිකයන් සිවු දෙනකු ගෙන් සමන්විත වේ.

ජාතික විද්‍යා පදනමේ කළමනාකරණ මණ්ඩලය

මහාචාර්ය ඩබ්.එල්. සුමතිපාල
සභාපති
ජාතික විද්‍යා පදනම
නො. 47/5, මේට්ලන්ඩ් පෙදෙස,
කොළඹ - 07.
chm@nsf.ac.lk

සුනේත්‍රා පෙරේරා මහත්මිය
වැඩබලන අධ්‍යක්ෂ ජනරාල්
ජාතික විද්‍යා පදනම
නො. 47/5, මේට්ලන්ඩ් පෙදෙස,
කොළඹ - 07.
dir@nsf.ac.lk

මහාචාර්ය එල්.එල්. රත්නායක
නො. 23/135, දියවන්නා ගාර්ඩන්ස්,
චන්ද්‍රා සිල්වා මාවත,
නුගේගොඩ.

මහාචාර්ය රංජිත් සේනාරත්න
උප සභාපති
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම
නො. 20, වෝඩ් පෙදෙස, කොළඹ 07.
ransen.ru@gamil.com

මහාචාර්ය කේ.ඒ.සී.ඩී.ඩී. ජයසූරිය
භෞතික විද්‍යා දෙපාර්තමේන්තුව
විද්‍යා පීඨය
කැලණිය විශ්ව විද්‍යාලය.
kdj@kln.ac.lk

මහාචාර්ය ඩී. ජී. හරේන්ද්‍ර ද සිල්වා
නො. 25, එලියස් පෙදෙස
කොළඹ 09.
harendra51@gmail.com

මහාචාර්ය බී.ටී.ඩී.එන්.කේ. ද සිල්වා
සත්ව විද්‍යා දෙපාර්තමේන්තුව
විද්‍යා පීඨය
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, නුගේගොඩ.
nissankakolitha@gmail.com

මහාචාර්ය පී.ආර්.ටී. කුමාරණතුංග
ප්‍රධාන සභාපති
SLAAS, විද්‍යා මන්දිරය,
නො. 120/10, විජේරාම මාවත, කොළඹ 07.
ruchiracum@gmail.com

ආචාර්ය සී. මහේෂ් එදිරිසිංහ
භෞතික විද්‍යා දෙපාර්තමේන්තුව
විද්‍යා පීඨය,
කොළඹ විශ්ව විද්‍යාලය,
කොළඹ 03.
cmedirisinghe@gmail.com

එම්.එෆ්.එස්.පී. ජයවර්ධන
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය,
මහරගම.
sjayawardene@hotmail.com

ජී.එම්.කේ. හෙට්ටිආරච්චි
නියෝජ්‍ය අධ්‍යක්ෂ
සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 09.
manjulap@dfd.treasury.gov.lk

සංවිධාන ව්‍යුහය


සභාපති සහ කළමනාකරණ මණ්ඩලය
අධ්‍යක්ෂ ජනරාල්
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
පර්යේෂණ අංශය
විද්‍යා ප්‍රචලිත කිරීමේ අංශය
විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති පර්යේෂණ අංශය
ජාත්‍යන්තර සබඳතා අංශය
තාක්ෂණ අංශය
ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය
මූල්‍ය අංශය
පරිපාලන අංශය
ජර්නල් ප්‍රකාශන ඒකකය
මුද්‍රණ ඒකකය
තොරතුරු තාක්ෂණ ඒකකය
අභ්‍යන්තර විගණන ඒකකය

ජාතික විද්‍යා පදනමේ ක්‍රියාකාරී කමිටු

ශ්‍රී ලංකාවේ ජාතික විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තිය හා සමගාමීව ගමන් කිරීමට සහ 1994 අංක 11 දරණ විද්‍යා තාක්ෂණ සංවර්ධන පනතෙහි දක්වා ඇති අවශ්‍යතා සපුරාලීම පිණිස ජාතික විද්‍යා පදනම විද්වත් ක්‍රියාකාරී කමිටු ස්ථාපිත කර ඇත. කමිටු සාමාජිකයන් තෝරාගෙන ඇත්තේ අදාළ ක්ෂේත්‍රයන්හි ඔවුන් තුළ වන විශේෂඥතාව පදනම් කරගෙන ය. ඉහත සඳහන් කමිටුව ප්‍රධාන වගකීම වනුයේ ජාතික සංවර්ධන අරමුණු කරා අභිමුඛ වන අතර ශ්‍රී ලංකාවේ ජාතික විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්තිය සමඟ සමගාමී වන බව සහතික කරමින් ජාතික විද්‍යා පදනමට පැවරී ඇති බලය මත පදනම්ව එහි සැලසුම් සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ සංවර්ධනය පිණිස කළමනාකරණ මණ්ඩලයට උපදෙස් සැපයීමයි.

ජාතික විද්‍යා පදනමේ ක්‍රියාකාරී කමිටු:

ජාතික විද්‍යා පදනමේ මූලික විද්‍යා පිළිබඳ ක්‍රියාකාරී කමිටුව
ජාතික විද්‍යා පදනමේ ජෛව තාක්ෂණ සහ ජෛව ආචාරධර්ම පිළිබඳ ක්‍රියාකාරී කමිටුව
ජාතික විද්‍යා පදනමේ කෘෂිකර්ම සහ ආහාර විද්‍යාව පිළිබඳ ක්‍රියාකාරී කමිටුව
ජාතික විද්‍යා පදනමේ සාගර විද්‍යා සහ සමුද්‍ර සම්පත් පිළිබඳ ක්‍රියාකාරී කමිටුව
ජාතික විද්‍යා පදනමේ සෞඛ්‍ය විද්‍යා පිළිබඳ ක්‍රියාකාරී කමිටුව
ජාතික විද්‍යා පදනමේ පරිසර හා ජෛව විවිධත්වය පිළිබඳ ක්‍රියාකාරී කමිටුව
ජාතික විද්‍යා පදනමේ ඉංජිනේරු විද්‍යා ගෘහ නිර්මාණ ශිල්ප සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ක්‍රියාකාරී කමිටුව
ජාතික විද්‍යා පදනමේ යුනෙස්කෝ සහභාගිත්ව වැඩසටහන පිළිබඳ ක්‍රියාකාරී කමිටුව
ජාතික විද්‍යා පදනමේ කාලගුණ විපර්යාස හා ස්වභාවික ව්‍යසන පිළිබඳ මෙහෙයුම් කමිටුව
ජාතික විද්‍යා පදනමේ විද්‍යා ගණිත සහ ඉංජිනේරු අධ්‍යාපනය පිළිබඳ ක්‍රියාකාරී කමිටුව
ජාතික විද්‍යා පදනමේ විද්‍යාව ප්‍රචලිත කිරීම පිළිබඳ ක්‍රියාකාරී කමිටුව
ජාතික විද්‍යා පදනමේ පුස්තකාල සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ ක්‍රියාකාරී කමිටුව
ජාතික විද්‍යා පදනමේ සමාජ විද්‍යාවන් පිළිබඳ ක්‍රියාකාරී කමිටුව
ජාතික විද්‍යා පදනමේ විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති අධ්‍යයනයන් පිළිබඳ ක්‍රියාකාරී කමිටුව
ජාතික විද්‍යා පදනමේ ස්වදේශීය දැනුම පිළිබඳ ක්‍රියාකාරී කමිටුව
ජාතික විද්‍යා පදනමේ මිනිසා සහ ජෛව ගෝලීය වැඩසටහන පිළිබඳ ක්‍රියාකාරී කමිටුව
ජාතික විද්‍යා පදනමේ ජාත්‍යන්තර සන්නිවේදනය පිළිබඳ ක්‍රියාකාරී කමිටුව

පර්යේෂණ උපදේශක මණ්ඩලය

විශේෂ කමිටු:

සංස්කාරක මණ්ඩලය - ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනම් වාර සඟරාව
සංස්කාරක මණ්ඩලය - ශ්‍රී ලංකා සමාජ විද්‍යා වාර සඟරාව
සංස්කාරක මණ්ඩලය - ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් - තත්ත්වයන් ප්‍රවණතා සහ භව්‍යතාවන්

2014 විශේෂ අවස්ථා

- තරගකාරී පර්යේෂණ ප්‍රදාන යෝජනා ක්‍රමය යටතේ රුපියල් මිලියන 76.1 ක් වටිනා නව පර්යේෂණ ප්‍රදානයන් 29 ක් පිරිනමන ලදි. 2014 වසර තුළ අරමුදල් සපයනු ලදුව කෙරීගෙන යන්නා වූ පර්යේෂණයන්හි සංඛ්‍යාව 119ක් වන අතර පසුගිය වසරේ ප්‍රදානයන් පිරිනමන ලද පර්යේෂණ 11ක කටයුතු සම්පූර්ණ කරන ලදි.

- පෘෂ්‍ය නිමවුම් සහිත වසර තුළ තාක්ෂණ ව්‍යාපෘති හයක් සාර්ථකව සම්පූර්ණ කරන ලද අතර එම නිපයුම් වාණිජකරණය සඳහා සූදානම්ව පවතී. තාක්ෂණ සංවර්ධනයට සහාය වනු වස් වසර තුළ නව ප්‍රදානයන් 6ක් පිරිනමන ලදි.

- වසර තුළ දී ශ්‍රී ලංකා විද්‍යා පදනම මගින් අරමුදල් සපයන ලද ව්‍යාපෘති වෙනුවෙන් සේවය කළ පර්යේෂණ සිසුන් 15 දෙනෙක් තම පශ්චාත් උපාධි සම්පූර්ණ කළ අතර ඉන් 5ක් ආචාර්ය උපාධි වේ. ජාතික විද්‍යා පදනමේ අරමුදල් මත කටයුතු කරන තවත් සිසුහු 24 දෙනෙකු හට පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි වීමට උපකාර කරන ලදි.

- පර්යේෂණ ප්‍රදාන යෝජනා ක්‍රමයේ ආරම්භයේ සිටම ජාතික විද්‍යා පදනම මගින් අරමුදල් සපයන ලද පර්යේෂණයන්හි සියලු පර්යේෂණ නිමවුම් සම්බන්ධයෙන් වන පූර්ණ පඨිතයන් හට ප්‍රවේශවිය හැකි පිණිස නව මාර්ගගත තොරතුරු ගබඩාවක් ස්ථාපිත කරන ලදි. එම තොරතුරු ගබඩාව ප්‍රගතියක් අත්කර ගනිමින් ක්‍රියාත්මක වන අතර වර්තමානයේ දී පර්යේෂණ වාර්තා 1066, පශ්චාත් උපාධි නිබන්ධ 304ක් සහ වාර සඟරා ලිපි 294ක් ඉන් ආවරණය කෙරේ.

- රටෙහි පර්යේෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කරනු පිණිස විශ්වවිද්‍යාල සහ පර්යේෂණ ආයතනයන් හට රුපියල් මිලියන 7.29 ක් වටිනා උපකරණ ප්‍රදානයන් 8ක් සිදුකරන ලදි.

- ක්ෂේත්‍රයේ නවතම සංවර්ධනයන් පිළිබඳව දැනුම ලබාගැනීමට සහ ජාත්‍යන්තර සංසදයන්හි තම පර්යේෂණ සොයාගැනීම් පිළිබඳ ඉදිරිපත් කිරීමට විද්‍යාඥයන් සහ තාක්ෂණඥයන්ට විදෙස් සංචාර ප්‍රදානයන් 51ක් පිරිනමන ලදි.

- විදෙස් විශේෂ පුහුණු වැඩසටහන යටතේ රට තුළ පුහුණු පහසුකම් නොපවතින්නා වූ ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විදෙස්හි සුවිශිෂ්ට මධ්‍යස්ථානයන්හි පුහුණුව ලබාගැනීම පිණිස අවස්ථා සපයමින් ශ්‍රී ලංකාවේ විද්‍යාඥයන් 16 දෙනෙකුට අරමුදල් ප්‍රදානය කරන ලදි. මීට ආචාර්ය උපාධි පහකට සහ දර්ශනපති උපාධියක් සඳහා සිසුනට උපකාර සැපයීම ඇතුළත් වේ.

- විද්‍යා හා තාක්ෂණය උදෙසා වන ජාත්‍යන්තර හවුල්කාරිත්ව යෝජනා ක්‍රමය යටතේ විදේශයන්හි සේවය කරනා ඉහළ නිපුණතාවකින් යුත් විද්‍යාඥයින් හා තාක්ෂණඥයින්ගේ සේවය ලබාගැනීම පිණිස ප්‍රදානයන් 3ක් පිරිනමන ලදි.

- 2011 වසරේ දී ජාතික විද්‍යා පදනම මගින් පවත්වන ලද ගෝලීය සංසද සම්මේලනයෙහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රතිජනනීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ මනිපාල් ආයතනය සමඟ සහයෝගයෙන් කොළඹ සරසවියෙහි පැවැත්වෙන stem cell biology ට පිළිබඳ AM.SE වැඩසටහන ආරම්භ කරන ලදි. එහි පළමු ශිෂ්‍ය කණ්ඩායම සිය වැඩසටහන 2015 වසරේ දී සම්පූර්ණ කිරීමට නියමිත ය.

- 2011 වසරේ දී පවත්වන ලද ගෝලීය සංසද සම්මේලනයෙහි ප්‍රතිඵලයක් ලෙස ඉහළ මට්ටමේ ජානයන්ට අදාළ පර්යේෂණ සහ පරීක්ෂාවන් සිදුකරනු පිණිස ක්‍රෙඩෙන්ස් ජෙනොමික්ස් සමාගම ස්ථාපිත කරන ලදි. මෙම සමාගම පැළෑටි සහ සත්ත්ව ජානමය ද්‍රව්‍යයන්හි අනුක්‍රමයන් පිළිබඳ විශ්ලේෂණයන් සඳහා ජෛව තොරතුරු සේවාවක් පිරිනමයි. මේ ආකාරයේ සේවාවක් පිරිනැමීම පිණිස ශ්‍රී ලංකාව තුළ සමාගමක් ස්ථාපිත කරන ලද පළමු අවස්ථාව මෙයයි.

- ප්‍රධාන ගැටලු දෙකක් එනම් තද රතු පැහැ වීදුරු භාවිත කරන විට ඇතිවන ලෙමන් පීල් බලපෑම් සහ කොබෝල්ට් නිල් වීදුරු භාවිත කරන විට ඇතිවන ස්ඵටික හැඩගැස්ම සඳහා ස්ථාවර විසඳුම් සම්පාදනය කරමින්, ශෛල උපකරණ සහ වීදුරු නිපයුම්හි ඇති ගැටලු විසඳනු පිණිස දියත් කරන ලද වර්ණිත වීදුරු සම්බන්ධයෙන් වන පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘතිය සාර්ථකව නිමකරන ලදි.

- සූර්ය බලශක්තිය පිළිබඳ හවුල් පර්යේෂණ සහ සංවර්ධන ආයතනයක් ස්ථාපිත කිරීමට මූලික පියවර ගනු ලැබිණි. ඇමරිකා එක්සත් ජනපදයේ සිවනාදන් විද්‍යාගාරයෙහි සූර්ය කෝෂ මත පදනම් වූ CdTe/CdS සංවර්ධනය පිණිස පේරාදෙණිය සහ යාපන සහ රුහුණු සරසවියන්හි විද්‍යාඥයන් තිදෙනකු පුහුණු කරන ලද අතර ඉන් අනතුරුව රුහුණු සරසවියෙහි මූලික අධ්‍යයන පිළිබඳ ජාතික ආයතනය මගින් වැඩමුළු දෙකක් පවත්වන ලදි.

- විද්‍යා උපුටන දර්ශකයෙහි තොම්සන් රොයිටර්ස් ආයතනය විසින් උපුටා දක්වනු ලබන එකම ශ්‍රී ලාංකීය වාර සඟරාව වන ජාතික විද්‍යා පදනමේ වාර සඟරාවෙහි කලාප 4ක් නිසි කලට පළකරන ලදි. වාර සඟරාවන්හි

මාර්ගගත ප්‍රකාශයට පත් කිරීම මගින් එහි අන්තර්ගතයන්ට දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් ඉහළ ව්‍යාප්තියක් හිමිවිණි.

- විද්‍යා හා තාක්ෂණ අංශයෙහි අනෙකුත් අදාළ තොරතුරු සහ දේශීය විද්‍යාඥයන් හා තාක්ෂණඥයන් පිළිබඳ තොරතුරු සපයන්නා වූ පරිගණක ගත විද්‍යා තාක්ෂණ කළමනාකරණ තොරතුරු පද්ධතිය නිතිපතා යාවත්කාලීන කරන ලද අතර දෙසැම්බර් මස වන විට දත්ත පදනම මගින් පුද්ගලයන් 5324ක ගේ තොරතුරු වාර්තා කර තිබිණි.

- පාසල් සිසුන් සහ පාර්ශ්වකරුවන් 1500කට වැඩි පිරිසකගේ සහභාගිත්වය සහිතව මානව වර්ගයාගේ යහපත උදෙසා අභ්‍යාවකාශ තාක්ෂණය යන තේමාව යටතේ නොවැම්බර් 10 දින ජාතික විද්‍යා පදනම මගින් සංවිධානය කරනු ලබන විශාලතම වාර්ෂික වැඩසටහන වන ලෝක විද්‍යා දින පාසල් වැඩසටහන පවත්වන ලදි. මෙම ලෝක විද්‍යා දින වැඩසටහනෙහි ප්‍රධාන අරමුණ වනුයේ විද්‍යාත්මක සාක්ෂරතාවෙන් යුත් සමාජයක් සංවර්ධනය කරනු පිණිස පාසල් ප්‍රජාව තුළ විද්‍යා සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම වේ. අමෙරිකා එක්සත් ජනපදයෙහි නාසා ආයතනයේ සේවය කරන ප්‍රවීණ ශ්‍රී ලාංකික විද්‍යාඥ ආචාර්ය සරත් ගුණපාල ප්‍රධාන දේශකයා ලෙස වැඩසටහනට සහභාගි විය. ගණිත සහ ජීවවිද්‍යා ධාරාවන්ගෙන් අපොස උ.පෙළ විභාගයේ දී විශිෂ්ට දස්කම් දක්වූ සිසුන් උදෙසා ප්‍රථම වතාවට විද්‍යාවේ තුරුණු නායකයෝ මැයෙන් නව වැඩසටහනක් හඳුන්වා දෙන ලදි. මෙහි අරමුණ වූයේ සිසුන් තුළ වන නිර්මාණශීලිත්වය, තාර්කික චින්තනය, සහජ දක්ෂතා සහ මෘදු කුසලතා තීව්‍ර කිරීමත් ඔවුනට විද්‍යාවෙහි කේන්ද්‍රීය කලාපයන් පිළිබඳ පුළුල් දැනුමක් ලබාදීමත් ය. මෙහි පළමු කණ්ඩායමට සිසුන් 23 දෙනකු ඇතුළත් වූ අතර සමස්ත වැඩසටහන සිවු මසකට වැඩි කාලයක් පුරා පැවතුණු වැඩමුළු, දේශන, ප්‍රායෝගික පාඩම් සහ ක්ෂේත්‍ර චාරිකාවන්ගෙන් සමන්විත විය.

- 2014 වසර තුළ දී ප්‍රසිද්ධ දේශන මාලාවක් අලුතින් හඳුන්වා දෙන ලද අතර එහි අරමුණ වූයේ රට තුළ වර්තමානයේ පවත්නා වැදගත් ගැටලු පිළිබඳ සංකථනයක් සඳහා විද්‍යාත්මක ප්‍රජාව මහජනයාට වේදිකාවක් නිර්මාණය කිරීම සහ නව පර්යේෂණ සොයාගැනීම පිළිබඳ මහජනයාට දැනුවත් භාවයක් ලබාදීමත් ය. තීරණ ගැනීමේ ක්‍රියාවලිය කරා යොමු වූ අනාගත ප්‍රයත්නයන් උදෙසා වන අදහස් හුවමාරුව සඳහා මේ වැඩසටහන මගින් වේදිකාවක් ද සපයනු ලැබිණි. මෙකී වැඩසටහන යටතේ දේශන තුනක් පැවැත්විණි.

- මිහිමඬල රූපවාහිනී වැඩසටහන් මාලාවේ දෙවන අදියර යටතේ සෞඛ්‍ය සහ ජීවන රටා, රොබෝ තාක්ෂණය සහ එහි අනාගතය, කාලගුණ විපර්යාසයන් හමුවේ ප්‍රකෘති තත්ත්වයට පත්වීම, විද්‍යාවේ දියුණුව උදෙසා ජෛව නිෂ්පාදන සහ මුඛ සෞඛ්‍ය යනාදී වශයෙන් වර්තමානයෙහි අවධානයට ලක්ව ඇති මාතෘකා 5ක් පිළිබඳ වීඩියෝ වැඩසටහන් 5ක් සිංහල දෙමළ සහ ඉංග්‍රීසි බසින් නිපදවන ලදි. මෙම වීඩියෝ වැඩසටහන් පුළුල් ප්‍රජාවක් කරා සමීප කරවීමට ප්‍රජා තොරතුරු සන්නිවේදනය උදෙසා භාවිත කිරීමට අපේක්ෂිත ය.

- දිස්ත්‍රික්ක හයක් ආවරණය කරමින් වැඩමුළු 10න් සමන්විත ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණය පිළිබඳ යුනෙස්කෝ වැඩසටහන සාර්ථකව සම්පූර්ණ කෙරිණි. මෙහි අරමුණ වූයේ ජල සංරක්ෂණය සහ ඒකාබද්ධ සම්පත් කළමනාකරණය පිළිබඳව ගොවි ප්‍රජාවන් තුළ දැනුවත්භාවයක් ඇතිකිරීමයි. තේමා මූලික පර්යේෂණ වැඩසටහනෙහි ජල සුරක්ෂිතතාව යන තේමාවට අදාළව මෙම වැඩසටහන මගින් කැපීපෙනෙනා දායකත්වයක් සපයන ලදි. රටෙහි ආයතනය එකොළහක දේශීය මූලයන් සහිත විද්වත් සාහිත්‍යය ආවරණය කරමින් ජාතික අංකිතකරණ ව්‍යාපෘතියෙහි අදියර (II) ආරම්භ කරන ලද අතර ව්‍යාපෘතියෙන් 75%ක ප්‍රමාණයක් සම්පූර්ණ කර ඇත. අධ්‍යයන සහ පර්යේෂණ ආයතනයන් අතර ආයතනික තොරතුරු ගබඩාවන්හි මාර්ගගත ජාලය අමතර නව තොරතුරු දත්ත ගබඩා හයක් සමඟින් තවදුරටත් පුළුල් කරන ලදි.

- වර්ෂය තුළ දී ශ්‍රී ලංකා මාර්ගගත වාර සඟරා වේදිකාව සමඟින් නව වාර සඟරා 4ක් සම්බන්ධ වූ අතර ඒ අනුව ශ්‍රී ලංකා මාර්ගගත වාර සඟරා මගින් පළකරනු ලබනා වාර සඟරා සංඛ්‍යාව 59ක් ලෙස වාර්තා විණි. මෙම වාර සඟරාවන්හි අන්තර්ගතයන් පරිශීලනය කරන්නන්ගේ සංඛ්‍යාව කැපීපෙනෙනා ලෙස වර්ධනය වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ලෝකයේ රටවල් 210 ක ඉහළ පරිශීලන සංඛ්‍යාවන් හිමිකර ගැනුණි.

- පර්යේෂණයන්හි ප්‍රතිඵල විවෘත ප්‍රවේශයක් සහිතව පළකිරීම ප්‍රවර්ධනය කිරීම පිණිස විවෘත ප්‍රවේශ ප්‍රතිපත්ති ආකෘතීන් දෙකක් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිසමේ සහයෝගයෙන් අරමුදල් සම්පාදනය කරන සංවිධාන සහ පර්යේෂණ ආයතන/සරසවි හරහා භාවිත කිරීමට ඉඩ සලසනු පිණිස සම්පාදනය කරනු ලැබිණි. පොදු අරමුදල් යොදවා සිදුකරනු ලබනා ශ්‍රී ලාංකික පර්යේෂණයන්හි ප්‍රතිඵල පුළුල්ව ව්‍යාප්ත කිරීම, ඒවාට වැඩි පිළිගැනීමක් ලබාදීම සහ වැඩි බලපෑමක් ඇතිකිරීම යන කරුණු ප්‍රවර්ධනය පිණිස මෙම උපාය මාර්ගය මගින් ඉඩ සැලසෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- රටෙහි ජාතික විද්‍යා මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම උදෙසා මූලික පියවර ගනු ලැබිණි. තේමා දොළහක් මේ යටතේ හඳුනාගනු ලැබූ අතර ඒ පිළිබඳ වේදිකාවන් සංවර්ධනය කෙරේ. තවද මෙකී එක් එක් තේමාව යටතේ ප්‍රදර්ශනය කළ යුතු දෑ හඳුනාගැනීමට සහ නිර්මාණය කිරීමට සාමාජිකයන් පත්කරනු ලැබිණි.

පර්යේෂණ සංවර්ධන සහ නවෝත්පාදන

ජාතික විද්‍යා පදනමේ තරගකාරී පර්යේෂණ ප්‍රදාන යෝජනා ක්‍රමය

රට තුළ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ ජාතික වැදගත්කමකින් යුත් තේමාවන්ට ආමන්ත්‍රණය කරනා බහුශික්ෂණමය සහයෝගී පර්යේෂයන් ඇතුළත්ව ශ්‍රී ලංකාව තුළ විශ්වවිද්‍යාල සහ විද්‍යා සහ තාක්ෂණ ආයතනයන් විසින් සිදුකරනු ලබන මූලික සහ ව්‍යවහාරික විද්‍යා පර්යේෂණයන් ආරම්භ කිරීම, ඒවාට පහසුකම් සැපයීම සහ ඒවාට උපකාර කිරීම අරමුණු කරගෙන ජාතික විද්‍යා පදනම ක්‍රියාකාරකම් සිදුකරයි. එසේම එමගින් විද්‍යා හා තාක්ෂණික ආයතනයන්හි විද්‍යාත්මක කාර්යයන් සඳහා ශ්‍රී ලාංකික පශ්චාත් උපාධි සහ පශ්චාත් උපාධි පර්යේෂණයන්ට ශිෂ්‍යත්වය සහ පොදු සහභාගිත්ව ශිෂ්‍යත්වයන් පිරිනමනු ලැබේ.

ජාතික විද්‍යා පදනමේ තරගකාරී පර්යේෂණ ප්‍රදාන යෝජනා ක්‍රමය

පර්යේෂණ අංශය මගින් මෙහෙයවනු ලබන ජාතික විද්‍යා පදනමෙහි තරගකාරී පර්යේෂණ ප්‍රදාන යෝජනා ක්‍රමය විද්‍යාත්මක පර්යේෂණයන් උදෙසා ශ්‍රී ලංකාවෙහි විද්‍යා හා තාක්ෂණ ආයතනයන්හි පවත්නා මූල්‍ය, භෞතික සහ මිනිස් බල සම්පත් සඳහා අතිරේක සහායක් සැපයීම අපේක්ෂා කරයි. තවද එය විද්‍යාඥයින්ගේ ස්වාධීන පුද්ගල සහ බුද්ධිමය ධාරිතාවන් ශක්තිමත් කිරීමට පහසුකම් සපයන අතරම රටෙහි සමාජ ආර්ථික සංවර්ධනය සඳහා යොමු වූ ඉහළ ප්‍රමිතීන්ගෙන් යුත් පර්යේෂණයන් සිදු කිරීමට දිරිගන්වනු ලබයි. විද්‍යා හා තාක්ෂණය සම්බන්ධ සියලු ක්ෂේත්‍රයන්ට අදාළව තරගකාරී පර්යේෂණ ප්‍රදාන පිරිනමනු ලැබේ.

සම්පූර්ණ කරනු ලැබූ ප්‍රදානයන් පිළිබඳ විශේෂිත අවස්ථා

ව්‍යාපෘති නාමය : කොළඹ දිස්ත්‍රික්කය තුළ කාන්තාවන් අතරෙහි පවත්නා පියයුරු පිළිකාවේ අවදානම් සාධක සහ අවධානම් තක්සේරුව **(RG/2011/HS/15)**

විමර්ශකයෝ : ආචාර්ය එන්.කේ. කරුක්ෂි, කේ. අරඹේපොල, ආචාර්ය පී.බී.වී.ආර්. කුමාරි, ප්‍රජා වෛද්‍ය දෙපාර්තමේන්තුව, වෛද්‍ය පීඨය, කොළඹ සරසවිය.

කොළඹ දිස්ත්‍රික්කයෙහි පියයුරු පිළිකා ආශ්‍රිත විභව්‍ය අවධානම් සාධකයන් හඳුනාගැනීමේ අරමුණ සහිතව මෙකී අධ්‍යයනය සිදු කරන ලදි. මෙම අධ්‍යයනය සංවර්ධනය කරන ලද්දේ වලංගු කරන ලද අවධානම් පුරෝකථන මාදිලියකට ය. මෙය ප්‍රමුඛතාව දිය යුතු, පියයුරු පිළිකා වර්ධනය පිළිබඳ අවධානමට මුහුණපා සිටින කාන්තාවන් හඳුනාගැනීම සහ ඔවුන් මැමෝග්‍රැෆි පර්යේෂණය සඳහා නිතිපතා යොමුකිරීම පිණිස අදාළ කරගත හැකි යෝග්‍ය පරීක්ෂණ ක්‍රමවේදයකි. ඉහළ පිරිවැය හේතුවෙන් ශ්‍රී ලංකාවට තවමත් මැමෝග්‍රැෆි පරීක්ෂණ පහසුකම් සැපයීමට නොහැකිව පවතින හෙයින් මෙම අඩු පිරිවැය සහිත අවධානම් පුරෝකථන මාදිලිය කාන්තා සෞඛ්‍ය සායනයන් සහ රෝහල් පරිශ්‍රයන් තුළ වසර 40 ඉක්මවූ කාන්තාවන් උදෙසා භාවිතාවේ යෙදිය හැකි ය.

ව්‍යාපෘති නාමය : Taxonomy and phylogenetic relationships of some selected endemic genera Amomum Roxb., and Alpinia Roxb., of the family Zingiberaceae, **(RG/2007/BT/02)**

විමර්ශකයෝ : මහාචාර්ය ඩී.එම්.ඩී. යකන්දාවල, උද්භිද අධ්‍යයානංශය, ආචාර්ය ප්‍රේමින්ද සමරජීව, අණුක ජීව විද්‍යා අධ්‍යානාංශය, විද්‍යා පීඨය, පේරාදෙණිය සරසවිය.

නූතන ජෛව විවිධත්ව සංරක්ෂණ ප්‍රයත්නයන්හි දී ජීව විශේෂ විවිධත්වය ක්‍රමානුකූලව සුචිකරණය සහ එහි වර්ගීකරණය අනාවරණය මෙන්ම පරිණාමීය සබඳතා නියමු සහ වැදගත් කාර්යභාරයක් ඉටුකරන හෙයින් මෙකී පර්යේෂණය මගින් සර්ම කලාපීය වනාන්තරයන්හි වැදගත් ශාක පවුලක (Zingiveraceae) අවම වශයෙන් අධ්‍යයනයට ලක් කරන ලද Genera Alpenia and Amomum) හි වර්ගීකරණ, පාරිසරික සහ සංරක්ෂණමය ගැටලුවලට ආමන්ත්‍රණය කරන ලදි.

ශ්‍රී ලාංකික Alpenia and Amomumහි වංශ ජනනය සමස්තයක් වශයෙන් genus සහ angiosperms වංශ ජනනයට දායක වනු ඇත. Alpenia and Amomum විශේෂයන් සඳහා නව ස්ථානයන් කිහිපයක් සකසන ලද අතර සංකේතමය නිදර්ශකයන් පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ ජාතික වියළි පැළෑටි එකතුවෙහි තැන්පත් කරන ලදි. නව Amomum විශේෂයක් හඳුනාගනු ලැබිණි.

Alpenia and Amomum යන වර්ගීකරණයන් දෙක සඳහා නවීකරණය ලද ප්‍රවේශයක් නිපදවන ලද අතර එය සමාජිකයන් ක්ෂේත්‍රයන් තුළ අඳුනාගැනීමේ දී උපකාරී වනු ඇත.

ව්‍යාපෘති නාමය : වී වගාව ආශ්‍රිත නයිට්‍රජන් ප්‍රතිෂ්ඨාපන බැක්ටීරියාවන් වෙන් කිරීම සහ නෛසර්ගීකරණය **(RG/2008/BT/01)**

විමර්ශකයෝ : ආචාර්ය ඒ.ඒ.එල්. රත්නතිලක රසායන විද්‍යා අධ්‍යනාංශය, විද්‍යා පීඨය, කැලණිය සරසවිය.

වී යනු ශ්‍රී ලංකාව තුළ මුළු වගාබිම් ප්‍රමාණයෙන් 34%ක් භාවිත කරනු ලබන පුළුල්ව වගාකරනා බෝගයකි. නයිට්‍රජන් පොහොර මත විශාල වශයෙන් රඳාපවත්නා ස්වභාවය, එහි ඉහළ යන පිරිවැය සහ පරිසරයට ඇතිකරනා අහිතකර බලපෑම මෑතකාලීන පර්යේෂණයන් තුළ දී ජීව විද්‍යාත්මක නයිට්‍රජන් කාරකයන් මත පදනම් වන්නා වූ ජෛව පොහොර වැනි විකල්ප ස්වාභාවික නයිට්‍රජන් පොහොර සඳහා වන පර්යේෂණයන් සිදුකිරීම පිළිබඳව අලුතින් උද්‍යෝගයක් ඇතිකර තිබේ.

වී වගාව ආශ්‍රිත නයිට්‍රජන් කාරක බැක්ටීරියාවන් අණුක වර්ගීකරණය කිරීම සහ වෙන්කිරීම පිළිබඳව ශ්‍රී ලංකාව තුළ සිදුකරනු ලබන පළමු අධ්‍යයනය මෙයයි. එහෙයින් මෙම අධ්‍යයනය මගින් එය හටගන්නා ආකාරය, වෙන් කිරීමේ ක්‍රම, නයිට්‍රජන් ප්‍රතිෂ්ඨාපනය මැනීමේ ක්‍රම, අණුක මට්ටමින් බැක්ටීරියාවන්හි නෛසර්ගික ලක්ෂණ පිළිබඳ නව විද්‍යා දැනුමක් රැගෙන විත් තිබේ. නව ක්‍රමවේදයන් සංවර්ධනය කර ඇති අතර පෙර දී ප්‍රකාශයට පත් කරන ලද ක්‍රමවේදයන් විශේෂයෙන්ම දේශීය බැක්ටීරියානු ශාක විග්‍රහයට උපරිම වශයෙන් යොදාගෙන ඇත. එහෙයින් මෙකී අධ්‍යයනයේ දී භාවිත කර ඇති ක්‍රමවේදයන් සහ තාක්ෂණයන් අනාගතයේ සිදුකරනු ලබන ආශ්‍රිත පර්යේෂණයන්ට බෙහෙවින් ප්‍රයෝජනවත් වනු ඇත.

ව්‍යාපෘති නාමය : ශ්‍රී ලංකාවේ පිනේයස් මොනොඩෝන් ගහනයේ ජාන ව්‍යුහය විශ්ලේෂණය **(RG/2010BT02)**

විමර්ශකයෝ : ආචාර්ය ඩී.එච්.එන්. මුණසිංහ සත්ත්ව විද්‍යා අධ්‍යානාංශය, රුහුණු විශ්ව විද්‍යාලය

ශ්‍රී ලංකාවේ පිනේයස් මොනොඩෝන් සත්ත්ව කොට්ඨාශයන් අතර ස්වභාවික/වන ගහනයේ ජාන විචල්‍යතාවන් වටහාගැනීමේ අරමුණින් සහ අනෙකුත් භූගෝලීය වශයෙන් විසිර ඇති ජාන ප්‍රවර්ගයන් අතර ශ්‍රී ලාංකික ඒකගුණ වර්ගයන්ගේ වංශ ප්‍රවේණික තත්ත්වයන් ඇස්තමේන්තු කිරීමේ අරමුණින් මෙම අධ්‍යයනය සිදුකරන ලදි. මෙම අධ්‍යයනයයෙන් අනාවරණය කරන ලද පරිදි නැගෙනහිර සහ බටහිර ගහනයන්හි ඉහළ මට්ටමේ ජාන විචල්‍යතාවක් දක්නට ලැබෙන අතර දකුණු ගහනයන්හි දක්නට ලැබෙනුයේ පහළ මට්ටමේ ජාන විචල්‍යතාවකි. තවද මෙම අධ්‍යයනය විසින් පෙන්නුම් කරනු ලැබූ කරුණක් වූයේ ශ්‍රී ලංකාවේ ගහනයන් ජානමය වශයෙන් බටහිර ඉන්දියානු සමුදුරු ගහනයන්ට වඩා බටහිර පැසිපික් සමුදුරු ගහනයන්ට සමීප සබඳතාවක් පවත්වන බවයි. මෙම අධ්‍යයනයෙන් අනාවරණය කරගනු ලැබූ තොරතුරු පිනේයස් මොනොඩෝන් වගාකිරීමේ වැඩසටහන් උදෙසා මව් සතුන් තෝරාගැනීමේ දී මෙන්ම මෙකී වන සත්ත්ව ගහනයන් සංරක්ෂණය කිරීමේ කළමනාකරණ උපාය මාර්ගයන් ක්‍රියාත්මක කිරීමේ දී බෙහෙවින් ප්‍රයෝජනවත් වනු ඇත.

ව්‍යාපෘති නාමය : රැල්ස්ටෝනියා සොලනාසීරම් මගින් තක්කාලිවලට ඇතිකරනු ලබනා මැලවීයාමේ බැක්ටීරියා භක්ෂක මගින් ආසාදනය පාලනය කිරීම. **(RG/2007/BT/05)**

පරීක්ෂක/පරීක්ෂකයෝ : ආචාර්ය දේවිකා එම්.ඩී. කොස්තා කෘෂිකර්ම පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය.

තක්කාලි, අර්තාපල්, ගම්මිරිස් සහ බටු යනාදී සොලනාසියස් වර්ගයේ බෝගයන් ඇතුළුව ආර්ථික වශයෙන් වැදගත් වන්නා වූ පරාසයකට ගැනෙන බෝග විශේෂයන්හි බැක්ටීරියා ආසාදනයන් හට ශාකවල අඩංගු පාංශු ව්‍යාධිජනකයන්, රැල්ස්ටෝනියා සොලනාසීරම් හේතුකාරක වේ. (ඊ.එෆ්. ස්මිත්) මෙම බැක්ටීරියා මගින් ඇතිකරනා මැලවීමේ රෝග තත්ත්වය තෙත්/සර්ම කලාපික සහ උප සර්මකලාපික කලාපයන්හි සහ ඇතැම් උෂ්ණත්වය ඉහළ මට්ටමක ඇති කලාපයන්හි අස්වැන්න සීමිත කරයි. රෝගකාරකයන්හි ජාන විචල්‍යතාවන්, රෝගකාරකයන් මගින් ඇතිකරනා ජානමය ප්‍රතිවිරෝධයන් මර්ධනය කිරීමේ හැකියාව, ඔරොත්තුදීමේ වර්ධනයෙහි සීමාවල ප්‍රතිඵලයක් ලෙස සඵලදායී බැක්ටීරියා නාශක හිඟය, මෙන්ම රෝගය වර්ධනය කිරීම සඳහා හිතකර තත්ත්වයන් ඇති අවස්ථාවන්හි දී සාපේක්ෂව කෙටි කාලයක් තුළ ඉහළ ගහනයන් කරා රෝග කාරකය ව්‍යාප්ත වීමේ හැකියාව යනාදිය හේතුවෙන් මෙම බැක්ටීරියා ආසාදනය සඵලදායී ලෙස පාලනය කිරීම අභියෝගයක්ව පවතී. එහෙයින් ලොව පුරාම ස්ථාවර බෝග නිපැයුමක් ස්ථාපිත කිරීම පිණිස මෙම බැක්ටීරියා ආසාදනය පාලනය කිරීමේ කළමනාකරණ පද්ධති අවශ්‍ය වේ.

ශාකයන්හි රෝගකාරක බැක්ටීරියා පාලනය කිරීම පිණිස ජෛව පාලන ඒකක වශයෙන් බැක්ටීරියා භක්ෂක භාවිත කිරීම පිණිස වන උනන්දුව වර්ධනය වෙමින් පවතී. මෙම බැක්ටීරියා භක්ෂකයන් යනු විශේෂයෙන්ම බැක්ටීරියාවන්ට හානිකරනා වෛරසයක් වන නමුදු එමගින් සතුන්ට හෝ ශාකයන්ට ඍජු නිශේධාත්මක බලපෑම් ජනිත නොකරයි.

බැක්ටීරියා මගින් ඇතිකරනා රෝග, විශේෂයෙන්ම එළවළු ගොවීන්ට සහ උද්‍යාන බෝග නිෂ්පාදකයන් හට බරපතළ හානි සිදුකරනා රෝගයක් මර්ධනය කිරීම උදෙසා බැක්ටීරියා භක්ෂක භාවිත කිරීමේ විභව්‍යතාව පිළිබඳව ශ්‍රී ලංකාව තුළ කෙරෙනා පළමුවන අධ්‍යයනය මෙයයි.

මෙම පර්යේෂණයෙහි ප්‍රධාන සොයාගැනීම වනුයේ (අ.) තක්කාලි මැලවීමේ රෝගයට හේතුවන්නා වූ ආර්. සොලෙනාසීරම්හි දේශීය කාරකයන් පාලනය කිරීමේලා සඵලදායී වන්නා වූ පාංශුගත දේශීය භක්ෂක සොලකරණය; සියලු බැක්ටීරියා භක්ෂකයන් විශාල වශයෙන් වගාකිරීම සඳහා වන සත්කාරක බැක්ටීරියාවක් ලෙස ප්‍රචණ්ඩ නොවනා ආර්. සොලෙනාසීරම් වර්ගයක් හඳුනා ගැනීම සහ වෙන්කර ගැනීම; බැක්ටීරියා භක්ෂකයන් දිගුකාලීනව ගබඩා කිරීම උදෙසා සඵලදායී ක්‍රමවේදයක් හඳුනාගැනීම. (ඇ.) ක්ෂේත්‍ර තත්ත්වයන් යටතේ මැලවීමේ රෝග තත්ත්වයන්හි වර්ධන අනුපාතය අඩු කිරීම සඳහා බැක්ටීරියා භක්ෂක යෙදීම පිණිස සඵලදායී ක්‍රමවේදයක් හඳුනාගැනීම.

ව්‍යාපෘති නාමය : දූෂණයට ලක් වූ ජලයෙන් නයිට්‍රේට් ඉවත් කිරීම සඳහා විද්‍යුත් රසායන තාක්ෂණවේදයක් සංවර්ධනය කිරීම. **(RG/2011/BS/01)**

පරීක්ෂක/පරීක්ෂකයෝ : ආචාර්ය නදීෂානී නානායක්කාර, ආචාර්ය මෙත්තිකා විතානගේ, ජේ.පී. පද්මසිරි මහතා, මූලික අධ්‍යයන ආයතනය, මහනුවර.

ජීවී සත්ත්වයින් සෞඛ්‍ය හානිකෙරෙන් ආරක්ෂා කරගැනීම සඳහා භූගත ජලය යහපත් මට්ටමක පැවතීම ඉතා තීරණාත්මක වේ. විශාල වශයෙන් කෘෂි රසායනයන් භාවිතය හේතුවෙන් වර්තමානයේ දී භූගත ජලයෙහි අඩංගු නයිට්‍රේට් ප්‍රමාණය ඉහළ ගොස් තිබේ. මෙම නයිට්‍රේට් යනු මෙත්හිමොග්ලොබිනිවීයා රෝගයට හේතුකාරක වන සාධකයක් බව හඳුනාගෙන ඇති අතර නයිට්‍රේට් මගින් දූෂිත වී ඇති පානීය ජලය පිළිකා රෝගකාරක තත්ත්වයන් ඇතිකරයි. විද්‍යුත් රසායනික නයිට්‍රීහරණය යනු මෙහි දී ඇති ආකර්ෂණීය තාක්ෂණවේදයක් වන අතර එය නයිට්‍රීහරණය සඳහා යොදාගත හැකි ය. කෙසේ වෙතත් කාර්යක්ෂම ලෙස නයිට්‍රේට් ඉවත් කිරීමට අදාළ වන්නා වූ සාධකයන් සලකා බලන කල නව විද්‍යුත් ද්‍රව්‍යයන්හි සංවර්ධනය කෙරේ පළකෙරෙනුයේ මඳ අවධානයකි.

මෙම පර්යේෂණයේ දී සෛලයකට ඒකාබද්ධ කරන ලද ප්‍රශස්ත කැතෝඩයක් සහ ප්‍රශස්ත ඇනෝඩයක් භූගත ජලයෙහි නයිට්‍රීහරණය සඳහා දිරිගන්වනසුලු ප්‍රතිඵල පෙන්වා තිබේ. ඒ අනුව නියම භූගත ජල ආදර්ශයන් නයිට්‍රීහරණය සඳහා විද්‍යුත් රසායනික සෛලයක් සාර්ථකව සංවර්ධනය කර පරීක්ෂා කර බලන ලදි. කෙසේවෙතත් මෙය සැබෑ ලෙසම භාවිත කිරීමට පෙර විසල් පරිමාවේ පරීක්ෂණ/අධ්‍යයනයන් සිදුකිරීම අවශ්‍ය වේ. එලෙස භාවිත කළ පසුව මෙම තාක්ෂණවේදය නයිට්‍රේට් මගින් වන දූෂණය සම්බන්ධයෙන් ආකර්ෂණීය විසඳුමක් සපයනු ඇත.

ව්‍යාපෘති නාමය : රබර් වගාබිම්හි අතුලබාගැනීම සඳහා වන විසිතුරු ශාක සහ මල් වගාකිරීම සඳහා සුදුසු වන ප්‍රභේදයන් සහ ජානමය සැකැස්මවල් හඳුනාගැනීම **(RG/2008/AG/02)**

පරීක්ෂක/පරීක්ෂකයෝ : ආචාර්ය එස්.එම්.එම්. ඉක්බාල්, ඩබ්.ඒ.ඩී.ඩී.එස්. වෙත්තසිංහ මයා, ආචාර්ය වී.එච්.එල්. රොඩ්රිගෝ, රබර් පර්යේෂණ ආයතනය, ශ්‍රී ලංකාව

ස්වභාවික රබර් ශ්‍රී ලංකා භූමියෙහි හෙක්ටයාර් 127,500ක් පුරා ව්‍යාප්තව පවතී. (හෙවියා බ්‍රසීලියනිසිස් මුල් ආර්ග්) තවද මෙකී කර්මාන්තයෙන් පන්ලක්ෂයකට අධික ජනතාවක් යැපෙන බව ද ඇස්තමේන්තු ගතකර තිබේ. රබර් ශාකයක ජීවන චක්‍රය දළ වශයෙන් වසර 30ක් පමණ වන අතර ඉන් වසර 5-6 ක් අතර කාලයක් අයත් වන්නේ නොමේරූ අවධියට ය. එම නොමේරූ අවධිය තුළ රබර් වගාකරුවාට වගාවෙන් ආදායමක් නොලැබේ. තවද රබර් අස්වැන්න නෙළීම සීමා වී පවතින්නේ දවසේ උදය කාලයට ය. එහෙයින් රබර් කිරි අස්වනු නෙළන්නන් පොදුවේ විවේක කාලයක් සහිතව දවසින් කොටසක් රැකියා විරහිතව සිටින්නන් සේ සැලකේ. මේ නිසා එම ශ්‍රම කාලය ඵලදායී ලෙස වර්ධනයන් ඇතිකර ගැනීම සඳහා යොදාගත හැකි අතර එමගින් ඔවුන්ගේ ජීවිකා වෘත්තිය ඉහළ නැංවිය හැකි ය.

රබර් වගාව සමඟ ආර්ථික වශයෙන් වැදගත් බෝගයන් අතුරු වගා ලෙස යෙදීම මේ සම්බන්ධයෙන් ඇති ප්‍රායෝගික විකල්පයකි. ශ්‍රී ලංකාවෙහි මල් සහ අතු සඳහා වන විසිතුරු ශාක කර්මාන්තය දේශීය මෙන්ම ජාත්‍යන්තර වෙළෙඳ පොළෙහි ද ඉහළ ප්‍රගතියක් අත්කරගනිමින් පවතී. එහෙයින් වර්තමාන අධ්‍යයනය මගින් අරමුණු කරන ලද්දේ රබර් වගාවන්හි විවිධ වර්ධන අවධීන් තුළ (නොමේරූ සහ මේරූ අවධීන් තුළ) වගාකළ හැකි මල් සහ අතු ලබාගැනීම සඳහා වන විසිතුරු ශාකයන්හි සුදුසු ප්‍රභේදයන් හඳුනාගැනීම කෙරෙහි ය.

මෙහිදී මේරූ සහ නොමේරූ යන වගා දෙකොටසෙහිම ක්ෂේත්‍ර පර්යේෂණ කට්ටල් දෙකක් පවත්වන ලදි. ඒ අනුව නොමේරූ රබර් වගාවන් යටතේ පොලීසියා, ක්‍රෝටන් සහ කේන් පාම් යන විසිතුරු ශාක වර්ග තුනක් ද මේරූ රබර් වගාවන් යටතේ කේන් පාම්, ඩ්‍රැකානියා සහ චයිනීස් ග්‍රාස් යන විසතුරු ශාක තුන ද මිශ්‍ර වගාවන් සහ ඒකීය පද්ධතීන් ලෙස ස්ථාපිත කෙරිණි. තවද මේරූ රබර් වගාබිම්හි සහ කෘතිම ආවරණයන් තුළ ඇන්තූරියන් ද වගාකරන ලදි.

මෙහිදී අතු සඳහා ගන්නා විසිතුරු ශාක සහ ඇන්තූරියම්වලට අදාළ වර්ධන සහ තත්ත්ව පරාමිතීන් තක්සේරු කරන ලදි. ඉන් ලද ප්‍රතිඵලවලට අනුව නොමේරූ රබර් වගාවන් තුළ ඒකීය ප්‍රබේදයක් ලෙස වගාකරනවාට වඩා ක්‍රෝටන් සහ පොලීසියා සමඟ මිශ්‍රව වගාකිරීමේ දී කේන් පාම් ශාකයෙහි වඩා හොඳ වර්ධනයක් දක්නට ලැබේ. තවද මේරූ රබර් වගාවන් තුළ ඒකීය වගාවන් ලෙස කේන් පාම්, ඩ්‍රැකානියා සහ චයිනීස් ග්‍රාස් වගාකිරීම තුළින් වඩා හොඳ වර්ධනයක් පෙන්වා ඇති අතර මිශ්‍ර වගාවන්ට වඩා ආර්ථික ප්‍රතිලාභයන් ද ලැබේ. කෘත්‍රිම ආවරණයන් යටතේ කරන ඇන්තූරියන් වගාව සහ අතු සඳහා විසිතුරු ශාක හා සසඳන විට මේරූ රබර් වගාවන් යටතේ කරනු ලබනා ඇන්තූරියන් වගාවෙන් ඉහළම ශුද්ධ ආර්ථික ප්‍රතිලාභ අත්වේ. තවද රබර් වගාකරුවන් සඳහා මේරූ සහ නොමේරූ රබර් වගාවන් යටතේ වගාකළ හැකි සුදුසු විසිතුරු ශාක පිළිබඳ ප්‍රොටොකෝලයන් පවා සංවර්ධනය කර තිබේ.

සටහන: 2014 වසර තුළ සම්පූර්ණ කරන ලද ප්‍රදානයන් පිළිබඳ විස්තර අංක 01 ඇමුණුමෙහි දැක්වේ.

ජාතික තේමාමූලික පර්යේෂණ වැඩසටහන

ජාතික පර්යේෂණ ප්‍රමුඛතාවන්ට ආමන්ත්‍රණය කරනු පිණිස ජාතික විද්‍යා පදනම මගින් මෙකී නව්‍ය පර්යේෂණ වැඩසටහන ආරම්භ කරන ලදි. ජාතික තේමාමූලාකි පර්යේෂණ වැඩසටහන යටතේ ආරම්භ කළ යුතු ප්‍රමුඛ කලාපයන් ලෙස ඒ අනුව ආහාර සුරක්ෂිතතාව, ජල සුරක්ෂිතතාව කාලගුණ විපර්යාස සහ ස්වභාවික ව්‍යසන සහ බලශක්ති සුරක්ෂිතතාව හඳුනාගන්නා ලදි.

තේමාව : ආහාර සුරක්ෂිතතාව

ජාතියේ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීමේ අරමුණින් සහ පර්යේෂණයන් තුළින් තේමාවට අදාළ ප්‍රධාන ගැටලු ආමන්ත්‍රණය කරනු පිණිස තේමාමූලික පර්යේෂණ වැඩසටහන මත ආහාර සුරක්ෂිතතාව යන්නට මුලපුරන ලදි. ස්වභාවයෙන්ම සහයෝගී වන්නා වූ සහ බහුවිධ ශික්ෂණයන්ගෙන් සමන්විත වන්නා වූ පර්යේෂණ වැඩසටහන් පහක් ඇති අතර එමගින් රටෙහි ආහාර සුරක්ෂිතතාව පිණිස ස්පුර්ශ සහ ප්‍රගතිකාරක බලපෑම් සැපයීමට අපේක්ෂා කෙරේ.

යෝජනාවන් වර්ධනය කිරීමට සහ නිසි ලෙස හැඩගැස්වීමට දීර්ඝ සාකච්ඡා සහ සංශෝධනයන් සිදුකිරීමෙන් පසුව 2012 සහ 2013 වසර තුළ මෙකී වැඩසටහන් පහ යටතේ ව්‍යාපෘති 9ක් පිරිනමන අතර 2014 වසර තුළ ද ඒවා අඛණ්ඩව ක්‍රියාත්මක විණි. සිදුකෙරෙමින් පවත්නා ප්‍රදානයන් පිළිබඳ විස්තර ඇමුණුම් 2හි දැක්වේ. මෙහෙයුම් කමිටුවේ මාර්ගෝපදේශයන් සහිතව පර්යේෂණ අංශය විසින් මෙකී ව්‍යාපෘතීන් ඉතා සියුම් ලෙස අධීක්ෂණය කෙරේ. ප්‍රගතිය අධීක්ෂණය කිරීමේ යාන්ත්‍රණයක් ලෙස පර්යේෂණ කණ්ඩායම් සමඟ නිතිපතා සාකච්ඡා පවත්වන ලදි. අවශ්‍ය අවස්ථාවන්හි දී යෝග්‍ය ඉදිරිපත්කිරීම් සිදු කිරීමට මෙන්ම ප්‍රගතියට බාධා පමුණුවන සීමාකාරී සාධකයන් පෙන්වා දීමට ඔවුන්ට ඇරයුම් කරනු ලැබිණි. ධනාත්මක ප්‍රතිපෝෂණයන් ලබාදීමට සහ සත්‍යාපන කාර්යය සඳහා ව්‍යාපෘති වැඩබිම් වෙත සංචාරයන් සිදුකෙරිණි.

සපයනු ලැබූ ක්‍රියාකාරී සැලසුම් අනුව ව්‍යාපෘතීන් ප්‍රගතිය අත්කරගෙන තිබේ දැයි බලනු පිණිස දෙවන පර්යේෂණ සම්බන්ධීකරණ රැස්වීම පවත්වනු ලැබිණ. ලබාගත් ජයග්‍රහණ මත පදනම්ව ව්‍යාපෘති කාර්යයන් අබණ්ඩව කරගෙන යනු පිණිස ඊළඟ වසර සඳහා අරමුදල් නිර්දේශ කරනු ලැබිණි. පර්යේෂණ සම්බන්ධීකරණ රැස්වීමේ දී ක්‍රියාකාරී සැලසුම් සාකච්ඡාවට බඳුන්කරනු ලැබූ අතර මෙහෙයුම් කමිටුව සහ ව්‍යාපෘති කණ්ඩායම් මගින් ඒවාට එකඟතාව පළකරනු ලැබිණි.

තේමාව : කාලගුණ විපර්යාස සහ ස්වභාවික ව්‍යසන

පහත හෙළීමෙන් සහ ගළපා ගැනීමෙන් කාලගුණ විපර්යාස සහ ස්වභාවික ව්‍යසනයන්හි විනාශයන් අවම කිරීමේ අරමුණින් යුතුව පර්යේෂණයන් හරහා ප්‍රධාන ගැටලුවලට ආමන්ත්‍රණය කරනු වස් කාලගුණ විපර්යාස සහ ස්වභාවික ව්‍යසන පිළිබඳ තේමාමූලික පර්යේෂණ වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබිණි.

අදාළ ක්ෂේත්‍රය තුළ විශේෂඥ විද්‍යාඥයින් දස දෙනකුගෙන් සමන්විත කාලගුණ විපර්යාස සහ ස්වභාවික ව්‍යසන පිළිබඳ මෙහෙයුම් කමිටුව මෙකී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම උදෙසා මාර්ගෝපදේශ සැපයී ය.

2014 වසරේ දී මෙකී වැඩසටහනට අදාළ තේමා පත්‍රිකාව සංවර්ධනය කරන ලදි. උපායමාර්ගික වැදගත් කලාප හයක් යටතේ ව්‍යාපෘති 12ක් හඳුනාගනු ලැබිණි. ඒවා නම්, ජාතික සැලසුම් සහ සංවර්ධන ක්‍රියාවලිය කෙරේ වැදගත්වන ප්‍රධාන ධාරාවේ කාලගුණ වෙනස්කම්. ජනාවාස මත කාලගුණ විපර්යාස ප්‍රකෘතිකරණය. මානව සෞඛ්‍ය සඳහා ප්‍රධාන ආර්ථික බලවේගයන් සහ බලපෑම් සිදු වූ අංශ. කාලගුණ විපර්යාසයන් අවම කිරීම. ආහාර සුරක්ෂිතතාවට සිදුවන බලපෑම. කාලගුණ විපර්යාසයන්හි බලපෑමෙන් ස්වභාවික සම්පත් සහ ජෛව විවිධත්වය ආරක්ෂා කිරීම. අනාගත කාලගුණය, කාලගුණ දර්ශනයන්, ස්වභාවික ව්‍යසනයන් සහ කල්තපා අනතුරු ඇඟවීම්, අවම කිරීම්.

ආයතනික හවුල්කාරීත්වයන්, සහ තීරණ ගැනීමේ දී තොරතුරු සහ දැනුම ඒකාබද්ධ කිරීම සඳහා පහසුකම් සපයනු ඇත්තා වූ පර්යේෂණ ආයතනයන්, රජයේ ආයතන සහ පුද්ගලික අංශයේ නියුක්තවීම මගින් තෝරාගනු ලැබූ පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරෙනු ඇත.

- කාලගුණ විපර්යාසයන් සහ ස්වභාවික ව්‍යසනයන් පිළිබඳ දැනුවත්භාවය ඇතිකිරීම. මූලිකවම හඳුනාගන්නා ලද කාලගුණ විපර්යාසයන් යන තේමාවට ස්වභාවික ව්‍යසන යන්න ද ඇතුළු කිරීම පිණිස මාර්තු 10 වන දින ජාතික විද්‍යා පදනමෙහි පාර්ශ්වකරුවන්ගේ රැස්වීමක් පවත්වන ලදි.

- ජාතික විද්‍යා පදනමෙහි දී 2014 ජුනි 3 වන දින කාලගුණ විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය කමිටුවේ පස්වෙනි තක්සේරු වාර්තාව පිළිබඳව සාකච්ඡාවක් පවත්වන ලදි. මෙකී සාකච්ඡාවේ ප්‍රධාන අරමුණ වූයේ මෙම වසරේ මුල් භාගයේ දී නිකුත් කරන ලද කාලගුණ විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය කමිටුවේ පස්වන තක්සේරු වාර්තාවෙහි නිර්දේශයන් පිළිබඳ දැනුවත්භාවයක් ඇතිකිරීම සහ එමගින් ශ්‍රී ලංකාව පිළිබඳ වාර්තාවෙහි මතුකර දක්වා ඇති බලපෑම් හඳුනාගැනීම සහ ශ්‍රී ලංකාවේ අනාගත කාර්යයන්හි දී මෙකී නිර්දේශවල බලපෑම කවරාකාර වේදැයි සැලකීමයි. මෙකී සාකච්ඡාවේ දී තාක්ෂණ සහ පර්යේෂණ අංශයන් විසින් ඉදිරිපත් කරන ලද මාර්ගය මතුකර දක්වන ලදි. මෙහි ප්‍රධාන අමුත්තා වූයේ තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මහතා ය.

- ජාතික විද්‍යා පදනමෙහි දී 2014 ජුනි 23 දින ශ්‍රී ලංකාවට එල්නිනෝ තත්ත්වයන්ගේ බලපෑම මැයෙන් ප්‍රසිද්ධ දේශනයක් මහාචාර්ය ඩබ්ලිව්.එල්. සුමතිපාල මහතා විසින් පවත්වන ලදි. මෙම අවස්ථාවට ප්‍රධාන අමුත්තා වශයෙන් තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මහතා සහභාගි විය.

තේමාව : ජල සුරක්ෂිතතාව

ජල සංරක්ෂණය සහ ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණය පිළිබඳව ගොවි ප්‍රජාවන් අතරෙහි දැනුවත්භාවය ඇතිකිරීමේ අරමුණින් යුනෙස්කෝ සහභාගිත්ව වැඩසටහන ආරම්භ කරන ලදි (ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණ භාවිතයන් උදෙසා පාර්ශ්වකරුවන් දැනුවත්කිරීම සහ සහභාගිකරවා ගැනීම).

ඉහත අරමුණ ඉටුකරගැනීම උදෙසා පහත සඳහන් දිස්ත්‍රික්ක 6 තුළ තෝරාගනු ලැබූ ප්‍රාදේශීය මට්ටමේ සේවා නියෝජිත ආයතනයන්හි ගොවි සංවිධාන ඇතුළුව අදාළ පුද්ගලයන් උදෙසා දැනුවත් කිරීමේ වැඩමුළු 10ක් සංවිධානය කරන ලදි.

දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
1. අනුරාධපුරය	මැදවච්චිය, කහටගස්දිගිලිය
2. මොනරාගල	වැල්ලවාය, බුත්තල
3. නුවරඑළිය	කොත්මලේ, හඟුරන්කෙත
4. යාපනය	තෙන්මරච්චි, වඩමාරච්චි
5. මහනුවර	මිණිපේ
6. පුත්තලම	පුත්තලම

මෙහිදී පහත මාතෘකා යටතේ ගොවීන් තුළ දැනුවත්භාවය ඇති කෙරිණි :

- ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණය යටතේ පාරිසරික ගොවිතැනෙහි කාර්යභාරය
- පාංශු සහ ජල සංරක්ෂණය
- වැසි ජලයෙන් වගාකිරීම
- කෘෂිකර්මය සඳහා භූගත ජලය භාවිතය

වාචිකව සිදුකරනු ලැබූ ඉදිරිපත් කිරීම්වලට අමතරව අත්පත්‍රිකා සහ කුඩා පොත් බෙදාහරිනු ලැබිණි. ඉදිරිපත් කිරීම්වලට පසුව අන්තර්ක්‍රියාකාරී සාකච්ඡා පවත්වන ලද අතර ජලය සහ සෞඛ්‍ය ආශ්‍රිත ගැටලු සහ විශේෂ ක්ෂේත්‍රයට අදාළව දැඩි බලපෑම් එල්ල කරනා ගැටලු සම්පත් පුද්ගලයන් විසින් විස්තර කරන ලදි.

ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණය පිළිබඳ ඩීවීඩී පිටපතක් සිංහල සහ දෙමළ භාෂාවෙන් නිපදවන ලදි. මෙකී ඩීවීඩී පිටපත නිර්මාණය කිරීමේ මූලික අරමුණ වූයේ දැනුවත්භාවය ඇතිකිරීම සඳහා තවත් උපකරණයක් භාවිත කිරීමයි. වැඩමුළු පවත්වන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි පාසල් අතර මෙය සංසරණය කරන ලද අතර ප්‍රාදේශීය ලේකම්වරුන් හා සහභාගි වූ ගොවි සංවිධානයන්ට ද මෙය බෙදාදෙන ලදි.

ඵලදායී යෝජනා ලිවීම සඳහා වන වැඩමුළුව

ජාතික විද්‍යා පදනමෙහි තරගකාරී පර්යේෂණ ප්‍රදාන යෝජනා ක්‍රමයට ඉහළ ප්‍රමිතියකින් යුත් පර්යේෂණ යෝජනා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් දැනුවත්භාවය ඇතිකරනු පිණිස වන ඵලදායී යෝජනා නිර්මාණය කිරීමේ වැඩමුළුවක් අනාගත අයදුම්කරුවන් 102 සහභාගිත්වයෙන් ජාතික විද්‍යා පදනමෙහි දෙසැම්බර් මස 09 දින පවත්වන ලදි.

ධාරිතා වර්ධනය සහ ඵලදායිතා වර්ධනය

පර්යේෂණ ශිෂ්‍යත්ව

වර්තමානයේ දී පැහැදිලිවම දක්නට ලැබෙන කරුණක් වන්නේ ශ්‍රී ලංකාවේ සරසවි මගින් පිරිනැමෙන පශ්චාත් උපාධි පර්යේෂණ උපාධිවල නිමැවුම ඉතා පහත මට්ටමක පවතින බවයි. එහෙයින් ආචාර්ය උපාධි සහ දර්ශනශූරී උපාධි කරා යොමු වූ (ශ්‍රී ලංකාව තුළ) පූර්ණකාලීන පර්යේෂණ පැවැත්වීම සඳහා විද්‍යා සහ ඉංජිනේරු උපාධිධාරීනට මේ වැඩසටහන මගින් මූල්‍ය ආධාර සැපයේ. කෙසේ වෙතත් පැවති මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් 2014 වසර තුළ දී නව ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් භාර නොගන්නා ලදි.

උපකරණ ප්‍රදානයන් සහ අමතර කොටස් ප්‍රදානයන්

ගෝලීය විද්‍යා හා තාක්ෂණ පර්යේෂණයන් සමඟ සමගාමීව යනු පිණිස පර්යේෂණයන් සඳහා නවීන යටිතල පහසුකම්වලින් සමන්විත විද්‍යාගාරයන් අවශ්‍ය වේ. එහෙයින් පර්යේෂණ උපකරණ සඳහා අවශ්‍ය අමතර කොටස් සහ උපකරණ අත්පත් කරගැනීමට සහාය දීම මෙම යෝජනා ක්‍රමයන් මගින් අපේක්ෂිත ය. එනම් පොදුවේ පර්යේෂණ ආයතනයන් සහ සරසවිවලට ඉහළ පිරිවැයක් දරමින් මිලදී ගැනීමට සිදුවන දෑ ලබාදීමට. තිරසර පර්යේෂණ සංස්කෘතියක් නිර්මාණය කරනු පිණිස පර්යේෂණ විද්‍යාගාරයන්හි යටිතල පහසුකම් සඳහා පහසුකම් හා උපකාර සැපයීම මෙකී යෝජනා ක්‍රමයන් මගින් සිදු කෙරේ. ඒ අනුව 2014 වසරේ දී රුපියල් මිලියන 7.29 ක වටිනාකමින් යුත් උපකරණ ප්‍රදාන 8ක් සිදුකෙරිණි.

ඉහළ කාර්ය සාධනයෙන් යුත් විද්‍යාඥයින්ට පිළිගැනීමක් අත්කරදීම

ජාතික විද්‍යා පදනමෙහි පහත සඳහන් යෝජනා ක්‍රමයන් යටතේ සම්මාන පිරිනැමීම පිණිස 2014 දෙසැම්බර් මස 23 දින ජාතික විද්‍යා පදනමෙහි දී 2014 ජාතික විද්‍යා පදනමේ පර්යේෂණ සම්මාන ප්‍රදානෝත්සවය පවත්වන ලදි.

- ජාතික විද්‍යා පදනමේ පර්යේෂණ සම්මාන
- පර්යේෂණ උපාධි අධීක්ෂණය සඳහා උපකාරක යෝජනා ක්‍රමය
- තෙවන ලෝකයේ විද්‍යා ඇකඩමිය/ජාතික විද්‍යා පදනමේ තරුණ විද්‍යාඥ සම්මානය

ජාතික විද්‍යා පදනමේ පර්යේෂණ සම්මාන

ජාතික විද්‍යා පදනමේ අරමුදල් මත ක්‍රියාත්මක පර්යේෂණ ව්‍යාපෘති හරහා විද්‍යා ප්‍රගමනයට කැපීපෙනෙනා දායකත්වයක් සැපයූ පර්යේෂකයන් හට වාර්ෂිකව ජාතික විද්‍යා පදනමෙහි පර්යේෂණ සම්මාන පිරිනමනු ලබයි. මෙකී සම්මාන ප්‍රදානයේ අරමුණ වනුයේ විද්‍යාවේ ප්‍රගමනය උදෙසා සපයන ලද දායකත්වය මෙකී පර්යේෂකයන්ට උරුම පිළිගැනීම ලබාදීමත් එමගින් ජාතික විද්‍යා පදනමේ එක් ප්‍රධාන අරමුණක් ළඟාකර ගැනීමට උපකාරී වීමයි. විද්‍යාත්මක පර්යේෂණයන්හි දී ඉහළ ප්‍රමිතීන් අනලස්ව පවත්වා ගැනීමට තරගකාරී පර්යේෂණ ප්‍රදානයන් ලද්දවුන් අභිප්‍රේරණය කිරීමත් ඒ අතරම පිළිගත් විද්‍යාඥයින් ලෙස ඔවුන්ගේ අනාගත රැකියා අවස්ථා වැඩිදියුණු කිරීමට උපකාරී වීමත් මෙම සම්මාන මගින් අපේක්ෂිත ය. මෙම වසරෙහි සම්මාන ප්‍රදානෝත්සවයේ දී ජාතික විද්‍යා පදනමේ පර්යේෂණ සම්මාන දෙකක් සහ ප්‍රශංසාත්මක සහතික තුනක් පිරිනමනු ලැබිණි. අදාළ විස්තර ඇමුණුම් 5හි දැක්වේ.

පර්යේෂණ උපාධි අධීක්ෂණය සඳහා උපකාර කිරීමේ යෝජනා ක්‍රමය

විද්‍යා හා තාක්ෂණය සම්බන්ධ සියලු ක්ෂේත්‍රයන්හි පර්යේෂණයන් සිදුකරනා පශ්චාත් උපාධි සිසුන් අධීක්ෂණය කිරීමේ නිරත විද්‍යාඥයින්/ඉංජිනේරුවන් අභිප්‍රේරණය කිරීම, ඔවුනට උපකාර කිරීම සහ ඔවුන් පිළිගැනීමට ලක්කිරීම උදෙසා පර්යේෂණ උපාධි අධීක්ෂණය සඳහා වන උපකාරක යෝජනා ක්‍රමය සඳහා වූ සම්මානය 2001 වසරේ දී ක්‍රියාත්මක කරන ලදි. මෙම යෝජනා ක්‍රමය පශ්චාත් උපාධි පර්යේෂණ පුහුණු වැඩසටහන් ප්‍රවර්ධනය කිරීමට හා ඒවාට පහසුකම් සැලසීමට සරසවි සහ පර්යේෂණ ආයතන දිරිගන්වයි. 2012 සහ 2013 වසර දෙක තුළ සම්පූර්ණ කරන ලද එක් ආචාර්ය උපාධියක් සහ දර්ශනශූරී උපාධි 5ක් වෙනුවෙන් ඉහත සම්මානය ලබාගැනීමට අධීක්ෂණ කණ්ඩායම් 6ට සාර්ථකව හැකියාව ලැබුණි.

තෙවන ලෝකයේ විද්‍යා ඇකඩමිය/ජාතික විද්‍යා පදනම (TWAS/NSF) තරුණ විද්‍යාඥ සම්මානය

මෙකී උත්සවයේ දී ම තෙවන ලෝකයේ විද්‍යා ඇකඩමිය/ ජාතික විද්‍යා පදනම (TWAS/NSF) තරුණ විද්‍යාඥ සම්මානය ජීව විද්‍යා ක්ෂේත්‍රයේ එක් ජයග්‍රාහකයකුට පිරිනමන ලදි.

විද්‍යාත්මක ඉසව් සහ පුහුණු වැඩසටහන් සඳහා අනුග්‍රහ සැපයීම

විද්‍යාත්මක ඉසව් සහ පුහුණු වැඩසටහන් සඳහා අනුග්‍රහ සැපයීම පිළිබඳ යෝජනා ක්‍රමය මගින් අපේක්ෂා කරනුයේ රාජ්‍ය සහ රාජ්‍ය නොවනා වූ පර්යේෂණ ආයතනයන්, අධ්‍යාපන ආයතනයන්, විශ්ව විද්‍යාල සහ මනාව ස්ථාපිත කරන ලද විද්‍යා හා තාක්ෂණ සංගමයන්ට විද්‍යාත්මක රැස්වීම්, පුහුණු වැඩසටහන්, වැඩමුළු සහ සම්මේලන පැවැත්වීමට සහාය දැක්වීමයි. මෙමගින් ශ්‍රී ලාංකික විද්‍යාඥයින්ට ඔවුනොවුන් සමඟ සහ විදේශයන්හි ප්‍රවීණ විද්‍යාඥයන් සමඟ අන්තර් සබඳතා පවත්වා ගැනීමට අවස්ථා සැලසේ. තොරතුරු තාක්ෂණය වැනි නව්‍ය විද්‍යාවන් සහ මූලික සහ ව්‍යවහාරික විද්‍යාව, සමාජ විද්‍යාව වැනි විවිධ ශික්ෂණයන් ආවරණය කෙරෙමින් 2014 වසර තුළ දී රුපියල් 4,307,260ක් වටිනා ශිෂ්‍යත්ව 29ක් පිරිනමන ලදි. විවිධ ශික්ෂණයන් අතර අනුග්‍රාහයන් බෙදී ගිය ආකාරය පහත වගුවේ දැක්වේ. අරමුදල්වලින් වැඩිම ප්‍රමාණයක් බහුවිධ ශික්ෂණයවලින් යුත් සම්මේලන පවත්වන ලද වෛද්‍ය අංශයට සපයන ලදි. අරමුදල්වලින් අවම ප්‍රමාණයක් සපයන ලද්දේ තොරතුරු තාක්ෂණයට ය.


Sponsorships for Scientific Meetings & Training Programs
2014
Fund disbursement among Subject Catergories
Science
Medical Sc
Mathematics and Statistics
Ayurvedic
IT
Forestry& Enviro Sc
Social Science
Biology
Chemistry
Engineering
Agriculture
Medical Sc
Chemistry
Engineering
Agriculture
Biology
Social Science
Forestry& Enviro Sc
IT
Ayurvedic
Mathematics and Statistics
Science


Sponsorships for Scientific Meetings and Training Programs
Fund disbarment in different cottagers (2012-2014)
No of Sponsorships Given
0
1
2
3
4
5
6
7
8
9
2012
2013
2014
Year
Medical Sc
Chemistry
Agriculture
Biology
Zoology
Social Science
Physical Science
Physiology
Forestry& Enviro Sc
IT
Ayurvedic
Mathematics and Statistics
Architecture
Science

තාක්ෂණය පැවරීම

විවිධ උපාය මාර්ගයන් තුළින් එනම් අරමුදල් සැපයීම, IP දැනුවත්භාවය සහ ආරක්ෂණය සඳහා ආරක්ෂණය සැපයීම සහ අදාළ ප්‍රතිපත්ති සංවර්ධනය සඳහා උපකාර කිරීම තුළින් නව හෝ වැඩි දියුණු කළ භාණ්ඩ හා සේවා උත්පාදනය පිණිස තාක්ෂණ සංවර්ධනය සහ නවෝත්පාදනය වෙනුවෙන් ජාතික විද්‍යා පදනමේ ක්‍රියාකාරකම් මගින් සහාය සැපයේ.

'තාක්ෂණ සංවර්ධනය සඳහා සහාය' සහ නව තාක්ෂණවේදයන් මත පදනම්ව ආරම්භ කරන ලද අලුත් ව්‍යාපාරයන් සඳහා සහාය මැයෙන් වූ නව තාක්ෂණ ප්‍රදාන යෝජනා ක්‍රමයන් දෙක අඛණ්ඩව රාජ්‍ය අංශයේ, රාජ්‍ය නොවන අංශයේ (කර්මාන්ත) මෙන්ම පුද්ගලයන් හට ද තාක්ෂණ සහායන් සපයයි.

ස්පෘෂ්‍ය නිමවුම් සහිතව සම්පූර්ණ කරන ලද තාක්ෂණ ව්‍යාපෘති

ඩීසල් ඉන්ධන පොම්ප පාරීක්ෂණ කට්ටලයේ ගුණත්වය වර්ධනය කිරීම

ඩීසල් එන්ජින්වල ඉන්ධන ඉන්ජෙක්ටර් පොම්පයෙහි කාර්යක්ෂමතාව පරීක්ෂා කරනු පිණිස ආනයන ආදේශන උපකරණයක් ලෙස වායුසමන පරිවර්තකයක් සහිත ඩීසල් ඉන්ධන පොම්ප පරීක්ෂා කිරීමේ උපකරණයක් සංවර්ධනය කරන ලදි. දැන් එම නිපයුම අලෙවිය සඳහා සූදානම්ව පවතින අතර විදේශ විනිමය ඉතිරි කිරීමට හැකිවන අයුරින් තරගකාරී මිලකට අලෙවි කිරීම සඳහා විවෘතයි.



පොල් කටු අඟුරු අඩු කිරීම පිණිස බලශක්ති කාර්යක්ෂම සහ පරිසර හිතකාමී නව තාක්ෂණවේදයක් හඳුන්වාදීම

පන්නල දී අභ්‍යන්තර කුටීර තුනකින් සහ බාහිර කුටීරයකින් සමන්විත පොල්කටු අඟුරු නිපැයුම් සඳහා වන අර්ධ ස්වයංක්‍රීය ඒකකයක් සංවර්ධනය කර එකලස් කරන ලදි. එම ඒකකය මගින් ඉහළ තත්ත්වයේ අඟුරු නිපදවන අතර (අඟුරු කි.ග්‍රෑම් 1000/ එක් කට්ටලයක් සඳහා පැය 24) මේවා ක්‍රියාකාරී කාබන් නිෂ්පාදනය සඳහා යොදාගත හැකි ය. මෙයින් අතුරු නිපයුමක් ලෙස තාර ද රැස්කරනු ලැබේ. මේ ඒකකය වනාහි සම්ප්‍රදායික අඟුරු නිපයුම් ක්‍රමවේදයන් හා බැඳුණු පාරිසරික හා සෞඛ්‍ය ගැටලු සම්බන්ධයෙන් මනා විසඳුමකි. මේ සඳහා උනන්දුවක් දක්වන සේවාදායකයන් උදෙසා වඩ වඩා මෙවන් ඒකක නිපදවන ලද අතර මෙහි දෙවන ඒකකය ද වරකාපොළ සවිකර තිබේ.

ශ්‍රී ලංකාවේ ගම්වල ජීවත්වන ළමුන්, ගැබිනි සහ කිරිදෙන මව්වරුන් අතරෙහි වන මන්දපෝෂණය පරදවාලීම සඳහා ඇල්ගී ස්පයිරුලිනා වගාකිරීම.



මෙම ව්‍යාපෘතියෙහි අරමුණ මන්දපෝෂණය මර්ධනය කිරීම සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවිපොළ තත්ත්වයන් යටතේ ස්පයිරුලිනා වගාව සඳහා ගම්වැසියන්ට උපකාර සැපයීම ග්‍රාමීය තරුණයන් හා කාන්තාවන් යන දෙපිරිසට (අර්ධකාලීන පදනමෙන්) සීමිත රැකියා අවස්ථා සැපයීම සහ පුහුණුව, විශේෂයෙන්ම වයඹ පළාතෙහි ගම්වැසියන්ට දූරිය හැකි මිලකට එය පිටි ලෙස අලෙවි කිරීමයි. මෙම නිපයුම ස්පයිරුලිනා පෙති හෝ කරල් යනාදී ආකාරයෙන් පරිභෝජනය කළ හැකි ලෙස සැපයිය හැකි මාදිලි හඳුනාගැනීමට සංවර්ධනය කරන ලද තාක්ෂණය පැවරීම සඳහා නව ව්‍යාපාරයන් නිර්මාණය කරයි.

සිසිල් පානයක් ලෙස සංග්‍රහ කිරීමට හැකිවන අයුරින් කෝමාරිකාවලින් පානයක් වැඩිදියුණු කිරීම.

මෙම ව්‍යාපෘතියෙහි සමස්ත අරමුණ වනුයේ විකල්ප පානයක් ලෙස සංග්‍රහ කිරීම සඳහා ගත හැකි ලෙස කෝමාරිකා පානයක් වැඩි දියුණු කිරීමයි. මේ වනාහි ලංකාව පුරාව ව්‍යාප්තව පවතිනා රෝගයක් වූ ඉන්සියුලින් ප්‍රතිරෝධය නිසා වැඩිහිටි වයසේ දී ඇතිවන්නා වූ දියවැඩියා වළකන පියවරකි.

කුඩා පරිමාන ගොවීන් උදෙසා දේශීය වශයෙන් සංවර්ධනය කරන ලද කිරි දෙවීමේ යන්ත්‍රයක් වැඩි දියුණු කිරීම සහ ක්ෂේත්‍ර පරීක්ෂණයකට ලක් කිරීම.

වැකුම් තාක්ෂණය සහ උපාංගයන්හි කල්පවත්නාභාවයට අදාළව පවත්නා කිරිදෙවීමේ යන්ත්‍රණයට වැඩිදියුණු කිරීම් එක්කරන ලදි. විදුලිබල පරිභෝජනය අඩුකිරීම සහ කිරි නීෂ්පාදනය පහසු කිරීම සඳහා තනබුරුල්ලට සවිකරනා චූෂක ස්පන්ධන යාන්ත්‍රණය ද වැඩි දියුණු කරන ලදි. මෙම නව මාදිලිය බරින් අඩුවන අතර සුසංහිත වේ. නිෂ්පාදනය මේ වන විට පේටන්ට් බලපත්‍රය අපේක්ෂාවෙන් පසුවේ. ප්‍රදානයන් සැපයූ පුද්ගලයා මෙම නව නිෂ්පාදනය කිරි ගොවීන්ට හඳුන්වා දීම සඳහා තමාගේම ව්‍යාපාරයක් ස්ථාපිත කිරීමට අපේක්ෂාවෙන් පසුවේ.

ස්වභාවික රබර් කිරි කර්මාන්තය සඳහා ගෝලාකාර බහාලුමක් නිර්මාණය කිරීම



මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ කිරි කපන අවස්ථාවේ සිට සැකසීම සහ සකසන ලද රබර් කිරි ප්‍රවාහනය දක්වා වන ද්‍රව්‍යමය අපතේ යාම් වළක්වාලීම සඳහා රබර් කර්මාන්තයට ගෝලාකාර රබර් කිරි බහාලුමක් නිපදවාලීමයි. A21000L ගෝලාකාර රබර් කිරි බහාලුම නිපදවා ලලාන් රබර්ස්හි වරකාපොළ කම්හලෙහි සවිකර තිබේ. ලලාන් රබර් ආයතනය විසින් පරීක්ෂණ ධාවනයන් දෙකක් සිදුකරන ලද අතර එහි ප්‍රතිඵල සම්ප්‍රදායික සිලින්ඩරාකාර ටැන්කි සමඟ සසඳන ලදි. ඒ අනුව නව මාදිලිය මගින් මුදවන ලද කිරිවලින් 42%ක් ඉතිරි කිරීමට ද, ඇමෝනියා භාවිතය 19.5% න් ඉතිරි කිරීමට ද, කිරි කපන ලද අවස්ථාවේ සිට සැකසීමෙන් පසු ප්‍රවාහනය දක්වා ශ්‍රම අවශ්‍යතාවෙන් 59%ක් ඉතිරි කිරීමට ද සමත් වෙයි. එහෙයින් සම්ප්‍රදායික සිලින්ඩරාකාර බහාලුම වෙනුවට ආර්ථික වශයෙන් වාසිදායක ගෝලාකාර බහාලුම ලලාන් ආයතනය නිර්දේශ කරයි. රිවඩ් පීරිස් පොලිමර්ස් පුද්ගලික ආයතනයෙහි දී ගෝලාකාර බහාලුම් දෙකක් සහ රොටෝමවුන්ඩ් ක්‍රියාවලිය ආධාරයෙන් ලීටර් 1500 ධාරිතාවෙන් යුත් ගෝලාකාරී බහාලුමක් සඳහා වන අච්චුවක් නිපදවන ලදි. ලීටර් 1500හි ගෝලාකාර බහාලුම් අලෙවිය සඳහා නිපයනු පිණිස ප්‍රධාන සපයන්නා සහ රිවඩ් පීරිස් පුද්ගලික ආයතනය සමඟ සාකච්ඡා පැවැත්වේ.

ගෘහාශ්‍රිත ආහාර නිපැයුම වැඩිදියුණු කිරීමට සහ වාණිජකරණය සඳහා උපාය මාර්ගයක් සංවර්ධනය කිරීමට සරල, පාංශු පදනමක් රහිතව කරනු ලබන වගාවන්හි සමාජ ආර්ථික සාධ්‍යතාව පිළිබඳ තක්සේරුව

මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ සරල කරන ලද පාංශු පදනමක් රහිත වගාවන්හි සමාජ ආර්ථික සාධ්‍යතාව පිළිබඳ තක්සේරුවක් කිරීම සහ එම පද්ධතිය ගෘහාශ්‍රිත එළවළු නිෂ්පාදනය උදෙසා යොදාගැනීම සඳහා අලෙවි උපක්‍රමයක් සංවර්ධනය කිරීමයි. මෙම ව්‍යාපෘතිය ගෘහ ඒකක විස්සක්, පාසල් දහයක් සහ ආයතන අටක් සම්බන්ධ කරගනිමින් කොළඹ සහ කළුතර දිස්ත්‍රික්කයන්හි සිදුකරන ලදි. මෙම සරල කරන ලද පාංශු පදනමක් රහිත වගා ක්‍රමය ගෘහාශ්‍රිත එළවළු නිපැයුම සඳහා දූරිය හැකි තාක්ෂණයක් බවත් එසේම සම්ප්‍රදායික ගෙවතු වගා සඳහා ඉඩකඩ/භූමිය සීමාසහිත ස්ථානයන්ට වඩා ගැළපෙන බවත් ව්‍යාපෘතිය මගින් අනාවරණය කෙරිණි. වගා පෙට්ටිවල වැවෙන අවස්ථාවේ දී මල් පීදීම සඳහා මාළු මිරිස්, මිරිස්, වම්බටු, තක්කලි, ගෝවා යනාදිය පරීක්ෂණයන්ට ලක්කරන ලදි. වගා මාධ්‍ය වශයෙන් වැලි සහ දහයියා භාවිත කෙරිණි. පෝෂණය සඳහා භාවිත කරන ලද මාධ්‍ය වූයේ පේටන්ට් බලපත්‍ර සහිත මිශ්‍රණයකි. වාණිජ පදනමින් පස් රහිත වගාවන් කිරීම සඳහා තාක්ෂණය සහ ගුණත්වයෙන් යුත් පෝෂක මිශ්‍රණයන් සුලබ කිරීමට ද අවසානයේ වාණිජ උපාය මාර්ගයක් යෝජනා කෙරිණි.

බලපෑම් තක්සේරු සමීක්ෂණය

සම්පූර්ණ කරන ලද තාක්ෂණ ප්‍රදානයන් මත බලපෑම් තක්සේරු සමීක්ෂණයක් සිදුකිරීම සඳහා ප්‍රශ්නාවලියක් සංවර්ධනය කරන ලදි. නියමු සමීක්ෂයක් ලෙස පළමු අදියරේ දී ව්‍යාපෘති හතරක් පිළිබඳ තක්සේරු කෙරිණි.

ප්‍රධාන අංකය	ව්‍යාපෘති නාමය
RG/2008/SI/01	දේශීය ප්‍රවාහනය සඳහා පරිසර ආරක්ෂිත භාණ්ඩ ප්‍රවාහන බෝට්ටුවක් නිෂ්පාදනය කිරීම
RG/2007/SI/03	උස වෙනස් කරගත හැකි පොල් කඩන කෙක්කක් නිපදවීම
RG/2006/IND/02	හරිතාගාරයන් තුළ වගාකරනු ලබන ගර්කින්හි ඵලදායිතාව වර්ධනය කිරීමේ ක්‍රමවේදයන් සහ මාධ්‍යයන් හඳුනාගැනීම (ආර්ථික පලදාව සහ ගුණත්වය)
RG/2007/SI/02	සංඥා මීටරයක් සැලසුම් කිරීම සහ සංවර්ධනය

රැස්කරන ලද තොරතුරු විග්‍රහ කිරීම සිදු කෙරෙමින් පවතී.

සම්පූර්ණ කරන ලද තාක්ෂණ ප්‍රධානයන් සඳහා පුළුල් ප්‍රචාරය

වාණිජකරණ අපේක්ෂා වර්ධනය කිරීම සහ ආයෝජකයන් ආකර්ෂණය කිරීමේ අරමුණින් යුතුව සන්ඩේ ටයිම්ස් පුවත්පතෙහි ජාතික විද්‍යා පදනමේ සම්පූර්ණ කරන ලද තාක්ෂණ ව්‍යාපෘති පිළිබඳ සමාලෝචන ලිපි පෙළක් පළකිරීමට මූලික පියවර ගනු ලැබිණි. ඒ අනුව 2014 නොවැම්බර් 30 දින උස ගළපා ගත හැකි පොල් කඩන කෙක්ක පිළිබඳ ලිපිය පළකරනු ලැබිණි. මෙම නිපයුම මිලට ගැනීම සඳහා වන කැමැත්ත පළකරමින් මේ ලිපිය සම්බන්ධයෙන් පාර්ශ්වකරුවන්ගෙන් බොහෝ විමසුම් ප්‍රතිචාර ලෙස ලැබිණි.

සිදු කෙරමින් පවත්නා තාක්ෂණ ප්‍රදානයන් අධීක්ෂණය

සිදු කෙරෙමින් පවත්නා ප්‍රධානයන්හි ප්‍රගතිය අධීක්ෂණය කිරීම වැඩබිම් 36 ක සංචාර සහ රැස්වීම් වාර හයකින් සිදුකෙරිණි. සිදුකෙරෙමින් පවත්නා ව්‍යාපෘති සඳහා අරමුදල් යෝග්‍ය පරිදි බෙදාහරිනු ලැබිණි. 2014 ජූලි 24 වන දින ප්‍රගති සමාලෝචන සම්මන්ත්‍රණයක් පවත්වන ලදි.

ජාතික විද්‍යා පදනම මගින් අරමුදල් සපයනු ලබන පර්යේෂණ ව්‍යාපෘති සහ අනෙකුත් මූලාශ්‍රයන්ගෙන් ලැබෙන අරමුදල්වලින් පවත්වාගෙන යනු ලබන පර්යේෂණයන්හි පර්යේෂණ සහ සංවර්ධන නිපැයුම් පිළිබඳ පසු විපරම් සිදුකිරීම.

2013 වසරෙහි දී සම්පූර්ණ කරන ලද ජාතික විද්‍යා පදනමේ පර්යේෂණ ව්‍යාපෘතීන්හි සාරාංශ වාර්තා පහෙන් ව්‍යාපෘති දෙකක් සඳහා වන වාර්තා තාක්ෂණ ප්‍රදාන යෝජනාක්‍රම යටතේ සලකා බැලීම සඳහා තෝරාගනු ලැබිණි. ඒ අනුව වාණිජකරන මට්ටම දක්වා නිපැයුම් තවදුරටත් සංවර්ධනය කිරීමේ අරමුණින් යුතුව පහත සඳහන් ප්‍රදානයන් දෙක පිරිනමනු ලැබිණි.

ව්‍යාපෘති නාමය : කපු සහ පොලියෙස්ටර් කපු රෙදිපිළි සඳහා වාණිජමය අගයක් ඇති ක්‍රියාමාර්ගයන් දෙකක් හඳුන්වාදීම මගින් සහ සිය ඇඟලුම් නිපයුම් සඳහා වටිනාකම් එකතු කිරීම පිණිස දේශීය රෙදිපිළි කර්මාන්තයට ප්‍රවාහ ක්‍රියාවලීන් ඒකාබද්ධ කරමින් වාණිජ රෙදිපිළි සංවර්ධන අධ්‍යයනයන් වැඩිදියුණු කිරීම, **(TG/2014/Tech-D/04)**

ප්‍රදානකරු : මහාචාර්ය ආර්.එම්.ජී. රාජපක්ෂ

ආයතනය : පේරාදෙණිය විශ්ව විද්‍යාලය

වර්ගය : රාජ්‍ය අංශය

ප්‍රතිපාදන : රු. 7, 201,000.00

ව්‍යාපෘති නාමය : බහු නියෝජිත පදනමින් යුත් බෙදාහැරීම් ස්වයංක්‍රීය ක්‍රමයක් භාවිතයෙන් වැරදි සොයා ගැනීම, ඉවත් කිරීම සහ යථා තත්ත්වයට සැකසීම, **(TG/2014/Tech-D/05)**

වර්ගය : රාජ්‍ය අංශය

ප්‍රදානකරු : ආචාර්ය කේ.ටී.එම්.යූ. හේමපාල

ආයතනය : මොරටුව විශ්ව විද්‍යාලය

ප්‍රතිපාදන : රු. 2,500,000.00

ජාතික විද්‍යා පදනමේ සම්පූර්ණ කරන ලද තාක්ෂණ ප්‍රදානයන් පිළිබඳ පසු විපරම් කිරීම

TG/2012/Tech-D/09 ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කරන ලද තාක්ෂණය (වැඩි දියුණු කරන ලද තත්ත්වයන් යටතේ ස්පිරුලිනා වැවීම) එස්.ඒ.පී. එන්ටප්‍රයිසස් පුද්ගලික සමාගමට පවරන ලදි. ස්පයිරුලිනා කුඩු භාවිතයෙන් කරල් නිපදවීම සඳහා වන තාක්ෂණවේදයක් සංවර්ධනය කරනු පිණිස එස්ඒපී එන්ටප්‍රයිසස් පුද්ගලික සමාගම වෙත නව තාක්ෂණ ප්‍රදානයක් පිරිනමන ලදි.

ව්‍යාපෘති නාමය	:	ස්පයිරුලිනා නීල හරිත ඇල්ගීවලින් කරල් සැකසීම සහ සංවර්ධනය, **(TG/2014/Tech-D/06)**
ප්‍රදානකරු	:	එස්ඒපී එන්ටප්‍රයිසස් පුද්ගලික සමාගම,
වර්ගය	:	මොරටුව විශ්ව විද්‍යාලය
ප්‍රතිපාදන	:	රු. 1,500,000.00

ජාතික විද්‍යා හා තාක්ෂණය සංවර්ධනය උදෙසා වන දායකත්වයන් පිළිගැනීම

අ. විද්‍යා හා තාක්ෂණ ජයග්‍රහණයන් උදෙසා වන ජාතික සම්මාන 2014

රටේ සමාජ ආර්ථික ප්‍රතිලාභ පිණිස විද්‍යා හා තාක්ෂණය භාවිත කිරීම උදෙසා පර්යේෂකයන්, තාක්ෂණඥයන්, ඉංජිනේරුවන් කාර්මික සහ අනෙකුත් අදාළ පාර්ශ්වකරුවන් දිරිගැන්වීම සහ අභිප්‍රේරණය කිරීම විද්‍යා හා තාක්ෂණ ජයග්‍රහණයන් උදෙසා වන ජාතික සම්මාන 2014හි මූලික අරමුණ වේ.

අපේක්ෂිත අයදුම්කරුවන් ආකර්ශණය කරගැනීම පිණිස විවිධ මාධ්‍යයන් හරහා සම්මාන ප්‍රදාන යෝජනා ක්‍රමය පිළිබඳ පුළුල් ප්‍රචාරයක් දියත් කරනු ලැබිණි. තාක්ෂණ අංශය මගින් පවත්වාගෙන යනු ලබනා තාක්ෂණ දත්ත පදනමෙහි වාර්තා වී සිටින සමාගම් සහ ආයතනය 3000ක් පමණ මෙහි දී සම්බන්ධ කරගනු ලැබිණි. ලද අයදුම්පත්‍ර 137 අතුරින් අයදුම් පත් 10ක් ජාතික සම්මාන පහත් සහ කුසලතා සහතික පහක් (වර්ගීකරණ 9ක් යටතේ) ප්‍රදානය සඳහා දැඩි ඇගයුම් ක්‍රියාවලියක් මගින් තෝරාගන්නා ලදි. ඇගයුම් කමිටුව විද්‍යා හා තාක්ෂණ සම්බන්ධයෙන් වන විවිධ ක්ෂේත්‍රයන්හි විශේෂඥයන් දසදෙනකුගෙන් සමන්විත විය. 2015 දෙසැම්බර් 31 දිනට ජනාධිපති ලේකම් කාර්යාලයෙන් දිනය ලබාගැනීම සඳහා දිනය ලබාගැනීම සහ උත්සවය පැවැත්වීම සඳහා අවශ්‍ය කටයුතු පිළියෙල කර තිබේ.

ආ. ජාතික විද්‍යා පදනමේ තාක්ෂණ සම්මාන

ජාතික විද්‍යා පදනමේ තාක්ෂණ සම්මාන සඳහා සලකා බැලීම පිණිස සම්පූර්ණ කරන ලද තාක්ෂණ ව්‍යාපෘතීන්හි ඇගයුම හා සම්බන්ධව බාහිර විශේෂඥයන් විසින් අවසන් වාර්තා ඇගයුම සහ පරිශ්‍රයන්හි සංචාරය සිදුකරන ලදි. ඒ අනුව සාර්ථකව සම්පූර්ණ කරන ලද ව්‍යාපෘතීන් දෙකක් සම්මාන ප්‍රදානය සඳහා තෝරාගන්නා ලදි. 2014 දෙසැම්බර් මස 23 වන දින ජාතික විද්‍යා පදනමේ පර්යේෂණ සම්මාන සමඟින් මෙකී සම්මාන ප්‍රදානෝත්සවය ද සිදු කෙරිණි. එහි දී සම්මාන 2ක් පිරිනැමිණි.

පේටන්ට් කෙටුම්පත් කිරීම, අයදුම්පත් පිරවීම සහ දැනුවත්භාවය ගොඩනැගීමේ ක්‍රියාකාරකම් පිළිබඳ උපදේශනයන්

PCT යටතේ දේශීය වශයෙන් පේටන්ට් අයදුම්පත් පිරවීම සම්බන්ධයෙන් නව නිෂ්පාදකයන් නමදෙනකුට උපදේශනයන් සපයන ලදි. පේටන්ට් කෙටුම්පත් කිරීම සහ නව නිෂ්පාදනයන් සඳහා සෙවුම් කිරීම පිණිස තොරතුරු විද්‍යා හා තාක්ෂණ නිලධාරීන් තිදෙනකු විසින් ලබාගන්නා ලදි.

අකුණු උවදුරු සහ ආරක්ෂණය පිළිබඳ දැනුවත්කිරීමේ වැඩසටහන

මෙකී වැඩසටහන 2014 මාර්තු 24 දින ඌරගස්මන්සන්ධිය ඩෙන්සිල් කොබ්බෑකඩුව මහා විද්‍යාලයේ දී පවත්වන ලදි. මෙකී වැඩසටහනෙහි සම්පත් දායකයා ලෙස සහභාගි වූයේ කොළඹ විශ්ව විද්‍යාලයෙහි භෞතික විද්‍යා අධ්‍යානාංශයේ ආචාර්ය මහේෂ් එදිරිසිංහ මහතා ය. මේ සඳහා 30 දෙනකු පමණ සහභාගි වූ අතර ඉන් බහුතරයක් අකුණු සැර පිළිබඳ සිදුවීම් වාර්තා වූ ප්‍රදේශයෙහි පදිංචිකරුවෝ ය.

නවෝත්පාදන සතිය

තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද 2014 විද්‍යා සතියට සමගාමීව ප්‍රදානයන් මගින් කරන ලද නිපයුම් වාණිජකරණය කිරීම සඳහා නව නිපයුම්කරුවන් සහ ආයෝජකයන්ට ප්‍රායෝගික වේදිකාවක් නිර්මාණය කරමින් 2014 නොවැම්බර් 04 වන දින තාක්ෂණ පැවරුම් පහසුකම් කුටිය 'වන්ස්ටොප් ටෙක් ස්පොට්' යනුවෙන් දියත් කරන ලදි. පේටන්ට් බලපත්‍ර සඳහා වන තොරතුරු සොයාගැනීමට සහ පේටන්ට් ආරක්ෂාව පිළිබඳ උපදේශනයන් ලබාගැනීමට ආයෝජකයන් හට අවස්ථා නිර්මාණය කරමින් කුටිය තුළ පේටන්ට් සඳහා උපකාරක සේවා මේසයක් ස්ථාපිත කෙරිණි.

විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති පර්යේෂණ හා උපාය මාර්ග සම්පාදනය

විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති පර්යේෂණ හා උපාය මාර්ග සම්පාදනය

විද්‍යා තාක්ෂණ හා නවෝත්පාදන හරහා රටෙහි ශීඝ්‍ර සමාජ ආර්ථික සංවර්ධනයක් ඉලක්ක කර ගනිමින් පවත්නා ප්‍රතිපත්ති අතරෙහි තිබෙනා පරතරයන්ට ආමන්ත්‍රණය කිරීම සහ ප්‍රතිපත්ති සම්පාදනය උදෙසා සාධක මත පදනම් වූ ප්‍රතිපත්ති නිර්දේශයන් සපයමින් ජාතික විද්‍යා පදනම විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති ක්ෂේත්‍රයෙහි පර්යේෂණ අංශයක් ලෙස ද ක්‍රියාත්මක වේ.

මෙකී යොමුගතවීම් මගින් අපේක්ෂා කරන ප්‍රධාන අරමුණු වනුයේ:

- ප්‍රතිපත්ති සම්පාදනය කරා යොමුවන පරිදි නිර්දේශයන් ඉදිරිපත් කිරීමට වැදගත් කලාපයන්හි විද්‍යා තාක්ෂණ සහ නවෝත්පාදන ප්‍රතිපත්ති පර්යේෂණයන් සිදු කිරීම.
- තීරණ ගැනීම සඳහා ප්‍රයෝජනවත් වන්නා වූ විද්‍යා තාක්ෂණ සහ නවෝත්පාදන යන සියලු අංශයන්හි අදාළ විවිධ දත්ත පදනම් සංවර්ධනය කිරීම.
- විද්‍යා තාක්ෂණ හා නවෝත්පාදන ක්ෂේත්‍රයන්ට අදාළ වන්නා වූ ජාතික වශයෙන් වැදගත් වන්නා වූ කරුණු අරභයා පොදු දැනුවත් කිරීමේ වැඩසටහන් සහ මහජන සංවාදයන් ඇති කිරීම.
- පවත්නා දේශීය ඥානය පිළිබඳ විමර්ශනය කරමින් එක්රැස් කර සුරක්ෂිත කිරීම සහ ශ්‍රී ලංකාව තුළ භාවිතයට ගැනීම.
- විශේෂයෙන්ම සමාජ විද්‍යා සහ දේශීය දැනුම් ක්ෂේත්‍රයන්හි මානව සම්පත් සම්බන්ධයෙන් ධාරිතා සංවර්ධනය සිදු කිරීම.

විද්‍යා තාක්ෂණ හා නවෝත්පාදන හා ප්‍රතිපත්ති පර්යේෂණ

ජාතික පර්යේෂණ සංවර්ධන සහ නවෝත්පාදන සමීක්ෂණය

2004 වසරේ සිට ජාතික විද්‍යා පදනම නිතිපතා ජාතික පර්යේෂණ සංවර්ධන සහ නවෝත්පාදන සමීක්ෂණ පවත්වාගෙන එයි. මෙකී සමීක්ෂණයන් මගින් පර්යේෂණ සංවර්ධන සහ නවෝත්පාදනයන් පිළිබඳ ආයෝජනයන්ට අනුව රටෙහි විද්‍යා හා තාක්ෂණ අංශයේ තත්ත්වය, විද්‍යා හා තාක්ෂණ සහ නවෝත්පාදන අංශයෙහි මානව සම්පත් නියුක්ත වීම සහ ප්‍රකාශන පේටන්ට් තාක්ෂණවේදයන් නවෝත්පාදනයන් වැනි ක්ෂේත්‍රයන් තුළ විද්‍යා තාක්ෂණ නවෝත්පාදන අංශයේ නිමැවුම් පිළිබඳ මැනුම් කිරීම සහ වාර්තාකරණය සිදු කරයි.

මෙම සමීක්ෂණය කරනු ලබන්නේ එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය සහ ආර්ථික සහයෝගිතාව සහ සංවර්ධනය පිළිබඳ සංවිධානය මගින් නිර්මිත ජාත්‍යන්තර ප්‍රමිතීන් අනුව ය. මෙම සමීක්ෂණයේ විෂය පථය මගින් උසස් අධ්‍යාපන අංශය, විද්‍යා හා තාක්ෂණ ආයතන, පර්යේෂණ හා සංවර්ධන ආයතන, කාර්මික ක්ෂේත්‍රය සහ දේශීය මෙන්ම විදේශීය රාජ්‍ය නොවන සංවිධාන ආවරණය කරනු ලබයි.

2014 වසර තුළ දී 2013 වසරේ ජාතික පර්යේෂණ සංවර්ධන සහ නවෝත්පාදන සමීක්ෂණය ආරම්භ කරන ලදි. එමගින් 2013 වසරට අදාළව දත්ත රැස්කෙරිණි. මෙසේ දත්ත රැස්කිරීම සිදුකෙරෙමින් පැවති අතර ශ්‍රී ලංකා විද්‍යා තාක්ෂණ සහ නවෝත්පාදන සංඛ්‍යාලේඛන අත්පොත 2013, 2015 වසර මුල දී ප්‍රකාශයට පත්කිරීමට සැලසුම් කෙරේ.

1998-2008 කාලය තුළ ජාතික විද්‍යා පදනම මගින් පිරිනමන ලද ප්‍රදානයන් පිළිබඳ සමීක්ෂණය

1998-2008 කාල පරිච්ඡේදය තුළ ජාතික විද්‍යා පදනම මගින් පිරිනමන ලද පර්යේෂණ ප්‍රදානයන්හි නිමැවුම් මැන බැලීම සහ තක්සේරු කිරීම උදෙසා මෙන්ම ජාතික විද්‍යා පදනමේ තරගකාරී පර්යේෂණ ප්‍රදාන යෝජනා ක්‍රමයෙහි අඩුපාඩු දුර්වලතා සහ පරතරයන් සොයාගැනීම උදෙසා මෙකී සමීක්ෂණය පවත්වන ලදි. සමීක්ෂණයේ තාක්ෂණ වාර්තාව 2015 වසරේ මුල්භාගය වන විට සූදානම්ව පවතිනු ඇත.

2009-2012 කාල පරිච්ඡේදය තුළ ජාතික සරසවිවලින් පිට වූ පශ්චාත් උපාධිධාරීන්ගේ සමීක්ෂණ අධ්‍යයනයන්

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වනුයේ දේශීය විශ්ව විද්‍යාල මගින් බිහිකරනු ලබනා පශ්චාත් උපාධිධාරීන් සේවා නියුක්ත කිරීමට ඇති හැකියාව පිළිබඳව විමර්ශනයක් සිදු කිරීමයි. 2014 ජනවාරි මාසයේ දී අදාළ සමීක්ෂණය ආරම්භ කරන ලද අතර දත්ත රැස් කිරීම සහ දත්ත ඇතුළු කිරීම සිදු කෙරමින් පවතී. ඒ අනුව තාක්ෂණික වාර්තාව 2015 වසර තුළ දී සූදානම්ව පවතිනු ඇත.

විද්‍යා තාක්ෂණ සහ නවෝත්පාදන ක්ෂේත්‍රයන්ට අදාළව පවත්නා ප්‍රධාන ජාතික ගැටලු සම්බන්ධයෙන් පොදු දැනුවත් කිරීමේ වැඩසටහන් සහ පොදු සංකථනයන් සිදු කිරීම.

පරිසර තිරසරභාවය සමඟ සාධාරණ වර්ධනයක් උදෙසා තාක්ෂණය සහ නවෝත්පාදනයන් භාවිත කිරීම මැයෙන් කණ්ඩායම් සාකච්ඡාවක් පැවැත්වීම.

පරිසර තිරසරභාවය සමඟ සාධාරණ වර්ධනයක් උදෙසා තාක්ෂණය සහ නවෝත්පාදනයන් භාවිත කිරීම මැයෙන් කණ්ඩායම් සාකච්ඡාවක් 2014 ජුනි මස 27 වන දින ජාතික විද්‍යා පදනමේ ශ්‍රවණාගාරයෙහි සංවිධානය කරන ලදි. එම සාකච්ඡාවෙහි දී අවධානය යොමු කරන ලද්දේ පහත සඳහන් කලාපයන් කෙරෙහි ය:

- ආර්ථික සංවර්ධනය සහ විද්‍යා තාක්ෂණ සහ නවෝත්පාදනයන් භාවිතය.
- සංවර්ධන ක්‍රියාවලිය තුළ තීරණාත්මක මැදිහත්වීමක් සහිත සමාජ ආර්ථික දේශපාලනික පරිසර සහ ව්‍යුහාත්මක සාධකයන් හඳුනාගැනීම.
- පරිසර තිරසරභාවය සමඟින් සාධාරණ වර්ධනයක් සැලසුම් කිරීම සහ කළමනාකරණය පිළිබඳ අන්තර් ශික්ෂණ ප්‍රවේශයක් බිහිකිරීම.

ජාතික විද්‍යා පදනම - වාර්ෂික වාර්තාව 2014

මෙම කණ්ඩායම් සාකච්ඡාවට ගරු තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍ය පාඨලී චම්පික රණවක මහතා සමඟ ආර්ථික විද්‍යාඥයන් සමාජ විද්‍යාඥයෝ සහ ප්‍රතිපත්ති සැලසුම්කරුවෝ සහ පර්යේශකයෝ සහභාගි වූහ. මෙම අංශයෙහි ප්‍රතිපත්තිමය මැදිහත්වීම් උදෙසා භාවිත කළ හැකි වැදගත් තොරතුරු හා නිර්දේශයන් මෙම සාකච්ඡාව මගින් මතුකරනු ලැබිණි.

මධ්‍ය ආදායම් උගුලෙන් ශ්‍රී ලංකාවට ගැලවිය හැක්කේ කෙසේ ද මැයෙන් පවත්වන ලද සම්මන්ත්‍රණය

විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයන්හි වඩ වඩා ආයෝජනය කිරීම මගින් ශ්‍රී ලංකාවට පහත් මධ්‍ය ආදායම් මට්ටමේ සිට ඉහළ මධ්‍ය ආදායම් මට්ටම කරා ගමන් කළ හැක්කේ කෙසේද යන්න පිළිබඳව බුද්ධිමය සංකථනයක් ආරම්භ කරනු පිණිස සම්මන්ත්‍රණයක් සංවිධානය කරනු ලැබිණි. මෙම සාකච්ඡාවේ දී රටෙහි ආර්ථික සහ විද්‍යා හා තාක්ෂණ මට්ටම් පිළිබඳව ද රටෙහි තිරසර ආර්ථික සංවර්ධනය වර්ධනය කිරීම පිණිස භාවිත කළ හැකි හා දියුණු කළ යුතු ක්ෂේත්‍රයන් පිළිබඳව ද අවධානය යොමු කෙරිණි.

මෙම අවස්ථාවට ප්‍රධාන අමුත්තා ලෙස තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මහතා සහභාගි වූ අතර මහාචාර්ය එස්.එස්. කොළඹගේ සහ ආචාර්ය ලලිත ගුණරුවන් යන මහතුන් විසින් ශ්‍රී ලංකාවේ වර්තමාන ආර්ථික තත්ත්වය පිළිබඳව ද විද්‍යා හා තාක්ෂණ අංශයන්හි සිදුකරන ලද දැවැන්ත ආයෝජනයන් පිළිබඳ උදාහරණයන් සහිතව සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවත්නා රටවල ආර්ථික ජයග්‍රහණයන් ලබාගැනීමේ ප්‍රවණතා මෙන්ම එහි දී ලබාගන්නා ලද ජයග්‍රහණයන් පිළිබඳව ද කරුණු ඉදිරිපත් කරන ලදි.

මෙම සාකච්ඡාව මෙහෙයවන ලද්දේ තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යවරයාගේ උපදේශක අශෝක අබේගුණවර්ධන මහතා විසිනි. මෙකී සාකච්ඡාවට විද්‍යා හා තාක්ෂණය පිළිබඳ ක්ෂේත්‍රයන්හි සහ ආර්ථික විද්‍යා ක්ෂේත්‍රයන්හි නියුතු විද්‍යාඥයින් සහ වෘත්තීයවේදීන් 110 දෙනකු පමණ සක්‍රීයව සහභාගි වූවෝ ය.

පර්යේෂණ සහ සංවර්ධනය උදෙසා වඩ වඩා ආයෝජනය කිරීම තුළින් ශ්‍රී ලංකාවට ආර්ථික සංවර්ධනය ළඟාකර ගත හැක්කේ කෙසේද යන මැයෙන් වූ සාකච්ඡාව: 2015-2020 සඳහා ජාතික පර්යේෂණ සහ සංවර්ධන ආයෝජන රාමුව හඳුන්වාදීම.

රටෙහි ජාතික සංවර්ධන න්‍යාය පත්‍රය කරා යොමු වූ විද්‍යා හා තාක්ෂණ මූලෝත්පාදනයන් පෙළගැස්වීම අරමුණු කරගනිමින් තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් සංවර්ධනය කරන ලද 2015-2020 සඳහා ජාතික පර්යේෂණ සහ සංවර්ධන ආයෝජන සැලසුම හඳුන්වාදීම උදෙසා විවෘත විශ්ව විද්‍යාලයේ මානව විද්‍යා හා සමාජ විද්‍යා පීඨයෙහි සම්මන්ත්‍රණ කාමරයෙහි දී සාකච්ඡාවක් පවත්වනු ලැබිණි. මෙම සාකච්ඡාවට තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මහතා ප්‍රධාන අමුත්තා ලෙස සහභාගි විය. ශ්‍රී ලංකාවේ අනාගත ආර්ථික වර්ධනයට ඇති අභියෝගයන් පිළිබඳ මහාචාර්ය එස්.එස්. කොළඹගේ මහතා විසින් සාකච්ඡා කරන ලද අතර තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යවරයාගේ උපදේශක අශෝක අබේගුණවර්ධන මහතා විසින් සාකච්ඡාව මෙහෙයවන ලද අතර ඔහු විසින් වැඩිදුරටත් ජාතික පර්යේෂණ සහ සංවර්ධන ආයෝජන සැලැස්ම හඳුන්වාදීම ද සිදු කෙරිණි. ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයෙහි අධ්‍යයනය කාර්ය මණ්ඩලය මීට සහභාගි වෙමින් අදාළ විෂයය සම්බන්ධයෙන් අදහස් හුවමාරු කරගත් අතර ආයෝජන වැඩසටහනේ සාර්ථකත්වය උදෙසා සරසවි පර්යේෂකයන්ට දායක විය හැකි ආකාරය පිළිබඳව සිය අදහස් පළ කළෝ ය.

විදුකවය පොදු දේශන මාලාව

සමාලෝචිත වර්ෂය තුළ දී ජාතික විද්‍යා පදනම සමාජ විද්‍යාව පිළිබඳව ජාතික විද්‍යා පදනමේ ක්‍රියාකාරී කමිටුව සහ දේශීය දැනුම පිළිබඳ ජාතික විද්‍යා පදනමේ ක්‍රියාකාරී කමිටුව සමඟ සහයෝගයෙන් රටෙහි වැදගත් ප්‍රශ්න පිළිබඳව සාකච්ඡා කිරීම උදෙසා විද්‍යාත්මක ප්‍රජාවට සහ පොදු මහජනතාවට වේදිකාවක් නිර්මාණය කිරීම සහ පොදු ජනයා හට පර්යේෂණයන්හි දී අනාවරණය කරගනු ලබන කරුණු පිළිබඳව දැනුවත්භාවය ලබාදීම මෙන්ම තීරණ ගැනීමේ

ක්‍රියාවලිය උදෙසා අනාගත මැදිහත්වීම් පිළිබඳ අදහස් සන්නිවේදනය කිරීම අරමුණු කරගෙන පොදු දේශන මාලාවක් ආරම්භ කරන ලදි. ඒ අනුව ප්‍රසිද්ධ දේශන තුනක් ඉහත වැඩසටහන යටතේ 2014 වසර තුළ දී පවත්වනු ලැබිණි.

ශ්‍රී ලංකාවේ සංවර්ධනයෙහි අනාගතය: ආර්ථික පර්යාලෝකයකින්

සර්ව ආර්ථික ස්ථාවරත්වය ආරක්ෂා කරගන්නා අතරේ ආර්ථික වර්ධනය වේගවත් කිරීමෙහි දී ශ්‍රී ලංකාව මුහුණදෙන අභියෝගයන් මෙම දේශනය මගින් සාකච්ඡාවට බඳුන් කරන ලදි. තාක්ෂණික ප්‍රගතිය, මානව ප්‍රාග්ධන සංවර්ධනය දැනුම සහ නවෝත්පාදනයන් වැනි දෑ මගින් ඵලදායිතා වර්ධනයන් හරහා රටෙහි වර්ධන විභවයන් පුළුල් කිරීමේ වැදගත්කම සහ දැනුම මත පදනම් වූ ආර්ථිකයක් පෝෂණය කිරීම මගින් ආයෝජන කලාපයන් වර්ධනය කිරීම යන කරුණු මෙහි දී අවධාරණය කරන ලදි.

සමාජ විද්‍යා සහ රාජ්‍ය ප්‍රතිපත්තිය

පාර්ශ්වකරුවන් තිස් දෙනකුට අධික පිරිසකගේ සහභාගිත්වයෙන් 2014 ජූනි 26 වන දින ජාතික විද්‍යා පදනමේ ශ්‍රවණාගාරයෙහි දේශන මාලාවේ දෙවැන්න පවත්වන ලදි. මෙහිදී රාජ්‍ය ප්‍රතිපත්තිය සහ සමාජ විද්‍යාවන්, මානව ස්වභාවය, සංස්කෘතිය සහ සමාජ පද්ධතීන් සමාජ විද්‍යාවන්හි විභව්‍ය දායකත්වය, රාජ්‍ය ප්‍රතිපත්ති සහ ප්‍රතිපත්ති වරණයන් අතර සබඳතාව පුළුල් ලෙස සාකච්ඡාවට බඳුන් කරන ලදි. මෙම සාකච්ඡාව අතරතුර දී දැනුවත් තීරණ ගැනීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයන්ට උපකාරී විය හැකි ප්‍රායෝගික දැනුමක් උත්පාදනය හරහා රාජ්‍ය ප්‍රතිපත්තියට බලපෑම් කිරීම සමාජ විද්‍යාවන්හි ප්‍රධාන අරමුණ බැව් මතුකර පෙන්වන ලදි.

සමකාලීන සමාජය තුළ සමාජ විද්‍යාවන්හි කාර්යභාරය

ජාතික විද්‍යා සතිය 2014 ට සමගාමීව ජාතික විද්‍යා පදනමේ ශ්‍රවණාගාරය තුළ 2014 නොවැම්බර් 7 දින 'සමකාලීන සමාජය තුළ සමාජ විද්‍යාවන්හි කාර්යභාරය' මැයෙන් ප්‍රසිද්ධ දේශනයක් පවත්වන ලදි. මෙම දේශනයට සරසවි පර්යේෂණ ආයතන රජයේ දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශ මෙන්ම රාජ්‍ය නොවන සංවිධාන ඇතුළුව විද්‍යා හා තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ ආයතනයන් ද නියෝජනය කරමින් විද්වතුන් සහ වෘත්තීයවේදීන් සහ මහජනතාව ද සහභාගි වූ අතර එහි දී විවිධ අංශයන් පිළිබඳ අදහස් හා අත්දැකීම් හුවමාරු වූ සේ ම සාකච්ඡාවට බඳුන්වන මාතෘකා අරභයා විවාදයන් ද පැන නැඟිණි.

පවත්නා දේශීය දැනුම පිළිබඳ විමර්ශනය කිරීම රැස් කිරීම සුරක්ෂිත කිරීම මෙන්ම ප්‍රායෝගිකව ශ්‍රී ලංකාව තුළ ඒවා භාවිත කිරීම

ශ්‍රී ලංකාවෙහි දේශීය දැනුම පිළිබඳ ඥාන විභාගය මැයෙන් පවත්වන ලද සම්මන්ත්‍රණය

මෙකී සම්මන්ත්‍රණයෙහි ප්‍රධාන අරමුණ වූයේ රට තුළ පවත්නා සහ භාවිත කෙරෙන දේශීය දැනුම් පද්ධතිය පිළිබඳ ඥානවිභාගය සම්බන්ධයෙන් සංවාදයක් ආරම්භ කිරීමයි. මෙම සාකච්ඡාවේ දී දේශීය දැනුම් කලාපයන් තුළ පර්යේෂණයන් පැවැත්වීම උදෙසා සුවිශිෂ්ට විද්‍යාත්මක ක්‍රමවේදයක් සංවර්ධනය කිරීම පිළිබඳව ද අවධානය යොමු කරන ලදි. දේශීය දැනුම් පද්ධතීන් පිළිබඳ විවිධ කලාපයන්හි කටයුතු කරනා විශේෂඥයන් විසින් මෙහි දී විවිධ මාතෘකා අරභයා ඉදිරිපත් කිරීම් සිදුකෙරිණි. තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මහතා ආරාධිත කථිකයා ලෙස රැස්ව සිටි පිරිස ඇමතී ය. දේශීය දැනුම පිළිබඳ කලාපයන්හි පර්යේෂකයන් සහ

ප්‍රායෝගිකව භාවිත කරන්නන් සහ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු පර්යේෂණ ආයතන විශ්ව විද්‍යාල සහ අනෙකුත් විද්‍යා හා තාක්ෂණ ආශ්‍රිත ආයතන නියෝජනය කරමින් නිලධාරීන් මීට සහභාගි වෙමින් සිය අදහස් සහ අත්දැකීම් හුවමාරු කරගෙන, බුද්ධිමය දේපළ ගැටලු සහ දේශීය දැනුම පිළිබඳ කලාපය තුළ පර්යේෂණ පැවැත්වීමේ ක්‍රමවේදය පිළිබඳව විවිධ පාර්ශ්වයන්ගෙන් වාද විවාද කළෝ ය. දේශීය ඥානය පිළිබඳව විමර්ශනය කිරීම උදෙසා යොදාගත හැකි ක්‍රමවේදයන් පිළිබඳව අදහස් ලබාගැනීම අරමුණු කොට කණ්ඩායම් සාකච්ඡාවක් ද පවත්වනු ලැබිණි..

මෙම අංශය උදෙසා අමාත්‍යාංශය විසින් ගනු ලැබූ නව පියවරයන් පොදු මහජනතාවට දැනුවත්කිරීම උදෙසා සම්මන්ත්‍රණයට පෙර 2014 අගෝස්තු 02 වන දින අදාළ ස්ථානයෙහිම මාධ්‍ය සාකච්ඡාවක් පවත්වන ලදි. තොරතුරු ඉදිරිපත් කරමින් සහ සම්මන්ත්‍රණයට අදාළව පැන නැගෙන ගැටලු පිළිබඳව මාධ්‍යකරුවන් විසින් මතුකරන ලද ප්‍රශ්නවලට පිළිතුරු සහ තොරතුරු ලබාදෙමින් තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මහතා මාධ්‍ය සාකච්ඡාවට සහභාගි විය.

රටෙහි දේශීය සහ ආයුර්වේද වෛද්‍ය වෘත්තිකයන් විසින් භාවිත කරනු ලබන්නා වූ ද දේශීය දැනුම පැවතීම පිළිබඳ විමර්ශනය

2014 ජුනි 24 වන දින ජාතික විද්‍යා පදනමේ ශ්‍රවණාගාරය තුළ රටෙහි දේශීය වෛද්‍ය වෘත්තිකයන් විසින් භාවිත කරනු ලබන සහ පවත්නා දේශීය දැනුම පිළිබඳ වැඩමුළුවක් සංවිධානය කරන ලදි. මෙකී වැඩමුළුවෙහි ප්‍රධාන අරමුණ වූයේ අනාගතය උදෙසා මෙන්ම සහ දැනුම් කොල්ලය වැළැක්වීම සඳහා සංරක්ෂණ කාර්යයන් සම්බන්ධයෙන් දේශීය වෛද්‍ය වෘත්තිකයන් අතර සුරැකී පවත්නා දැනුම පිළිබඳ විමර්ශනය කර වාර්තා කිරීමයි. තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මහතා ආරාධිත කථිකයා ලෙස මීට සහභාගි විය. මෙහිදී දේශීය වෛද්‍ය වෘත්තිකයන් හය දෙනකු (පාරම්පරික) සම්පත් දායකයන් ලෙස සහභාගි වූ අතර දේශීය වෛද්‍ය වෘත්තියේ විවිධ පාර්ශ්වයන් පිළිබඳ සිය දැනුම බෙදාහදා ගත්තෝ ය. වැඩසටහනට සහභාගි වූ ආයුර්වේද වෛද්‍ය නිලධාරීහු, දේශීය වෛද්‍ය වෘත්තිකයෝ ද සිය දැනුම අදහස් සහ අත්දැකීම් මූලික ඉදිරිපත් කිරීම්වලින් පසුව පැවති සාකච්ඡාවේ දී බෙදාහදා ගනිමින් මීට සහභාගි වූවෝ ය.

රටෙහි විවිධ කලාපයන් තුළ ගොවියන් විසින් භාවිත කරනු ලබන සහ පවතින දේශීය දැනුම පිළිබඳ විමර්ශනය

දැනුම් කොල්ලය වැළැක්වීමට මෙන්ම අනාගත ප්‍රයෝජනය සඳහා සංරක්ෂණය කිරීමේ ද අරමුණින් රටෙහි ගොවියන් විසින් භාවිත කරනු ලබන්නා වූ ද පවතින්නා වූ ද දේශීය දැනුම් පද්ධතීන් වාර්තා කර ලේඛනගත කිරීම පිණිස තොරතුරු රැස්කිරීම උදෙසා රටෙහි විවිධ පළාත් තුළ වැඩමුළු මාලාවක් සංවිධානය කරන ලදි. මෙහි දී රැස්කරගනු ලබනා තොරතුරු රටෙහි පරිසර හිතකාමී වගා පද්ධතියක් ප්‍රවර්ධනය කරනු පිණිස වර්තමානයේ පවත්නා වගා ක්‍රමයන් සමඟින් විමර්ශනයට ලක් කරනු ලැබේ.

ඒ අනුව පහත සඳහන් ප්‍රදේශයන් තුළ සෑම ප්‍රදේශයකින්ම ගොවීන් 100 දෙනකුගේ සහභාගිත්වයෙන් යුතුව වැඩමුළු 4ක් පවත්වන ලදි.

- බස්නාහිර පළාතේ අඹේපුස්ස (ගම්පහ දිස්ත්‍රික්කය) - පෙබරවාරි 20
- ඌව පළාතේ බදුල්ල (බදුල්ල දිස්ත්‍රික්කය) - මැයි 30
- සබරගමුව පළාතේ බලංගොඩ (රත්නපුර දිස්ත්‍රික්කය) - ජූලි 29
- උතුරු මැද පළාතේ කැබිතිගොල්ලෑව (අනුරාධපුර දිස්ත්‍රික්කය) - දෙසැම්බර් 3

පාරම්පරික සටන් කලාවන් පිළිබඳ වැඩමුළුව

පාරම්පරික සටන් කලාවන් ඉදිරිපත් කරන්නන්ගේ සහභාගීත්වයෙන් රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙහි 2014 ඔක්තෝබර් 2 වන දින ඉහත වැඩමුළුව පවත්වන ලදි. මෙහි මූලික අරමුණ වූයේ පාරම්පරික සටන් කලාවන් ආශ්‍රිත තොරතුරු රැස්කිරීම් සහ ගවේශණය කිරීමත් අනාගත පරිහරණය උදෙසා සංරක්ෂණය වෙනුවෙන් එහි විද්‍යාත්මක පදනම විමර්ශනයට ලක්කිරීමත් ය. මෙකී වැඩමුළුවට සබරගමුව පළාතේ පාරම්පරික සටන් කලාවන් ආශ්‍රිත නිරූපණයන් කීපයක්ම ඇතුළත් විණි.

දේශීය දැනුම සහ සංවර්ධනය පිළිබඳ ප්‍රසිද්ධ සම්මන්ත්‍රණය

2014 නොවැම්බර් 10 සහ 14 අතර සංවිධානය කරන ලද ජාතික විද්‍යා සතියට සමගාමීව 50 දෙනකුට අධික සම්බන්ධවන්නන් පිරිසකගේ සහභාගිත්වයෙන් 2014 නොවැම්බර් 4 වන දින ජාතික විද්‍යා පදනමෙහි ශ්‍රවණාගාරයෙහි සම්මන්ත්‍රණයක් පවත්වනු ලැබිණි. දේශීය දැනුම් පද්ධතීන්ට අදාළව පහත සඳහන් ක්ෂේත්‍රයන් සම්මන්ත්‍රණයේ දී සාකච්ඡා කරනු ලැබිණි.

- දේශීය වෙදකම
- දේශීය ගෘහනිර්මාණ ශිල්පය
- දේශීය කෘෂිකර්මය සහ වාරිමාර්ග
- ශ්‍රී ලංකාවේ ලෝහ කර්මාන්තය

මෙම සම්මන්ත්‍රණයෙහි අරමුණ වූයේ අතීතයෙහි වසර 3000ට අධික කාලයක් පුරා ශ්‍රී ලාංකිකයන් විසින් භාවිත කරනු ලැබූ ඉහත කලාපයන්ට අදාළ දේශීය දැනුම සහ තාක්ෂණවේදයන් ගවේෂණය පිළිබඳ ජනතාව පොලඹවාලීම සහ පොදු දැනුවත්භාවයක් ඇතිකිරීමයි. මෙයින් ඇතැම් දැනුම් පද්ධතීන් සහ තාක්ෂණවේදයන් තිරසර සහ පරිසර හිතකාමී සංවර්ධන ක්‍රියාකාරකම් උදෙසා තවමත් භාවිත කළ හැකි ය.

විශේෂයෙන් සමාජ විද්‍යා සහ දේශීය දැනුම් පද්ධතීන්ට අදාළ කලාපයන් තුළ මානව සම්පත්හි ධාරිතා වර්ධනය ප්‍රවර්ධනය කිරීම

සමාජ විද්‍යා පර්යේෂණ සහ විස්තීර්ණ පර්යේෂණ යෝජනා සංවර්ධනය මැයෙන් පවත්වන ලද වැඩමුළුව - 2014 ජූලි 16-17.

සමාජ විද්‍යා පර්යේෂණ සහ විස්තීර්ණ පර්යේෂණ යෝජනා සංවර්ධනය මැයෙන් වැඩමුළුවක් 2014 ජූලි 16-17 දෙදින තුළ ජාතික විද්‍යා පදනමෙහි සාර්ථකව පවත්වනු ලැබිණි.

මෙකී වැඩමුළුවෙහි අරමුණ වූයේ විශේෂයෙන්ම සමාජ විද්‍යා ක්ෂේත්‍රයන් තුළ දේශීය සහ විදේශීය පර්යේෂණ අරමුදල් ප්‍රදාන සංවිධානයන්ගෙන් අරමුදල් සපයාගනු පිණිස සාර්ථක ලෙසින් පර්යේෂණ යෝජනාවන් සම්පාදනය කිරීම පිණිස පර්යේෂකයන් සහ විද්‍යාඥයන් පුහුණු කිරීමයි.

මෙකී වැඩසටහනට සහභාගි වූ සම්පත් දායකයන් වූයේ මහාචාර්ය ඉන්ද්‍රලාල් ද සිල්වා, මහාචාර්ය සී.අයි.ජී. ගුණවර්ධන, මහාචාර්ය ටියුඩර් සිල්වා, මහාචාර්ය එස්.එස්. කොළඹගේ සහ ආචාර්ය හේමාල් ගුණතිලක ය. මේ සියල්ලෝම සමාජ විද්‍යාවන් පිළිබඳ ජාතික විද්‍යා පදනමේ ක්‍රියාකාරී කමිටුවෙහි සාමාජිකයෝ වෙති. එකී වැඩමුළුවෙහි දී උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය, පර්යේෂණ ආයතන, රජයේ ආයතන මෙන්ම පුද්ගලික ආයතනයන්හි ද සහභාගි වන්නන් 35 දෙනකු පුහුණු කරන ලදි.

මෙකී වැඩසටහනට සැසිවාර 4ක් ඇතුළත් විණි.). අ. යහපත් පර්යේෂණ යෝජනාවක මූලික ලක්ෂණ සහ සංරචකයන් ආ. ගැටලු හඳුනාගැනීම න්‍යාය සහ ප්‍රතිපත්තිවල අදාළත්වය ඇ. සාහිත්‍යමය විමර්ශනය ඈ. ගුණාත්මක සහ ප්‍රමාණාත්මක පර්යේෂණයක් උදෙසා පර්යේෂණ ක්‍රමවේදයන් හඳුනාගැනීම සහ සංවර්ධනය සෑම සැසිවාරයකටම පසුව ප්‍රශ්න සහ පිළිතුරු වාරයක් මෙන්ම කණ්ඩායම් ක්‍රියාකාරකම් ද සිදුකරන ලදි. කණ්ඩායම් ක්‍රියාකාරකම් අතරතුර සහභාගි වන්නන් හට තමන්ගේම පර්යේෂණ යෝජනාවක් සැකසීම පිළිබඳ අත්දැකීම් ලබාගැනීමට ද ඒවා අදාළ යෝජනාවන් නිසි පරිදි සැකසීම සඳහා වන වැඩිදුර උපදෙස් අදහස් සැපයූ විද්වත් කණ්ඩායමට ඉදිරිපත් කිරීමට උපකාර කරන ලදි.

පර්යේෂණයන්හි ආචාරධර්ම පිළිබඳ වැඩමුළුව

පර්යේෂණයන්හි ආචාරධර්ම පිළිබඳ වැඩමුළුවක් 2014 නොවැම්බර් 27 වන දින විද්‍යාත්මක පර්යේෂණයන්ට අදාළ ආචාර ධාර්මික කරුණු පිළිබඳව පර්යේෂණයන්හි නිරත විද්‍යාඥයන් දැනුවත් කිරීම සහ පර්යේෂකයන් අතර යහපත් ආචාර ධාර්මික පැවැත්මක් ප්‍රවර්ධනය කරනු පිණිස ජාතික විද්‍යා පදනමෙහි ශ්‍රවණාගාරයෙහි පවත්වනු ලැබිණි. මෙම වැඩමුළුව අන්තර් ක්‍රියාකාරී ස්වරූපයෙන් පවත්වන ලද අතර පර්යේෂකයන් සහ විද්‍යාඥයන් 38 දෙනකු වැඩමුළුව තුළ දී පුහුණු කරනු ලැබිණි.

විද්‍යා අධ්‍යාපනය සහ ප්‍රවලිත කිරීම



විද්‍යා අධ්‍යාපනය සහ ප්‍රචලිත කිරීම

විද්‍යා අධ්‍යාපනය සහ ප්‍රචලිත කිරීම ශ්‍රී ලංකාවේ ජනතාව අතර විද්‍යාව හා තාක්ෂණය ප්‍රචලිත කිරීමේ අරමුණින් විද්‍යාව ප්‍රචලිත කිරීමේ ක්‍රියාකාරකම් සිදුකරනු ලබන අතර එහි දී ප්‍රධාන වශයෙන්ම අවධානය යොමු කරනු ලබන්නේ පාසල් දරුවන් කෙරෙහි ය. එනමුදු එහිදී පොදුජනයා සහ විද්‍යා ක්ෂේත්‍රයන්හි නිරත ප්‍රජාව ද මේ දිශානතියට යොමු කිරීම පිළිබඳ සලකා බැලේ. ඒ අනුව 2014 වසර තුළ දී පහත සඳහන් ක්‍රියාකාරකම් සිදුකරනු ලැබිණි.

විවිධ වූ ඉලක්කගත කණ්ඩායම් කරා ළඟාවීම පිණිස ජනසන්නිවේදන මාධ්‍යයන් භාවිත කිරීම

මිහිමඬල යනු පොදුජනයා ඉලක්ක කරගෙන විවිධ විද්‍යාත්මක මාතෘකා යටතේ සිංහල දෙමළ සහ ඉංග්‍රීසි බසින් නිෂ්පාදනය කරනු ලබනා කාලය මිනිත්තු විස්සක් විසිපහක් අතර වන කෙටි වීඩියෝ වැඩසටහන් වේ.

පහත සඳහන් මාතෘකා යටතේ වීඩියෝ පට නිෂ්පාදනය කිරීම ඉලක්ක කරමින් මිහිමඬල වැඩසටහනේ අදියර II 2014 වසරේ දී ආරම්භ කරනු ලැබූ අතර එය 2015 අග භාගයේ දී නිම කිරීමට නියමිත ය.

- සෞඛ්‍ය සහ ජීවන රටාව
- රොබෝ තාක්ෂණය සහ එහි අනාගතය
- කාලගුණ වෙනස්කම්වලට හුරුවීම
- විද්‍යාවේ සංවර්ධනය උදෙසා ජෛව අනුකරණය
- මුඛ සෞඛ්‍යය



සාධිකාරී විද්‍යාත්මක ප්‍රකාශනයන් ලබාගැනීමට ඇති ඉඩකඩ සහ එහි ප්‍රවේශයන් වර්ධනය කිරීම

විදුරාව විද්‍යා සඟරාව

1978 සිට විද්‍යා ප්‍රකාශනයක් ලෙස පළකරනු ලබනා විදුරාව විද්‍යා සඟරාව යනු විද්‍යා ක්ෂේත්‍රයෙහි පළ කරනු ලබන පැරණිතම විද්‍යා සඟරාවන්ගෙන් එකකි. විශේෂිත තේමාවක් යටතේ මෙම සඟරාවේ කලාපයන් ජනවාරි ජූනි සහ නොවැම්බර් (විශේෂ කලාපය) වශයෙන් පළ කරනු ලබයි. මෙම සඟරාව සිංහල දෙමළ හා ඉංග්‍රීසි වශයෙන් භාෂා ත්‍රිත්වයකින් පළකරනු ලැබේ.

31 වන වෙළුමේ පහත සඳහන් කලාපයන් 2014 වසර තුළ දී පළ කරන ලදි.

කලාප අංක 1. :

තේමාව: පුරාවිද්‍යාවේ මෑත කාලීන සොයාගැනීම් (සිංහල දෙමළ ඉංග්‍රීසි)



කලාප අංක 2. :

තේමාව: දෛනික ජීවිතය උදෙසා ගණිතය (සිංහල දෙමළ භාෂාවන්ගෙන්)

විශේෂ කලාපය :

තේමාව: මානව වර්ගයාගේ යහපැවැත්ම උදෙසා අභ්‍යාවකාශ තාක්ෂණය (සිංහල සහ දෙමළ භාෂාවන්ගෙන්)

මෙහි විශේෂ කලාපය (සිංහල සහ දෙමළ භාෂාවන්ගෙන්) 2014 ලෝක විද්‍යා දිනය වෙනුවෙන් පවත්වනු ලැබූ පාසල් වැඩසටහනට සහභාගි වූවන් අතර බෙදාහරින ලද අතර ජනවාරි කලාපය ජාතික විද්‍යා පදනමේ ලියාපදිංචි වී සිටින පාසල් විද්‍යා සංගම්, විද්‍යාතා මධ්‍යස්ථාන, සරසවි විද්‍යා පුස්තකාලයන්, පළාත් විද්‍යා සම්බන්ධීකාරකවරුන්, කලාප විද්‍යා අධ්‍යක්ෂකවරුන් අතර බෙදාහරින ලදි.

පුවත් ලිපිය

සම්මන්ත්‍රණ, වැඩමුළු සහ සමුළු වැනි ජාතික විද්‍යා පදනම විසින් සංවිධානය කරනු ලබන විවිධ ක්‍රියාකාරකම් පිළිබඳව තොරතුරු විද්‍යා පුවත් ලිපිය මගින් වාර්තා කරනු ලබයි. එසේම එමගින් ජාතික විද්‍යා පදනම විසින් පරිපාලනය කරනු ලබන පර්යේෂණ ප්‍රදාන සහ සංචාරක ප්‍රදාන පිළිබඳ තොරතුරු ද සපයනු ලැබේ.

ජනවාරි කලාපය මුද්‍රණය කර බෙදාහරිනු ලැබූ අතර අප්‍රේල් කලාපය මුද්‍රණය කිරීම සඳහා සූදානම්ව පවතී. එසේම ජූලි සහ ඔක්තෝබර් ඒකාබද්ධ කලාපය 2014 දෙසැම්බර් 31 වන දිනට සංගෘහිත කිරීමේ අදියරේ පවතී.

ළමුන් උදෙසා විද්‍යාව පිළිබඳ පොත් පිංචවල්

පාසල් දරුවන් අතර විද්‍යාත්මක සංකල්ප පිළිබඳ කියවීමේ සහ දැනුම වර්ධනය කිරීමේ අදහසින් තාක්ෂණ සහ පර්යේෂණ ගරු අමාත්‍යතුමාගේ සංකල්පයක් මත නව වැඩසටහනක් ආරම්භ කරන ලදි. මෙකී වැඩසටහන යටතේ විද්‍යාව පිළිබඳ පොත් සහ පොත් පිංචවල් මාලාවක් මුද්‍රණය කිරීමට සහ විශේෂයෙන්ම පහසුකම් අඩු පාසල් අතර බෙදා හැරීමට සැලසුම් කෙරේ. මෙකී වැඩසටහන යටතේ 2014 වසර තුළ පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කෙරිණි.

- *නව පොත්පත් :*

ජෛව තාක්ෂණය (ආචාර්ය සුනෙත් සූරියපතිරණ විසින් රචිත), අභ්‍යන්තර සහ බාහිර පරිසරයේ වායු දූෂණය (මහාචාර්ය රංජිත් මහානාම විසින් රචිත), අරුම පුදුම ගස්වැල් (ආචාර්ය සූධීර රන්වැල්ල විසින් රචිත) සහ පරමාණු තාක්ෂණය (මහාචාර්ය ප්‍රිනාත් ඩයස් විසින් රචිත) යන අත් පිටපත් 4 ප්‍රකාශනය සඳහා තෝරාගනු ලැබිණි. මේ කෘති හතරම සමාලෝචන මට්ටමේ පවතී.

❖ *ජනප්‍රිය කෘති නැවත මුද්‍රණය :*

වයි. පෙරෙල්මාන් විසින් රචිත ගණිතය විනෝදයක් කරගත හැකිය මැයෙන් වූ කෘතියේ සිංහල සංස්කරණය වූ ගණිත විනෝදයෙහි පිටපත් 5000 ක් නැවත මුද්‍රණය කර අධ්‍යාපන අමාත්‍යාංශයේ ගණිත ශාඛාව සමඟ සහයෝගයෙන් අඩුපහසුකම් සහිත පාසල් 2713 ක් අතරෙහි බෙදාහරින ලදි.

පාසල් විද්‍යා සමාජ වැඩසටහන

❖ 2014 වසර තුළ දී ජාතික විද්‍යා පදනමෙහි නව පාසල් විද්‍යා සමාජ 72ක් ලියාපදිංචි කරන ලදි. (සිංහල මාධ්‍යයෙන් 51යි දෙමළ මාධ්‍යයෙන් 21යි) වර්ෂ අවසානය වන විට ලියාපදිංචි කරන ලද පාසල් විද්‍යා සමාජ මුළු සංඛ්‍යාව 788 කි.

❖ ජාතික විද්‍යා පදනමෙහි ලියාපදිංචි වී සිටිනා පාසල් 14ක විද්‍යා දිනයන්හි දී දේශීය විද්‍යාඥයන්ගේ සේවාව ලබාදෙනු ලැබිණි.

❖ විද්‍යා නාට්‍ය පිළිබඳ වැඩමුළුව

බස්නාහිර සහ සබරගමුව පළාත්හි ජාතික විද්‍යා පදනමෙහි ලියාපදිංචි වී ඇති පාසල්වල විද්‍යා සහ නාට්‍ය ගුරුවරුන් 50 න් සමන්විත තෝරාගනු ලැබූ කණ්ඩායමක් පුහුණු කිරීම සඳහා දෙදිනක නේවාසික වැඩමුළුවක් මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ දී 2014 මැයි 29,30 දෙදින තුළ සංවිධානය කරන ලදි. මෙම වැඩමුළුව සංවිධානය කිරීමේ අරමුණ වූයේ විද්‍යා කටයුතු සන්නිවේදනය සම්බන්ධයෙන් නාට්‍යයකට ඉටුකළ හැකි වැදගත් කාර්යභාරය පිළිබඳ ගුරුවරුන් තුළ දැනුවත්භාවය ඇති කිරීමත් විද්‍යා නාට්‍ය සඳහා තිරරචනය පිළිබඳ දැනුම වර්ධනය කිරීමත් ය. මෙහිදී ආචාර්ය ජයන්ත වත්තෙවිදානගේ මහතා ජයලාල් රෝහණ මහතා තුසිත මලලසේකර මහතා සහ සුගත් වටගෙදර මහතා සම්පත් දායකයන් ලෙස සේවය සැපයූවෝ ය.

❖ ලියාපදිංචි කරනු ලැබූ පාසල්හි සිසුන් සහ ගුරුවරුන් හට ජාතික විද්‍යා පදනම විසින් සංවිධානය කරනු ලබන අන්තර් පාඨශාලීය විද්‍යා සමාජ තරගය, පර්යේෂණ ආයතනයන්, සරසවි සහ කර්මාන්ත නැරඹුම් චාරිකා, විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරගය, ශ්‍රී ලංකා විද්‍යා සහ ඉංජිනේරු පොළ සහ 2014 ලෝක විද්‍යා දින පාසල් වැඩසටහන් වැනි වැඩසටහන්වලට සහභාගි වීමට අවස්ථාව සලසනු ලැබිණි.

අන්තර් පාඨශාලීය විද්‍යා සමාජ අතර තරග 2014

2014 වසරේ සැප්තැම්බර් ඔක්තෝබර් කාලය අතරතුර 2014 අන්තර් පාඨශාලීය විද්‍යා සමාජ අතර තරග සංවිධානය කරනු ලැබිණි. තරග 7ක් (කෙටි විද්‍යා නාට්‍ය, විද්‍යා චරිත රංගනයන්, විරිඳු ගායනා, පෝස්ටර් චිත්‍ර, අභ්‍යාවකාශ ආකෘතීන්, ඩිජිටල් කතන්දර කීම සහ විද්‍යා ප්‍රබන්ධ) මානව වර්ගයාගේ යහපැවැත්ම උදෙසා විද්‍යා තාක්ෂණය යන තේමාව යටතේ ජාතික විද්‍යා පදනමේ ලියාපදිංචිය ලැබ සිටින පාසල් විද්‍යා සමාජ අතරේ පවත්වන ලදි.

තරගාවලියේ පළමු වටය (නාට්‍ය චරිත රංගන සහ විරිඳු) කොළඹ මහනුවර සහ අනුරාධපුරයෙහි පවත්වනු ලැබිණි. 2014 ඔක්තෝබර් 17 සහ 18 දෙදින තුළ මරදාන මහා බෝධී ශාලාවේ දී අවසන් වටය පවත්වනු ලැබිණි.

ලියාපදිංචි පාසල් විද්‍යා සමාජයන්හි ගුරුවරුන් උදෙසා ද තරගයක් සංවිධානය කරන ලද අතර එය පාසල් දරුවන් අතරෙහි විද්‍යාව ප්‍රවර්ධනය කිරීම උදෙසා ගුරු ප්‍රණාම මැයෙන් පවත්වනු ලැබිණි.

අන්තර් පාඨශාලීය විද්‍යා සමාජ අතර තරගය 2014හි ජයග්‍රාහකයන් 2014 නොවැම්බර් 14 දින බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ ශාලාවේ දී පැවති ලෝක විද්‍යා දින පාසල් වැඩසටහන තුළින් අභිනන්දනයට ලක් කෙරිණි.

ලෝක විද්‍යා දින පාසල් වැඩසටහන 2014

මානව වර්ගයාගේ යහපැවැත්ම උදෙසා අභ්‍යාවකාශ තාක්ෂණය යන තේමාව යටතේ 2014 නොවැම්බර් 10 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ ප්‍රධාන ශාලාවේ දී 2014 ලෝක විද්‍යා දින පාසල් වැඩසටහන පවත්වනු ලැබිණි. ජාතික විද්‍යා පදනමෙහි ලියාපදිංචිය ලැබ සිටින පාසල් සිසුන් සහ ගුරුවරුන් මෙන්ම ජාතික විද්‍යා පදනම මගින් පවත්වනු ලැබූ තරගයන්හි ජයග්‍රාහකයන්, විද්‍යාඥයන්, විද්වතුන් සහ මාධ්‍යකරුවන් හට මේ අවස්ථාවට සහභාගි වීමට ආරාධනය කරනු ලැබූ අතර 1600 දෙනකු පමණ ඒ අනුව මීට සහභාගි විය. මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ගරු තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යවරයා සහභාගි වූ අතර අමෙරිකා එක්සත් ජනපදයේ නාසා ආයතනයෙහි තාක්ෂණය පිළිබඳ කැලිෆෝනියා ආයතනයේ අධෝරක්ත ඡායාරූප අනාවරණ මධ්‍යස්ථානයෙහි අධ්‍යක්ෂක ආචාර්ය සරත් ගුණපාල විසින් මානව වර්ගයාගේ යහපැවැත්ම උදෙසා අභ්‍යාවකාශ තාක්ෂණය මැයෙන් ප්‍රධාන දේශනය පවත්වනු ලැබිණි.

ලෝක විද්‍යා දින වැඩසටහන යටතේ පහත තරගයන්හි ජයග්‍රාහකයන් සම්මානයට පාත්‍ර කෙරිණි.

- අන්තර් පාඨශාලීය විද්‍යා සමාජ තරග
- පාසල් සිසුන් අතරෙහි විද්‍යාව ප්‍රවර්ධනය කිරීම උදෙසා ගුරු සම්මාන
- විද්‍යාව ප්‍රචලිත කිරීම උදෙසා මහාචාර්ය එම්.ටී.එම්. ජින්රි අනුස්මරණ සම්මානය
- ස්ටාර් රේටිං වැඩසටහන (ජාතික විද්‍යා පදනමෙහි ලියාපදිංචිය ලැබ සිටින පාසල් විද්‍යා සමාජ අතරින් හොඳම විද්‍යා සමාජය)
- විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරගය සහ ශ්‍රී ලංකා විද්‍යා සහ ඉංජිනේරු පොළ
- ජාතික විද්‍යා පදනමෙහි සරසවි විද්‍යා සමාජ වැඩසටහන යටතේ ලියාපදිංචිය ලැබ සිටින උපාධි අපේක්ෂකයන් සඳහා වන ඩිජිටල් කතන්දර කීමේ තරගය

සරසවි විද්‍යා සමාජ වැඩසටහන 2014

සරසවි විද්‍යා සමාජ වැඩසටහනෙහි අරමුණු වනුයේ ජාතික ක්‍රියාකාරකම්හි සිය දැනුම සහ කුසලතා වර්ධනය කරගනු පිණිස විද්‍යා උපාධි අපේක්ෂකයන්ට වේදිකාවක් නිර්මාණය කිරීම, උපාධි අපේක්ෂකයන්ගේ විද්‍යා සන්නිවේදන සහ ලේඛන කුසලතා වර්ධනය කිරීම, ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගේ යහපැවැත්ම උදෙසා විද්‍යාව ප්‍රචලිත කිරීම උදෙසා විද්‍යා උපාධි අපේක්ෂකයන්ගේ දැනුම භාවිත කිරීම, සරසවි ප්‍රවේශයට සුදුසුකම් ලැබූ උසස්පෙළ සිසුන් අතරෙහි විද්‍යාව පිළිබඳ පිළිගැනීම වර්ධනය කිරීම සහ සරසවි උපාධි අපේක්ෂකයන් සහ පාසල් සිසුන් අතරෙහි විද්‍යාව ඉගෙනීම සඳහා පහසුකම් සැපයීම වේ.

ජංගම විද්‍යා ප්‍රදර්ශන බස් රථය

2014 වසරේ අවසාන භාගය වන විට ජාතික විද්‍යා පදනමෙහි ලියාපදිංචි වී සිටි සරසවි විද්‍යා සමාජ සංඛ්‍යාව 29කි. වැඩසටහන දියත් කිරීමේ නිල අවස්ථාව 2014 මාර්තු 19 දින පවත්වනු ලැබිණි. 2014 අගෝස්තු 09 වන දින ලියාපදිංචිය ලැබූ සරසවි විද්‍යා සමාජයන්හි උපාධි අපේක්ෂකයන් උදෙසා ඩිජිටල් කතන්දර කීමේ වැඩමුළුවක් පවත්වන ලද අතර ඉන් පසු ඩිජිටල් කතන්තර කීමේ තරගාවලියක් පවත්වනු ලැබිණි. එම තරගාවලියේ ජයග්‍රාහකයන් 2014 ලෝක විද්‍යා දින වැඩසටහනේ දී ඇගයුමට පාත්‍ර කෙරිණි.

තාක්ෂණ හා පර්යේෂණ ගරු අමාත්‍යවරයාගේ මගපෙන්වීම යටතේ ජංගම විද්‍යා ප්‍රදර්ශන කටයුතු සඳහා භාවිත කිරීම පිණිස බස් රථයක් මිලට ගනු වස් ව්‍යාපෘති යෝජනාවක් ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිණි. මෙම බස් රථය පාසල සිසුන් හට අත්දැකීම් බහුල පුද්ගලයන් අතින් මූලික විද්‍යාත්මක සංකල්පයන් ඉගෙන ගැනීමට අවස්ථාව සලසාදීමේ මධ්‍යස්ථානයක් ලෙස සේවය සලසා ගත හැකිවනු ඇතැයි අපේක්ෂා කෙරේ. එසේම පෙරළා එමගින් ඔවුන්ගේ විමර්ශනාත්මක හැකියාව නිර්මාණශීලිත්වය හා නවෝත්පාදන හැකියාවන් වර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. එසේම මෙමගින් විද්‍යාව ප්‍රචලිත කිරීමට දායකත්වයක් සැපයෙනු ඇති අතර සමාජය තුළ විද්‍යා සංස්කෘතියක් වර්ධනය කෙරෙනු ඇත.

විද්‍යාව ප්‍රචලිත කිරීම උදෙසා තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශය යටතේ වන ආයතනයන් සමඟ සහයෝගයෙන් වැඩ කිරීම

විද්‍යා වැඩසටහනේ තුරුණු නියමුවෝ

2013 වසරේ අ.පොෂ. උපෙළ විභාගයේ ඉහළ ප්‍රතිඵල ගත් සිසුන් කණ්ඩායමක් උදෙසා ප්‍රථම වතාවට විද්‍යාවේ තුරුණු නියමුවෝ මැයෙන් නව වැඩසටහනක් හඳුන්වා දෙනු ලැබිණි. මෙම වැඩසටහනේ අරමුණු වූයේ සිසුන් හට සිය නිර්මාණශීලී හැකියාවන් තියුණු කරගැනීමට සහ සහජ හැකියාවන් වර්ධනය කරගැනීමට අවස්ථාවක් සැලසීම භෞතික විද්‍යා මෙන්ම ජීව විද්‍යා ධාරාවන් දෙකෙහිම පොදු විද්‍යා හරයාත්මක කලාපයන් තුළ පුළුල් දැනුමක් ලබාදීම, වාර්තාකරණ සහ ඉදිරිපත් කිරීමේ කුසලතා ඇතුළුව සියුම් කුසලතා වර්ධනය කිරීම සහ කණ්ඩායම් හැඟීම ප්‍රවර්ධනය කිරීම සහ සහයෝගී විද්‍යා වැඩසටහන් තුළින් තම පළාත්හි අඩු පහසුකම් සහිත පාසල්වල සිසුන් හට උපකාර කිරීම සඳහා පුහුණු කරන ලද සිසුන්ගේ දායකත්වය ලබාගැනීම වේ.

වැඩසටහනට සහභාගි වූ සිසුන්ගේ සංඛ්‍යාව 23 වන අතර මැයි සිට අගෝස්තු දක්වා මාස හතරක කාලයක් පුරා වැඩසටහන පවත්වනු ලැබිණි. තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශය යටතේ ඇතැම් ආයතනයන් වෙත සංචාර 11 ක් ද විද්‍යාවේ විවිධ පාර්ශ්වයන් පිළිබඳ දේශන/වැඩමුළු 20ක් සහ ඒවායේ භාවිතයන් පිළිබඳව වැඩසටහන් පවත්වනු ලැබිණි..

තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශයේ සහයෝගයෙන් විද්‍යා දිනයන් පැවැත්වීම

පාසල් සිසුන් 2000ගේ සහභාගිත්වයෙන් තෝරාගත් පාසල් පහක තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශයේ සහයෝග යෙන් විද්‍යා දිනයන් පහක් සංවිධානය කරනු ලැබිණි. මෙකී විද්‍යා දින වැඩසටහන් සෑම එකකම සාමාන්‍ය වශයෙන් විද්‍යා දේශන තුනක් පවත්වනු ලැබිණි. එකී ක්‍රියාකාරකම සංවිධානය කරනු පිණිස පාසලේ විද්‍යා සංගමයට මූල්‍ය සහාය සහ අවශ්‍ය මඟ පෙන්වීම සපයනු ලැබිණි.

අනෙකුත් ආයතන - සංවිධාන විසින් පවත්වනු ලබන විද්‍යා අධ්‍යාපන සහ විද්‍යාව ප්‍රචලිත කිරීමේ ක්‍රියාකාරකම් සඳහා අනුග්‍රහය සැපයීම පිණිස ආධාර යෝජනා ක්‍රම

ජාතික විද්‍යා පදනමෙහි ලියාපදිංචිව සිටින පාසල්, පර්යේෂණ සංවිධාන විශ්වවිද්‍යාල සහ තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශය යටතේ වන ආයතන ඇතුළුව අනෙකුත් ආයතන/සංවිධාන විසින් සංවිධානය කරනු ලබන විද්‍යා ක්‍රියාකාරකම් සඳහා මූල්‍ය ආධාර සැපයීමේ අරමුණින් 2013 වසර තුළ මෙකී යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලැබිණි.

මෙකී යෝජනා ක්‍රමය යටතේ සමාලෝචනයට ලක්වන වසර තුළ කෑගල්ල ශාන්ත මේරි විද්‍යාලයේ තාරකා විද්‍යා පුහුණු මධ්‍යස්ථානයක් ස්ථාපිත කරනු පිණිස රු. මිලියනයක් වෙන් කරනු ලැබිණි. එම ව්‍යාපෘතිය ආරම්භ කරනු පිණිස පළමු වාරිකය වශයෙන් රු. ලක්ෂ හතරක් සපයනු ලැබිණි.

ජාතික මූලික අධ්‍යාපන ආයතනය මගින් දියත් කළ විද්‍යා සිංහල යූටියුබ් නාළිකාවේ විදුණුන දසුන වැඩසටහන සඳහා වන දෙවන වාරිකය (රු. 506400) එකී ක්‍රියාකාරකම අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා මුදාහරිනු ලැබිණි. මෙකී වැඩසටහන 2013 වසරේ අවසන් කාර්තුවේ දී ආරම්භ කරනු ලබන අතර අනුමත කරන ලද මුළු ප්‍රමාණය රු. 896,000කි.

ශ්‍රී ලංකා ඔලිම්පික් ෆෙඩරේෂනයට සහාය දීම සහ ජාත්‍යන්තර ඔලිම්පික් තරගාවලිය සඳහා සහභාගි වීම උදෙසා මූල්‍ය ප්‍රදානයන්

පහත සඳහන් ජාත්‍යන්තර ඔලිම්පික් තරගවලට සහභාගීවීම සඳහා ශ්‍රී ලාංකික කණ්ඩායම්වලට ජාතික විද්‍යා පදනම මගින් අනුග්‍රහය සපයනු ලැබිණි. ජාත්‍යන්තර සම්මාන ලැබූ ලැයිස්තුව පහත දැක්වේ.

අංකය	ජාත්‍යන්තර ඔලිම්පියාඩ් තරගාවලිය	ශ්‍රී ලංකා සිසුන් විසින් දිනාගන්නා ලද ජාත්‍යන්තර ත්‍යාග
01-	සිංගප්පූරුවේ පැවති 15වන ආසියානු භෞතික විද්‍යා ඔලිම්පියාඩ් තරගය	රිදී පදක්කම් 1 යි ගෞරව සම්මාන 3යි.
02-	තායිවානයේ පවත්වන ලද 2014 ජාත්‍යන්තර තොරතුරු තාක්ෂණ ඔලිම්පියාඩ් තරගාවලිය	
03-	රුමේනියාවේ පවත්වන ලද තාරකා විද්‍යා සහ තාරකා භෞතික විද්‍යාව පිළිබඳ අටවන ජාත්‍යන්තර ඔලිම්පියාඩ් තරගාවලිය	ලෝකඩ පදක්කම් 1යි.
04-	දකුණු කොරියාවේ පවත්වන ලද 2014 ජාත්‍යන්තර ගණිත තරගාවලිය වයස් මට්ටම් II (14 පහළ) - ඒකල තනි කණ්ඩායම් වයස් මට්ටම් III (17 පහළ) කණ්ඩායම් දෙකයි.	ලෝකඩ පදක්කම් 2යි ගෞරව සම්මාන 1යි. කණ්ඩායම් දෙක සඳහා ලෝකඩ පදක්කම් 2යි
05-	ඉන්දුනීසියාවේ පවත්වන ලද ජාත්‍යන්තර ගණිත සහ විද්‍යා ඔලිම්පියාඩ් තරගාවලිය	රන් පදක්කම් 2යි රිදී පදක්කම් 2යි ලෝකඩ පදක්කම් 1යි.

නැනෝ තාක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්

වර්ෂය තුළ දී විදාතා මධ්‍යස්ථාන විසින් සංවිධානය කරන ලද නැනෝ තාක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් හතක් පැවැත්වීමට සම්පත් පුද්ගලයන් සපයනු ලැබිණි.

පාසල් සහ පර්යේෂණ ආයතන/කර්මාන්ත/විශ්ව විද්‍යාල අතර අන්තර් ක්‍රියාකාරිත්වයන් සඳහා පහසුකම් සැපයීම

කාර්මික තාක්ෂණ විද්‍යා ආයතනය වෙතට (පාසල් දෙකකින් සිසුන් 60 දෙනකු) සංචාරයන් දෙකක් මෙම වැඩසටහන යටතේ සංවිධානය කරන ලද අතර ජාත්‍යන්තර ඔලිම්පියාඩ් තරගාවලියේ සහ ජාතික විද්‍යා පදනම මගින් සංවිධානය කරනු ලබන විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරගාවලියේ සම්මාන සහ සහතික දිනාගත් පාසල් සිසුන් 82 සඳහා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ දී වැඩසටහන් තුනක් සංවිධානය කරනු ලැබිණි.

පහසුකම් අඩු පවුල්වල පාසල් සිසුන් සඳහා 'විද්‍යා ගණිත අත්වැල

තාක්ෂණ සහ පර්යේෂණ අමාත්‍යාංශයේ මාර්ගෝපදේශය යටතේ, 2014 අ.පො.ස සා.පෙළ විභාගය ඉලක්ක කරමින් අව වරප්‍රසාදිත පවුල්වල පාසල් සිසුන් 1200ට වැඩි පිරිසක් උදෙසා විද්‍යා සහ ගණිත අධ්‍යාපන වැඩසටහන් 9ක් ජාතික විද්‍යා පදනම මගින් පහත සඳහන් පරිදි සංවිධානය කරන ලදි.

සිරි පැරකුම්බා විද්‍යාලය, රාජගිරිය	සැප්තැම්බර් 13-14
බුද්ධඝෝෂ විද්‍යාලය, කළුබෝවිල	ඔක්තෝබර් 2-3
ශාන්ත මේරි විද්‍යාලය, දෙහිවල	ඔක්තෝබර් 2-3
ධර්මසේන ආටිගල බාලිකා විද්‍යාලය, කැස්බෑව	ඔක්තෝබර් 4-5
ශාන්ත ලුසියා විද්‍යාලය, කොටහේන, කොළඹ 13	ඔක්තෝබර් 14-16
ආනන්ද විද්‍යාලය, මෝදර	ඔක්තෝබර් 18-19
ධර්මාශෝක විද්‍යාලය, කඳාන	ඔක්තෝබර් 18-19
මහසෙන්පුර මහා විද්‍යාලය, තිස්සමහාරාමය	ඔක්තෝබර් 25-26
ගඟේයාය විද්‍යාලය, තිස්සමහාරාමය	ඔක්තෝබර් 25-26

මෙකී වැඩසටහන් සඳහා සම්පත් පුද්ගලයන් ලෙස කොළඹ විශ්ව විද්‍යාලයේ සහ රුහුණු විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂකයෝ සේවය සැපයූහ.

අදාළ වැඩසටහන් තුළ දී සහභාගි වූවන් හට සාමාන්‍ය පෙළ ගණිතය සහ විද්‍යා ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පසුගිය ප්‍රශ්න පත්‍ර සපයන ලද අතර විෂයයන්හි අසීරු කොටස් පැහැදිලි කරන ලදි. මෙහිදී දුර්වල සිසුන් සඳහා විශේෂ අවධානයක් යොමු කෙරිණි.

විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරගාවලිය

රටෙහි පාසල් සිසුන් අතර නවෝත්පාදන චින්තනය, නිර්මාණශීලීත්වය සහ විමර්ශනාත්මක හැකියාව වර්ධනය කිරීමේ අරමුණින් වාර්ෂිකව විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරගාවලිය සංවිධානය කරනු ලැබේ. මෙහි දී වැඩමුළු මාලාවක් හරහා විද්‍යාත්මක ක්‍රමවේදයන් අනුගමනය කරමින් විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති පැවැත්වීම පිළිබඳව පාසල් සිසුන්ට සහ ව්‍යාපෘති අධීක්ෂණය කරනා ගුරුවරුනට මාර්ගෝපදේශයන් සපයනු ලැබේ.

විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරගාවලිය 2013 ඉතා සාර්ථක ලෙස 2014 ජනවාරි 30 සහ 31 දෙදින තුළ ජාතික විද්‍යා පදනමෙහි පවත්වනු ලැබිණි. එහි දී පාසල් සිසුන් විසින් ව්‍යාපෘති 25ක් ඉදිරිපත් කරන ලදි. 2014 ශ්‍රී ලංකා විද්‍යා සහ ඉංජිනේරු පොළෙහි සහභාගිත්වය පිණිස ඉන් හොඳම ව්‍යාපෘති 10 තෝරාගනු ලැබිණි. මෙම ව්‍යාපෘති 10න් එකක් ඉන්ටෙල් විද්‍යා සහ ඉංජිනේරු පොළ කේවළ පළමු ස්ථානය දිනාගත් අතර තවත් ව්‍යාපෘති 4ක් විසින් ඉන්ටෙල් විද්‍යා සහ ඉංජිනේරු පොළ කලාප සම්මාන දිනාගන්නා ලදි. මෙහිදී සම්මාන ප්‍රදානය සිදුකරන ලද්දේ ඇමරිකා එක්සත් ජනපදයේ 2014 ඉන්ටෙල් විද්‍යා සහ ඉංජිනේරු පොළෙහි රිකොෆ් ඇමෙරිකාස් කෝපරේෂන් සහ ඇමරිකානු කාලගුණ විද්‍යා සමාජය, යාලේ විද්‍යා සහ ඉංජිනේරු සංගමය, පරිගණක විද්‍යාව පිළිබඳ ඉන්ටෙල් එක්සලන්ස් ආයතනය විසිනි.

ශ්‍රී ලංකා විද්‍යා සහ ඉංජිනේරු පොළ

අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉන්ටෙල් ශ්‍රී ලංකා ආයතනයෙහි සහයෝගය සහිතව ජාතික විද්‍යා පදනම සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් වාර්ෂිකව ශ්‍රී ලංකා විද්‍යා සහ ඉංජිනේරු පොළ සංවිධානය කරනු ලැබේ. මෙහි පළමු පොළ සංවිධානය කරන ලද්දේ 2008 වසරෙහි ය. වසරේ කණිෂ්ට නව නිපැයුම්කරු තරගයෙන් තෝරාගන්නා

ලද නව නිපැයුම් 10ක සහ 2013 විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරගාවලියෙන් තෝරාගන්නා ලද හොඳම පර්යේෂණ ව්‍යාපෘති 10හි සහභාගිත්වයෙන් ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයෙහි 2014 පෙබරවාරි 25 වන දින 2014 ශ්‍රී ලංකා විද්‍යා හා ඉංජිනේරු පොළ පවත්වන ලදි. 2014 ශ්‍රී ලංකා විද්‍යා හා ඉංජිනේරු පොළෙහි ජයග්‍රාහකයන් ලෙස ඒකල ව්‍යාපෘති දෙකක් (වසරේ තරුණ නිපැයුම්කාර තරගකරුවන්) සහ එක් කණ්ඩායම් ව්‍යාපෘතියක් (විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති තරගාවලිය) තෝරාගන්නා ලදි. ඇමරිකා එක්සත් ජනපදයේ ලොස් ඇන්ජලීස් නුවර 2014 මැයි 11-16 අතර පවත්වන ලද ලෝකයේ විශාලතම පූර්ව විද්‍යාල විද්‍යා තරගාවලිය නියෝජනය කිරීම පිණිස ඔවුනට අවස්ථාව සලසන ලදි. මෙය පවත්වන ලද්දේ ලෝකයේ ඉහළින්ම නැඟි එන තරුණ විද්‍යාඥයන් ඉංජිනේරුවන් ගණිතඥයන් 1800ට ආසන්න ප්‍රමාණයකගේ සහභාගිත්වයෙනි. මෙකී ව්‍යාපෘති තුන අතරින් එක් ව්‍යාපෘතියක් විදුලි සහ කාර්මික ඉංජිනේරු ගණය යටතේ දෙවන තෑගය දිනාගත් අතර තවත් ව්‍යාපෘතියක් පරිගණක විද්‍යා ගණය යටතේ සිව්වන තෑගය දිනාගති. පළමුවෙන් සඳහන් කරන ලද ව්‍යාපෘතිය ඇමෙරිකානු බුද්ධිමය දේපළ නීති සංවිධානය සහ ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ එක්සත් ජනපද නියෝජිත ආයතනයෙන් විශේෂ සම්මාන දෙකක් දිනාගැනීමට සමත් විය.

විද්‍යා හා තාක්ෂණික යටිතල ව්‍යුහය, හැකියාව සහ සහභාගීත්වය ගොඩනැංවීම

විද්‍යා හා තාක්ෂණික යටිතල ව්‍යුහය, හැකියාව සහ සහභාගීත්වය ගොඩනැංවීම

ජාතික විද්‍යා පදනමේ තවත් කාර්යයක් වන්නේ ජාත්‍යන්තර සබඳතා පවත්වා ගැනීම වන අතර මෙහිදී අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ සහ විදේශය තුළ සිටින විද්‍යාඥයින් අතර විද්‍යා තොරතුරු හුවමාරු කර ගැනීම වේ. ඒ අනුව වෙනත් රටවල පුද්ගලයන්, සංගම් සහ ආයතන සමඟ සබඳතා පවත්වා ගැනීමේ කාර්යභාර්ය අංශය මඟින් තවදුරටත් අඛණ්ඩව සිදු වූ අතර ශ්‍රී ලංකාවේ විද්‍යාඥයින්ට ජාත්‍යන්තර වශයෙන් අනන්‍යතාවයක් ගොඩනැංවීමේ කටයුතු ප්‍රවර්ධනයද ඒ අතර විය. 2014 වර්ෂය තුළදී ඉටු කරනු ලැබූ ක්‍රියාකාරකම් පහත පරිදිය.

තිරසාර ජල පාලනය සඳහා ශාක ආවරණ තාක්ෂණය (Phytocap Technology) පිළිබඳ වැඩමුළුව

ජාතික විද්‍යා ආයතනය විසින් ද්‍රව්‍ය ස්‍රාව සහ සම්පත් ඒකාබද්ධව කළමනාකරණය කිරීම සඳහා වූ එක්සත් ජාතීන්ගේ විශ්ව විද්‍යාල ආයතනය (UN- FLORES), එක්සත් ජනපදයේ නිව් ජර්සි ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි (NJIT), මෙල්බර්න් විශ්ව විද්‍යාලය (UoM) සහ ශ්‍රී ලංකාවේ විවෘත විශ්ව විද්‍යාලයේ සහයෝගය ඇතුව මැයි 29 -30 දක්වා ජාතික විද්‍යා ආයතනයේ දී තිරසාර ජල පාලනය සඳහා ශාක ආවරණ තාක්ෂණය (Phytocap Technology) පිළිබඳ කලාපීය වැඩමුළුවක් සංවිධානය කළ අතර මේ සඳහා කලාපීය රටවල් එකොළහක නියෝජිතයන් සහභාගී විය. ඒ අනුව විවිධ ආයතන නියෝජනය කරන විදේශීය ක්‍රියාකරුවන් දහනව දෙනෙකු සහ දේශීය ක්‍රියාකරුවන් දහසය දෙනෙකු සහභාගී විය.

යෝජිත වැඩමුළුවේ ප්‍රධාන අරමුණ වූයේ ශාක ආවරණ තාක්ෂණයට (Phytocap Technology) අදාළ විද්‍යාත්මක පදනම ප්‍රාදේශීය රාජ්‍යයන් වෙත හඳුන්වාදීමත් ඉන්දියානු උප මහාද්වීපය තුල පිහිටි සියළුම ජාතීන් සඳහා සන අපද්‍රව්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීම පිණිස ප්‍රායෝගික සහ ආර්ථික විකල්පයක් ලෙස ශාක ආවරණ තාක්ෂණය යොදා ගැනීමත් පිළිබඳව වේ.

කෘෂිකාර්මික හරිතාගාර වායු පිළිබඳ ගෝලීය පර්යේෂණ සන්ධානය

පර්යේෂණ, සංවර්ධනය සහ තාක්ෂණික ක්‍රමවේද ව්‍යාප්තිය පිළිබඳ ක්‍රියා කිරීම සහ හරිතාගාර වායු විමෝචන වීමේ වැඩිවීමකින් තොරව වැඩිපුර ආහාර හා දේශගුණිකව ඔරොත්තු දිය හැකි ආහාර පද්ධතියේ වර්ධනය කිරීමේ ක්‍රම භාවිතා කිරීම් වලට අදාළව ක්‍රියාකාරී කෘෂිකාර්මික හරිතාගාර වායු පිළිබඳ ගෝලීය පර්යේෂණ සන්ධානයේ කේන්ද්‍රස්ථානය ජාතික විද්‍යා පදනම වේ.

ඉන්දුනීසියාවේ යෝගකර්තා වල නොවැම්බර් 14 සිට 15 දක්වා පැවති කෘෂිකාර්මික හරිතාගාර වායු පිළිබඳ ගෝලීය පර්යේෂණ සන්ධානයේ වාර්ෂික රැස්වීමට පමණක් නොව සත්ව නිෂ්පාදන සමිතීන් වල ආසියානු - ඕස්ට්‍රේලියානු සංගමයේ (AAAP) සම්මේලනය සඳහාද පශු සම්පත් පර්යේෂණ කණ්ඩායමේ සම්බන්ධතා විද්‍යාඥ මහාචාර්ය තක්ෂිලා සේරසිංහ සහභාගී විය.

ශ්‍රී ලාංකික විද්‍යාඥයින්ගේ ගෝලීය සංසඳය

2011 දී ශ්‍රී ලංකාවේ පැවති ගෝලීය සංසදයේදී ඉදිරිපත් වූ නිර්දේශ මත පදනම්ව ව්‍යාපෘති විසි පහක් ආරම්භ කරන ලදී. මේවායින් ඇතැම් ව්‍යාපෘතිවල වැඩකටයුතු අවසන් කොට තිබේ. සම්පූර්ණ වූ ව්‍යාපෘතිවල තොරතුරු පහත දක්වා තිබේ.

- ❖ ඉහළ කාර්යක්ෂමතාවයකින් යුතු ජාන තාක්ෂණික පහසුකම් ස්ථාපිත කිරීම - ඉහළ කාර්යක්ෂමතාවයකින් යුතු ජාන තාක්ෂණය හා සම්බන්ධ පර්යේෂණ සහ පරීක්ෂණ පැවැත්වීම පිණිස මෙම ව්‍යාපෘතිය යටතේ 'ක්‍රිඩෙන්ස් ජිනෝමික්ස්' සමාගම (Credence Genomics Company) ස්ථාපිත කරන ලදී.

- ❖ ශාක සහ සත්ත්ව ඒක ගුණික වර්ණදේහ කට්ටල (plant and animal genomes) වල අනුක්‍රමික විශ්ලේෂණය පිණිස වූ ගෝලීය අවශ්‍යතාවය සපුරාලීම පිණිස ප්‍රවේණි ක්ෂේත්‍ර විශ්ලේෂණ සේවාවක් (Bioinformatics service) ස්ථාපිත කිරීම - මෙම සේවාව සාර්ථකව ආරම්භ වූ අතර 'ක්‍රිඩෙන්ස් ජිනෝමික්ස්' සමාගම (Credence Genomics Company) මඟින් ක්‍රියාත්මක කරමින් පවතී.

- ❖ පුනර්ජනනීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ මැනිපල් ආයතනය (Manipal Institute of Regenerative Medicine) සමඟ එක් වී ස්කන්ධ සරල ජීව විද්‍යාව (Stem Cell Biology) පිළිබඳ සහයෝගීතා විද්‍යාපති පාඨමාලාවක් (M'Sc' Course) ආරම්භ වීම - 2013 වර්ෂයේ අගෝස්තු මාසයේදී කොළඹ විශ්ව විද්‍යාලීය වෛද්‍ය පීඨයේදී මෙම විද්‍යාපති පාඨමාලාව (M' Sc' Course) ආරම්භ විය. එය ද්විවාර්ෂික පාඨමාලාවක් වේ. කොළඹ විශ්ව විද්‍යාලයේත් පුනර්ජනනීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ මැනිපල් ආයතනයේත් අධීක්ෂණය යටතේ කොළඹ විශ්ව විද්‍යාලීය වෛද්‍ය පීඨයේ ජාන විද්‍යා ඒකකය මඟින් මෙම පාඨමාලාව පවත්වනු ලැබේ. මෙහි පළමු කණ්ඩායම 2015 අගෝස්තු මාසයේදී උපාධිය අවසන් කිරීමට අපේක්ෂිතය. එසේම 2015 අගෝස්තු මාසයේදී ආරම්භ වන පාඨමාලාවට ඇතුළත් වීමට නියමිත මෙහි දෙවන කණ්ඩායම දැනටමත් තොර අවසන් කොට තිබේ. මෙම පාඨමාලාව ආරම්භ වීමත් සමඟ ශ්‍රී ලංකාව තුළ ස්කන්ධ සරල ජීව විද්‍යාව (Stem Cell Biology) පිළිබඳ පර්යේෂණ කණ්ඩායම ස්ථාපිත විය. ඉදිරි වර්ෂ වලදී මෙම පර්යේෂණ කණ්ඩායම විසින් නව සොයාගැනීම් සිදු කරනු ඇති බවට අපේක්ෂා කෙරේ.

- ❖ ප්‍රතිදේහ පදනම් එන්නත් සංවර්ධන පහසුකම් ස්ථාපිත කිරීමේ සමාරම්භය - ඩෙංගු සඳහා එන්නත් කිරීම් ඉලක්ක කොටගත් සමාරම්භක පර්යේෂණය කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේදී පවත්වා ගෙන යනු ලැබේ.

- ❖ වර්ණ ගැන්වූ වීදුරු සමාන ඔපයන් පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන් - ඝන මැටියෙන් තැනූ භාජන සහ වීදුරු සමාන ඔපයන් පිළිබඳ නිෂ්පාදන ගැටළු විසඳීම සඳහා මෙම ව්‍යාපෘතිය සිදු කරන ලදී. මෙම කටයුත්ත හෝමාගම පිහිටි මිඩායා සෙරමික් පෞද්ගලික සමාගම (Midaya Ceramics (Pvt&) Ltd) සාර්ථකව අවසන් කරන ලද අතර ගැටළුන් දෙකක් සඳහා ප්‍රත්‍යක්ෂ විසඳුම් ඉදිරිපත් කරන ලදී. උදාහරණ ලෙස තද රතු දිස්නය භාවිතා කිරීමේ දී ලෙමන් ලෙල්ලේ බලපෑම සහ ගුරුලේත්තු නිල් පැහැති දිස්නය භාවිතයේදී තද රතු දිස්නය සහ ක්‍රිස්ටල් නිර්මාණය වීම දැක්විය හැක.

- ❖ ඕස්ට්‍රේලියාවේ සහ නවසීලන්තයේ වෙළඳපොළ වෙත ශ්‍රී ලාංකික සම සුරකුම් නිෂ්පාදන හඳුන්වාදීම - ඕස්ට්‍රේලියාවේ සහ නවසීලන්තයේ වෙළඳපොළ වෙත ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත නේචර්ස් සීක්‍රට් සම සුරකුම් නිෂ්පාදන හඳුන්වාදීමේ උපාය මාර්ගයක් ලෙස නේචර්ස් ක්‍රියේෂන්ස් නිව්සීලන්ඩ් ලිමිටඩ් (Nature's Creations NZ Ltd'), නව සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී.

- ❖ සූර්ය ශක්තිය පිළිබඳ ඒකාබද්ධ පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපාරයක් ස්ථාපිත කිරීම - ඇමෙරිකාවේ සිවානන්දන් රසායනාගාරයේදී (Sivananthan Laboratary" USA) රුහුණ, යාපනය සහ පේරාදෙණිය යන විශ්ව විද්‍යාල නියෝජනය කරන විද්‍යාඥයින් තිදෙනෙකු හට සූර්ය කෝෂ පදනම් CdTe/CdS පර්යේෂණ සහ සංවර්ධනය පිළිබඳ පුහුණුවක් ලබා දෙන ලදී. එසේම, මේ පිළිබඳ වැඩමුළු දෙකක්ද මූලික අධ්‍යයන ආයතනයේදී සහ රුහුණු විශ්ව විද්‍යාලයේදී පවත්වනු ලැබිණ.

- ❖ තෝරාගත් ආසියානු සහ අප්‍රිකානු රටවල ජල කළමනාකරණය සහ දේශගුණික විපර්යාස සඳහා අනුවර්තනය පිළිබඳ ආයතනික හැකියාව සංවර්ධනය කිරීම - නෝර්වේහි ලයිෆ් සයන්ස් විශ්ව විද්‍යාලයේ මහාචාර්ය හර්ෂ රත්නවීර සහ ශ්‍රී ලංකාවේ පේරාදෙණිය සහ යාපනය විශ්ව විද්‍යාල වල සහයෝගීතාවය මත 2014 ජනවාරි මස දී මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

ජාත්‍යන්තර සහයෝගිතාවයන්

පකිස්ථානු විද්‍යා පදනම (PSF) සහ ජාතික විද්‍යා පදනම අතර අවබෝධතා ගිවිසුම (MoU)

දේශීය විද්‍යාඥයින්ට සහ කාර්මික විද්‍යාඥයින්ට තම තමන්ගේ අදාළ විෂය පථයන් පිළිබඳ විශේෂඥ දැනුම ලබා ගැනීමට පමණක් නොව විද්‍යා සහ තාක්ෂණයට අදාළ විවිධ ක්ෂේත්‍ර තුළ සහයෝගීතා ක්‍රියාකාරකම් ස්ථාපිත කිරීමට අවස්ථාවක් ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා පකිස්ථානු විද්‍යා පදනම (PSF) සහ ජාතික විද්‍යා පදනම අතර අත්සන් කිරීම සඳහා අවබෝධතා ගිවිසුමක් (MoU) පිළියෙළ කරන ලදී. මෙම වැඩසටහන යටතේ සමාජයේ විවිධ අංශ අතර විද්‍යාව ජනප්‍රිය කිරීම සඳහා ශ්‍රී ලංකාව වෙත පකිස්ථානයේ උපකාරයද හිමිවනු ඇත.

ක්ෂිතිජය 2020 දීමනා යෝජනා ක්‍රමය (Horizon 2020 Grants Scheme) පිළිබඳ වැඩමුළුව

යුරෝපා සංගමයේ ක්ෂිතිජය 2020 දීමනා යෝජනා ක්‍රමය (Horizon 2020 Grants Scheme) ශ්‍රී ලංකාවේ විද්‍යාත්මක ප්‍රජාව වෙත හඳුන්වාදීම සඳහා ඉහත වැඩමුළුව ජාතික විද්‍යා පදනම් ශ්‍රවණාගාරයේදී පැවැත්විණ. මෙම වැඩසටහන සඳහා ශ්‍රී ලංකාවේ විවිධ විශ්ව විද්‍යාල සහ පර්යේෂණ සංවිධාන වල විද්‍යාඥයින් 40ක් පමණ සහභාගී විය. එහිදී නව දිල්ලියේ යුරෝපා සංගම් කාර්යාලයේ ඩෙනිස් ඩාම්බොයිස් මහතා (Mr. Denis Dambois) සහ එක්සත් රාජධානියේ පිහිටි සැල්ෆෝර්ඩ් විශ්ව විද්‍යාලයේ (University of Salford) මහාචාර්ය ඩිලන්ති අමරතුංග විසින් පහත මාතෘකා යටතේ දේශණ පවත්වන ලදී;

- ඩෙනිස් ඩාම්බොයිස් මහතා - ක්ෂිතිජය 2020 වැඩසටහනේ ආකෘතිය සහ අරමුණු - යුරෝපීය විභව්‍ය පර්යේෂණ ප්‍රදේශය විවෘත කර ගැනීම සඳහා වූ යතුරක් ලෙස විශිෂ්ටත්වය සඳහා එක්ව කටයුතු කිරීම.

- මහාචාර්ය ඩිලන්ති අමරතුංග - ක්ෂිතිජය 2020 තුළින් දකුණු ආසියාව සඳහා මංපෙත් විවර කර ගැනීම් - දකුණු ආසියානු ආයතන සඳහා අවස්ථාවන්.

- මහාචාර්ය රිචර්ඩ් හෙයිග් (Prof' Richard Haigh) සැල්ෆෝර්ඩ් විශ්ව විද්‍යාලය, එක්සත් රාජධානිය - ක්ෂිතිජය 2020 වෙබ් අඩවියේ සැරිසැරීම හුරුපුරුදු කරනු වස් වැඩමුළුව අවසානයේදී පළපුරුදු දැනින් මෙහෙයවූ අත්දැකීම් සැසියක් පවත්වනු ලැබිණ.

දීමනා ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් සළකා බැලීම සඳහා සුදුසු ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කරන ලෙස සහභාගී වූවන්ගෙන් ඉල්ලීම්ද කරන ලදී.

තරුණ විද්‍යාඥයින් සඳහා විද්‍යාව පිළිබඳ ලෝක විද්‍යායතනය (TWAS) / ජාතික විද්‍යා පදනම (NSF) විසින් ලබාදෙන වාර්ෂික ත්‍යාග

ජෛව විද්‍යාව, රසායන විද්‍යාව, ගණිතය සහ භෞතික විද්‍යාව යන ක්ෂේත්‍රයන්හි පර්යේෂණ කටයුතුවල ඉහළ මට්ටමේ විශිෂ්ටත්වයක් පෙන්නුම් කළ දක්ෂ තරුණ විද්‍යාඥයින් සඳහා වාර්ෂිකව ත්‍යාග ප්‍රදානය කිරීමේ වැඩපිළිවෙළක් ලෝක විද්‍යායතනය (TWAS) සමඟ එකමුතුව ජාතික විද්‍යා පදනම (NSF) විසින් ආරම්භ කර ඇත. මෙම සියළුම ප්‍රදානයන් වලට විද්‍යාව පිළිබඳ ලෝක විද්‍යායතනය මඟින් පිරිනමනු ලබන ඇමෙරිකානු ඩොලර් 2000කට සමාන මුදල් ත්‍යාගයක් සහ ජාතික විද්‍යා පදනම මඟින් පිරිනමනු ලබන සහතික පත්‍රයක්ද ඇතුළත් වේ. මෙවැනි ත්‍යාග ලබාදීම මඟින් බලාපොරොත්තු වනුයේ පර්යේෂණ කටයුතුවල ඉහළ මට්ටමේ විශිෂ්ටත්වයක් පෙන්නුම් කළ දක්ෂ තරුණ විද්‍යාඥයින් වෙත දිරි දීමනා ලබාදීමත් එවැනි විශිෂ්ට ක්‍රියාකාරකම් සඳහා ත්‍යාග ලබාදීමත්ය. 2014 වර්ෂය සඳහා ත්‍යාග ලබාදීම සම්බන්ධව ජෛව විද්‍යාව ක්ෂේත්‍රය වෙනුවෙන් ඉදිරිපත් වූ අයදුම්පත්‍ර පහක් අතරින් එක් නාම යෝජනාවක් නිර්දේශ කොට සලකා බැලීම සඳහා විද්‍යාව පිළිබඳ ලෝක විද්‍යායතනය (TWAS) වෙත ඉදිරිපත් කරනු ලැබිණ.

විදේශ ගමන් දීමනා

මෙම වැඩසටහනේ අරමුණ වනුයේ ජාත්‍යන්තර සමුළුවලදී පර්යේෂණ සොයාගැනීම් ඉදිරිපත් කිරීමට සහ හුවමාරු කර ගැනීමට පමණක් නොව ඔවුනගේ අදාළ පර්යේෂණ ක්ෂේත්‍ර තුළ නව ගවේෂණාත්මක කරුණු, අත්කරගත් ප්‍රගතීන් සහ සංවර්ධන කටයුතු පිළිබඳ දැනුම සහ නිපුණත්වය අත්කර ගැනීම පිණිස ශ්‍රී ලාංකික විද්‍යාඥයින් සහ කාර්මික විද්‍යාඥයින් සඳහා අවස්ථාවක් ලබාදීම වේ. එසේම ගෝලීය වශයෙන් නිරාවරණය වීම තුළින් සමාන ක්ෂේත්‍රයන් වල නියුතු විද්‍යාඥයින් සමඟ සබඳතා ගොඩ නැගීම ඔස්සේ අනාගත සහයෝගීතා ක්‍රියාකාරකම් සඳහා ජාත්‍යන්තරය තරණය සඳහා මෙමඟින් ශ්‍රී ලාංකික විද්‍යාඥයින් වෙත ලැබෙනුයේ අනගි අවස්ථාවකි. 2014 වර්ෂය තුළ ජාතික විද්‍යා පදනම විසින් විදේශ ගමන් පනස් එකක් (51) ප්‍රදානය කරන ලදී. වර්ෂය තුළ ලබා දුන් විදේශ ගමන් දීමනා පිළිබඳ විස්තරාත්මක තොරතුරු ඇමුණුම 07 මඟින් ඉදිරිපත් කොට තිබේ.

විදේශීය විශේෂ පුහුණු වැඩසටහන් (OSTP)

යම් යම් ක්ෂේත්‍ර වලට අදාළව විදේශීය විශිෂ්ඨත්වයේ ආයතන මඟින් ලබා දෙනු ලබන පුහුණු වීම් අවස්ථා හරහා ශ්‍රී ලාංකික විද්‍යාඥයින්ගේ ජාතික හැකියාවන් ඉහළ නැංවීම, විදේශීය විශේෂ පුහුණු වැඩසටහන් (OSTP) සංවිධානය කිරීමේ අරමුණ වේ. මෙම විදේශීය විශේෂ පුහුණු වැඩසටහන (OSTP) යටතේ පූර්ණ කාලීන පර්යේෂණ සිසුන්, විද්‍යා පරිපාලකයන්, විද්‍යා අධ්‍යාපඥයින්, විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති සම්පාදකයන් සහ විද්‍යා සන්නිවේදකයන් වැනි විද්‍යාත්මක සහ කාර්මික ක්ෂේත්‍ර වල නියුක්ත වූවන්ට විදේශීය පුහුණු වීම් ලබා ගැනීම සඳහා මාස දොළහක කාල පරිච්ඡේදයක් දක්වා මූල්‍ය ආධාර සපයනු ලැබේ. දැනට පෙනෙන පරිදි අනාගත ශ්‍රී ලංකාව තුළද දක්නට නොලැබිය හැකි වැඩි දියුණු කළ රසායනාගාර හා පර්යේෂණ කුසලතා, කාර්මික හා තාක්ෂණික අත්දැකීම් සහ විද්‍යා සන්නිවේදනය හා ඉගැන්වීම් කුසලතා පිළිබඳ අධ්‍යයනය කිරීමේ අවස්ථාව මේ හරහා ඔවුනට ලැබෙන වරප්‍රසාදයකි.

2014 වර්ෂයේදී ජාතික විද්‍යා පදනම විසින් විදේශීය විශේෂ පුහුණු වැඩසටහන් (OSTP) දාහතක් (17) ප්‍රදානය කරන ලදී. අදාළ වර්ෂය තුළ ලබා දුන් මෙම විදේශීය විශේෂ පුහුණු වැඩසටහන් පිළිබඳ තොරතුරු ඇමුණුම 08 මඟින් දක්වා තිබේ.

විද්‍යාව සහ තාක්ෂණය සඳහා ජාත්‍යන්තර සහභාගීත්වය (IPSAT)

විදේශ රටවල සිටින ඉහළ නිපුණත්වයක් සහිත විද්‍යාඥයින්ගේ සහ තාක්ෂණවේදීන්ගේ සේවය ලබා ගැනීම පිණිස වන වැඩසටහනක් වනුයේ විද්‍යාව සහ තාක්ෂණය සඳහා ජාත්‍යන්තර සහභාගීත්වය (IPSAT) වේ. මෙහිදී මග පෙන්වනු ලබනුයේ ජාත්‍යන්තර පර්යේෂණ සහයෝගීතාවයන්, තාක්ෂණ මාරුකිරීම් සහ ශ්‍රී ලංකාව තුළ සිටින ගෝලීය වශයෙන් වැදගත් කාර්යයන්හි නියුතු විද්‍යාඥයින් සහ තාක්ෂණවේදීන් ගෙන් සමන්විත ප්‍රජාවගේ සංවර්ධනය උදෙසා විශේෂඥ දැනුම ලබා ගැනීම පිණිස වේ. මෙම වැඩසටහන ආරම්භ කරන ලද්දේ 2012 වර්ෂය තුළදීය. විද්‍යාව සහ තාක්ෂණය සඳහා ජාත්‍යන්තර සහභාගීත්වය (IPSAT) දීමනා ත්‍රිත්වයක් (03) සඳහා 2014 දී ජාතික විද්‍යා පදනමේ සහයෝගය හිමිවිය. කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයේදී ආරම්භ වූ 'ශ්‍රී ලංකාව තුළ පර්යේෂණ හා ජෛව තාක්ෂණ යෙදුම් සඳහා වන වෛරස් අධ්‍යයන ප්‍රතික්‍රියක නිෂ්පාදනය කිරීම පිණිස සහභාගීත්වය' පිළිබඳ ව්‍යාපෘතියේ සම්පත් දායකයා ලෙස ඇරයුම් කරන ලද්දේ මහාචාර්ය ඒ. එම්. ඩී. සිල්වා (වෛද්‍ය පාසල, නෝර්ත් අදහස් දැක්වීම සඳහා මහාචාර්ය ඒ. පී. ඩී. සිල්වා සහ මහාචාර්ය ශෙර්වාන්ති හෝමර් වෙත ඇරයුම් කරන ලදී. 2014 වර්ෂයේදී පැවැත්වීමට සංවිධානය කළ නමුදු පසුවට කල් තැබූ ඩී. එන්. ඒ (DNA) තීරු සංකේත අයදුම්පත් හා ක්ෂේත්‍ර/රසායනාගාර මුල් පිටපත් පිළිබඳ ජාතික වැඩමුළුවේදී මහාචාර්ය එල්. එම්. ගාඕගේ (L. M. Gao), (විද්‍යාව පිළිබඳ චීන ඇකඩමිය) විශේෂඥ දැනුම ලබා ගැනීම පිණිස පොල් පර්යේෂණ ආයතනය (CRI) සඳහා ප්‍රදානයක් ලබාදෙන ලදී.

මිනිසා සහ පෛවගෝලය වැඩසටහන

යුනෙස්කෝ වල මිනිසා සහ පෛවගෝලය වැඩසටහන සඳහා කේන්ද්‍රස්ථානය වනුයේ ජාතික විද්‍යා පදනම වන අතර පෛව ගෝල සංචිත සහ ජාතික මිනිසා සහ පෛව ගෝලීය සංචිත වල ලෝක සංචිත වලට පෛව ගෝලීය සංචිත නාම යෝජනා සම්බන්ධව පහසුකම් සලසනු ලබන ජාතික මිනිසා සහ පෛවගෝලය කමිටුව හරහා එය ක්‍රියාකාරකම් ඉටු කරනු ලැබේ. 2014 වර්ෂයට අදාළ ක්‍රියාකාරම් පහත දක්වා තිබේ.

ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර පෛව ගෝලීය සංචිත ආවර්තිතා සමාලෝචනයන්

ශ්‍රී ලංකාව තුළ පිහිටි ජාත්‍යන්තර පෛව ගෝලීය සංචිත (IBR) හතරේ ආවර්තිතා සමාලෝචනය පිළිබඳ කටයුතු පිළිබඳව වේ. නම් වශයෙන් දැක්වූ විට සිංහරාජ, බූන්දල, හුරුළු හා කන්නේලිය, දැදියාගල සහ නාකියාදෙනිය (KDN) සංකීරණය අවසන් කොට එහි වාර්තා යුනෙස්කෝ වෙත ඉදිරිපත් කොට තිබේ. ශ්‍රී ලංකාව තුළ සිය ජාත්‍යන්තර පෛව ගෝලීය සංචිත තත්වය ඉදිරියට ගෙන යෑම පිණිස යුනෙස්කෝ විසින් අනුමත කොට තිබේ.

උසන්ගොඩ භූ උද්‍යානයක් ලෙස නම් කිරීම

උසන්ගොඩ ජාතික උද්‍යානය භූ උද්‍යානයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ ක්‍රියාකාරි අනු කමිටුව විසින් යුනෙස්කෝව වෙත සිය අවධානය යොමු කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන නාම යෝජනා ලිපිගොණු ඇතුළත් පළමු කෙටුම්පතේ කටයුතු අවසන් කොට තිබුණි. මේ ආශ්‍රිත ක්ෂේත්‍ර චාරිකාව අගෝස්තුව මාසයේදී සිදු කළ අතර යෝජිත ආකෘතිය භූ උද්‍යානය ලෙස ගොඩ නැංවීමේ ක්‍රමානුරූප නිර්මාණ සටහන පිළියෙළ කොට තිබේ.

ශ්‍රී ලංකාවේ වඳුරු මිනිස් ගැටුම

කෘෂිකාර්මික සංවර්ධනය සඳහා පමණක් නොව රටේ සමහර ප්‍රදේශ වල ජීවත්වන ජනතාවගේ සුභසිද්ධිය සඳහා ද බලපාන ප්‍රධාන ගැටළුවක් ලෙස හඳුනා ගෙන ඇත්තේ මෑත වසර කිහිපයක සිට පවතින වනජීවී - මිනිස් ගැටුම වේ. පෛව විවිධත්ව සංරක්ෂණයටද මෙය තර්ජනයක් වී තිබේ. වඳුරු මිනිස් ගැටුම උත්සන්න වීමට බලපාන විවිධ හේතූන් අතර අතීතයේදී ශ්‍රී ලංකාව තුළ උරුමයක්ව පැවති වන ආවරණය අහිමිව යෑම සහ තෙත් කලාපයේ ඇති බොහොමයක් කුඩා වනාන්තර වල වනයක පැවතිය යුතු ගුණාත්මකභාවයට හානි වී තිබීම දැක්විය හැක. ගෙවතු වගා සහ රබර් වගා කිරීම සඳහා කැලෑ ඉඩම් කැබලි කිරීම හේතුවෙන් මෑත වසර කිහිපය තුළ වනාන්තර වල පිටත වියන් ආවරණය අහිමිව යෑමද වැඩිවී තිබේ. වසර ගණනාවක් පුරා සිදු වූ මෙම සියළුම සාධක වල ඒකාබද්ධ බලපෑම මත (අ) ගැටුම් වලට මැදිහත් වීමකින් තොරව වඳුරන්ට ජීවත් විය හැකි ප්‍රදේශ (ස්වභාවික සහ කෘත්‍රිම) සහ (ආ) වඳුරන්ට ආහාර සපයා ගත හැකි ශාක අඩු වී යෑම සිදුව තිබේ.

මෙම සියළුම සාධක කෙරේ අවධානය යොමු කරමින් 2014 අප්‍රේල් 10 වැනි දින ශ්‍රී ලංකාවේ වඳුරු මිනිස් ගැටුම පිළිබඳ වැඩමුළුවක් පවත්වන්නට සංවිධානය කෙරුණි. මෙම වැඩමුළුවේදී ගනු ලැබූ නිර්දේශ මත ක්‍රියාකාරි සැලැස්මක් සකස් කිරීම සඳහා පරිසර සහ පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ඇත.

දැනුම නිර්මාණකරණය, සංශෝධනය, පිළියෙළ කිරීම සහ හුවමාරු කර ගැනීම

දැනුම නිර්මාණකරණය, සංශෝධනය, පිළියෙළ කිරීම සහ හුවමාරු කර ගැනීම

ජාතික විද්‍යා පදනම යටතේ පවතින ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය (NSLRC) විසින් ශ්‍රී ලංකාවේ සහ විදේශීය රටවල සිටින විද්‍යාඥයින් අතර විද්‍යාත්මක තොරතුරු හුවමාරු කර ගැනීම් සඳහා ආධාර කිරීම තුළින්ද විද්‍යා සහ තාක්ෂණික පොත්පත් පිළිබඳ ජාතික සුරක්ෂිතාගාරයක් ලෙස ක්‍රියා කිරීම තුළින්ද සහ පුස්තකාල වෘත්තිකයන් පුහුණු කිරීම්, තාක්ෂණික සහාය ලබාදීම සහ මෘදුකාංග බෙදා හැරීම් ඔස්සේ කාර්යක්ෂම විද්‍යා සහ තාක්ෂණික තොරතුරු සේවාවක් සඳහා පහසුකම් සම්පාදනය කිරීම තුළින්ද සම්බන්ධතා සහ ජාල ශක්තිමත් කිරීම හරහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ ක්‍රමවේද භාවිතා කරමින් විද්‍යාත්මක ප්‍රජාව වෙත කාර්යක්ෂම තොරතුරු බෙදාහැරීමේ සේවාවක් අඛණ්ඩව පවත්වා ගෙනු ලැබේ. ඉහත අවශ්‍යතා සපුරා ගනු වස් 2014 වර්ෂය තුළ පහත ක්‍රියාකාරකම් සිදු කරනු ලැබේ.

සැලකිය යුතු කරුණු: වර්ෂය තුළ පහත දක්වා ඇති කැපීපෙනෙන ප්‍රගතීන් අත්කර ගැනුණි.

- ජාතික ඩිජිටල්කරණය (සංඛ්‍යාංකකරණ) ව්‍යාපෘතිය (**NDP**) : රට තුළ පිහිටි දේශීය සම්භවයක් සහිත ආයතන එකොළහක (11) විද්වත් පොත්පත් එකතුව ආවරණ වන පරිදි ජාතික ඩිජිටල්කරණය ව්‍යාපෘතියේ (NDP) දෙවන පියවර (ii) ආරම්භ කරන ලදී. ව්‍යාපෘතිය තුළින් අපේක්ෂිත 75%කට වඩා වැඩි වැඩකටයුතු ප්‍රමාණයක් අවසන් කරමින් සැලකිය යුතු මට්ටමේ ප්‍රගතියක් ළඟාකර ගත හැකි විය. පොදු අතුරු මුහුණතක් හරහා සෙවුම් කිරීම පිණිස එක් එක් අදාළ ආයතනයේ ඊ - ගබඩාව තුළ ව්‍යාපෘතියේ පළමු පියවරේ ඩිජිටල් ද්‍රව්‍ය පවත්වා ගනු ලැබේ.
- ශ්‍රී ලංකා ජර්නල වල මාර්ගගත දත්ත පද්ධතිය (**SLJOL**) : 2013 ජූලි මාසයේදී ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය (NSLRC) වෙත ශ්‍රී ලාංකික ජර්නල වල මාර්ගගත දත්ත පද්ධතියේ (SLJOL) පරිපාලන වගකීම් පැවරීමෙන් අනතුරුව එය මේ වන විට ප්‍රමාණාත්මක බවට පත්වී ඇති අතර දේශීය සම්භවයක් සහිත ජර්නල 59 ක් මුද්‍රණය කරමින් සාර්ථකව ක්‍රියාත්මක වේ. ව්‍යවහාර සංඛ්‍යාලේඛන වලට අනුව, ශ්‍රී ලංකා ජර්නල වල මාර්ගගත දත්ත පද්ධතියට අදාළ සඟරා වල සංයුතිය කෙරේ ලොව පුරා අවධානය යොමු වීමේ ප්‍රවණතාව අතිවිශාල ලෙස ඉහළ ගොස් ඇති බව සැලකිය යුතු කරුණකි.
- වාරික දත්ත පද්ධති පිළිබඳ ඒකාබද්ධ ලැයිස්තුව (ULIST) : සංශෝධිත වාරික දත්ත පද්ධති පිළිබඳ ඒකාබද්ධ ලැයිස්තුවේ (ULIST) දත්ත බැංකුව සඳහා වෙබ් අඩවියක් පදනම් සෙවුම් අතුරු මුහුණත සාර්ථක අයුරින් වැඩි දියුණු කොට තිබේ. එය රටේ පවතින ප්‍රධාන විද්‍යා හා තාක්ෂණ පුස්තකාල 55 ක් තුළ සඟරා ශීර්ෂ 6623 ක් යටතේ පවතින සඟරා ස්ථාන වෙත ශ්‍රී ලංකා විද්වතුන්ට ඉක්මන් හා පහසුවෙන් ළඟා වීමට හැකි අන්තර්ජාල සෙවුම් මෙවලමක් ලෙස කාර්යය ඉටු කරයි.

- ❖ විවෘත ප්‍රවේශයක් සහිත ප්‍රතිපත්ති ආකෘති : ජාතික විද්‍යා පදනම විසින් විවෘත ප්‍රවේශයක් සහිත ප්‍රතිපත්ති ආකෘති දෙකක් (02) සාර්ථක අයුරින් සංවර්ධනය කළ අතර එය නව සොයාගැනීම් ප්‍රවර්ධනය කිරීම පිණිස පමණක් නොව ශ්‍රී ලංකාව තුළ පර්යේෂණ මත ආයෝජනය කරන ලද මහජන අරමුදල් වලට වඩා හොඳ සහ උපරිම ප්‍රතිඵල ළඟා කර ගැනීම පිණිසද අරමුදල් සම්පාදක සංවිධාන සහ පර්යේෂණ ආයතන/ විශ්ව විද්‍යාල ඔස්සේ භාවිතා කළ හැකිය. එසේම, එහි තවත් අරමුණක් වනුයේ ශ්‍රී ලාංකික පර්යේෂණ සඳහා වඩා හොඳ පිළිගැනීමක් සහ වැඩි බලපෑමක් කළ හැකි අයුරින් පර්යේෂණ සොයාගැනීම් සඳහා පුළුල් ප්‍රචාරණයක් ලබාදීමද වේ.
- ❖ ජාතික විද්‍යා පදනම අරමුදල් සපයන පර්යේෂණ වල ප්‍රකාශන පිළිබඳ ඊ - ගබඩාව (විද්‍යුත් ගබඩාව) ජාතික විද්‍යා පදනම මඟින් අරමුදල් සම්පාදිත සියළුම පර්යේෂණ වල සම්පූර්ණ ලේඛන වෙතට ප්‍රවේශය සනිටුහන් කරමින් නව ඊ - ගබඩාව ස්ථාපිත කරන ලද අතර මෙහි අරමුණ වනුයේ වඩා පුළුල් ප්‍රජාවක් අතර කියවීමට, සඳහන් කිරීමට, ආදේශ කිරීමට සහ ගොඩනැංවීමට මෙම පර්යේෂණ වාර්තා වලට වඩා පුළුල් ප්‍රචාරයක් ලබා දීම වේ.

විද්‍යා සහ තාක්ෂණ කළමනාකරණ තොරතුරු පද්ධතියක් පවත්වා ගැනීම (STMIS)

විද්‍යා සහ තාක්ෂණ කළමනාකරණ තොරතුරු පද්ධතිය යනුවෙන් හඳුන්වනුයේ ජාතික විද්‍යා පදනම (NSF) විසින් 2004 වර්ෂයේ සිට වැඩි දියුණු කොට පවත්වා ගනු ලබන පරිගණකගත තොරතුරු පද්ධතියකි. එහි වෙබ් අඩවිය වන www.nsf.mis.ac.lk හරහා මාර්ගගත සෙවුම සහ ලියාපදිංචිය ලබා ගත හැකිය. විද්‍යා සහ තාක්ෂණ කළමනාකරණ තොරතුරු පද්ධතියට ඇතුළත් වනුයේ රට තුළ ඒකරාශීව ඇති විද්‍යාඥයින්, විද්‍යා සහ තාක්ෂණය හා සම්බන්ධ ආයතන, උසස් විද්‍යාත්මක තොරතුරු, විද්‍යා සහ තාක්ෂණය ආශ්‍රිත සේවා සහ පුහුණු වැඩසටහන් තොරතුරු, පර්යේෂණ ප්‍රකාශන සහ රටේ දැනට සිදුකරමින් පවතින පර්යේෂණ තොරතුරු ආදිය වේ.

විද්‍යා සහ තාක්ෂණ කළමනාකරණ තොරතුරු පද්ධතියේ යාවත්කාලීන කටයුතු නොකඩවා සිදු කරනු ලබන අතර 2014 අවසානය වන විට දත්ත පද්ධතිය තුළ ලියාපදිංචි වී සිටි විද්‍යාඥයින් මුළු සංඛ්‍යාව 5,324 කි.

ලියාපදිංචි විද්‍යාඥයින් වෙත ඔවුනගේ නිපැයුම් සහ සේවා වෙනුවෙන් රෝහල්, හෝටල්, ගුවන් ප්‍රවාහන සමාගම්, පොත් සාප්පු ආදී විවිධ ආයතන මඟින් සහන පදනමක් යටතේ හැඳුනුම්පත්ද නිකුත් කරනු ලැබේ. වර්තමාන විද්‍යා සහ තාක්ෂණ කළමනාකරණ තොරතුරු පද්ධතියේ ව්‍යුහාත්මක සහ ක්‍රියාත්මක සීමාවන් කෙරේ අවධානය යොමු කරමින් ජාතික විද්‍යා පදනමේ තොරතුරු තාක්ෂණ ඒකාබද්ධ ව්‍යාපෘතිය යටතේ 2014 වර්ෂය තුළ නව පද්ධතියක් සංවර්ධනය කරන ලදී. එමඟින් ජාතික විද්‍යා පදනමේ වෙනත් ක්‍රියාවලි සමඟ පෙර කී පද්ධතිය ඒකාබද්ධ කෙරෙනු ඇත. නව පද්ධතිය තුළට දත්ත හඳුන කර ගැනීමේ මෙවලම් පිළිබඳ කටයුතු අවසන් වෙමින් පවතින අතර පෙර පැවති පද්ධතියේ සිට දත්ත සම්ප්‍රේෂණය කිරීමට අදාළ කටයුතුද සිදු කෙරෙමින් පවතින. www.mis.nsf.ac.lk වෙබ් අඩවිය ඔස්සේ අදාළ පද්ධතිය සමඟ සම්බන්ධ වීමටත් මාර්ගගත ලියාපදිංචි වීමටත් අවකාශ සැලසී තිබේ.

විද්‍යාව, තාක්ෂණය සහ සමාජ විද්‍යාව ආශ්‍රිත පර්යේෂණ ප්‍රකාශන පමණක් නොව දේශීය පර්යේෂණ සොයාගැනීම් ලොව පුරා ව්‍යාප්තියට අදාළ කටයුතු ප්‍රවර්ධනය සඳහා අප විසින් ක්‍රියාකරනු ලබන අතර සඟරා දෙකක් පළ කිරීමද සිදු කරනු ලබයි.

පර්යේෂණ දැනුම බෙදා හැරීම සහ හුවමාරුව දක්වා

ජාතික විද්‍යා පදනම විසින් විද්‍යාව, තාක්ෂණය සහ සමාජ විද්‍යාව යනාදී ක්ෂේත්‍ර වල දේශීය පර්යේෂණ සොයා ගැනීම් වල ප්‍රකාශන වලට අතහිත දීම් සිදු කරනු ලැබේ. සම සමාලෝචිත ජර්නල දෙකක් ප්‍රකාශයට පත් කිරීම සහ ලොව පුරා බෙදා හැරීමද ජාතික විද්‍යා පදනම විසින් සිදු කරනු ලබයි.

ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනම් ජර්නලය (JNSF)

1973 සිට ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනම් ජර්නලය (JNSF) හරහා විද්‍යා සහ තාක්ෂණයට අදාළ පර්යේෂණ වල ප්‍රතිඵල වල සියළුම ස්වරූප ප්‍රකාශයට පත් කරනු ලැබේ. වසරකට කාලපයන් හතරක් වන පරිදි මාර්තු, ජූනි, සැප්තැම්බර් සහ දෙසැම්බර් මාස තුළදී සඟරාව පළ කරනු ලැබේ. ජර්නල වල අඩංගුව සම සමාලෝචනයට භාජනය කරන අතර දැනට සුචිය සකස් කරනුයේ තොම්සන් විද්‍යාත්මක දර්ශකය (විද්‍යාව සඳහන් දර්ශකය - ***SCI***), රසායනික හා ජීව විද්‍යාත්මක සාරාංශ, ඊසදිසි පූර්ව දර්ශක, සත්ත්ව විද්‍යාත්මක වාර්තා සහ SCOPUS දත්ත පද්ධති තුළ වේ. ජර්නලය මුද්‍රිතව පමණක් නොව අන්තර්ජාලය හරහාද ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

2014 තුළදී, ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනම් ජර්නලයේ සියළුම කලාප සහ වෙළුම් 42ක්ද (කලාප 1, 2, 3, 4 වශයෙන්) නියමිත කාලයේදී ප්‍රසිද්ධියට පත් කරන ලදී. දේශීයව සහ විදේශීයවද සඟරාව සතුව පුළුල් ප්‍රචාරණයක් පවතින අතර ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනම් සම්පූර්ණ ජර්නලය වෙතම ශ්‍රී ලංකා මාර්ගගත ජර්නල (Sri Lanka Journals Online - SLJOL) වෙබ් අඩවිය ඔස්සේ (http//www.Sljol.info/index.php/JNSFSL/index) කිසිදු මුදල් භාවිතයකින් තොරව ප්‍රවේශය සනිටුහන් කරගත හැකිය. සඟරාව සහ එහි අඩංගුව වෙතට අන්තර්ජාල ප්‍රවේශය හරහා බොහෝදෙනෙකු ප්‍රවේශ වේ. ව්‍යාහාර සංඛ්‍යා ලේඛන මඟින් පෙන්නුම් කරනුයේ ගෝලීය මට්ටමින් ඉහළ ප්‍රේක්ෂක ප්‍රචාරයක් සහ අදාළ වාර්තා බාගත කිරීම් (download) වැඩිවීමක්ද වේ.

ශ්‍රී ලංකා සමාජ විද්‍යා සඟරාව (SLJSS)

ශ්‍රී ලංකා සමාජ විද්‍යා සඟරාව (SLJSS) ජූනි සහ සැප්තැම්බර් මාස වලදී වසරකට දෙවතාවක් පළ කරනු ලැබේ. ශ්‍රී ලංකාව සහ වෙනත් දකුණු ආසියානු රටවල් පිළිබඳ අවධානය යොමු කරමින් සමාජ විද්‍යාව පිළිබඳ සමස්ත පරාසයම ආවරණය වන පරිදි සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා වලින් සඟරාවේ විශේෂාංග ලිපි පළ කරනු ලැබේ.

සෑම වර්තාවක්ම සම සමාලෝචනයට භාජනය කරනු ලැබේ. ශ්‍රී ලංකා මාර්ගගත ජර්නල (Sri Lanka Journals Online - SLJOL) වෙබ් අඩවිය ඔස්සේ (http//www.Sljol.info/index.php/SLJSS) සඟරාවේ සියළුම විශේෂාංග ලිපි වලට ප්‍රවේශය සකසා ගත හැකි වනු ඇත. 2014 වර්ෂය තුළ පළ කරනු ලැබූ සඟරා පිළිබඳ කරුණු පහත පරිදි වේ.

1) *කලාප 35/36 අංක 1 සහ 2 - පළ කරන ලදී.*
   ජූනි / දෙසැම්බර් (2012/ 2013).

2) *කලාප 372014 අංක 1 සහ 2*
   ජූනි / දෙසැම්බර් 2014 - කටයුතු කෙරෙමින් පවතී.

විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් (Centre of Excellence) බවට පත් කිරීම සඳහා ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය (NSLRC) ශක්තිමත් කිරීම

ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය (NSLRC) වෙතින් ජාතික මට්ටමේ දත්ත පද්ධති ලබා ගත හැකි බව

රට තුළ සිදු කරනු ලැබූ කාලීන සහ අතීත පර්යේෂණ පිළිබඳ තොරතුරු වලට ශ්‍රී ලාංකික පර්යේෂකයන් සහ විද්වත් ප්‍රජාව සතු අවශ්‍යතා පිරිමසා ගැනීමට පිවිසිය හැකි වීම පිණිස ජාතික මට්ටමේ දත්ත පද්ධති බොහෝ සංඛ්‍යාවක් ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය (NSLRC) හරහා පවත්වා ගැනීම එහි අනිවාර්ය කාර්යභාරයක් වේ.



❖ ශ්‍රී ලංකා විද්‍යා දර්ශක දත්ත පද්ධති (***SLSI***) : ශ්‍රී ලංකා විද්‍යා දර්ශක දත්ත පද්ධතිය තුළ දැනට ලේඛන 46100 කට වැඩි සංඛ්‍යාවක් සංචිතව පවතින අතර මෙම ලේඛන වලින් 90% ක ප්‍රතිශතයකට වැඩි සංඛ්‍යාවක සමස්ත ලේඛනය වෙතම අන්තර්ජාලය ඔස්සේම ප්‍රවේශය ලබා ගත හැකි වේ. වර්ෂය තුළ දත්ත පද්ධති වලට වාර්තා 2918 ක් ඇතුළත් කරන ලදී. දේශීය ජාලයේ සිදු වූ තාක්ෂණික ගැටළුවක් හේතුවෙන් ශ්‍රී ලංකා විද්‍යා දර්ශක දත්ත පද්ධතිය ආශ්‍රිත ප්‍රගතිය කෙරේ දැඩි බලපෑමක් එල්ල විය.

දත්ත පද්ධතිය තුළ බහුලව අත් විදීමට සිදු වූ ගැටළුද නිරීක්ෂණය විය. මන්ද යත් මෙම වකවානුවේ වේගවත් දෘඩාංග සහ මෘදුකාංග සංවර්ධනයත් සමඟ අනුගත වීම පිණිස ශ්‍රී ලංකා විද්‍යා දර්ශක දත්ත පද්ධතිය ඇතුළත් කර ඇති උෂභෂීෂ මෘදුකාංගය අඛණ්ඩව යාවත්කාලින කරමින් නඩත්තු නොකිරීම මෙයට බලපෑම් ඇති කරනු ලැබේ. එබැවින් රූඩ්ගත ශ්‍රී ලංකා විද්‍යා දර්ශක දත්ත පද්ධතියේ අඩංගුව එක් එක් බාණ්ඩය යටතේ D - අවකාශය මෘදුකාංගයේ (D - space software) කලා ඩිජිටල් ගබඩාවේ ස්ථානය වෙතට මාරු කිරීමේ කටයුතු වේගවත් කිරීමට පියවර ගෙන තිබේ.

❖ පර්යේෂණ දීමනා දත්ත පද්ධති (RGR) : අවසන් වාර්තා 24 ක තොරතුරු ඇතුළත් කරමින් දත්ත පද්ධතිය යාවත්කාලින කළ අතර වසර තුළ ජාතික විද්‍යා පදනමේ මූල්‍ය අනුග්‍රහය මත සිදුකළ ව්‍යාපෘති වල ප්‍රතිඵල තුළින් ලැබූ මෙම දත්ත පශ්චාත් ක්‍රමාංකනයට ලක් කරන ලදී.

❖ SLASS දත්ත පද්ධති SLASS දත්ත පද්ධතිය සැලකිය යුතු වර්ධනයක් අත්කර ගෙන තිබේ. උෂභෂීෂ මෘදුකාංගය යටතේ අත්විඳීමට සිදු වූ ගැටළු මැඩ පැවැත්වීම සඳහා SLASS දත්ත පද්ධතිය සම්පූර්ණයෙන්ම JISIS නව විවෘත මූලාශ්‍ර මෘදුකාංගයක් වෙත සම්ප්‍රේෂණය කරන ලදී. 1976 - 2013 දක්වා කාල පරිච්ඡේදය තුළ SLASS වාර්ෂික සැසි වලදී ඉදිරිපත් කරන ලද සියළු ලිපිලේඛණ වල සම්පූර්ණ විමර්ශණ හා සාරාංශ නිබන්ධන දත්ත පද්ධතියට ඇතුළත් කර තිබේ. වර්ෂය තුළ දත්ත පද්ධතිය වෙත ඇතුළත් කරන ලද මුළු වාර්තා සංඛ්‍යාව 697 ක් වන අතර 2014 දෙසැම්බර් 31 වන දිනට දත්ත පද්ධතිය සතුව පැවති මුළු වාර්තා සංඛ්‍යාව 8862. අන්තර්ජාල පහසුකම් හරහා දත්ත පද්ධතිය වෙතට පිවිසීමට පමණක් නොව සාරාංශ නිබන්ධන බාගත කිරීමට/ මුද්‍රිත පිටපත් ලබා ගැනීමටද ඉඩකඩ සලසා දී තිබේ.

එක්රැස් කිරීම් සංවර්ධනය කිරීම : ජාතික ඊ - ගබඩාව

නවතම තොරතුරු බෙදා හැරීමේ තාක්ෂණික උපක්‍රම යොදා ගැනීම තුළින් දේශීය විද්‍යාත්මක ප්‍රජාව වෙතට ලබාදිය හැකි හොඳම සේවාව ලබාදීම ඉතා වැදගත් වේ. ඒ අනුව, රූඩ්ගත ශ්‍රී ලංකා විද්‍යා දර්ශක දත්ත පද්ධතිය (SLSI) තුළ අඩංගුව D - අවකාශය මෘදුකාංගයේ (D - space software) ජාතික ඊ - ගබඩාව වෙත මාරු කිරීම 2009 වර්ෂයේදී ආරම්භ වූ අතර එම කර්තව්‍ය අඛණ්ඩව තව දුරටත් ඉදිරියට ගෙන යන ලදී. වර්ෂය තුළ දී ශ්‍රී ලංකා විද්‍යා දර්ශක දත්ත පද්ධතියේ (SLSI) සිට ජාතික ඊ - ගබඩාව වෙත සම්ප්‍රේෂණය කළ මුළු අයිතම සංඛ්‍යාව 4456 ක් වූ අතර

ජාතික ඊ - ගබඩාව ඔස්සේ පූර්ණ වශයෙන්ම ප්‍රවේශ ලබා ගත හැකි හැකි දේශීය විද්වත් සඟරා සංඛ්‍යාව 23කි. ජාතික විද්‍යා පදනම විසින් අරමුදල් ප්‍රදානය කරන ලද පර්යේෂණ වල ප්‍රකාශන මත සැදුම්ලත් එක් නව සමාජයක් ඒකාබද්ධ කිරීම තුළින් අවසන් වාර්තා 1090 කට ඉඩ පහසුකම් සැලසුණු අතර නිබන්ධන සංඛ්‍යාව 304කි. මේ අනුව 2014 දෙසැම්බර් 31 වන දිනට ජාතික ඊ - ගබඩාව වෙත වාර්තා වී ඇති මුළු අයිතම සංඛ්‍යාව 9695 කි.

එක්රැස් කිරීම් සංවර්ධනය කිරීම : යොමු කිරීම් එක්රැස් කිරීම, විශේෂ විෂය එක්රැස් කිරීම්

විද්වත් ප්‍රජාවගේ නිර්දේශ අවශ්‍යතා පිරිමසා ගැනීම පිණිස සංචිතය සඳහා නව ග්‍රන්ථ 79 ක් ඇතුළත් ඇත. මෙම නව එකතු කිරීම් මඟින් ශ්‍රී ලාංකික දේශීය දැනුම සහ විද්‍යා කල්පිත පිළිබඳ ග්‍රන්ථ කට්ටල රාශියක් ආවරණය කර තිබුණි. රට තුළ පල වූ විද්වත් සඟරා වල නව කලාප (මාතෘකා 68 කට වඩා වැඩි) පිටපත් සංඛ්‍යාවක් මධ්‍යස්ථානය වෙත ලැබුණි. විදේශීය සඟරා දායකත්වය 7 ක් විය.

ගෝලීය පොත්පත් වෙත ප්‍රවේශය පිණිස එක්රැස් කිරීම් ආශ්‍රිත සංවර්ධනය ශක්තිමත් කිරීම

වර්ෂය තුළදී සිදු වූ තවත් කාර්යයක් වූයේ පර්යේෂණ ප්‍රජාවගේ ප්‍රධාන අවශ්‍යතාවයක් වූ පහත දැක්වෙන ජාත්‍යන්තර දත්ත පද්ධති වලට ප්‍රවේශය ජාතික විද්‍යා පදනම් පරිශ්‍රය තුළම ලබා දීම වේ. පර්යේෂණ කටයුතු සහ තම ප්‍රකාශන පිළිබඳ තොරතුරු සඳහන් කිරීම් සඳහාද විද්වතුන් සහ පර්යේෂකයන් විසින් මෙම දත්ත පද්ධතිය භාවිතා කරනු ලැබිණ.

- ***SCOPUS*** සඳහන් කිරීම් සහ උපුටා දැක්වීම් දත්ත පද්ධතිය: ***SCOPUS*** යනුවෙන් හඳුන්වනු ලබන්නේ ග්‍රහණය කිරීම්, විශ්ලේෂණය කිරීම් සහ පර්යේෂණ දෘශ්‍යකරණය කිරීම් වලට ඉඩ සලසන අනර්ග මෙවලම් සහිත ප්‍රකාශකයන් 500 කගේ සඟරා 20500 කට වඩා වැඩි සම සමාලෝචිත ශාස්ත්‍රීය ග්‍රන්ථ ආවරණය කරනු ලබන ශාස්ත්‍රීය පොත්පත් සෙවුම් සඳහා වූ සංකීර්ණ තොරතුරු මූලාශ්‍රයකි. ශාස්ත්‍රීය ග්‍රන්ථ සෙවුම් සඳහා මෙම දත්ත පද්ධතිය ඉතා සුදුසු මූලාශ්‍රයක් වේ.

- ***TEEAL*** (අත්‍යාවශ්‍ය කෘෂිකාර්මික පුස්තකාලය): ප්‍රමුඛ පෙළේ ප්‍රකාශකයන් විසින් පළ කරනු ලබන අත්‍යාවශ්‍ය කෘෂිකාර්මික සඟරා 200ක සියළු තොරතුරු වලට ප්‍රවේශය ***TEEAL*** හරහා ලබා ගත හැක.

- ***HINARI*** (සෞඛ්‍ය ආශ්‍රිත පර්යේෂණ සඳහා ප්‍රවේශය) සම්පූර්ණ සඟරාවම ඇතුළත් දත්ත පද්ධතිය: ජෛව වෛද්‍ය සහ අදාළ සමාජ විද්‍යා ක්ෂේත්‍ර සතු ප්‍රධාන පෙළේ සඟරා (ශීර්ෂ 8,500ක් සහ විද්‍යුත් පොත්පත් 7000ක්) වෙත ප්‍රවේශය සලසා දීම සඳහා ප්‍රමුඛ පෙළේ ප්‍රකාශකයන් සමඟ එක් වූ ***HINARI*** ක්‍රියාකරනු ලබයි.

- ***AGORA*** (කෘෂිකර්මය ආශ්‍රිත ජාත්‍යන්තර පර්යේෂණ සඳහා ප්‍රවේශය) : එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය (***FAO***) සමඟ ප්‍රමුඛ පෙළේ ප්‍රකාශකයන් එකතු වී ***AGORA*** වැඩසටහන ස්ථාපිත කළ අතර මේ හරහා ආහාර, කෘෂිකර්මය, පරිසර විද්‍යාව සහ අදාළ සමාජ විද්‍යා ක්ෂේත්‍ර තුළ කැපීපෙනෙන ඩිජිටල් පුස්තකාල සංචිතයක් වෙත ප්‍රවේශය ලබා දේ. සඟරා ශීර්ෂ 1900ක අඩංගුව මෙමඟින් ආවරණය වේ.

- ***ARDI*** (පර්යේෂණ සහ සංවර්ධන තොරතුරු වෙත ප්‍රවේශය) දත්ත පද්ධතිය: ***ARDI*** යනු විද්වත් ශාස්ත්‍රීය ග්‍රන්ථමය දත්ත පද්ධතියක් වන අතර එමඟින් විද්‍යාව සහ තාක්ෂණය ආශ්‍රිත විවිධ ක්ෂේත්‍ර වලට ශ්‍රී ලංකාවේ සිට මුදල් අයකිරීමකින් තොරව අන්තර්ජාලය ඔස්සේ ප්‍රවිෂ්ට වීම සඳහා පහසුකම් සලසාලයි. එමඟින් සඟරා, ග්‍රන්ථ සහ නිර්දේශ පොතපත 10,000 ක් ඉක්මවා යන පරිදි ප්‍රවේශය සලසා දේ.

- ***NSLRC*** වෙබ් අඩවිය : විද්වතුන්ට තම තොරතුරු වලට පරිශීලක මිත්‍රශීලී හා පහසු ප්‍රවේශයක් ලබා ගැනීමට දේශීය සහ ජාත්‍යන්තර සම්පත් නැවත නිර්මාණය කිරීම පිණිස මෙම වෙබ් අඩවිය කේන්ද්‍රීය දොරටුවක් ලෙස ක්‍රියා කරනු ලැබේ. දේශීය සහ ජාත්‍යන්තර සම්පත් වලට ප්‍රවිෂ්ට වීමේ වඩා වැදගත් මාර්ග සබඳතා මෙයට ඇතුළත් කර තිබේ. රට තුළ පවතින ජාත්‍යන්තර සඟරා සහ දත්ත පද්ධති පදනම් දායකත්වයට ඉතා සීමිත ප්‍රවේශයක් වෙනුවෙන් සම්මුතියක් ඇතිකර ගැනීම සඳහා විවෘත ප්‍රවේශයක් සහිත සඟරා, ආයතනික තොරතුරු ගබඩා සහ අයකිරීම් රහිත වෙනත් සම්පත් සඳහා ප්‍රවේශ සබඳතාවක් ගොඩ නැංවීම සඳහා මෙමඟින් වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.

දේශීය පුස්තකාල තුළ ඇති තොරතුරු වලට ප්‍රවේශය ශක්තිමත් කිරීම

ජාතික ඩිජිටල්කරණ ව්‍යාපෘතිය (NSP)

ජාතික ඩිජිටල්කරණ ව්‍යාපෘතියේ (NSP) අරමුණ වනුයේ ආයතනික තොරතුරු ගබඩාවල ජාතික ජාලයක් ඔස්සේ සමස්ත ලිපිලේඛණ සඳහාම පහසු සහ වේගවත් අන්තර්ජාල පිවිසුමක් සඳහා පහසුකම් සැලසීමට රට වටා පවතින පර්යේෂණ සහ විද්වත් පුස්තකාල තුළින් ලබාගත හැකි දේශීය විද්‍යා සහ තාක්ෂණික ග්‍රන්ථමය ප්‍රකාශ ඩිජිටල් කරණය කිරීම වේ. ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ රට තුළ පිහිටි ආයතන අටක් (08) ආවරණය වූ අතර එහි වැඩකටයුතු 2013 දී අවසන් විය. අදාළ ආයතනික තොරතුරු ගබඩා සතු ලේඛණ ඩිජිටල්කරණය කොට අන්තර්ජාලයට මුසු කිරීමේ කටයුතු පුස්තකාල පහක් (5) සම්බන්ධයෙන් අවසන් කොට තිබේ. නම් වශයෙන් දැක්වූ විට ඒවා නම්, රබර් පර්යේෂණ ආයතනය (PRI), හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි පර්යේෂණ හා පුහුණු ආයතනය (HARTI), මොරටුව විශ්ව විද්‍යාලය (UM), කාර්මික තාක්ෂණ ආයතනය (ITI) සහ කෘෂි කාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති පිළිබඳ සභාව (CARP) වේ. පොල් පර්යේෂණ ආයතනය (CRI) සහ මධ්‍යම පරිසර අධිකාරිය (CEA) සතු ලේඛණ උඩුගත කිරීමේ කටයුතුවල සැලකිය යුතු මට්ටමේ ප්‍රගතියක් පෙන්නුම් කරන අතර කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය (PGIA) ලේඛණ උඩුගත කිරීමේ කටයුතු ආරම්භ කොට තිබේ.

පහත දක්වා ඇති ආයතන වල තොරතුරු ආවරණය කොටගත් ව්‍යාපෘතියේ දෙවන අදියරද ආරම්භ වූ අතර වසර ඇතුළත ඩිජිටල්කරණය කරන ලද සමස්ත පිටු සංඛ්‍යාව 442093 ක් විය. (සම්පූර්ණ ලේඛණ වලින් 55.25%ක ප්‍රතිශතයක්). එක් එක් පුස්තකාලය විසින් අත්කරගත් ප්‍රගතිය පහත පරිදි වේ

- ❖ අග්නිදිග විශ්ව විද්‍යාලය (SEU), මහවැලි අධිකාරිය (MA) සහ ජාතික විද්‍යා පදනම විසින් (NSF) ඩිජිටල්කරණ ක්‍රියාවලියේ 100%ක ප්‍රගතියක් අත්කර ගෙන සිටී. (2010 - 2014 කාලසීමාව ඇතුළත)
- ❖ භූ විද්‍යාත්මක සමීක්ෂණ හා පතල් කාර්යාංශය (GSMB) 90% ක ප්‍රතිශතයක්ද, ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව (DCS) 80% ක ප්‍රතිශතයක්ද, වාරිමාර්ග දෙපාර්තමේන්තුව 85% ක ප්‍රතිශතයක්ද සහ ජාතික පුස්තකාලය 58% ක ප්‍රතිශතයක්ද වශයෙන් කැපිපෙනන ප්‍රගතියක් සනිටුහන් කොට ගෙන තිබේ.
- ❖ පේරාදෙණිය විශ්ව විද්‍යාලය (UP) තේ පර්යේෂණ ආයතනය (TRI) සහ මූලික අධ්‍යයන ආයතනය (IFS)ට අදාළ ඩිජිටල් කරණ ක්‍රියාවලිය 2015 දී ආරම්භ කෙරෙනු ඇත.

එලදායී සම්පත් හුවමාරුවක් සඳහා විශ්ව විද්‍යාල සහ විද්‍යා හා තාක්ෂණ පුස්තකාල තුළ ආයතනික ඊ - ගබඩාවන්ගේ සංවර්ධන කටයුතු වලට සහයෝගය ලබාදීම සහ ඒවා ප්‍රවර්ධනය කිරීම.

ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය (NSLRC) වෙත පැවරී ඇති වගකීම් දෙකක් වනුයේ වෙනත් පුස්තකාල වෙනුවෙන් තොරතුරු තාක්ෂණය පදනම් සේවා සඳහා කාර්මික සහාය ලබාදීම සහ පුස්තකාල වෘත්තිකයන් පුහුණු කිරීම වේ. සමාලෝචනයට භාජනය වූ වසර තුළ පුස්තකාල වලින් ලැබුණු ඉල්ලීම් මත පදනම්ව පහත දක්වා ඇති සේවා පහසුකම් ලබාදෙන ලදී.

ජාතික ආයතනික ගබඩා ජාලය තුළ එලදායි සහභාගීත්වයක් ලබාගත හැකි අයුරින් තම ආයතනික තොරතුරු ගබඩාවන් (IRs) පවත්වා ගැනීම පිණිස පහත දක්වා ඇති ආයතන සඳහා ජාතික විද්‍යා පදනමේ පරිගණක සේවාදායකය (NSF Server) තුළ අතත්‍ය පරිගණක සේවාදායක (Servers) සංවර්ධනය කිරීම.

- කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති පිළිබඳ ශ්‍රී ලංකා සභාව
- කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය
- භූ විද්‍යාත්මක සමීක්ෂණ හා පතල් කාර්යාංශය
- ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව
- ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
- තේ පර්යේෂණ ආයතනය
- වෛද්‍ය පීඨය - කැලණිය විශ්ව විද්‍යාලය

ආයතනික තොරතුරු ගබඩාවල (IRs) සීග්‍ර වර්ධනය කැපී පෙනුණි. 2014 දෙසැම්බර් 31 දිනට වෙනත් සියළු ආයතනික තොරතුරු ගබඩාවන් (IRs) සඳහා එකතු කරන ලද මුළු ලේඛණ සංඛ්‍යාව 10533කි.

තොරතුරු සේවා

සාහිත්‍යමය ග්‍රන්ථ සෙවීම්, ලේඛන සැපයීම් සේවා සහ යොමු කිරීම් සේවා 714, 636

විද්වත් ප්‍රජාවගේ තොරතුරු අවශ්‍යතා සම්පූර්ණ කිරීම පිණිස ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය (NSLRC) අඛණ්ඩව ක්‍රියා කරන ලදී. සාහිත්‍යමය ග්‍රන්ථ සෙවුම්, ලේඛන වල පිටපත් සහ සඟරා විශේෂාංග වෙනුවෙන් ඉදිරිපත් වූ ඉල්ලීම් සාර්ථකව ලෙස ඉටු කරන ලදී.

SCOPUS සඳහන් කිරීම් සහ උපුටා දැක්වීම් දත්ත පද්ධතිය මත සාහිත්‍යමය ග්‍රන්ථ සෙවුම් සිදුකළ මුළු පරිශීලකයන්ගේ සංඛ්‍යාව 37 ක් වන අතර SCOPUS සඳහන් කිරීම් සහ උපුටා දැක්වීම් දත්ත පද්ධතිය මත බාගත කරන ලද මුළු සාරාංශ නිබන්ධන සංඛ්‍යාව 2796 කි.

HINARI, TEEAL, AGORA සහ ARDI ලෙස නම් කරන ලද ජාත්‍යන්තර සම්පූර්ණ ලේඛන දත්ත පද්ධති මත ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය (NSLRC) විසින් නඩත්තු කරනු ලබන දේශීය දත්ත පද්ධති මත සිදුකළ සම්පූර්ණ සෙවුම් සංඛ්‍යාව 714 ක් වූ අතර පරිශීලකයන් වෙත ලබා දුන් පූර්ණ ලේඛන විශේෂාංග සංඛ්‍යාව 636ක් විය. ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානය (NSLRC) වෙත පිවිසි පරිශීලකයන් 277 කගේ අවශ්‍යතා සාර්ථක ලෙස විසඳිය හැකි විය. මීට අමතරව, දුරකතනය සහ අන්තර්ජාලය ඔස්සේ ලැබුණු විමසීම් 88 ක් සඳහාද විසඳුම් ලබාදිය හැකි විය.

වත්මන් දැනුවත් කිරීමේ සේවා (CAS)

සිනෝටෙක් (ScinoTech) විද්‍යුත් පුවත් ලිපිය ඔස්සේ ප්‍රචාරය කරනු ලැබූ මාසික වත්මන් දැනුවත් කිරීමේ සේවා සාර්ථක ලෙස අඛණ්ඩව පවත්වා ගැනුණි. වර්ෂය තුළ ලබාදුන් වත්මන් දැනුවත් කිරීමේ සේවා ලැයිස්තු මුළු සංඛ්‍යාව දහයකි (10). වත්මන් දැනුවත් කිරීමේ සේවා වල අරමුණ වූයේ විද්වතුන්ට තම පර්යේෂණ විෂය පථය සීමාව තුළ නවතම පර්යේෂණ සොයා ගැනීම් පිළිබඳ දැනුවත්භාවය ලබාදීම වේ.

තොරතුරු සේවාවල ඵලදායි ව්‍යාප්තිය සඳහා වෙනත් විද්‍යා හා තාක්ෂණ පුස්තකාල වල සිටින පුස්තකාල වෘත්තිකයන්ගේ හැකියාව ගොඩ නැංවීම

හැකියාව ගොඩ නැංවීම

ආයතනික තොරතුරු ගබඩාව පවත්වා ගැනීම පිළිබඳ අවශ්‍ය දැනුම සහ පුහුණුව ලබාදීම සඳහා ජාතික ඩිජිටල්කරණ ව්‍යාපෘතියට සහභාගී වූ ආයතන වල පුස්තකාල වෘත්තිකයන් වෙත පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

- **ආයතනික තොරතුරු ගබඩාව වැඩිදියුණු කිරීම සඳහා D - අවකාශය මෘදුකාංගය (D - space software) පිළිබඳ වැඩමුළුව**

පුස්තකාලපතිවරුන් 17 දෙනෙකු සඳහා අවශ්‍ය දැනුම ලබාදීම සඳහාත් ***D*** - අවකාශය මෘදුකාංගය (D - space software) වෙතට දත්ත ඇතුල් කිරීමට පුහුණු කිරීම සඳහාත් 2014 මාර්තු 18 - 19 යන දෙදින තුළ වැඩමුළුවක් සංවිධානය කරන ලදී. 2014 සැප්තැම්බර් මස තුළ සහ ඔක්තෝබර් මස තුළදී ඉහත ව්‍යාපෘතිය තුළ ක්‍රියා කරනු ලබන දත්ත ක්‍රියාකරුවන් හත් දෙනෙකු (07) සඳහා පසුවිපරම් පුහුණු වැඩසටහනක්ද පවත්වන ලදී.

❖ **තාක්ෂණික සහාය**

ජාතික ඩිජිටල්කරණය ව්‍යාපෘතිය (NDP) සඳහා සහභාගී වූ ආයතන වල පුස්තකාල සහ පුස්තකාලය ස්වයංක්‍රියකරණය සඳහා WINISIS මෘදුකාංගය යොදා ගනු ලබන පුස්තකාල වෙත අවස්ථාවන් 45 කදී තාක්ෂණික සහාය සපයන ලදී.

පර්යේෂණ තොරතුරු වලට විවෘත ප්‍රවේශය (OA) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ සිටින පුස්තකාල වෘත්තිකයන් සහ පර්යේෂණ ප්‍රජාව අතර විවෘත ප්‍රවේශ සංකල්පය පිළිබඳ දැනුවත් භාවයේ ප්‍රවර්ධනය අරමුණු කොට පහත වැඩමුළු පැවැත්වීම සඳහා පියවර ගනු ලැබුණි.

➢ **සම්මන්ත්‍රණ/ වැඩමුළු : පහත ආයතන වලදී වැඩමුළු හතක් (07) පවත්වන ලදී.**

- මොරටුව විශ්ව විද්‍යාලය
- කාර්මික තාක්ෂණ ආයතනය
- පොල් පර්යේෂණ ආයතනය
- හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි පර්යේෂණ හා පුහුණු ආයතනය
- රබර් පර්යේෂණ ආයතනය
- ජාතික පුස්තකාල සහ ප්‍රලේඛන විද්‍යා සේවා මණ්ඩලය
- පේරාදෙණිය විශ්ව විද්‍යාලය

➢ ජාතික විද්‍යා පුස්තකාලය සහ සම්පත් මධ්‍යස්ථානයේ (**NSLRC**) සම්බන්ධීකරණය යටතේ 2014 SLASS වාර්ෂික සැසි වල තේමා සම්මන්ත්‍රණය සහ කාර්මික සැසිවලදී පර්යේෂණ තොරතුරු වලට විවෘත ප්‍රවේශය පිළිබඳ සංකල්පයේ ඇති වැදගත්කම සම්බන්ධ දේශණයක්, විද්වත් ප්‍රකාශන හා අධ්‍යයන සම්පත් සන්ධානයේ විධායක අධ්‍යක්ෂ හේතර් ජෝශප් මෙනවිය විසින් පවත්වනු ලැබිණ. ඉහත සමාන විෂය පිළිබඳ තවත් සම්මන්ත්‍රණයක් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේදී පැවැත්වූයේ විද්වත් ප්‍රජාව සහ පර්යේෂකයන් 100 වඩා වැඩි පිරිසකගේ සහභාගීත්වය ඇතුව වේ.

➢ **SLSTINET සම්මන්ත්‍රණ**

වර්ෂය තුළ මෙවැනි සම්මන්ත්‍රණ දෙකක් සංවිධානය කළ අතර මෙහි අරමුණ වූයේ තොරතුරු ව්‍යාප්ති ක්ෂේත්‍රය තුළ සිදුවන නව සංවර්ධන ප්‍රවණතා සමඟ පුස්තකාල සහ තොරතුරු වෘත්තිකයන් උරෙන් උර ගැටී සිටීමට සැලැස්වීම වේ.

❖ පර්යේෂණ තොරතුරු වලට විවෘත ප්‍රවේශය : දැනුවත් කිරීම - 2014 පෙබරවාරි 18 (ජාතික විද්‍යා පදනම් ශ්‍රවණාගාරය), මෙහිදී සහභාගී වූ සාමාජිකයන් සංඛ්‍යාව 54 කි.

❖ ජාතික සංවර්ධනය සඳහා දේශීය දැනුම : පුස්තකාලයේ කාර්යභාරය - 2014 ජූලි 25 (ජාතික විද්‍යා පදනම් ශ්‍රවණාගාරය), මෙහිදී සහභාගී වූ සාමාජිකයන් සංඛ්‍යාව 46 කි.

ස්වභාවික සම්පත් තිරසාර ලෙස උපයෝජනය

ස්වභාවික සම්පත් තිරසාර ලෙස උපයෝජනය

යුනෙස්කෝ සංවිධානයේ මිනිසා හා ජෛවගෝලීය වැඩ සටහන සඳහා දේශීය කේන්ද්‍රස්ථානය වනුයේ ජාතික විද්‍යා පදනම වන අතර එය ජාතික මිනිසා හා ජෛවගෝලීය කමිටුව තුළින් ක්‍රියාත්මක වේ. ජෛවගෝලීය සංචිතයට හා ජෛවගෝලිය සංචිත පිළිබඳ ගෝලීය ජාලයට නාම යෝජනා කිරීම මෙම කමිටුව හරහා සිදුවේ. 2014 වසරට අදාල කටයුතු පහත දැක්වේ.

ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ජෛවගෝලීය සංචිත පිළිබඳ වාරික සමාලෝචන

ශ්‍රී ලංකාවේ ඇති ජාත්‍යන්තර ජෛවගෝලිය සංචිත (IBR) සතර වන සිංහරාජ, බුන්දල, හුරුළු හා නාකියාදෙනිය සංකීර්ණ පිළිබඳ වාරික සමාලෝචනයන් සම්පූර්ණ කරන ලද අතර යුනෙස්කෝ සංවිධානය වෙත වාර්තාවක් ඉදිරිපත් කරන ලදි. ජෛවගෝලීය සංචිත නිසිලෙස කලමනාකරණය සඳහා යුනෙස්කෝ වෙතින් නිර්දේශ ලබා ගන්නා ලදි.

වාරික සමාලෝචන ක්‍රියාවලින් තුළින් ජෝත්‍යන්තර ජෛවගෝලී සංචිත හතර සාර්ථකව කළමනාකරණය කරගැනීම පිළිබඳ නිර්දේශ ලබා ගත් අතර ශ්‍රී ලංකාවේ ජෛවගෝලීය සංචිත ලැයිස්තුවලින් ඉවත් කිරීම මග හැරීමටද නිර්දේශ ලබා ගන්නා ලදි.

උස්සන්ගොඩ භූ උද්‍යානයක් ලෙසට යෝජනා කිරීම

නාමයෝජනා පිළිබඳව කටයුතු කරන අනු කමිටුව විසින් යුනෙස්කෝව වෙත ඉදිරිපත් කළ යුතු භූ උද්‍යාන නාම යෝජනා ඩොයිසරය අවසන් කරන ලදි. අගෝස්තු මාසයේදී ක්ෂේත්‍ර චාරිකාවක් සිදු කළ අතර භූ උද්‍යානය තුළ ඉදි කිරීමට යෝජිත ඉදිකිරීම් පිළිබඳ ක්‍රමානුකූල සැලැස්මක් සකසන ලදි.

ශ්‍රී ලංකාවේ මිනිස් වඳුරු ගැටුම

2014 අප්‍රේල් 10 වනදා ශ්‍රී ලංකාවේ මිනිස් වඳුරු ගැටුම පිළිබඳ වැඩ මුළුවක් පවත්වන ලදි. ක්‍රියාකාරී සැලැස්මක් සැකසීම පිණිස පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය වෙත නිර්දේශ ඉදිරිපත් කෙරෙනු ඇත.

ජාතික විද්‍යා පදනමේ භෞතික හා මානව සම්පත් හා ක්‍රියාවලින් ප්‍රශස්ථකරණය කිරීම

ජාතික විද්‍යා පදනමේ භෞතික හා මානව සම්පත් හා ක්‍රියාවලින් ප්‍රශස්ථකරණය කිරීම

ජාතික විද්‍යා පදනම එයට පරිබාහිරින් ඇති අදාල රජයේ හා සංස්ථාපිත ආයතන අතර සම්බන්ධතා හා සන්නිවේදනයන් ශක්තිමත් කිරීමට ප්‍රයත්න දරයි. 2014 වසර තුළදී ජාතික විද්‍යා පදනමේ මෙහෙවර ළඟා කරගැනීම උදෙසා සේවක දායකත්වය වැඩි දියුණු කර ගැනීම සඳහා උපකාර වූ ප්‍රතිඵලාබිමුඛ විවෘත සංස්කෘතියක් පවත්වා ගැනීම සඳහා අප කාර්ය මණ්ඩලයේ හැකියාවන් හා ඵලදායිතාවය සංවර්ධනය කිරීමට උත්සාහ ගන්නා ලදි. තම ප්‍රධාන කාර්යයන් ඉටු කිරීමෙහි ලා සහය අංශයන් විද්‍යාත්මක අංශ සමග සම්බන්ධීකරණය සහිතව කටයුතු කරනු ලබයි.

පරිපාලන අංශය

සමාලෝචනය කරන වර්ෂය තුළදී ප්‍රශස්ත මට්ටමින් ජාතික විද්‍යා පදනමේ ප්‍රධාන කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය සේවාවන් සැපයීම සඳහා පරිපාලන අංශය පහත ප්‍රධාන කාර්යයන් ඉටු කරන ලදි.

- සාමාන්‍ය පරිපාලනය
- මානව සම්පත් කළමනාකරණය
- වත්කම් කළමනාකරණය
- ජාතික විද්‍යා පදනමේ ප්‍රවර්ධනමය අවශ්‍යතාවයන්

ජාතික විද්‍යා පදනමේ කාර්ය මණ්ඩලය විද්‍යාත්මක නිලධාරීන් 29 ක් ද ඇතුලත්ව සාමාජිකයන් 125 දෙනෙකුගෙන් සමන්විත වෙයි. 2014.12.31 වන දින සිටි ප්‍රධාන කාර්ය මණ්ඩලය ඇමුණුම 13 මගින් දක්වා ඇත.

2014 වසර තුළ නව කාර්ය මණ්ඩල සාමාජිකයන් 10 (දහයක්) බඳවා ගත් අතර සාමාජිකයන් දොලහක් (12) අස්වී යනු ලැබූහ. එක් (01) සාමාජිකයෙක් විශ්‍රාම ලැබීය.

කාර්ය මණ්ඩල පුහුණුව

2013 වසරේදී සිදු කරනු ලැබූ 'පුහුණු පරතර විශ්ලේෂණය' මත පදනම්ව වඩා නිපුණ හැකියාවෙන් පරිපූර්ණ හා කාර්යක්ෂම කාර්ය මණ්ඩලයක් ගොඩ නැගීම දේශීය මෙන්ම විදේශීය පුහුණුව සහිත ''කාර්ය මණ්ඩල පුහුණු සැලැස්මක්'' 2014 වසරේදී ගොඩනගන ලදි. ලබා දුන් පුහුණු අවස්ථාවලින් සැලසුම් තුළ තිබූ සියළුම අවශ්‍යතාවන් සම්පූර්ණ කළ නොහැකි වූවත් 2014 වසර තුළදී 2013 වසරට වඩා සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කෙරිණ.

සියළුම මට්ටම් වල සේවකයන් විශාල ප්‍රමාණයකගේ (අධ්‍යාපනික හා පර්යේෂණ : කණිෂ්ඨ කළමනාකරු හා ඉහළ කාන්ඩයන්: PL ශ්‍රේණිද ඇතුලත්ව කළමනාකරණ සහකාරවරුන්) දැනුම හා හැකියාව සුදුසු පරිදි වැඩි දියුණු කිරීම සඳහා පුහුණුව ලබ දෙන ලදි. පුද්ගල මට්ටමින් පුහුණුව ලබා දුන් මුළු සංඛ්‍යාව 27 ක් වන අතර කාල කළමනාකරණ ක්ෂේත්‍ර සම්බන්ධව වැඩ සටහන් අටක් (08) කණ්ඩායම් වශයෙන් පැවැත්විණ. PL ශ්‍රේණිය සඳහා පරිගනක හැකියාවන් පිලිබඳ මූලික පුහුණුවක් ලබා දෙන ලදි.

පහත ප්‍රස්ථාර වලින් සේවකයන් කාන්ඩවලට ලබා දුන් විවිධ පුහුණු හා විවිධ විෂයන් යටතේ පුහුණු කරන ලද සංඛ්‍යාව දැක්වේ. වැඩිම අවස්ථාවන් ගණනක් ලබා දී ඇත්තේ කළමනාකරණ සහකාර ශ්‍රේණියට (35) වන අතර ඉන්පසු අධ්‍යාපන හා පර්යේෂණ කාණ්ඩය (24) PL ශ්‍රේණිය (15) සහ JM හා ඉහළ ශ්‍රේණි (11) වලට ලබා දී ඇත. සේවකයින් දෙදනකු ඩිප්ලෝමා මට්ටමේ පුහුණුවක් ලබන ලදි.

පුහුණු අවශ්‍යතා සැපිරීමට අදාල ප්‍රධාන ගැටළුවක් ලෙස හඳුනා ගනු ලැබුවේ ප්‍රමාණවත් අරමුදල් ලබාගත නොහැකි වීම හා දේශීයව සුදුසු වැඩ සටහන් කොමැති වීමය.

සේවකයන්ගේ දායකත්වය ඔවුන් සේවය කරන එක් එක් අංශ වෙත මෙන්ම පොදුවේ ජාතික විද්‍යා පදනමට ලබා ගැනීම සඳහාත් පුද්ගල ඵලදායිතාවය වැඩි දියුණු කිරීම සඳහාත් ඔවුන්ගේ විෂයානුබද්ධ දැණුම හා හැකියාව වැඩි දියුණු කිරීමේ ලා අවශ්‍ය වන පුහුණු අවස්ථාවන් ලබා දීම කෙරෙහි වගකියනු ලබන්නේ කාර්ය මණ්ඩල සංවර්ධන කමිටුවයි (SDC).

දේශීය හා විදේශීය රැස්වීම්/ වැඩමුළු/ සම්මන්ත්‍රණ පිළිවෙලින් 38 ක් හා 11 ක් තුළ අප සේවකයන් ජාතික විද්‍යා පදනම නියෝජනය කරන ලදි. අදාල තොරතුරු අමුණා ඇත. (ඇමුණුම 10 හා 11)

ජාතික විද්‍යා පදනමේ කාර්ය මණ්ඩලය විසින් ජාතික හා ආයතනික කමිටු කීපයක්ද නියෝජනය කරන ලදි.



පොදු පුහුණු වැඩසටහන්

පවතින මූල්‍ය රෙගුලාසි තුළ ආයතනයේ සියළුම මූල්‍ය කටයුතු ඉක්මනින් හා කාලිනව ඉටු කරමින් ඵලදායී හා කාර්යක්ෂම මූල්‍ය සේවයක් ලබා දීමට මූල්‍ය අංශය විසින් සිදු කරනු ලබයි. මෙතෙක් ගතවූ අවුරුද්ද තුළ පහත කටයුතු සිදු කරන ලදි.

- ගිණුම් පොත්, ස්ථාවර වත්කම් ලේඛනය, පොදු ලෙජරය, ප්‍රධාන ලෙජරය, තොග පොත් යනාදිය නඩත්තු කිරීම.
- වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, ඇස්තමේන්තු යනාදිය ඇතුළු සියළුම මූල්‍ය වාර්තා සැකසීම හා නියමිත දිනවලදී අදාල ආයතනවට ඉදිරිපත් කිරීම.
- ආයතනයේ අංශ මගින් සිදු කරන ලද කාර්යයන්ට අදාලව ගෙවීම් සිදු කිරීම.
- වේතන හා අතිකාල යනාදී සාමාන්‍ය ගෙවීම් සිදු කිරීම.

- ගබඩා නඩත්තුව.
- ජාතික විද්‍යා පදනමේ ප්‍රකාශනවල තොග නඩත්තුව.
- ප්‍රදර්ශන, පොත් ප්‍රදර්ශන හා ජාතික විද්‍යා පදනම මගින් සංවිධානය කරන විවිධ වැඩමුළුවල ජාතික විද්‍යා පදනමේ ප්‍රකාශන අලෙවි කිරීම.
- ආයතනය සඳහා ආධාර ලබාගැනීම සඳහා මූල්‍ය අමාත්‍යාංශය හා රේඛීය අමාත්‍යාංශ නිලධාරීන් සමග සම්බන්ධීකරණය.

මූල්‍ය තොරතුරු නඩත්තු කිරීම සඳහා වන අනුගමනය කරන ලද මාර්ගගත පද්ධතිය මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කරන ලදී.

මුද්‍රණ ඒකකය

ජාතික විද්‍යා පදනමෙහි සියලුම අංශවල කටයුතු සඳහා උපකාර කිරීම මුද්‍රණ ඒකකය මගින් අඛණ්ඩව සිදු කරන ලදී. ග්‍රන්ථ සහ වාරසඟරා ඇතුලු ප්‍රකාශන 16ක් සහ වෙනත් මුද්‍රණ කටයුතු 78 ක් 2014 වර්ෂය තුළ මුද්‍රණ ඒකකය මගින් සිදු කරන ලදී.

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ඒකකය

ජාතික විද්‍යා පදනමේ කටයුතු සාර්ථකව ඉටු කිරීම සඳහා හා ජාතික විද්‍යා පදනමේ කාර්යමණ්ඩලයට අවසන් පරිශීලක තොරතුරු තාක්ෂණ සහය ලබා දීම සඳහා තොරතුරු තාක්ෂණ ඒකකය තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් නඩත්තු කිරීම හා වැඩි දියුණු කිරීමට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකය වග කියනු ලබයි.

2014 වසර තුළදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකය, සංවිධානමය ව්‍යාපාර ක්‍රියාවලියේ කාර්ය සාධනයන් වැඩි දියුණු කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පහසුකම් උත්ශ්‍රේණි ගත කරන ලදී. අන්තර්ජාල තරංග පරාසය 2mbp සිට 15mbp දක්වා උත්ශ්‍රේණිගත කිරීම, VLANS හඳුන්වා දීම සඳහා ප්‍රාදේශීය ජාලය (Local Area Network) උත්ශ්‍රේණිගත කිරීම හා නවතම ෆයර්වෝල් භාවිතා කිරීමෙන් ආරක්ෂක පද්ධතිය වැඩි දියුණු කිරීම එහිදී සිදු කරන ලද ප්‍රධානම කාර්යයන් අතරින් කිහිපයකි. පරිගණක 38 ක් ස්ථාපනය කිරීමෙන් හා පුහුණු මධ්‍යස්ථානයේ පහසුකම් උත්ශ්‍රේණිගත කිරීම, දීර්ඝකාලීන අවශ්‍යතාවයක්ව තිබූ නව පරිගණක දහයක් (10) ස්ථාපනය කිරීම හා යල්පැන තිබූ පරිගණක දහහතරක් (14) අපහරණය කිරීම යනාදිය තුළින් කාර්ය මණ්ඩලයේ පරිගණක අවශ්‍යතාවය සම්පූර්ණ කරන ලදී. කොළඹ විශ්ව විද්‍යාලය පරිගණක ජාල තුළින් සපයන අනුකාලීන මාර්ගගත මෘදුකාංග සේවයේ ප්‍රගතියද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකය මගින් අධීක්ෂණය කෙරිණ. එහි ප්‍රගතිය ඉතා මන්දගාමී බවට නිරීක්ෂණය කෙරිණ.

අභ්‍යන්තර විගණන අංශය

2014 වසර තුළදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් හතරක් (04) පවත්වන ලදී. වසරේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ආංශික ක්‍රියාකාරකම්වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය සමාලෝචනය කරන ලද අතර පරතරයන් හඳුනාගෙන නිමැවුම් හා කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමට කළමනාකාරිත්වයට සුදුසු යෝජනා හා නිර්දේශ සිදු කරන ලදී. ආංගික බඩු වට්ටෝරු ලේඛන සඳහා වැඩි දියුණු කිරීම් ද යෝජනා වූ අතර වත්කම් වාර්තා කිරීමේ පද්ධතිය අනුකූලනය කරන ලදී.

නිපුණ විද්‍යාත්මක පරිපාලන, තාක්ෂණික හා සහාය කාර්ය මණ්ඩලය

මාදුරු ඔය ශ්‍රී ලංකා යුධ හමුදා විශේෂ කාර්ය බලකා පුහුණු පාසලේදී කණ්ඩායම් හැඟීම හා නායකත්වය වර්ධනය සඳහා පිටත සංවිධානය කෙරුණු වැඩ සටහනක් පවත්වන ලදී.

තත්ව කළමාකරණ පද්ධතිය (QMS)

ආයතනය තුළ වෙනත් විද්‍යාත්මක ක්‍රියාකාරකම් සඳහා දෙන ලද ප්‍රමුඛතාවය හේතුවෙන් QMS හි ප්‍රගතිය ඉතා මන්දගාමී වූ බවට නිරීක්ෂණය වේ. කෙසේ වෙතත් ලේඛනමය කාර්යයන් බොහොමයක් නිම කිරීමට ආසන්නව පැවතිණ. ආංශිකමය මට්ටමෙන් සම්මත මෙහෙයුම් පටිපාටින් (SOP) සංශෝධනය කරන ලද අතර QMS දොරටුව (gateway) වෙත උඩුගත කරන ලදි. ප්‍රධානතම අරමුණ වූයේ පාර්ශ්වකරුවන්ට තත්වයෙන් ඉහළ හා කාලීන සේවාවක් ලබා දීම පිණිස සියලුම කාර්යයන්, පටිපාටින් ජාතික විද්‍යා පදනමේ ක්‍රියාවලින් ප්‍රමිතිකරණය කිරීමයි. පද්ධතියේ ලේඛන (අභ්‍යන්තර හා බාහිර) හා වාර්තා වෙත මාර්ගගතව ප්‍රවේශ වීමට හැකිවන පරිදි දෙරටුවක් (gateway) සංවර්ධනය කරන ලදි.

තුලිත ලකුණු කාඩ් පත් (BSC)

මෙහි අරමුණ වූයේ වාර්ෂික ක්‍රියාකාරිත්ව සැලසුම හා අනුරූපිව සංවිධානයේ ප්‍රධාන ව්‍යාපාර ක්‍රියාවලින් හා සම්බන්ධ කාර්තුමය ඉලක්ක (සංඛ්‍යාත්මක) සකසා ගැනීමයි. BSC හි ප්‍රධානතම අභිප්‍රාය වන්නේ මානව සම්පත් මූල්‍ය හා වෙනත් සම්පත් වඩා කේන්ද්‍රගත කොට සංවිධානයේ විෂය ක්ෂේත්‍රය තුළ තබා ගැනීමත් එමගින් සේවාදායක තෘප්තිය, අභ්‍යන්තර ක්‍රියාවලත් සේවක කාර්ය සාධන හා මූල්‍යමය කරුනු යනාදියේ කාර්ය සාධනය මැනීමත්ය. ප්‍රධාන කාර්ය සාධන දර්ශකයන් (KPI) අර්ථ දක්වන ලද අතර පුද්ගල හා සංවිධානමය මට්ටමින් ප්‍රගතිය අධීක්ෂණය හා මැනීම සිදු කරන ලදි. මුලින් සකසන ලද ඉලක්ක වෙත ළඟා වීමේ ලා සතුටුදායක මට්ටමක පවති.

මූල්‍ය ප්‍රකාශන

2014 වසරේ කාර්ය සාධනය පිළිබඳව ගණන් තැබීමේ නිල කාර්යයේ නිරීක්ෂණ

ජාතික විද්‍යා පදනම යනු රජයේ ආධාර මත පමණක්ම යැපෙන ආධාර ලබා දීමේ සංවිධානයකි. 2015 වසර සඳහා ජාතික අය වැය දෙපාර්තමේන්තුව මගින් ජාතික විද්‍යා පදනමේ 'පුනරාවර්තන' හා 'ප්‍රාග්ධන' වියදම් සඳහා නිකුත් කිරීමට නිර්දේශිත අරමුදල් පිළිවෙලින් රු.මි. 107 ක් සහ රු.මි.247 ක් විය. ඒ අනුව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව මගින් පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සඳහා රු.107,555,000 ක් හා රු.230,776,510 ක් නිකුත් කරන ලදී. මීට අමතරව ශ්‍රී ලංකාව තුළ නැනෝතාක්ෂණය හා සම්බන්ධ කටයුතු නියාමන රාමුවක් සංවර්ධනය කිරීම සඳහා ජාත්‍යන්තර සංවර්ධන මධ්‍යස්ථානය (IDRC) විසින් ජාතික විද්‍යා පදනම වෙ රු.6,173,234 ක් ලබා දෙන ලදී.

	තක්සේරුව (රු.'000) ලැබුණු අරමුදල් (රු.'000)	භාණ්ඩාගාරයෙන් (රු.'000)	වියදම
පුනරාවර්තන වියදම්			
පුද්ගල වේතන	81,400	107,555	66,717
වෙනත් පුනරාවර්තන වියදම්	33,600		27,420
එකතුව	**115,000**		**94,137**
ප්‍රාග්ධන වියදම්			
වැය විෂය - 133-02-05-3-2201			
	260,000	230,776	217,870
IDRC (විදේශ අරමුදල්)		6,173	
ආදායම	387		

පහත ප්‍රස්ථාරය මගින් 2010 - 2014 වසර තුළ ලැබුණු අරමුදල් වල වාර්ෂික වියදම පිළිබඳ තොරතුරු දැක්වේ.



2015 වසර තුළ ප්‍රධාන අංශ තුළ ප්‍රාග්ධන වියදම පිළිබඳ විස්තර

වසර තුළ ලැබුණු අරමුදල් හා ප්‍රධාන අංශවල ප්‍රාග්ධන වියදම පිළිබඳ විස්තර

විස්තරය	රු'000 වියදම 2014
1. පර්යේෂණ හා වෙනත් විද්‍යාත්මක කටයුතු සඳහා ප්‍රදාන	117,290
2. විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති පර්යේශන අංශය	4,120
3. තාක්ෂණ අංශය	24,927
4. ජාතික විද්‍යා පුස්තකාලය හා සම්පත් මධ්‍යස්ථානය	9,057
5. විද්‍යාව ප්‍රචලිත කිරීමේ අංශය	25,132
6. ජාත්‍යන්තර සම්බන්ධීකරණ අංශය	14,931
7. තොරතුරු තාක්ෂණ අංශය	1,587
8. කාර්යාල ගෘහ භාණ්ඩ සවිකිරීම් හා උපකරණ	8,636
9. ප්‍රාග්ධන වත්කම් ප්‍රතිසංස්කරණය	-
10. අධ්‍යක්ෂ කාර්යාලයේ වැය	7,771
11. විදේශ පුහුනු වැඩ සටහන	3,971
එකතුව	**217,870**

කළමනාකරණ ගැටළු

වසර තුළ බලපැවැත්වුණු ප්‍රධානතම ගැටළුව වූයේ වසරේ එක් එක් කාර්තු සඳහා කාලීන ක්‍රමානුකූල පදනමකින් වෙන් කරන ලද අරමුදල් නිකුත් නොකිරීමයි. වසර සඳහා සකසන ලද ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුලත් වූ ඉලක්ක වෙත ළඟා වීමේ හා කාර්යයන් සම්පූර්ණ කිරීමේ ලා මෙම ගැටළුව අයහපත් ලෙස බලපෑමක් එල්ල කරන ලදි. පර්යේෂණ ප්‍රදානවල ප්‍රතිලාභීන් මූලික වශයෙන් අධ්‍යාපන හා පර්යේෂණ ආයතනවල සිටින්නන් වන අතර ඔවුන් කෙරෙහි ජාතික විද්‍යා පදනමට සෘජු වශයෙන් කටයුතු කළ නොහැකිය. අදාල පර්යේෂණ ආයතනවල දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ අධීක්ෂණය යටතේ පර්යේෂණ කටයුතු සිදු කරන ලදි. බලපැවැත්වූ ශක්තිමත් ප්‍රදාන ක්‍රමයන් තිබියදීත් ප්‍රදාන ආයතනවල පවතින පටිපාටින් හා ක්‍රමවේදයන් හේතුවෙන් ව්‍යාපෘති කලට වේලාවට ක්‍රියාත්මක කිරීමේ අපහසුතාවයක් මතු විය. කෙසේ වෙතත්, නිසි කළමනාකරණ ඵලඹුම් ක්‍රියාත්මක කිරීම තුළින් වසර සඳහා කරන ලද මුළු වෙන්කිරීම් වලින් 84% ක ප්‍රාග්ධන වියදමක් වාර්තා කරමින් සැලසුම් කරන ලද වැඩ සටහන්වල සැලකිය යුතු සාර්ථකත්වයක් ලබා ගැනීමට ජාතික විද්‍යා පදනමට හැකි විය. පසුගිය වසර හා සන්සන්දනය කරන විට මෙය සැලකිය යුතු විජයග්‍රහණයකි.

මූල්‍ය ප්‍රකාශය

2014 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා විස්තෘත ආදායම් ප්‍රකාශනය

Rs.000

ආදායම	2014		2013	
රාජ්‍ය ප්‍රදාන	107,555		84,661	
වෙනත් ආදායම්				
ලැබුණු පොලි	234		231	
විවිධ ආදායම්	147		42	
ලාභ/(අලාභ) ප්‍රකාශන අලෙවිය	(2,192)		(3,490)	
ඡායා පිටපත් ලැබීම්	4		3	
NSLRC ආදායම	1		26	
විනිමය ලාභය (අලාභය)	21		108	
අසමාන අයභාරය	11,396		11,210	
වියදම		117,166		92,791
පුද්ගල චේතන				
වැටුප්00 හා දීමනා	54,674		49,248	
සේවක අර්ථ සාධක අරමුදල	6,724		6,175	
සේවක භාරකාර අරමුදල	1,343		1,236	
විශ්‍රාම පාරිතෝෂික ලබා දීම	2,297		2,401	
අතිකාල	830		790	
නිවාඩු දින ගෙවීම්	49		51	
නිල ඇඳුම්	250		213	
කාර්ය මණ්ඩල පුහුණුව	550		282	
	66,718		**60,396**	
ප්‍රවාහන	434		196	
සැපයුම්	4,013		3,423	
නඩත්තු	2,512		4,629	
ගිවිසුම්ගත සේවා	9,449		9,161	
වෙනත්	11,011		6,986	
ක්ෂයවීම්	13,550		12,401	
	40,970	107,687	**36,796**	97,192
විශේෂ අයිතමයන්ට පෙර ආදායම මත අතිරික්ත හිඟය		9,479		(4,401)
විශේ අයිතම (ශුද්ධ ලාභය හෝ අලාභය)		-		-
කාලවැය සඳහා ශුද්ධ අතිරික්තය/හිඟය		**9,479**		**(4,401)**

2014 දෙසැම්බර් 1 වන විට මූල්‍ය තත්ව ප්‍රකාශය

රු.'000

	2014		2013		2012	
වත්කම්						
වත්කම් නොවන වත්කම්						
දේපල පිරියත හා උපකරණ	446,997		451,912		445,069	
		446,997	451,912	445,069		442,743
ආයෝජන		632,000	632,000	632,000		661,522
ජංගම වත්කම්						
ඉන්වෙන්ට්‍රි/තොග	1,509		2,910		4,263	
වෙළඳ හා වෙනත් ලැබීම්	18,706		14,596		13,913	
පූර්ව ගෙවීම්	3,451		811		661	
මුදල් හා මුදල් සමක	17,929		8,808		12,481	
		41,595	27,125	31,318		35,717
මුළු වත්කම්		**1,120,592**	1,111,037	**1,108,387**		**1,139,982**
ශුද්ධ වත්කම් හා සංචිත						
ප්‍රාග්ධනය හා සංචිත						
සම්මුචිත අරමුදල්	(5,794)		(18,163)		(8,819)	
ප්‍රතිමාණන සංචිත	422,549		422,549		422,549	
රජයේ ප්‍රදාන	632,000		632,000		632,000	
		1,048,755	1,036,386	1,045,730		1,090,327
ජංගම නොවන වගකීම්						
පාරිතෝෂික සඳහා සැපයීම්	21,413		20,526		23,085	
අසමාන අයහාරය	38,040		28,378		27,539	
		59,454	48,904	50,624		40,252
ජංගම වගකීම්						
ගෙවිය යුතු	2,097		4,417		2,764	
උපාචිත වියදම්	10,286		21,330		9,269	
		12,383	25,747	12,033		9,403
		1,120,592	1,111,037	**1,108,387**		**1,139,982**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

රු.'000

	2014		2013	
මෙහෙයුම් කටයුතු වලින් මුදල් ප්‍රවාහ				
ආදායම මත වියදමෙහි ශුද්ධ අතිරික්තය	9,479		(4,401)	
එකතු කළ: ජා.වි.ප. තුළින් වසරේ ගැලපුම්	**(12,397)**		**(1,178)**	
	(2,918)		(5,579)	
ගැලපුම්				
ක්ෂයවීම්	(13,550)		(12,401)	
ප්‍රකාශනවලින් පාඩුව	(2,192)		(3,490)	
වසර තුළ ගෙවන ලද පාරිතෝෂික	1,410		4,960	
පාරිතෝෂික සඳහා සැපයීම්	(2,297)		(2,401)	
විනිමය ලාභ/පාඩු	21		108	
අසමාන අයභාර	11,396		11,210	
කපා හරින ලද සඟරා හා ජර්නල තොග	(898)		(182)	
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභ/පාඩු	**3,192**		**(3,383)**	
වෙනත් ලැබීම් වෙළඳමේදි ශුද්ධ වැඩිවීම/අඩුවීම	(6,750)		(833)	
ඉන්වෙන්ට්‍රිවල ශුද්ධ වැඩිවීම/අඩුවීම	1,402		1,353	
වෙළඳ ගෙවීම්වල වැඩිවීම / අඩුවීම	(13,364)		13,714	
මෙහෙයුම් කටයුතුවලින් උපයන මුදල්	(18,712)		14,234	
මෙහෙයුම් කටයුතුවලින් ලද ශුද්ධ මුදල		**(15,520)**		**10,851**
ආයෝජන කටයුතුවලින් මුදල් ප්‍රවාහ				
කටයුතුවලින් බැහැර හිඟ මුදල්	(203,105)		(134,111)	
වත්කම් මිලදී ගැනීම	(8,636)		(19,244)	
ග්‍රන්ථ අලෙවියෙන් ලද ලාභය	166		133	
Net cash used in investing activities		**(211,575)**		**(153,222)**
මූල්‍ය කටයුතුවලින් මුදල් ප්‍රවාහ				
රජයේ දායකත්වය	230,777		135,115	
විදේශ ආධාර	5,439		3,583	
		236,216		**138,698**
මූල්‍ය කටයුතුවලින් ශුද්ධ ලාභය		9,121		(3,673)
ආරම්භ කාල සීමාවේදි මුදල් හා මුදල් සමක		8,808		12,481
අවසන් කාල සීමාවේදි මුදල් හා මුදල් සමක		**17,929**		**8,808**

ගිණුම් පිළිබඳ සටහන්

ගිණුම් වාර්තා සකසනු ලැබ ඇත්තේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතින්ට SLPSANS 01 -මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට අනුකූලව ඉදිරිපත් කර ඇත.

වත්කම් ආශ්‍රිත ක්ෂයවීම් සලකනු ලැබ ඇත්තේ LKSA 20 ට අනුව වත්කමෙහි ප්‍රයෝජනවත් ආයු කාලය පුරා විදිමත් වූද සහේතුක පදනමක් මත ලැබෙන ආදායමක් ලෙස හඳුනාගත් අපමාන ආකාරයන් ලෙසය.

1.1 ප්‍රලේඛන ඒකකයේ ප්‍රාග්ධන අරමුදල් වියදම්

		2014	2013
		රු.	රු.
1	NSLRC උපකරණ	-	186,368.00
2	NSLRC ග්‍රන්ථ	83,564.75	102,998.00
3	ජාතික සංඛණ්‍යාකරණ ව්‍යාපෘතිය	5,902,355.31	3,878,904.38
4	NSLRC කාර්ය මණ්ඩල පුහුණුව	84,342.65	7,000.00
5	ජාත්‍යන්තර දත්ත පදනම	2,748,429.43	2,597,123.89
6	NSLRC වැඩමුළු හා සම්මන්ත්‍රණ	-	(34,963.02)
7	ඒකාබද්ධ ලැයිස්තු දත්ත පදනම	8,525.00	90,757.26
8	ජාතික කෝෂ්ඨාගාර විද්‍යා හා තාක්ෂණ තොරතුරු සංග්‍රහ	83,157.00	-
9	සම්මන්ත්‍රණ වැඩමුළු, හා පුස්තකාලය වෙත වෙනත් සහය	104,920.00	400,472.97
10	ප්‍රවර්ධන ද්‍රව්‍ය සැකසීම	-	13,166.98
11	ශ්‍රී ලංකාවේ විද්‍යා හා තාක්ෂණ පුස්තකාලය	8,755.05	-
12	පර්යේෂණ තොරතුරු වෙත විවෘත පිවිසුම	32,582.97	-
		9,056,632.16	**7,241,828.46**

1.2 පර්යේෂණ සහ වෙනත් විද්‍යාත්මක කටයුතු සඳහා ප්‍රදාන

පර්යේෂණ ප්‍රදාන පිළිබඳ එකඟතා ගිවිසුමෙහි දක්වා ඇති නියමයන්ට අනුව පර්යේෂණ ප්‍රදාන වලට මූල්‍යාධාර සැපයීමේදී අපගේ ප්‍රතිපත්තිය වන්නේ ප්‍රදානලාභියා සේවයේ නියුතු ආයතනය වෙත වාරික වශයෙන් එම මුදල් සැපයීමයි. ව්‍යාපෘතිය නිම කිරීමෙන් අනතුරුව එම ව්‍යාපෘතිය සඳහා ලබා දුන් අදාල ආයතනය භාවිතා නොකළ මූල්‍යාධාර ශේෂයක් තිබේ නම් එම ශේෂය නැවත ජාතික විද්‍යා පදනම වෙත ආපසු එවිය යුතුවේ. එලෙස එක් එක් ආයතන වලට සපයනු ලබන මූල්‍යාධාර වියදමක් සේ අපි සලකන්නෙමු. ව්‍යාපෘතිය නිම කිරීමෙන් අනතුරුවද එකී ව්‍යාපෘතියට අදාල උපයෝජන - නොකළ අරමුදල් යම් ආයතනයක් මගින් තබා ගෙන ඇත්නම් අපි එම ආයතනය ණයකරුවෙකු බවට පත් කර ගන්නෙමු.

	2014	2013
	රු.	රු.
පර්යේෂණ හා අනෙකුත් විද්‍යාත්මක කටයුතු සඳහා වියදම්	107,481,063.82	60,777,254.90
පර්යේෂණ ශිෂ්‍යත්ව හා අධිශිෂ්‍යත්වය	9,809,383.80	8,705,139.22
වසර සඳහා සැබෑ වියදම	117,290,447.62	69,482,394.12
උපාචිත වියදම	447,932.92	1,037,413.45
	117,738,380.54	**70,519,807.57**

1.3 විවිධ අරමුදල් වියදම්

		2014	2013
		රු.	රු.
1	ජාත්‍යන්තර සබඳතා	11,866,910.58	8,273,139.32
2	විද්‍යාව ප්‍රචලිත කිරීමේ අංශය	25,127,304.82	13,247,995.35
3	තොරතුරු තාක්ෂණ ඒකකය	1,586,985.00	5,673,574.19
4	ප්‍රතිසංස්කරණ හා වත්කම් වැඩි දියුණු කිරීම	-	161,501.76
5	අධ්‍යක්ෂ කාර්යාලයේ වැය ශීර්ෂය	7,771,395.71	1,118,659.53
6	විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති පර්යේෂණ අංශය	4,120,061.80	2,312,689.99
7	තාක්ෂණ අංශය	24,926,555.10	24,463,161.95
8	ජාත්‍යන්තර සබඳතා අංශය	3,063,636.86	2,721,985.21
9	ජගත් සංසද පසු විපරම්	840.00	3,360.00
10	IDRC NSF වියදම	-	5,328.00
11	ජාත්‍යන්තර සබඳතා OSTP	3,970,982.86	4,164,686.23
12	ජාතික විද්‍යා මධ්‍යස්ථානය	4,483.61	-
		82,439,156.34	**62,146,081.53**

වත්කම් සහ ඒවායේ වටිනාකම තක්සේරු කිරීමේ පදනම

ක්ෂයවිය හැකි වත්කම් සහ ක්ෂයවීම්

ක්ෂයවීම් සපයනු ලැබ ඇත්තේ මුල් පිරිවැය මත හෝ වත්කම මිලට ගත් දින සිට සෘජු රේඛා පදනමක් මත වටිනාකම තක්සේරු කිරීම මත හෝ වන අතර වත්කමෙහි තක්සේරු ආයු කාලය පුරා එහි වටිනාකම ශූන්‍ය කිරීමට ගණනය කිරීම සිදු කරනු ලැබේ.

ක්ෂයවීම් අනුපාතිකය පහත පරිදිය	
ගොඩනැගිල්ල	5%
කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ	20%
මෝටර් රථ	20%
උපාංග හා විවිධ	20%
පුස්තකාල පොත්	5%
ණය පදනම මත ලබා දුන් විද්‍යාත්මක හා විද්‍යාගාර උපකරණ	10%
ප්‍රලේඛන උපකරණ	10%

3 ණය ගැතියන්

	2014	2013
	රු.	රු.
මුළු ණය ගැතියන්	15,298,909.50	10,454,771.54
අඩු කළා : අවිනිශ්චිත ණය සඳහා සැපයීම්	-	-
	15,298,909.50	10,454,771.54

වසර තුනක් තිස්සේ නොපියවා තිබෙන ණය සඳහා ජාතික විද්‍යා පදනම අවිනිශ්චිත ණය සපයයි.

4 වගකීම්

ණය හිමියෝ

ජාතික විද්‍යා පදනම මගින් රඳවාගෙන තිබෙන රු. 2,097,206.92 ක් නියෝජනය කරන ණය හිමියන් පහත දක්වා ඇත.,

		2014	2013
		රු.	රු.
1	SIDA/RFC A/c	11,719.58	11,618.17
2	SIDA	608.05	608.05
3	සුළු ණය හිමියන්	752,846.66	752,846.66
4	කාර්ය මණ්ඩල ණය හිමියන්	5,870.19	5,189.32
5	බලශක්ති පර්යේෂණ ව්‍යාපෘතිය	24,476.05	24,476.05
6	UNESCO සහභාගිත්ව වැඩ සටහන	(134,886.64)	2,185,785.70
7	ස්ටොෆාන් වැඩමුළුව	1,436,573.03	1,436,573.03
		2,097,206.92	**4,417,096.98**

5 (අ) **ප්‍රකාශන**

විශේෂයෙන් පාසල් සිසුන්ට සහ පොදුවේ සමාජය වෙත විද්‍යාත්මක දැනුම ව්‍යප්ත කිරීමට මෙන්ම විද්‍යාත්මක ප්‍රජාවට, ප්‍රතිපත්ති සකස්කරන්නන්ට මූල්‍යාධාර සපයන ආයතන යනාදියට දැනුම බෙදා දීමට ප්‍රධාන වශයෙන් මේවා ප්‍රකාශනය කිරීම සිදු කරනු ලබයි.

එබැවින් බොහෝ අවස්ථාවලදි විශේෂයෙන් විද්‍යාව ආශ්‍රිත කටයුතු සඳහා පාසල් හා වෙනත් අදාල ආයතන ගණනාවකට නොමිලේ ලබා දීමට සිදුවේ. උදා:- තරග මෙවැනි නිකුත් කිරීම් අධ්‍යක්ෂකගේ අනුමැතියට යටත්ව සිදු කෙරේ.

කළමනාකරණ මණ්ඩලය 2010 නොවැම්බර් 15 දින ගන්නා ලද තීරණයකට අනුව මාස හයකට වඩා පැරණි වාර සඟරා හා සඟරාවල වටිනාකම 50% කින් අවප්‍රමාණය කර තිබෙන අතර වසරකට වඩා වැඩි කාලයක් ගතවූ වාර සඟරා හා සඟරාවල වටිනාකම කපා හැර ඇත.

2011 අගෝස්තු 12 වනදා කළමනාකරණය ගන්නා ලද තීරණයකට අනුව වාර සඟරා හා සඟරා හැරුණුකොට මුද්‍රණයෙන් වසර පහක් ගතවී ඇති ග්‍රන්ථ/වෙනත් ඕනෑම ප්‍රකාශනයක වටිනාකම කපා හැර ඇත.

(b) Net Profit/(Loss) Sale of Publications

		2014
		රු.
1	වෙනත් ප්‍රකාශන	2,317.50
2	සමාජ විද්‍යා ශ්‍රී ලංකා වාර සඟරාව	600.00
3	සමාජ විද්‍යා ශ්‍රී ලංකා වාර සඟරාව වෙළුම 31-32	1,000.00
4	සමාජ විද්‍යා ශ්‍රී ලංකා වාර සඟරාව වෙළුම 33-34	1,200.00
5	සමාජ විද්‍යා ශ්‍රී ලංකා වාර සඟරාව වෙළුම 35-36	(67,505.04)
6	විදුරාව	200.00
7	ස්වභාවික සම්පත්	4,500.00
8	ශ්‍රී ලංකාවේ දිය කුරුල්ලෝ	1,200.00
9	ලංකාවේ ස්වභාවික විපත්	(1,699.76)
10	තිරසාර කෘෂිකර්මය	2,347.92
11	ශ්‍රී ලංකාවේ භාවිතා වන ඖෂධීය පැලෑටි	(17,032.00)
12	රිටිපන්න	(1,649.88)
13	ශ්‍රී ලංකාවේ ඖෂධීය ශාඛ සහ ශාස්ත්‍රීය නිබන්ධ	(45,560.00)

14	සාමය සඳහා පරමාණු	(12,807.85)
15	පර්යේෂණ හා විද්‍යාත්මක ආයතන සඳහා මාර්ගෝපදේශය	(66,571.93)
16	විකල්ප බලශක්තිය	(4,863.18)
17	පරිසර පද්ධති මත පදනම් වූ දේශීය ජල කළමනාකරණය	3,194.00
18	ශ්‍රී ලංකාවේ භූගත ජල තත්වය	3,000.00
19	ළදරු හා ළමා පෝෂණය	(5,181.60)
20	සම්ප්‍රදාය හා ජීවනෝපාය	(5,950.00)
21	ශ්‍රී ලංකා විද්‍යා හා තාක්ෂණ වර්ෂෝත්පාදන සංඛ්‍යා ලේඛනමය දර්ශනය	205.00
22	සමහර මූලික ඉඟි	150.00
23	කඳුකරය හා නාය යාම්	(2,348.30)
24	විදුරාව වෙළුම 28 - 1 (ඉ)	300.00
25	විදුරාව වෙළුම 28 - 2 (ඉ)	100.00
26	විදුරාව වෙළුම 28 - 2 (සි)	100.00
27	ශ්‍රී ලංකාවේ සත්ව රෝග	1,682.04
28	සංඛ්‍යා ලේඛන අත් පොත 2004	3,800.00
29	සංඛ්‍යා ලේඛන අත් පොත 2006	(1,768.00)
30	JNSF වෙළුම 40	50,886.80
31	JNSF වෙළුම 41	(5,457.90)
32	JNSF වෙළුම 42	(487,973.22)
33	විදුරාව වෙළුම 29 විශේෂ (සි)	(900.00)
34	විදුරාව වෙළුම 29 විශේෂ (දෙ)	(850.00)
35	විදුරාව වෙළුම 30 - 1 (සි)	(10,700.00)
36	විදුරාව වෙළුම 30 - 1 (ඉ)	(21,100.00)
37	විදුරාව වෙළුම 30 - 1 (දෙ)	(58,200.00)
38	විදුරාව වෙළුම 30 - 2 (ඉ)	(116,100.00)
39	විදුරාව වෙළුම 30 - 2 (ඉ)	(147,900.00)
40	විදුරාව වෙළුම 30 - 2 (දෙ)	(42,150.74)
41	විදුරාව වෙළුම 30 - විශේෂ (ඉ)	(154,237.42)
42	විදුරාව වෙළුම 30 - විශේෂ (සි)	(107,168.27)
43	විදුරාව වෙළුම 30 - විශේෂ (දෙ)	(58,370.47)
44	විදුරාව වෙළුම 31 -1 (සි)	(185,103.58)
45	විදුරාව වෙළුම 31 -1(ඉ)	(138,010.63)
46	විදුරාව වෙළුම 31 -1(දෙ)	(133,893.06)
47	විදුරාව වෙළුම 31 -2 (සි)	(155,404.97)
48	විදුරාව වෙළුම 31 -2 (ඉ)	(139,463.70)
49	විදුරාව වෙළුම වෙළුම 31 (සි)	100.00
50	විදුරාව වෙළුම 31 (ඉ)	100.00
51	විදුරාව වෙළුම 31 (දෙ)	(70,934.96)
52	MAB පිරික්සුම් ලැයිස්තුව හා අත්පොත - 24	(180.46)
53	MAB පිරික්සුම් ලැයිස්තුව හා අත්පොත - 25	(2,073.73)
		(2,192,127.39)

5.1 ජාතික කමිටු වියදම

		2014
		රු.
1	MAB වැඩ සටහන පිළබඳ ජාතික කමිටුව	186,814.18
2	සමාජ විද්‍යා පිළබඳ ජාතික කමිටුව	40,000.00
3	JNF සඳහා වන සංස්කරණ මන්ඩලය	179,633.75
		406,447.93

5.2 ජාතික විද්‍යා පුස්තකාල හා සම්පත් මධ්‍යස්ථානය

		2013	2012
		රු.	රු.
1	නඩත්තු හා අලුත් වැඩියා	36,530.41	39,836.71
2	වාර සඟරා දේශීය හා විදේශීය	848,988.30	749,460.66
3	පරිභෝජන ද්‍රව්‍ය	54,792.00	52,654.00
4	ලේඛන භාරදීම් සේවා	7,595.85	1,989.00
		947,906.56	**843,940.37**

5.3 මුද්‍රණ ඒකකය

		2014	2013
		රු.	රු.
1	පරිභෝජන ද්‍රව්‍ය හා රසායන	762,418.12	601,335.05
2	කඩදාසි හා භන කඩදාසි	112,896.01	6,001.09
3	නඩත්තු හා අලුත්වැඩියා	299,846.80	189,928.52
		1,175,160.93	**797,264.66**

6 **ආයෝජන -** රු. 632,000/-ක ආයෝජනය ජාතික විද්‍යා පදනම NANCO (Pvt) Ltd හි සිදු කරන ලද ආයෝජනය නියෝජනය කරයි.

7 සේවක ප්‍රතිලාභ

සියළුම සේවකයන්ට EPF හා ETF ආවරණ සපයා තිබේ. අනුමත වෛද්‍ය යෝජනා ක්‍රමයක් සපයනු ලැබේ.

8 විශ්‍රාමික පාරිතෝෂිකය

වර්ෂයක සේවා කාලයක් සපුරන ලද සේවකයන් සඳහා විශ්‍රාමික පාරිතෝෂිකය ගෙවීමේ වගකීම හා සම්බන්ධව ගිණුම්වල ඉඩකඩ වෙන් කොට තිබේ.

	රු. සත
වසර සඳහා ගෙවන ලද මුදල් ප්‍රමාණය	1,409,905.00
වසර සඳහා ප්‍රතිපාදන	2,297,022.58

9 විකුණූ පසු මුදල් ගෙවීමේ පදනම මත බැහැර යවන ලද ප්‍රකාශන තොගයේ වටිනාකම රු. 47,500/=

10 ජාතික විද්‍යා පදනම සතුව වාහන 07 ක් තිබේ.

11 2014 වසර තුළ භාන්ඩාගාරයෙන් ලබා ගත් අරමුදල්

	රු.	
ඒකාබද්ධ අරමුදල්	230,776,510.00	
පුනරාවර්තන අරමුදල්	107,555,000.00	
විදේශ ආධාර - IDRC	5,439,463.95	
භාන්ඩාගාර තැන්පතු	733,771.87	(IDRC)

1968 - 2014 දක්වා භාන්ඩාගාරයෙන් ලබා ගත් මුදල්

		රු.
ඒකාබද්ධ අරමුදල්	රු.	1,637,547,139.45
විදේශ ආධාර	රු.	345,081,785.42

12 පූර්ව කාල සීමා ගැලපීම් - අරමුදල් ගිණුමට පහත සඳහන් ගැලපීම් සිදු කරනු ලැබේ.

1 ප්‍රලේඛන ඒකක ප්‍රාග්ධන අරමුදල

	2014	**2013**
	රු.	රු.
2014.01.01 දිනට ශේෂය	721,951.42	2,962,279.88
එකතු කළා: පූර්ව වසර ගැලපීම්	-	1,500.00
	721,951.42	2,963,779.88

2 පර්යේෂණ ප්‍රදාන අරමුදල

2014.01.01 දිනට ශේෂය	993,889.91	2,983,302.73
එකතු කළා: පූර්ව වසර ගැලපීම්	5,969,955.49	5,530,394.75
	6,963,845.40	8,513,697.48

3 මිනිසා සහ ජෛවගෝලි අරමුදල

2014.01.01 දිනට ශේෂය	1,829,977.19	1,829,977.19
අඩු කළා: පූර්ව වසරේ ගැලපීම්	-	-
	1,829,977.19	1,829,977.19

4 විවිධ අරමුදල්

2014.01.01 දිනට ශේෂය	918,191.01	1,120,436.24
අඩු කළා: පූර්ව වසරේ ගැලපීම්	269,539.68	1,338,824.56
	648,651.33	(218,388.32)

5 විද්‍යාත්මක සංචිත අරමුදල

2014.01.01 දිනට ශේෂය	6,747,380.02	6,747,380.02
එකතු කළා: පූර්ව වසර ගැලපීම්	-	
	6,747,380.02	6,747,380.02

6 විදේශ ආධාර

2014.01.01 දිනට ශේෂය	8,701,918.97	8,034,907.10
එකතු කළා: පූර්ව වසර ගැලපීම්	120,000.00	-
	8,821,918.97	8,034,907.10

7 NSF අරමුදල

2014.01.01 දිනට ශේෂය	(38,076,800.00)	(32,497,950.37)
එකතු කළා: පූර්ව වසර ගැලපීම්	(12,397,343.96)	(1,177,634.08)
	(50,474,143.96)	(33,675,584.45)

සටහන

කම්කරු දෙපාර්තමේන්තුව මගින් නියෝග කළ පරිදි 2006 ජනවාරි මස සිට 2012 මාර්තු දක්වා ජීවන වියදම් දීමනාව මත සේවක අර්ථ සාධක අරමුදලට හිඟ ලෙස රු. 10,207,537. 99 ක් මෙම වසර තුළදී ගෙවන ලදී. එමෙන්ම 2006 ජනවාරි මස සිට 2012 මාර්තු දක්වා ජීවන වියදම් දීමනාව මත සේවක භාරකාර අරමුදල් මණ්ඩලය විසින් නියෝග කළ පරිදි රු.1,224,904.15 ක මුදලක් සේවක අර්ථ සාධක අරමුදලට ගෙවන ලදී.

විගණකාධිපතිතුමාගේ වාර්තාව

මගේ අංකය எனது இல. My No. } එල්එස්2/එන්/එන්එස්එන්/1/14 මබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2015 ජූලි 13 දින

සභාපති,

ජාතික විද්‍යා පදනම.

ජාතික විද්‍යා පදනමේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සි) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

ජාතික විද්‍යා පදනමේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1994 අංක 11 දරන විද්‍යා තාක්ෂණ සංවර්ධන පනතේ 40 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සි) වගන්තිය ප්‍රකාර කොමිසමේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් පදනමේ සභාපති වෙත 2015 අප්‍රේල් 10 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පදනමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පදනමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 19 වන වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ජාතික විද්‍යා පදනමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිති අංක 01 ප්‍රකාරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ සියලුම වත්කම් හා වගකීම් ද්‍රවශීලතාවය අනුපිළිවෙලට ඉදිරිපත් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ගෙවා තිබූ රු.4,822,697ක් වූ ආපදා ණය ශේෂයෙන් අයකර ගැනීම වසරකට අධික කාලයක් ගතවන ණය ශේෂය හඳුනාගෙන ජංගම නොවන වත්කම් යටතේ දක්වා නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ

(අ) රාජ්‍ය ප්‍රදාන වලින් ඉදිකල බහලුම් කාර්යාල ගොඩනැගිල්ල සඳහා වූ වාර්ෂික ක්ෂය ප්‍රමාණය රු.382,690ක් වෙනුවෙන් ක්‍රමක්ෂය ගිණුම් ගතකර නොතිබුණි.

(ආ) බැංකු සැසඳුම් ප්‍රකාශයේ දක්වා ඇති හඳුනා නොගන්නා ලද සෘජු බැර රු. 141,311 ක මුදල ආදායම් ප්‍රකාශයට ගැලපීමට කටයුතු කර නොතිබුණි.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

2014 දෙසැම්බර් 31 දිනට වසර දෙකකට වඩා කල් ඉකුත් වූ එකතුව රු.789,649ක් වූ ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.4 නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371(ඇ)	තත් කාර්යය අතුරු අග්‍රිමයන් එය දෙන ලද කාර්යය අවසන් වූ විගසම පියවිය යුතු වුවද අවස්ථා 09කදී ලබාදෙන ලද එකතුව රු.1,726,100ක් වූ මුදල් අත්තිකාරම් නිරවුල් කර නොතිබුණු අතර ඉන් රු.266,600ක අත්තිකාරම් වසරකට වඩා වැඩි කාලයක් නිරවුල් නොවී පැවතුණි.
(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.1 (අ) වගන්තිය.	සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන තිබූ රු.2,040,000ක් වටිනා පරිගණක 20 මිලදී ගැනීම සඳහා අවම වශයෙන් ආයතන 5කින් මිල ගණන් කැඳවා නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පදනමේ මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය රු.9,478,985ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂය සඳහා ඌනතාවය රු.4,401,216ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.13,880,204ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. පුනරාවර්තන ප්‍රදාන රු.22,894,000කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයෙහි අතිරික්තයක් ඇතිවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012,2013 හා 2014 වර්ෂවලදී පදනම විසින් රු.80,016,591ක් වටිනා පර්යේෂණ 54ක් නිමකර තිබුණු අතර ඉන් 2014 වර්ෂයේ නිමකරන ලද මූලික හා ව්‍යවහාර පර්යේෂණ වලින් තාක්ෂණ පැවරීම් සඳහා පර්යේෂණ වාර්තා 2ක් යොමුකර තිබූ අතර ඒ සඳහා රු.9,700,000 ක් ලබාදිය යුතු වුවද, 2014 දෙසැම්බර් 31 දිනවන විට ප්‍රදානය කර තිබුනේ රු. 100,000 ක් පමණි.

(ආ) පර්යේෂණ ව්‍යාපෘතිවල අවසන් වාර්තා ඇගැයීම් කමිටුවක් මගින් ඇගැයීමට ලක්කර නිර්දේශ ලබාදෙන අතර එවැනි වාර්තා සම්බන්ධයෙන් පහත දුර්වලතා නිරීක්ෂණය විය.

(i) පර්යේෂණ අවසන් කිරීම සඳහා සහ අවසන් වාර්තා ඉදිරිපත් කිරීම සඳහා අසාමාන්‍ය කාල ප්‍රමාදයන් ඇතිවීම.

(ii) අවසන් වාර්තා නියමිත ප්‍රමිතියකින් යුක්තව ඉදිරිපත් නොවීම.

(iii) අපේක්ෂිත අරමුණු කරා ලහා වී නොතිබීම.

(iv) වාර්තාව සාර්ථක වාර්තාවක් ලෙස නිර්දේශ වුවද, පර්යේෂණය වාර්තාවකට පමණක් සීමාවී තිබීම.

(v) වාර්තා ඇගැයීමෙන් පසුව රටට ඵලදායී ලෙස යොදා ගැනීමට උනන්දු නොකිරීම.

4.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

පර්යේෂණ ගිවිසුමට අනුව ප්‍රදානයක කටයුතු අවසන් වූ වහාම ප්‍රදානලාභියා විසින් අවසන්වාර්තාව සමඟ ඉතිරි මුදල් ශේෂය පියවිය යුතු වුවත් පර්යේෂණ 09 කට අදාළව ප්‍රදාන ලාභීන් විසින් එකතුව රු.2,798,134ක මුදලක් ප්‍රතිපූරණයකර නොතිබුණි.

4.3 **හඳුනාගත් පාඩු**

සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වෙත 2006 ජනවාරි සිට 2012 දෙසැම්බර් දක්වා දායක මුදල් අඩුවෙන් ගෙවීම හේතුවෙන් රු.408,301ක අධිභාර මුදලක් ගෙවා තිබුණි.

4.4 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පදනමේ කළමනාකරණ තොරතුරු පද්ධතිය පරිගණකගත කිරීම වෙනුවෙන් කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක පාසල සමඟ 2011 පෙබරවාරි 15 දින රු.2,999,000ක් වටිනා ගිවිසුමකට එළඹ තිබූ අතර, එම කාර්ය 2012 ජූනි 14 දින වන විට නිම කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටද නිමකර නොතිබූ අතර ඒ වෙනුවෙන් රු.1,157,100ක වියදමක් දරා තිබුණි.

(ආ) පදනම විසින් සමාලෝචිත වර්ෂය තුළදී රු.9,132,365ක් වටිනා උපකරණ ප්‍රදාන ලබා දී තිබුණි.

(i) ප්‍රදානයට අදාල ගිවිසුම අනුව උපකරණය මිලදී ගත් පසු එම ආයතනයේ ඉන්වෙන්ට්‍රි ලේඛනයට ඇතුලත් කර එහි පිටපතක් හා භාණ්ඩ ලැබීමේ තුන්ඩුවේ පිටපතක් පදනම වෙත එවිය යුතු වුවත් එකතුව රු.7,486,653ක් වටිනා උපකරණ ප්‍රදාන 05ක් සඳහා එසේ කර නොතිබුණි.

(ii) මිලදී ගැනීම් සිදුකල පසු අදාල ආයතනය හා සැපයුම්කරු අතර නඩත්තු ගිවිසුමක් අත්සන් කල යුතු වුවත් ප්‍රදානයන් 02ක් සම්බන්ධයෙන් එවැනි නඩත්තු ගිවිසුමකට එළඹ නොතිබුණි.

(iii) ප්‍රගති වාර්තා සැකසීම පිළිබඳ මාර්ගෝපදේශය අනුව පළමු ප්‍රගති වාර්තාව ප්‍රදාන ලබා දී වර්ෂයක් තුල එවිය යුතු වුවත්, ප්‍රදාන 07ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2010 වර්ෂයේ සිට ක්‍රියාකාරී තත්ත්වයේ නොපවතින පිළිවෙලින් රු.1,829,977ක් හා රු.6,747,380ක් වූ Man & Biosphere Fund සහ Scientific Reserve Fund යන අරමුදල් 2ක් සම්බන්ධයෙන් කළමනාකරණය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට බැංකු ගිණුම් ශේෂ 04ක එකතුව රු.5,798,120ක් වූ අරමුදල් ඌන උපයෝජිතව පැවතුණි.

4.6 ආර්ථික නොවූ ගනුදෙනු

2008 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා රු. මිලියන 632ක මුදලක් නැන්කෝ පුද්ගලික සමාගමෙහි කොටස් වල ආයෝජනය කර තිබුණ අතර, ඒ සඳහා 19,050,909ක සාමාන්‍ය කොටස් සහතික පත් හා 45,248,286ක වරණීය කොටස් සහතික පත්‍ර ජාතික විද්‍යා පදනම නමින් නිකුත් කර තිබුණි. 2011 දෙසැම්බර් 14 දින ප්‍රසිද්ධ කර ඇති අංක 1736/23 දරන අති විශේෂ ගැසට් නිවේදනය අනුව අදාල සමාගම තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය යටතට පත්කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය වන විටද කිසිදු ප්‍රතිලාභයක් පදනම වෙත ලැබී නොතිබුණි.

4.7 කාර්යාල මණ්ඩල කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2014 දෙසැම්බර් 31 වන විට නිලධාරීන් 19ක් පුරප්පාඩුව පැවති අතර එම පුරප්පාඩු වලින් 14ක් විධායක ශ්‍රේණියේ තනතුරු විය.

(ii) පදනමේ ගිණුම් නිලධාරින් බඳවා ගැනීම සඳහා වූ පරිපාලන ගැටළුව සම්බන්ධයෙන් බාහිර පරීක්ෂණ නිලධාරියෙකු පත්කර තිබුණ ද, පරීක්ෂණ කටයුතු පවත්වා අවශ්‍ය පියවර ගැනීමට 2015 මාර්තු වන විටත් කටයුතු කර නොතිබුණි.

(iii) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද බඳවා ගැනීම් පටිපාටියට අනුව පැවැත්විය යුතු කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමට කටයුතු කර නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.

5.1. ක්‍රියාකාරී සැලැස්ම

මූල්‍ය හා භෞතික ඉලක්කයන් සපුරා ගනු ලබන ආකාරය පිළිබඳව ක්‍රියාකාරී සැලැස්මෙන් පෙන්නුම් කල යුතු වුවත්, පදනම විසින් ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්මෙහි භෞතික ඉලක්කයන් ඇතුළත් කර නොතිබීම හේතුවෙන් භෞතික කාර්ය සාධනය ඇගැයීමට ලක්කල නොහැකි විය.

6. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර පදනමේ සභාපති වෙත යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමු විය යුතුය.

(අ) ස්ථාවර වත්කම් පාලනය.
(ආ) තොග පාලනය.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

විගණන වාර්තා පිළිබඳව ජාතික විද්‍යා පදනමේ අදහස්

ජාතික විද්‍යා පදනමේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව හා බැඳේ. එහි සඳහන්ව ඇති කරුණු සම්බන්ධයෙන් මේ වන විට පහත සඳහන් ක්‍රියාමාර්ග ජාතික විද්‍යා පදනම විසින් ගෙන ඇත.

2. මූල්‍ය ප්‍රකාශන

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 1 ප්‍රකාරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුල සියළු වත්කම් සහ වගකීම් ද්‍රවශීලතාවයේ අනුපිළිවෙලට ඉදිරිපත් කිරීමට ද ආපදා ණය ශේෂයෙන් අයකර ගැනීම වසරකට අධික කාලයක් ගතවන ශේෂය ජංගම නොවන වත්කම් යටතේ වර්ගීකරණය කිරීමට ද 2015 වර්ෂයේ සිට කටයුතු කරනු ලැබේ.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) බහලුම් කාර්යාල ගොඩනැගිල්ල සඳහා වූ වාර්ෂික ක්ෂය ප්‍රමාණය ක්‍රමක්ෂය ගිණුමේ ගිණුම් ගත කර නිවැරදි කර ඇත.

(ආ) බැංකු සැසඳුමේ හඳුනා නොගන්නා ලද මෙම රු. 141,311ක මුදල සඳහා ලියකියවිලි 2015 මැයි මස බැංකුවෙන් ලැබී ඇති අතර එම මුදල 2015 මැයි මාසය සඳහා වූ බැංකු සැසඳුමෙන් ඉවත්ව ඇත.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

මෙම ණය හිමි ශේෂයෙන් රු.752,846 දැනටමත් නිරවුල් කර ඇත. ඉතිරි මුදල වන රු. 36,803 2015 සැප්තැම්බර් 30 වන දිනට හෝ එදිනට පෙර නිරවුල් කිරීමට කටයුතු කරනු ඇත.

2.4 නීති,රීති රෙගුලාසි හා කළමනාරණ තීරණ වලට අනුකූල නොවීම

(අ) මුදල් රෙගුලාසි 371(ඇ) රු.1,726,100 ක් වූ මුදල් අත්තිකාරම් වලින් රු.1,416,100ක් 2015 ජූලි මස වන විට නිරවුල් කර ඇති අතර ඉතිරි මුදල ඉදිරියේදී නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.
වසරකට වඩා වැඩි කාලයක් නිරවුල් නොවී පැවති ලෙස පෙන්වා දී ඇති රු. 266,000 මුදලින් රු. 186,600 දැනටමත් පියවා ඇති අතර ඉතිරි මුදල නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.1 (අ) මෙම පරිගණක මිළදී ගැනීමේදී වෙළඳ පොළ මිළ සැසඳුම් ක්‍රමය අනුව සැපයුම්කරුවන් 06 දෙනෙකුගෙන් සංවෘත මිළ ගණන් කැඳවා ඇති අතර ඔවුන්ගෙන් 04 දෙනෙක් මිළ ගණන් ඉදිරිපත් කර ඇත.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

(අ) ජාතික විද්‍යා පදනමට මූල්‍ය ප්‍රතිපාදන ලැබීමේ ප්‍රමාදයන් නිසා තාක්ෂණ පැවරුම් සඳහා මුදල් යැවීමේදී ප්‍රමාදයන් සිදුවී ඇත.

(ආ) (i) පර්යේෂණ නියමිත කාලයට අවසන් කිරීමට නොහැකි වීමට බලපාන ප්‍රධාන කරුණු

- ජාතික විද්‍යා පදනමට මූල්‍ය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් කලට වේලාවට නොලැබීම නිසා පර්යේෂණ ප්‍රදානයන්ට මුදල් යැවීම මාස කිහිපයකින් ප්‍රමාද වීම සෑම වසරකම සිදු වේ.

  නිසි කලට මුදල් යැවීමට නොහැකි වීම නිසා පර්යේෂණයේ යෙදී සිටින පර්යේෂණ සහායකයන් හා තාක්ෂණික සහායකයන් පර්යේෂණ අතහැර වෙනත් රැකියා සඳහා යොමුවීම නිසා සමහර ප්‍රතිපාදනලාභීන්ට පර්යේෂණය නිසි කලට නිම කල නොහැකි වේ.

- පර්යේෂණයක් ප්‍රදානය කළ පසු පර්යේෂණය සිදු කරගෙන යාම සඳහා අවශ්‍ය උපකරණ (Equipment), පාරිභෝගික භාණ්ඩ (Consumables) ලබාගැනීම සඳහා ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කලයුතු අතර එම ක්‍රියාවලිය සඳහා දීර්ඝ කාලයක් ගත වේ.

- සමහර පර්යේෂණ සෑළසුම් කරනුයේ නියමිත කාල වකවානු (Seasonal Research) අනුව පාරිභෝගික භාණ්ඩ සහ සාම්පල එකතු කිරීම සඳහා බිහිවැඩ චාරිකාවන් (Field Visits) යෑමේ ප්‍රමාදයන් හා ප්‍රතිපාදන නිසි කලට නොලැබීම නිසා ඉදිරිපත් කර නිර්දේශ ලබා ගනු ලැබේ.

(ii) අවසන් වාර්තා නියමිත ප්‍රමිතියෙන් ලබා ගැනීම සඳහා අවසන් වාර්තා පිළියෙල කිරීමේ උපදෙස් පත්‍රිකාවක් සහ ආකෘතියක් සෑම ප්‍රතිපාදනලාභියෙකුටම ලබා දෙයි. එම උපදෙස් හා ආකෘතිය වලට අනුකූල නොවන වාර්තා නිවැරදි කර ලබා දුන් පසු පමණක් අදාල කමිටුවටලට ඉදිරිපත් කර නිර්දේශ ලබා ගනු ලැබේ.

(iii) බොහෝ පර්යේෂණ 75% කටත් වඩා අපේක්ෂිත අරමුණු කරා ලඟා වන අතර, එසේ නොවන පර්යේෂණයන් පිළිබඳ අදාල ප්‍රතිපාදනලාභියා විසින් අරමුණු කරා ලඟා නොවීමට හේතු දක්වනු ලැබේ. බොහෝ විට මෙම අරමුණු කරා ලඟා නොකර ගැනීමට හේතු ප්‍රතිපාදනලාභියාටත් වළක්වා ගත නොහැකි හේතු කාරණා මත සිදුවේ. එවන් අවස්ථාවල ජාතික විද්‍යා පදනම සහ අදාල කමිටුව එම කරුණු විශ්ලේශණය කර සලකා බලා අවසන් වාර්තාව පිළිබඳ නිර්දේශ ලබා දෙයි.

(iv) වාර්තාව සාර්ථක වුවත්, සොයා ගැනීම් වැදගත් වුවත්, එය දැනුම එකතු කිරීම සඳහා (Fundamental Research) ප්‍රධානව යෙදෙන අවස්ථා ඇත. ඒවායේ ප්‍රායෝගික යොදා ගැනීම් සීමා සහිතය. කෙසේ වුවත් ජාත්‍යන්තර පර්යේෂණ පත්‍රිකා ඔස්සේ ජාත්‍යන්තර තලයට අපගේ දැනුම එක් කිරීම ද, පශ්චාත් උපාධි අධ්‍යයන ඔස්සේ රටේ සංවර්ධනය සඳහා දැනුම (Knowledge Base) හා හැකියා වර්ධනය (Capacity Building) සෘජුවම දායක වීම ද සිදු වේ.

(v) ප්‍රායෝගිකව රටේ දියුණුව සඳහා යොදා ගත හැකි පර්යේෂණ වාර්තා, ජාතික විද්‍යා පදනමේ තාක්ෂණික අංශයට යොමු කර ඉදිරි කටයුතු සිදු කරගෙන යාමට දිරිමත් කරනු ලැබේ.

මෙයට අමතරව අවසන් වාර්තාව සමඟ, පර්යේෂණය රටේ ඵලදායීතාව සඳහා යොදා ගත හැකි ආකාරය දක්වා එවීමට ආකෘති පත්‍රයක් ප්‍රතිපාදනලාභියාට යවනු ලැබේ.

කෙසේ වෙතත් මෙම විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇති තත්වයන් මඟහරවා ගැනීම අවම කර ගැනීම සඳහා ඉදිරියේදී අවශ්‍ය කටයුතු කරනු ලැබේ.

4.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

ඉතිරි මුදල් ශේෂයන් පියවිය යුතු ලෙස පෙන්වා ඇති පර්යේෂණ 09 අදාළව ප්‍රදානලාභීන් විසින් පියවිය යුතු මුදලින් රු. 1,854,631ක මුදලක් දැනටමත් නිරවුල් කර ගිණුම් ගත කර ඇති අතර ඉතිරි මුදල් ඉදිරියේදී නිරවුල් කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.

4.3 හඳුනාගත් පාඩු

සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වෙත 2006 ජනවාරි සිට 2012 දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය සඳහා දායක මුදල් ගෙවීමේ දී ජීවන වියදම් දීමනාව සැළකිල්ලට නොගැනීම හේතුවෙන් දායක මුදල් අඩුවෙන් ගෙවීම නිසා රු.408,301ක අධිභාර මුදලක් ගෙවීමට සිදුවිය. දැනට මෙම තත්වය සම්පූර්ණයෙන්ම නිවැරදි කර ඇත.

4.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) මෙකී වැඩසටහනේ ප්‍රගතිය කළමනාකරණ මණ්ඩල රැස්වීම් සඳහා මාසිකව ඉදිරිපත් කරන අතර අවශ්‍ය පසු විපරම් ද තොරතුරු තාක්ෂණ අංශය විසින් සිදු කරගෙන යනු ලැබේ. ගිවිසුම (Schedule 04) අනුව පමණක් රු. 1,157,100 මුදල ගෙවීම් කර ඇත.

මෙම කාර්යය කොළඹ විශ්ව විද්‍යාල පරිගණක පාසල ලවා නිමකර ගැනීමට සමීප සම්බන්දතාවයකින් අධීක්ෂණ කටයුතු කිරීමට කළමනාකරණ මණ්ඩලය තීරණය කර ඇත.

(ආ) (i) මෙහි දක්වා ඇති උපකරණ ප්‍රදාන 05 අතරින් ප්‍රදාන 04 ක් සඳහා ඉන්වෙන්ට්‍රි ලේඛණයට ඇතුලත් කල පිටපත හා භාණ්ඩ ලැබීමේ රිසිටපතක් ජාතික විද්‍යා පදනමට ලැබී ඇත. ඉතිරි ප්‍රදාන සඳහා අවශ්‍ය පිටපත් ලබා ගැනීම සඳහා කඩිනම් කටයුතු කරනු ලැබේ.

(ii) මෙහි සඳහන් ප්‍රදානයන් 02 සම්බන්ධ ආයතනය වෙත නඩත්තු ගිවිසුම් ජාතික විද්‍යා පදනමට එවන ලෙස සිහි කැඳවීම් සිදු කර ඇති අතර අධීක්ෂණ කටයුතු කෙරෙමින් පවතී.

(iii) මෙහි සඳහන් ප්‍රදානයන් 07 අතරින් ප්‍රදානයන් 06 සඳහා ප්‍රගති වාර්තාවන් ලැබී ඇත. ඉතිරි ප්‍රදානය සඳහා ප්‍රගති වාර්තාව ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

(අ) ජාතික විද්‍යා පදනමට භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදල් අරමුදල් ගිණුම් (Fund Accounts) ආකාරයෙන් ගිණුම් ගත කරනු ලබන අතර මෙම Man and Biosphere Fund සහ Scientific Reserve Fund වශයෙන් පෙන්නුම් කර ඇත්තේ 2010 වර්ෂයට පෙර වර්ෂවල සිට භාණ්ඩාගාරයෙන් ලද මුදල් ගිණුම් ගත කළ ආකාරය වන අතර මෙම ගිණුම් වල මුදල් ශේෂයක් නොමැත.

ඒ අනුව මෙම අරමුදල් නිවැරදිව ගිණුම් තබා ඇති බව පදනමේ මතය වේ.

(ආ) ලංකා බැංකුවේ 2323376 , RFC/USD/2872719 සහ RFC/USDLOICZ/2872732 ගිණුම් විදේශ ආධාර වෙනුවෙන් විවෘත කරන ලද ගිණුම් වන අතර දැනට එම ව්‍යාපෘතිය අවසන්ව ඇත. ව්‍යාපෘති අවසන් කර ඇති එම බැංකු ගිණුම් වසා දැමීම පිළිබඳව අමාත්‍යාංශයේ උපදෙස් ලබා ගෙන ගිණුම් වසා දැමීමට කටයුතු කරනු ලැබේ.

ලංකා බැංකුවේ 2322471 ගිණුමට ජාතික විද්‍යා පදනමේ ජර්නල් විකිණීමෙන් ලැබෙන මුදල් තැන්පත් කරනු ලබන අතර මෙය අකීය ගිණුමක් නොවේ.

4.6 ආර්ථික නොවූ ගනුදෙනු

නැන්කෝ පුද්ගලික සමාගමෙහි කොටස්වල සිදු කළ ආයෝජනය පර්යේෂණ හා සංවර්ධන අංශයෙහි සිදු කළ ආයෝජනයක් වන හෙයින් ඉක්මන් ප්‍රතිලාභ අපේක්ෂාවෙන් ආයෝජනය නොකරන ලදී. එසේම මෙම ආයෝජනය කැබිනට් තීරණ මත ආයතනයේ පරිපාලනයෙන් බැහැරව, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය හරහා සිදු කළ අතර අවශ්‍ය ක්‍රියාමාර්ග හා තීරණ ගැනීම මෙම අමාත්‍යාංශය මගින් සිදු කරයි. අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම ද එම අමාත්‍යාංශයේ උපදෙස් මත සිදු කළ යුතු වේ.

(i) විධායක ශ්‍රේණියේ පූරප්පාඩු වලින් විද්‍යාත්මක නිලධාරී තනතුරු 05 සහ අංශ ප්‍රධානී - මූල්‍ය සහ පාලන තනතුර සඳහා කොන්තාත් පදනම මතද 2015 අගෝස්තු මසදී බඳවා ගැනීමට කටයුතු කර ඇත.

ප්‍රධාන විද්‍යාත්මක නිලධාරී තනතුරු, එම තනතුරුවල කාර්යභාරය සහ ඒ සඳහා අවශ්‍ය රැකියා පළපුරුද්දට සාපේක්ෂව වැටුප් තලය අඩු මට්ටමක පවතින බැවින් එම තනතුරු පිරවීමට අවශ්‍ය පියවර ගනුලැබුවද අදාළ සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් බඳවාගැනීම දුෂ්කර වී තිබේ.එබැවින් කළමණාකාර මණ්ඩලයේ උපදෙස් මත විකල්ප ක්‍රියාමාර්ග ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත.

(ii) පරීක්ෂණ වාර්තාව ලබා ඇති අතර කළමණාකාර මණ්ඩලයේ උපදෙස් මත ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ.

(iii) බඳවාගැනීම් සහ උසස් කිරීම් පටිපාටියට අනුව පැවැත්විය යුතු කාර්යක්ෂමතා කඩඉම් විභාග ඒ ඒ සේවක කණ්ඩායම් අනුව 2015 ඔක්තෝම්බර් මාසයේ සිට පැවැත්වීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කෙරෙමින් පවතී.

5. <u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>

5.1 <u>ක්‍රියාකාරී සැලැස්ම</u>

පදනමෙහි 2014 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්මේ මූල්‍ය ඉලක්කයන් මෙන්ම භෞතික ඉලක්කයන් පෙන්වා දිය හැකි ක්‍රියාකාරකම් සඳහා භෞතික ඉලක්කයන් ද ඇතුළත්ව ඉදිරිපත් කර තිබූ අතර එක් එක් කාර්තුව සඳහාද එම අගයන් වෙන් වෙන්ව දක්වා තිබුණි. එසේම 2014 වර්ෂය සඳහා මූල්‍ය වෙන් කිරීම අපේක්ෂිත අගයට වඩා අඩු වූ හෙයින් ඇතැම් භෞතික ඉලක්කයන් සපුරා ගැනීමට බාධා ඇති විය. එම නිසා අගෝස්තු මසදී ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කර අදාල අංශ අතර මූල්‍ය වෙන් කිරීම් හුවමාරු කරන ලදී.

6. <u>පද්ධති හා පාලනයන්</u>

(අ) අනුයුක්ත කල අංශය නිවැරදිව දක්වා ස්ථාවර වත්කම් ලේඛනයේ දක්වා ඇති අතර වාර්ෂික ක්ෂය ලේඛනය ද යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇත.

(ආ) 2015 වර්ෂයේ සිට කපාහරින ලද විද්‍යාත්මක ප්‍රකාශන තොගය වෙනම ලේඛනයක පවත්වාගෙන යනු ලැබේ.

සභාපතිනිය
ජාතික විද්‍යා පදනම

NATIONAL SCIENCE FOUNDATION

Chairman
NATIONAL SCIENCE FOUNDATION
47/5,Maitland Place,
Colombo 7
Sri Lanka

ඇමුණුම්

2014 වසරේ සම්පූර්ණ කරන ලද පර්යේෂණ ප්‍රදානයන්

ජෛව තාක්ෂණය හා ජෛව ආචාර ධර්ම පිළිබඳ ක්‍රියාකාරී කමිටුව

ප්‍රදාන අංකය හා කාල සීමාව	ප්‍රදාන ලබන්නා/(න්) ආයතනය	ව්‍යාපෘති මාතෘකාව	වෙන්කරන ලද මුළු මුදල රු.
RG/2007/BT/02 **වසර 3**	**ආචාර්ය ඩී.එම්. දිප්ති යකන්දාවල** උද්භිද විද්‍යා අංශය පේරාදෙණිය විශ්ව විද්‍යාලය **ආචාර්ය ප්‍රේමින්ද සමරජීව** අණුක ජීව විද්‍යාව හා ජෛව තාක්ෂණික අංශය පේරාදෙණිය විශ්ව විද්‍යාලය	Zingiberaceae කුලයේ තෝරාගත් Amomum Roxb හා Alpinion Roxb ඒක දේශීය ගණවල වර්ගීකරණය හා වංශප්‍රවේණික සම්බන්ධතාවය.	**2,261,682**
RG/2007/BT/05 **වසර 3**	**ආචාර්ය දේවිකා එම් ද කොස්තා** කෘෂිකාර්මික ජීව විද්‍යාව, කෘෂිකර්ම පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය	බැක්ටීරියා භක්ෂක භාවිතයෙන් Ralstonia Solancearum *(Pseudomonas Solanacearum)* බැක්ටීරියාවෙන් තක්කාලිවලට සිදුවන හානිය පාලනය කිරීම	**1,622,000**
RG/2008/BT/01 **වසර 2**	**ආචාර්ය ඒ.ඒ.එල්. රත්නතිලක** රසායන විද්‍යා අංශය, කැලණිය විශ්ව විද්‍යාලය	හාල් හා සම්බන්ධ නයිට්‍රජන් ප්‍රයෝජ්‍ය බැක්ටීරියා වෙන් කිරීම හා දර්ශීය කිරීම	**1,623,675**
RG/2010/BT/02 **වසර 2**	**ආචාර්ය ඩී.එච්.එන්. මුණසිංහ මිය** සත්ව විද්‍යා අංශය, රුහුණු විශ්ව විද්‍යාලය මාතර	ශ්‍රී ලංකාවේ *penaeus mondon* හි ගහන ජාන ව්‍යුහය විශ්ලේෂණය	**1,050,352**

මූලික විද්‍යා පිළිබඳ ක්‍රියාකාරී කමිටුව

ප්‍රදාන අංකය හා කාල සීමාව	ප්‍රදානලාභියා/ආයතනය	ව්‍යාපෘති මාතෘකාව	වෙන් කරන ලද මුළු මුදල රු.
RG/2011/BS/03 **වසර 2**	**ආචාර්ය වැරනි ඒ. සෙනවිරත්න** භෞතික විද්‍යා අංශය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය.	නැවත ආරෝපණය කළ හැකි බැටරි, අධික විදුලි බර ධාරක හා සූර්ය කෝෂ වැනි විද්‍යුත් රසායන උපාංග වැනි දේ මගින් නව හෙල්මර් විද්‍යුත් විච්ඡේදක සංශ්ලේෂණය හා විස්තර කිරීම	**1,860,000**
RG/2011/BS/03 **වසර 2**	**ආචාර්ය කේ.ජී. නදීෂානි නානායක්කාර** ජාතික මූලික අධ්‍යාපන ආයතනය, හන්තින පාර, මහනුවර.	සංකලන භූ ජලය වෙතින් නයිට්‍රේට් ඉවත් කිරීම සඳහා විද්‍යුත් රසායනික තාක්ෂණයක් සංවර්ධනය	**821,020**

විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති අධ්‍යයන පිළිබඳ ක්‍රියාකාරී

ප්‍රදාන අංකය හා කාල සීමාව	ප්‍රදානලාභියා	ව්‍යාපෘති මාතෘකාව	වෙන්කරන ලද මුළු මුදල
RG/2011/HS/01 **වසර 2**	**ආචාර්ය ගතසයුරි නීලිකා මල්විගේ** ක්ෂුද්‍රජීවී විද්‍යා අංශය වෛද්‍ය විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය	බරපතල ඩෙංගු ආසාදනය පුරෝකථනය කිරීම සඳහා ජෛව සලකුණු හඳුනා ගැනීම	1,306,000
RG/2011/HS/15 **වසර 2**	**ආචාර්ය එන්.කේ. කරුණෂි කේ අරඹේපොල** ආචාර්ය පී.බී.ටී.ආර්. කුමාරි ප්‍රජා වෛද්‍ය විද්‍යා අංශය වෛද්‍ය පීඨය කොළඹ විශ්ව විද්‍යාලය	කොළඹ දිස්ත්‍රික්කය තුළ කාන්තාවන්ගේ පියයුරු පිළිකා අවදානම් සාධක හා අවදානම් ඇගයීම	993,780

පරිසරය හා ජෛව විවිධත්වය පිළිබඳ ක්‍රියාකාරී කමිටුව

ප්‍රදාන අංකය හා කාල සීමාව	ප්‍රදානලාභියා	ව්‍යාපෘති මාතෘකාව	වෙන්කරන ලද මුළු මුදල
RG/2008/EB/03 **වසර 1**	**ආචාර්ය විපුල බී යාපා** සත්ව විද්‍යා අංශය කොළඹ විශ්ව විද්‍යාලය	ශ්‍රී ලංකා වවුලන්ගේ අංශු රශ්මි වයිරසවල වංශ ප්‍රවේනික සම්බන්ධතාවය හා පරිසර විද්‍යාව පිළිබඳව මූලික පරීක්ෂණ	**287,120.00**

ජෛව තාක්ෂණය හා ජෛව ආචාර ධර්ම පිළිබඳ ක්‍රියාකාරී කමිටුව

ප්‍රදාන අංකය හා කාල සීමාව	ප්‍රදානලාභියා	ව්‍යාපෘති මාතෘකාව	වෙන්කරන ලද මුළු මුදල
RG/2011/STP/01 **මාස 18**	**ආචාර්ය පරාක්‍රම සමරතුංග** **ඩිලානි හිරිමුතුගොඩ** ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය	පැළෑටි වර්ග හා ගොවීන්ගේ සම්ප්‍රදායික දැනුම ආරක්ෂා කිරීම සම්බන්ධ බුද්ධිමය දේපළ පිළිබඳ අයිතිය - ශ්‍රී ලංකාවේ සහල් පිළිබඳ අධ්‍යයනය.	**727,400.00**

විද්‍යාත්මක ජයග්‍රහණයන් සඳහා සම්මාන හඔසෘජ - ආහාර ආරක්ෂාව
31-12-2014 දිනට ක්‍රියාත්මක ප්‍රදාන

වැඩ සටහන් අංකය හා ප්‍රදාන අංකය	ව්‍යාපෘති මූලිකයා/ආයතනය	ව්‍යාපෘති නාමය	වෙන් කළ මුදල (රු.)
වැඩසටහන 1 NTRP/2012/FS/PG-01/P-01	**ආචාර්ය ආර්.එම්. හේරත්** කෘෂිකර්ම දෙපාර්තමේන්තුව	ශ්‍රී ලංකාවේ ජාල පදනම් අස්වැන්න පුරෝකථනය කිරීම සංවර්ධන කිරීම.	2014 අප්‍රේල් සිට වසර 1ක කාලය රු. 2 297 000
NTRP/2012/FS/PG-01/P-02	**මහාචාර්ය ජී.එන්. වික්‍රමනායක** කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක පාසල	කලට වේලාවට අවශ්‍ය තොරතුරු ලබා දීම හා අස්වනු නිශ්පාදනය මනා ලෙස අධීක්ෂණය හා කළමනාකරණය මගින් ගොවියන්ට ජනගහනයේ විවිධවූ ආහාර ඉල්ලුම සැපිරීමට හැකියාව ලබා දීම සඳහා සමාජමය ජීවිත ජාලයක්	2014 අප්‍රේල් 1 වනදා සිට වසරක කාලය රු. 3 200 000
වැඩසටහන 2 NTRP/2013/FS/PG-02/P-01	**මහාචාර්ය කේ.කේ.ඩී. රණවීර** ආහාර විද්‍යාව හා තාක්ෂණ දෙපාර්තමේන්තුව ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය	තෝරා ගත් පලතුරු සහ එළවළු වර්ග 5ක පශ්චාත් අස්වනු අපතේ යෑම අවම කර ගැනීම සඳහා නව තාක්ෂණ ක්‍රම උපයෝගි කර ගැනීම	පළමුවන මාස හය සඳහා රු. 1 659 600
NTRP/2013/FS/PG-02/P-02	**ආචාර්ය එච්.එල්.ඩී. වීරහේවා** ශ්‍රී ලංකා නාවල විවෘත විශ්ව විද්‍යාලයේ උද්භිද විද්‍යා දෙපාර්තමේන්තුව	පූර්ව අස්වනු තාක්ෂණයන් භාවිතා කිරීම තුළින් ආහාර ආරක්ෂණය : පසට පොටෑසියම් හා සිලිකන් යොදා ගැනීමෙන් නැවුම් නිෂ්පාදනයන්ගේ තත්වය ඉහළ නැංවීම	පළමුවන මාස හය සඳහා රු. 1 590 000
වැඩසටහන 3 NTRP/2012/FS/PG-3/P-01	**ආචාර්ය ටී.බී. ආනන්ද ජයලාල්** සෞඛ්‍ය අමාත්‍යාංශය	ක්ෂුද්‍ර ජීව විද්‍යාත්මකව ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා ජාතික ක්‍රමවේදයක් ස්ථාපිත කරවීම	2014 අප්‍රේල් සිට වසර 1 ක කාලයක් රු. 1 530 000
වැඩසටහන 4 NTRP/2012/FS/PG-04/P-02	**ආචාර්ය අතුල සේනාරත්න** ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය	ශ්‍රී ලංකාව තුළ තෝරාගත් බෝගයන් හා පශු සම්පත් නිශ්පාදන හා සම්බන්ධ සැපයීම හා මිල හැසිරීම සම්බන්ධව අධ්‍යයනයක්	2014 අගෝස්තු සිට වසර1 ක කාලය රු. 2 470 000
NTRP/2012/FS/PG-04/P-01	**මහාචාර්ය උදිත් කේ ජයසිංහ මුදලිගේ** කෘෂි ව්‍යාපාර කළමනාකරණ දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය.	ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාවයට බලපාන අභ්‍යන්තර හා බාහිර වෙළඳ ප්‍රතිපත්ති හා පරිවයන් ඇගයීම හා වැඩි දියුණු කළ යුතු ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම.	2014 අගෝස්තු සිට වසර1 ක කාලය රු. 10 729 000
වැඩසටහන 5 NTRP/2012/FS/PG-05/P-01	**ආචාර්ය එස්. පත්මරාජා** කෘෂි කාර්මික ඉංජිනේරු දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්ව විද්‍යාලය.	ශ්‍රී ලංකාවේ දුප්පත් බවෙන් පීඩා විඳින ප්‍රදේශයන්හි ගෘහස්ථ ආහාර සුරක්ෂිතතා මාදිලි සංවර්ධනය ඉහළ නැංවීම	2014 දෙසැම්බර් සිට වසර 1ක කාලය රු. 900 640
NTRP/2012/FS/PG-05/P-02	**මහාචාර්ය පී. මිකුන්තන්** කෘෂි ජීව විද්‍යා දෙපාර්තමේන්තුව, යාපනය විශ්ව විද්‍යාලය.	ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ සම්පත් අවම පවුල්වල ගෘහස්ථ ආහාර හා පෝෂන ආරක්ෂණය, ආර්ථික වර්ධනය හා ජීවනෝපාය වැඩි දියුණු කිරීම සඳහා තිරසර අනුකතලිත ආහාර නිෂ්පාදන ක්‍රමයන් සංවර්ධනය	2014 අප්‍රේල් සිට වසර 1 ක් සඳහා රු. 2 465 000

පර්යේෂණ උපකරණ ප්‍රදාන - 2014

#	අයදුම්කරුවා/තනතුර හා ආයතනය	උපකරණ සඳහා වගකිව යුතු නිලධාරියා	උපකරණය	අනුමත මුදල
01	**මහාචාර්ය කේ.කේ.ආර්. මහානාම** පීඨාධිපති විද්‍යා පීඨය කොළඹ විශ්ව විද්‍යාලය	මහාචාර්ය ආර්.ඩී.විජේසේකර රසායන විද්‍යා අංශය, විද්‍යා පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය	Shaking Incubator	රු. 586,686/-
02.	**මහාචාර්ය රොහාන් ඩබ්ලිව් ජයසේකර** වෛද්‍ය පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය, කින්සි පාර, කොළඹ 08.	මහාචාර්ය සී.පී.ඩී.ඩබ්.මැතිව් ජෛව රසායන විද්‍යා හා අණුක ජීව විද්‍යා අංශය, වෛද්‍ය පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය	Vertical – 20 ^{0} C High Performance Enzyme Freezer	රු. 1,447,600/-
03.	**ආචාර්ය සුබා හීන්කෙන්ද** අධ්‍යක්ෂ, පලතුරු පර්යේෂන හා සංවර්ධන ආයතනය, හොරණ	එස්.ඩී.ආර්. වන්නිආරච්චි, ප්‍රධානි, පාංශු විද්‍යාව හා පැලෑටි පෝෂණය පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය, හොරණ.	UV –Vis Single Beam Spectrophotometer	රු. 813,873/-
04	**මහාචාර්ය අනුර වික්‍රමසිංහ** පීඨාධිපති, විද්‍යා පීඨය, පේරාදෙනිය විශ්ව විද්‍යාලය, පේරාදෙණිය.	මහාචාර්ය දීප්ති යකන්දාවල, උද්භිද විද්‍යා අංශය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය, පේරාදෙණිය	Multigene Optimax Gradient	රු. 825,000/-
05	**මහාචාර්ය එස්.ඒ. අරියදුරෙයි** පීඨාධිපති, ඉංජිනේරු තාක්ෂණ පීඨය, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය, නාවල.	ආචාර්ය සුනිල් තිරිකාවල කෘෂිකාර්මික හා වැවිලි ඉංජිනේරු අංශය, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය.	Rotary evaporator RV 10 Digital Vacuum Pump	රු. 897,080/-
06	**ආචාර්ය ඩී.බී. මහින්ද වික්‍රමරත්න** පීඨාධිපති, සම සෞඛ්‍ය විද්‍යා පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය.	ආර්ය එම්.ටී.ඒ. මුදලිගේ, ප්‍රධානි, වෛද්‍ය රසායනාගාර විද්‍යා අංශය, සම වෛද්‍ය විද්‍යා පීඨය.	Research Microscope with digital camera and software to capture photomicrogaphs and analysis	රු.1,072,500/-
07.	**ආචාර්ය එස්.එස්. ඉක්බාල්** පීඨාධිපති ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය, නාවල.	ආචාර්ය එස්. ආර්. වීකෝන්, ප්‍රධානි, උද්භිද විද්‍යා අංශය, ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය, නුගේගොඩ.	Gradient PCR (Thermal Cycler)	රු. 825,000/-
08.	**ආචාර්ය ඩබ්.එම්.ජී. සෙනවිරත්න** අධ්‍යක්ෂ, රබර් පර්යේෂණ ආයතනය, අගලවත්ත.	ආචාර්ය ටී.එස්.ජී.එස්. ප්‍රනාන්දු මිය, පැලෑටි ව්‍යාධි විද්‍යා හා ක්ෂුද්‍ර ජීව විද්‍යා අංශය, රබර් පර්යේෂණ ආයතනය, අගලවත්ත.	Gradient PCR (Thermal Cycler)	රු. 825,000/-

පර්යේෂණ ප්‍රදාන ක්‍රමයේ සාරාංශය - 2014

		කෘෂිකර්ම හා ආහාර විද්‍යාව	මූලික විද්‍යා	ජෛව තාක්ෂණ හා ජෛව ආරක්ෂ	පරිසර හා ජෛව විවිධත්වය	ඉංජිනේරු, ගෘහ නිර්මාණ ශිල්පය හා තොරතුරු තාක්ෂණය	සෞඛ්‍ය විද්‍යා	පුස්තකාල හා තොරතුරු	සමාජ විද්‍යා	විද්‍යා හා තාක්ෂණ ප්‍රතිපත්ති අධ්‍යයනය	විද්‍යා අධ්‍යාපන	සාගර විද්‍යාව හා සමුද්‍ර විද්‍යාව	එකතුව
01	31.12.2014 දිනට ක්‍රියාත්මක ප්‍රදානයන් ප්‍රමාණය	25	18	22	15	03	30	-	03	02	-	01	119
02	පිරිනමන ලද ප්‍රදාන	04	02	04	05	01	09	-	03	-	-	01	29
03	සම්පූර්ණ කරන ලද ප්‍රදාන	01	02	04	01	-	02	-	-	01	-	-	11
04	අවලංගු කරන ලද ප්‍රදාන	-	-	-	-	-	-	-	-	-	-	-	-
05	අවසන් කරන ලද ප්‍රදාන	-	-	-	-	-	-	-	-	-	-	-	-
06	පත්කළ/පත්කිරීමට නියමිත පර්යේෂණ ශිෂ්‍යයන්	03	-	03	05	01	04	-	03	01	-	-	20
07	පශ්චාත් උපාධියට ලියා පදිංචි වීමට නියමිත පර්යේෂණ ශිෂ්‍යයන්	10	02	02	05	01	04	-	03	01	-	-	28
08	පත් කළ හෝ පත්කිරීමට නියමිත TA	01	-	-	01	01	03	-	01	-	-	-	07
09	ලබා ගන්නා ලද පශ්චාත් උපාධි ආචාර්ය උපාධිය	02	01	-	-	-	01	-	01	-	-	-	05
	දර්ශනපති	02	-	03	-	01	01	-	02	-	-	-	09
	විද්‍යාපති	-	-	-	-	-	01	-	-	-	-	-	01
	වෛද්‍ය විද්‍යාපති	-	-	-	-	-	-	-	-	-	-	-	-
10	ප්‍රදාන මගින් සිදුවූ ප්‍රකාශන සංඛ්‍යාව (විදේශ)	00	01	00	03	02	02	-	-	-	-	00	08
11	ප්‍රදාන මගින් සිදුවූ ප්‍රකාශන සංඛ්‍යාව (දේශීය)	00	00	1	01	01	00	-	-	-	-	00	03
12	සන්නිවේදන	10	25	20	07	05	20	-	-	-	-	00	87

ජාතික විද්‍යා පදනමේ පර්යේෂණ සම්මාන

පර්යේෂණ සම්මාන – **2012**

ක්‍රියාකාරී කමිටුව	ප්‍රදානලාභියා	ප්‍රදාන අංකය/ ව්‍යාපෘති මාතෘකාව
මූලික විද්‍යාවන්	**මහාචාර්ය නාමල් ප්‍රියන්ත** රසායන විද්‍යා අංශය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය. **පර්යේෂණ ශිෂ්‍ය** අනුෂ්ක බණ්ඩාරනායක මහතා (දර්ශනපති)	**RG/2007/FR/06** “Mechanistic investigation of interaction of chromium species and thermally heated brick clay”

පර්යේෂණ සම්මාන – **2013**

ක්‍රියාකාරී කමිටුව	ප්‍රදානලාභියා	ප්‍රදාන අංකය/ව්‍යාපෘති මාතෘකාව
ජෛව තාක්ෂණය හා ජෛව ආචාර ධර්ම	**ආචාර්ය එස්.එන්. සුරේන්ද්‍රන්** සත්ව විද්‍යා දෙපාර්තමේන්තුව, විද්‍යා පීඨය, යාපනය විශ්ව විද්‍යාලය **පර්යේෂණ ශිෂ්‍ය** පී. ජේ. ජූඩ් මහතා (දර්ශනපති)	**RG/2006/BT/03** “Bionomics of the sibling species of the *Anopheles culicifacies* species complex in Sri Lanka”

ඇගයීම් සහතික **-2013**

ක්‍රියාකාරී කමිටුව	ප්‍රදානලාභියා	ප්‍රදාන අංකය/ව්‍යාපෘති මාතෘකාව
ජෛව තාක්ෂණය හා ජෛව ආචාර ධර්ම	**ආචාර්ය රනිල් සමන්ත දසනායක** රසායන විද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ විශ්ව විද්‍යාලය. **මහාචාර්ය ඊ.එච්. කරුණානායක** **ආචාර්ය ඕ.වී.ඩී.එස්.ජේ. වීරසේන** ජෛවරසායන ආයතනය, කොළඹ විශ්ව විද්‍යාලය. **පර්යේෂණ ශිෂ්‍ය** ඩබ්ලිව්. ඩබ්ලිව්. පී. රොඩ්රිගෝ (ආචාර්ය)	**RG/2006/BT/04** “Structural and functional characterization of putative nuclear cell envelope like parasitic nematode specific growth factor protein from goat and sheep parasite, *Setaria digitata* and human filarial parasite *“Wuchereria bancrofti”*
ජෛව තාක්ෂණය හා ජෛව ආචාර ධර්ම	මහාචාර්ය ඩබ්ලිව්.ඒ.ජේ.එම්.ද කොස්තා ආචාර්ය දේවිකා එම්. ද කොස්තා බෝග විද්‍යා දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය. **පර්යේෂණ ශිෂ්‍ය** ඒ.ආර්.එෆ්. සාහ්රා මිය (ආචාර්ය)	**RG/2007/BT/01** “Expression of candidate genes for salt tolerance in Sri Lankan rice germplasm”
